# පරමාර්ථ ධර්ම මකරන්දය

මොරටුවේ රුවතාවත්තේ

පරමාර්ථප්‍රකාශිනී සමිතියේ

ආයාචනා පරිදි

පාණ්ඩුරේ වැලිපිටියේ අභයකරුණාරතනාරාමාධිපති

මොරටුවේ

ආභිධම්මිකාචාර්‍යය්‍ය මෙධානන්ද සංඝරාජ

පාදසාණන්වහන්සේ

විසින්

සම්පාදනයකරනලද

# පරමාර්ථ ධම්මකරණ්ඩය.

HERA
LIBRARY
Book No.....
SIII-82
POLGASDUW
DODANDUW

ප්‍රථම භාගය.

පරමාර්ථප්‍රකාශිනී සමිතියෙහි සභාපතිතැන්පත්

ජේම්ස් ඇල්ප්‍රෙඩ් ප්‍රනාන්දු

මහත්මයාගේ

ධන පරිත්‍යාගයෙන්

මුද්‍රාපිතයි.

---

ශ්‍රී බුද්ධ වර්ෂ 2461. ක්‍රිස්තු වර්ෂ 1917.

**මොරවූවේ රාවනාවත්තේ පරමාර්ථප්‍රකාශිනී සමිතිය.**

(වෂී 1916 ක්වූ නොවැම්බර් මස 19 වෙනි දින සභාරූඪවීම.)

ISLAND HALL
LIBRARY
MORANDUWA

# පරමාර්ථධම්මකරණ්ඩය.

නමොතස්ස භගවතෝ අරහතෝ
සම්මා සම්බුද්ධස්ස.

නිස්සෙසස සත්ත විසයෙ කරුණාවසස්ස
නිස්සඩග සුඛණතති වත්තතති සබ්බධමෙම,
බුධස්ස තස්ස අරහාදි ගුණාකරස්ස
මයහං මනං සුරහි ගන්ධකුටිවහොතං.

සාදෙසනා සුනිපුණා ජිනවංස දීප—
කාරෙන ධම්මගරුනා රවිවාසරෙසු,
අජෙඤ්ඤ සිතෙන පරමත්ථ පකාසිනීති
විඛ්‍යාත සොභත සඝාය විභාවිතාමෙ.

සරස මධුර මධු මධුරං-පරමං පරමත්ථ ධම්ම මකරණ්ඩං තං,
අජ්ඣාමර සුඛභාගී-භවන්තු හොතෙතා නිපිය සුණසඤ්ඤිනා.

ඉන්ද්‍රිය බඩ ධාතුකාය අනින්ද්‍රිය බඩ ධාතුකාය යනි ධාතුකාය විප්‍රකාරවේ. ඉන්ද්‍රිය බඩ ධාතුකාය නම්සතත්ව ශරීරයයි; අනින්ද්‍රිය බඩ ධාතුකායනම් වෘක්ෂලතා පෘථිවී පර්වත ගඞ්ගා සමුද්‍ර වහ්නි වායු ආදි ධාතු සමූහයයි. සංසාර යාත්‍රාව හෝ සංසාර ශුද්ධිය හෝ ඉන්ද්‍රිය බඩ ධාතු ශරීරයෙහි පිහිටා ලැබියහැකිවා මිස අනින්ද්‍රිය බඩ ධාතු ශරීරයෙහි පිහිටා නොලැබියහැකි බැවින්ද අනින්ද්‍රිය බඩ ධාතු ශරීරය ඉන්ද්‍රිය බඩ ධාතු ශරීරයට පෙරළාගත නොහැක්කාසේ ඉන්ද්‍රියබඩ ධාතු ශරීරය අනින්ද්‍රිය බඩ ධාතු ශරීරයට පෙරළාගත නොහැකි බැවින්ද අනින්ද්‍රිය බඩ ධාතු ශරීරයෙකී මෙන්ම ඉන්ද්‍රිය බඩ ධාතු ශරීරයෙහි නිත්‍ය ධ්‍රුව ශාශ්වත ශුභසුඛ ආත්ම ආත්මීය සත්ත්ව පුද්ගල වේදක කාරකයන්ගේ විරහිතභාව යෙන්ද ඉන්ද්‍රියබඩ ධාතු ශරීරය මානෘකාංකාට මෙහි කරුණු දක් වනු ලැබේ.

ඉන්ද්‍රිය බඹ ධාතුකායය සඞ්ඛ්‍යාතවූ සත්ත්ව ශරීරය වනාහි බ්‍රහ්ම දිව්‍ය මනුෂ්‍ය තිරශ්චීන ප්‍රෙත අසුර නෙරයිකආත්ම භාව වශයෙන් නොයෙක් ප්‍රභෙද ඇත්තේවීනමුත් ඔවුනතුරෙන් මනුෂ්‍ය සත්ත්ව ශරීරයාගේ ඇති සවභාව දැන අවබෝධ කරගැන්ම මිනිස් අත්බැව ලත් හැම දෙනාටම අත්‍යන්තොපකාරීවන හෙයින් ඒ මෙහි විශෙෂ වශයෙන් විස්තර කටයුතුවේ. කිසේයත් ?

මනුෂ්‍ය සත්ත්වශරීරයයි කියනලද ඉන්ද්‍රිය බඹ ධාතුකායයෙහි හද දැඩි රළු ගුණ ඇති පිහිටවන දරා සිටින ක්‍රියා ඇති ශරීර ශෛලාවයව පෘථිවිධාතු කොටස් බවද වැගිරීම් දියවීම් ලක්ෂණ ඇති දිගකොට වව පෙතැලි සිව්රැස් ආදි ආකාරයෙන් ධාතූන් ගළපන බන්දවන ක්‍රියා ඇති ශරීර දියරලාවු මැලියම් අවයව ආපොධාතු කොටස් බවද රත්කිරීම උණුසුම් කිරීම් ලක්ෂණ ඇති පැසවන මුහුකුරුවන ක්‍රියා ඇති ශරීරාග්නිහු තෙජොධාතු කොටස් බවද පූරවන ලක්ෂණ ඇති සොලවන තල්ලුවන ක්‍රියා ඇති ශරීර සුලන් වායොධාතු කොටස් බවද දතයුතුයි.

මෙහි කී පෘථිවී ආපො තෙජො වායො ධාතු කොටස් සතර අතුරෙන් ශරීරයෙහි හල් පස් ආකාර අවයවවූ කෙස් ලොම් නිය දත් සම් මස් නහර ඇට ඇටමිදුළු වකුගඩු හදවත් අක්මා දලබු බඩදිවි පපුමස් අතුනු අතුනු බහන් උදරිය (හෙවත් නොදිරූ අහර) අඟුවි මොළ ලොද යන මේකුණප කොටස් (20) විසිදෙන තද දැඩිරළුගුණ ඇති පිහිටවන දරාසිටින කිස ඇති ධාතු බැවින් පෘථිවි ධාතු කාණ්ඩ යෙහි ඇතුළත්වන බවද.

ශරීරයෙහි ද්‍රව ලාටු මැලියම් අවයවවූ පිත් සෙම් සැරව ලේ ඩහදිය මේදතෙල් වුරුණුතෙල් කෙළ සොටු සඳමිදුළු මූත්‍ර යන මේ කුණප කොටස් (12) දෙලොස්දෙන වැගිරීම් දියවීම් ලක්ෂණ ඇති ගළපන බන්දවන කිස ඇති ධාතු බැවින් ආපො ධාතු කාණ්ඩයෙහි ඇතුළත්වන බවද

ශරීරයෙහි අග්නි අවයවවූ ශීතජ්වර උෂ්ණජ්වරාදිවූ නොයෙක් උණරොගයන්ට කාරණවූ සන්තාපන තෙජොධාතුවයයි කියනලද හින්නද ඇස් කන් ආදි ඉන්ද්‍රිය ධර්මයන්ගේ මිහිකිරීමෙන් ඉදුරන් විකල බව කායබල හීනබව කෙස් ලොම් පැසීම් ඇඟ රැලි වැටීම් ආදි ජරා විකාර බව ඇතිකරන්නාවූ ජීරණ තෙජොධාතුවයයි කියනලද හින්නද සකල ශරීරය පුවපාකයක්සේ හැමවේලේ උණුසුම් කරගණ පවත්නාවූ දහන තෙජොධාතුවයයි කියනලද හින්නද කන බොනු ලබන ආහාරපානවගීයන් රස ඕජස් බවට පමුණුවා

සෙස්ස මලමූත්‍රාදිභාවයට වෙන්කර දමන්නාවූ පාවක තෙජෝ ධාතුවයයි කියනලදද ශින්නද යන මේ කොටස් සිව්දෙන රත් කරණ උණුසුම්කරණ ලක්ෂණ ඇති පැසවන මෝරවන කිස ඇති ධාතු බැවින් තෙජෝධාතු කාණ්ඩයෙහි ඇතුළත්වන බවද.

ශරීරයෙහි වායු අවයවවූ කථාබස් කිරීම් හා වමන ඔක්කාර හික්කා ආදි ක්‍රියා විශෙෂයන්ගේ පැවැත්මට කාරණවූ උඩඟම වාතනම් සුලඟද මලමූත්‍රාදිය පැවැත්මට නැවැත්මට කාරණවූ අධොගම වාතනම් සුලඟද බඩවැලෙන් පිටත්හි හෙවත් කුසතුල ක්‍රියාකරන්නාවූ කුවජිසය වාතනම් සුලඟද බඩවැල ඇතුළේ ක්‍රියා කරන්නාවූ කොෂ්ටාශය වාතනම් සුලඟද නහරවැල් අනුසාරයෙන් සියළු ශරීරාවයවයන්හි පැනිර අත්පා දිගුකිරීම් වක්කිරීම් යෑම් ඒම් ඉදීම් සිටීම් සයනය කිරීම් ආදි ක්‍රියා විශෙෂ පැවැත්මට කාරණවූ අඛ්ගමඛ්ගානුසාරී නම් සුලඟද පරමාණුමාත්‍රවූ සියුම් රජස්ගෙණ නාසිකා ජිද්‍රයෙන් ඇතුල්වන නිකුත්වන ආඝ්වාස ප්‍රඝ්වාස නම් සුලඟද යන මේ කොටස් සදෙන පුරවන ලක්ෂණ ඇති සැලෙන තල්ලුවන කිස ඇති ධාතු බැවින් වායොධාතු කාණ්ඩයෙහි ඇතුළත් වන බව දතයුතුයි. මෙසෙයින් ඉඳුරිය බඳ ධාතු ශරීරයෙහි විසි වැදෑරුම් (20) පෘථිවීධාතු කොටස් දෙලොස් (12) වැදෑරුම් ආපොධාතු කොටස් සිව් (4) වැදෑරුම් තෙජෝධාතු කොටස් සවැදෑරුම් (6) වායොධාතු කොටස් එකතුව දෙසාළිස් ධාතුවයව කෙනෙක් වන්නාහ.

තවද ඉන්ද්‍රිය බඳ ධාතු ශරීරය පිළිබඳව පවත්නා අද්‍රව්‍යධාතුව ගව රාශිය චිත්ත චෛතසිකයගි කියනුලැබේ එහිනුදු රූපාදිඅරමුණු දැනගැන්මට ශකතිමත් අද්‍රව්‍ය ධාතුවයව ධම්මරාශිය චිත්ත නම්. ඒ සිත වනාහි අරමුණු දැනගැණීම් ලක්ෂණ මාත්‍රයෙන් එක් අයුරක් ඇති නමුත් කාමභූමියට ඇතුළත් සින් රූපභූමියට ඇතුළත් සින් අරූපභූමියට ඇතුළත් සින් ලොකොත්තර භූමියට ඇතුළත් සින් වශයෙන් ප්‍රභෙද ඇත්තේය; ඒ චාතුර්භූමික චිත්තයෙහි කාමාවචර සිත් සූපණසෙක් රූපාවචර සිත් පසළොසෙක් අරූපාවචර සිත් දෙළසෙක් ලොකොත්තර සිත් අටදෙනෙක් ඝථාක්‍රමයෙන් සඞ්ග්‍රහ බවට යෙත්.

ඔවුනතුරෙන් ලොභ සහගත සිත් අටදෙනද දෙෂ සහගත සිත් දෙදෙනද මොහ සහගත සිත් දෙදෙනද යන මේ දෙළස අකුසල් සිත් නම්වෙත්.

ඉෂ්ටානිෂ්ට රූප දර්ශනය කරන්නාවූ සිත් දෙදෙනද ඉෂ්ටා නිෂ්ට ශබ්ද ශ්‍රවනය කරන්නාවූ සිත් දෙදෙනද, ඉෂ්ටා නිෂ්ට ගන්ධ ඝ්‍රාණය කරන්නාවූ සිත් දෙදෙනද, ඉෂ්ටා නිෂ්ට රසාස්වාදය කරන්නාවූ සිත් දෙදෙනාද, ඉෂ්ටා නිෂ්ට පහස ඥානගන්නා සිත් දෙදෙනද, රූපාදී අරමුණු පස පිළිගන්නා සිත් දෙදෙනද, රූපාදිවූ අරමුණු පස තීරණය කරන්නාවූ සිත් සිදෙනද රූපාදිවූ අරමුණු පස්දෙන පඤ්චද්වාරයෙහි ගැටුණුකළ මේ කිමෙක්දැයි ආවර්ජනා කරන්නාවූ සිතද, රූපාදිවූ ෂට්විධ අරමුණු මනොද්වාරයෙහි ගැටුණුකළ ආවර්ජනා කරන්නාවූ සිතද, බුඩාදීන්ට යම්කිසි අරමුණෙක්නි ලා සිනා පහළකිරීම් වශයෙන් උපදනා සිතද යන මේ අටලොස අහෙතුක සිත් නම් වෙත්.

දන්දීම්, සිල් රැකීම්, භාවනා කිරීම්, කුලදෙටුවන් පිදීම්, වතා වත් කිරීම්, පින්දීම්, පින් ගැණීම, බණ ඇසීම්, බණ කීම්, නුවණ සෘජුමගට පැමිණවීම් ආදිවූ සුචරිත ධර්මයන් සකස් කරන්නාවූ කාලයෙහි උපදනා මහා කුසල් සිත් අටදෙනද එයින් ජනිත විපාක වශයෙන් මතු ප්‍රතිසන්ධි භවාඞ්ග චුතිකෘත්‍ය සාධකවූ මහා විපාක සිත් අටදෙනද, බුදු පසේබුදු රහත්නට පිළිවෙත් පිරීමෙහිදී අට ගන්නා මතු විපාකයක් නැති ක්‍රියාසිත් අටදෙනද යන මේ සූවිසි දෙන (24) කාමාවචර ශොභන සිත් නම්වෙත්. මෙපරිද්දෙන් සියල්ල සූපණසෙක්වූවාහු කාම භූමියෙහි අනාගත බවට යෙත්.

ප්‍රථමධ්‍යාන කුශලසිත ද්විතීයධ්‍යාන කුශලසිත තෘතීයධ්‍යාන කුශල සිත චතුර්ථධ්‍යාන කුශලසිත පඤ්චමධ්‍යාන කුශලසිත යන මේ රූපාවචර කුසල් සිත් පස්දෙනද ඔවුන්ගේ විපාක වශයෙන් මතු භවයෙහි ප්‍රතිසන්ධි භවාඞ්ගච්‍යුති කෘත්‍ය සාධකවූ රූපාවචර ප්‍රථම ද්විතීය තෘතීය චතුර්ථ පඤ්චමධ්‍යාන විපාක සිත් පස්දෙනද බුදු පසේබුදු රහත්නට රූපප්‍රාප්තතාවූ සමවදනා කාලයෙහි උපදනා රූපාවචර ප්‍රථම ද්විතීය තෘතීය චතුර්ථ පඤ්චමධ්‍යාන ක්‍රියා සිත් පස්දෙනද යනමේ පසළොස්දෙන රූපභූමියෙහි අනාගත බවට යෙත්.

ආකාසානඤ්චායතන විඤ්ඤාණඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන අරූපාවචර කුසල් සිත් සතරද ඔවුන්ගේ විපාක වශයෙන් මතු භවයෙහි ප්‍රතිසන්ධි භවාඞ්ගච්‍යුති කෘත්‍යසාධකවූ එසැමින් යුත් අරූපාවචර විපාකසිත් සතරද බුදු පසේබුදු රහත්නට අරූසමවත් සමවදනාකළ උපදනාවූ අරූපාවචර ක්‍රියා සිත් සතරද යනමේ දෙළොස අරූප භූමියෙහි අනාගත බවට යෙත්.

සොවාන් සෙදගැම් අනගැම් රහත් මග සිත් සතරද එනමින් ඵලසිත් සතරද යනමේ අටදෙන ලොකොත්තර භූමියෙකි අන්තර්ගත බවට යෙත්.

මෙහි කී මධ්‍යම ගණන පරිච්ඡේදයෙන් චාතුර්භූමිකචිත්තයෙහි අනාගීත බවට පැමිණි එකුන් අනූ (89) සිත් වනාහි නීලපිතාදී වණීවත්වූවාහුද නොවෙත් දිගකොට උස්මිට්ටිවට පෙනැලි සවහන් ඇත්තාහුද නොවෙති. ගන්ධරස ඵස්පර්ශකාරයකුත් නොවෙති. වණී සණ්ඨානාදි වශයෙන් අදෘශ්‍යමානයහ, අදෘශ්‍යමානහයින් අද්‍රව්‍යයන අද්‍රව්‍යවූවාහු නමුදු එකිනෙකට වෙනස් සවරූපයහයි දතයුතුයි.

මෙහිදී අද්‍රව්‍යවූ යමක් මේ මේ හැටියයි පෙන්විය නොහැකි නමුත් ආසන්නගුණයන් කරණකොටගෙණ දෙලොස් අකුසල් සිත් පහළවන කල්හි පවත්නා අන්දම මදක් විස්තරකරණුලැබේ. කිසේයත්?

පස්කම් සැප සෙවීම් ආදි ලාමක ධර්මාචරණයෙහි තුටුපහටුවීම ඒ නිවරදකොට ලබ්ධි ගැණීම ඒ ගැණ උනන්දුවීම යන මේ තෙඅඟින් පළමුවන (1) ලොබසහගිය සිතද; එසේමැ තුටුපහටුවීම ඒ නිවරදකොට ලබ්ධි ගැණීම ඒ ගැණ උනන්දුනොවීම යන මේ තෙඅඟින් දෙවන (2) ලොබසහගිය සිතද, තුටුපහටුවීම වරදක් හැටියට ලබ්ධි ගැණීම උනන්දුවීම යනමේ තෙඅඟින් තුන්වන (3) ලොබ සහගිය සිතද, තුටුපහටුවීම වරදක් හැටියට ලබ්ධි ගැණීම උනන්දුනොවීම යන මේ තෙඅඟින් සිව්වන (4) ලොබසහගිය සිතද, මධ්‍යස්ථ බව නිවරදකොට ලබ්ධි ගැණීම උනන්දුවීම යන මේ තෙඅඟින් පස්වන (5) ලොබසහගිය සිතද, මධ්‍යස්ථ බව නිවරදකොට ලබ්ධිගැණීම උනන්දුනොවීම යන මේ තෙඅඟින් සවන (6) ලොබ සහගිය සිතද, මධ්‍යස්ථ බව වරදක් හැටියට ලබ්ධිගැණීම උනන්දුවීම යනමේ තෙඅඟින් සත්වන (7) ලොබසහගිය සිතද, මධ්‍යස්ථ බව වරදක් හැටියට ලබ්ධි ගැණීම උනන්දුනොවීම යන මේ තෙඅඟින් අට වන (8) ලොබ සහගිය සිතද යුක්තවේ.

සතුන් මැරීම් ආදි අකුසල් පාපධර්මයක් කිරීමෙහිදී දොම්නස් වීම නිපෙන සුළු බව උනන්දුවීම යන මේ තෙඅඟින් පළමුවන (1) ක්‍රොධ සිතද, එසේම දොම්නස්වීම නිපෙන සුළු බව උනන්දුනොවීම යන මේ තෙඅඟින් දෙවන (2) ක්‍රොධසිතද යුක්තවේ.

සිසියම් පාපධර්මයක් කිරීමෙහිදී උදාසීනවීම නොසන්හුන්බව යනමේ දෙඅඟින් පළමුවන (1) මොහ සිතද, එසේම උදාසීනවීම සැකසහිත බව යනමේ දෙඅඟින් දෙවන (2) මොහසිතද යුක්තවේ.

අද්‍රව්‍යධාතු ධර්මවූ චාදශ අකුශලයන්ගේ පහළවීමෙහි පවත්නා අන්දම මෙකීනයින් අවබොධ කටයුතුයි.

තවද දුනශීල භාවනාදි දශකුශල කර්මපථයන් අතුරෙන් යම් කිසිවක් සකස්කරන්නාහට සතුටත් නුවනත් උනන්දුවත් ඇතිවේනම් පළමුවන කුසල් සිතද එසේම සතුටත් නුවනත් පසුබැසීමත් ඇතිවේනම් දෙවන (2) කුසල් සිතද සතුටත් නුවන රහිත බවත් උනන්දුවත් ඇතිවේනම් තුන්වන (3) කුසල් සිතද සතුටත් නුවන රහිත බවත් පසුබැසීමත් ඇතිවේනම් සිවුවන (4) කුසල් සිතද මධ්‍යස්ථබවත් නුවනත් උනන්දුවත් ඇතිවේනම් පස්වන (5) කුසල් සිතද මධ්‍යස්ථ බවත් නුවනත් පසුබැසීමත් ඇතිවේනම් සවන (6) කුසල් සිතද මධ්‍යස්ථ බවත් නුවන රහිත බවත් උනන්දුවත් ඇති වේනම් සත්වන (7) කුසල් සිතද මධ්‍යස්ථ බවත් නුවන රහිත බවත් පසුබැසීමත් ඇතිවේනම් අටවන (8) වන කුසල් සිතද පහළවේ.

මේ කුසල්සිත් අටදෙනා අතුරෙන් යම් සිතකින් යම් බඳු යහ පනක් කෙළේවිනම් මතු අනාගත භවයෙහි පිළිසිඳගන්නා අවස්ථා වෙහිද පිළිසිඳගැන්මෙන් පසු ජීවත්ව පවත්නා අවස්ථාවෙහිද චුත වන අවස්ථාවෙහිද ඒ සමාන අඹග සම්පූර්ණ විපාකසිත් අටදෙනා අතුරෙන් යම්කිසි විපාක සිතකින් සුදුසුපරිදි විපාක දුනය කෙරේ. මෙසේ කාමාවචර අකුශල කුශල චිත්තයන්ගේ පහළවන ආකාරය බින්දුමාත්‍රයෙකින් දක්වාලිම්. තදනන්තරව චෛතසික නම්ලත් අද්‍රව්‍යවූ ධාතු ධර්මයන් ගැණ කරුණු දක්වනුලැබේ. කිසේයත්?

මේ ඉන්ද්‍රියබඳ ධාතු ශරීරයෙහි හෙවත් සත්ව ශරීරයෙහි එකි නෙකට වෙනස්වූ චෛතසිකයයි කියනලද අද්‍රව්‍යධාතු අවයව දෙපණස්දෙනෙක් උපදනාහ. ඒ දෙපණස් ධර්මයෝ සිතසමග එකට ඉපිද සිත සමග එක් අරමුණක ක්‍රියාකොටැ සිත සමග චක්ෂුරාදි කිසියම් වස්තු රූපයක් ඇසුරුකොටැ සිත සමග ඉදිරි පසුනොව එකවර බිඳී යන්නාහ. සිත පෙරදැරිකොට ඇති ඔවුහු චෛතසික යෝයයි කියනු ලැබෙත්. මෙහි සිත් චෛතසික නොවෙති, චෛතසික සිත් නොවෙති, ඔවුහු ඔවුනොවුන් හින්නව පවත්නා ධර්මයෝ වෙත්. චිත්තය රජක්හුමෙන්ද චෛතසිකයෝ රාජ කෘත්‍ය යන්හි නියුක්ත රාජපුරුෂයන් මෙන්ද වෙනස්ව පවත්නාහයි දත යුතු, ඒ චෛතසික රූශිය නීලපීතාදි වණී වශයෙන් හා දිගකොට උස් මිටි වට පෙහැලි සවහත් වශයෙන්ද මෙබඳු පෑයක් මෙබඳු හැඩහුරුකමක් ඇතැයි කියනොහැක්ක අද්‍රව්‍ය ධාතූ විශෙෂයක් බැවින් ඔවුන්ගේ ලක්ෂණ කෘත්‍යාදිය මේ මේයයි සලකා කරුණු දක්වනු ලැබේ.

වෙදනායය, සංඥුය, චෙතනායය, සපශීය, මනසකාරය, ජීවි තෙන්ද්‍රියය, එකාග්‍රතායය, මේ චෛතසික සත්දෙන මූලකී සිතක් පාසා සෑම සිත්වල යෙදෙන බැවින් සමීවිත්ත සාධාරණයහයි දතයුතු.

විතකීය, විචාරය, අධිමොක්ෂය, වීයය්‍යය, ප්‍රීතිය, ඡන්දය, යන මේ චෛතසික සදෙන ශොභන චිත්ත පඤ්ඤයෙහිද අශොභන චිත්ත පඤ්ඤයෙහිද සුදුසු පරිද්දෙන් ඇතැම්සිත් සමග යෙදෙන බැවින් ප්‍රකී ණීකයහයි දතයුතුයි. මෙකී මචෛතසික තෙළෙස් (13) දෙන එක රාශිකොට අන්‍ය සමානයයි නම්කරනුලැබේ.

මෝහය, අහ්‍රීකය, අනොත්තප්පය, ඔඛත්‍යය, ලොභය, දෘෂ්ටිය, මානය, චෙෂය, ඊෂ්‍යාය, මාත්සය්‍යය, කුක්කුච්චය, ථීනය, මිඛය, විචිකිත්සාය, යනමේ චෛතසික තුදුස් (14) දෙන අකුශල චිත්ත යන් සමගම යෙදෙන බැවින් අකුශල සාධාරණයෝ නම් වෙති.

ශ්‍රඛ්‍රය, සමෘතිය, හිරිය, ඔත්තප්පය, අලොභය, අචෙෂය, නත්‍ර මධ්‍යස්ථතාය, කායප්‍රස්‍රඛ්‍රිය, චිත්තප්‍රස්‍රඛ්‍රිය, කායලඝුතාය, චිත්ත ලඝුතාය, කායමෘදුතාය, චිත්තමෘදුතාය, කායකර්මණ්‍යතාය, චිත්ත කර්මණ්‍යතාය, කායප්‍රාගුණ්‍යතාය, චිත්තප්‍රාගුණ්‍යතාය, කායඍජුකතාය, චිත්තඍජුකතාය, යන මේ එකුන්විසි (19) දෙන ශොභන සාධාරණ චෛතසික නම්වෙත්.

සම්මාවාචාය, සම්මා කම්මන්තය, සම්මා අජීවය, යන තිදෙන විරති චෛතසික නම්වෙත්. කරුණාමුදිතා දෙදෙන අප්පමඤ්ඤ චෛතසික නම්වෙත්. ප්‍රඥෙන්ද්‍රිය සමග මෙසේ චෛතසික දෙප ණස් දෙනෙක් (52) ඇත්තාහ.

---

(1) ඔවුන් අතුරෙන් "**වෙදනා චෛතසිකය**" වනාහී ඉදුරන් සදෙනාට විෂයවූ ගොදුරුවූ අරමුණු රස අනුභවකිරීම් ලක්ෂණ ඇත්තීය. හේ ඇතැම් අරමුණෙක්හි සොම්නස් ආකාරයෙන්ද ඇතැම් අරමුණෙක්හි දොම්නස් ආකාරයෙන්ද ඇතැම්අරමුණෙක්හි උදාසීනාකාරයෙන්ද ඇතැම් අරමුණෙක්හි දුඃඛාකාරයෙන්ද ඇතැම් අරමුණෙක්හි සුඛාකාරයෙන්ද විඳීම කරන්නීය. රූප භොජනය වළඳන්නාවූ රජෙකුමෙනැසි වදුළහෙයින් අරික් චිත්ත චෛතසිකයන්ගේද එකදෙශයකින් අරමුණු රස විඳීමක් ඇති නමුදු වෙදනා චෛතසිකය වනාහි සාතිශයෙන් අරමුණුරස විඳියයි දතයුතුයි. යම්යම් අරමුණු ඉදුරන්ට ගොදුරුවීමෙන් සොම්නස

දෙමිනස උදැසින බව සැපදුක විඳින්නාක්මෙන් අපට වැටහීමවේද ඒ වනාහි වේදනා චෛතසිකයාගේ ආකාර විශෙෂයක් මුත් සත්ව පුද්ගල ආත්ම ජීවයක්හුගේ ක්‍රියා විශෙෂයෙක් නොවේ. එබැවින් වේදනා චෛතසිකය අද්‍රව්‍ය ධාතු සභාවයෙක්මැයි.

(2) **සංඥා චෛතසිකය**-ඉදුරන් සදෙනාට විෂයවූ අරමුණු ඇතිසැටි හෝ වරදවා හෝ හැඳිනීම කෙරේ. හේ වනාහි ළඟු වන්ගේ දැවදඬු සලකුණු කිරීමක්මෙන් රූපාදීවූ අරමුණු හැඳිනීම් සලකුණු කිරීම් ආකාරයෙන් පවත්නීය. යම්සේ වඩ්ඩකී ආදීහු පසුව දැන හැඳිනගැන්මේදී පහසුව පිණිස දැවදඬු ආදියෙහි යම් යම් සලකුණු තබද්ද එසේම පසු පසුව හැඳිනගැණීම් පහසුව පිණිස රූපාදි අරමුණු විෂයෙහි තබාලන සලකුණුමෙන් උපදී. එක් එක් අරමුණෙහි කෙළලක්ෂගණන් සංඥාවන් (හැඳිනීම්) ඇතිවීමෙන් පසුව භවාන්තරයට පැමිණෙද මතකනැතිනොවේ. ඒ එසේමැයි ඉදුරන් නුමුතුල කුඩා දරුවන්ට කෙළෙස් සැඟවී තිබීගිය නමුදු ක්‍රමයෙන් ඉඳුරන් මුකුරන්ට පවත්ගත්කල්හි පෙර භවයෙහි හදුනා පුරුදු බලයෙන් කෙළෙස් වැඩීමට හෙතුවූ අඟපසඟ නිමිති විශෙෂයන් හදුනාගැණීමට හැකිවීමය. ඇතැම්විට මේ සංඥාව අඹාළු පඹරුවක් දිවිඇතිරුවෙකැයි වරදවා හඳුනන්නාක්මෙන් අරමුණු වරදවා හැඳිනීමද මේ නාමය මේ රූපය යනාදි වශයෙන් ඇතිසැටි නොවරදවා හැඳිනීමද නොවේ. හෙද ආත්මජීව සත්ව පුද්ගලාන්තරයක්හුගේ ක්‍රියා විශෙෂයක් නොවේ. අද්‍රව්‍යවූ සංඥා ධාතු ධර්මයාගේම ක්‍රියා විශෙෂයමැයි.

(3) **චෙතනා චෛතසිකය**-චිත්ත චෛතසික ධර්මයන් ඔවුනොවුන් අයත් කටයුතු අරමුණෙහි ලා යොදයි; යම් ගුරුවර යෙකුගේ ප්‍රධාන ශෝලයෙක්වීනම් හෙතෙම තමාගේ ඉගණීම් කිසිදා ගුරුන්ගේ කුදු මහත් කිසිදා සෙසු අතවැසියන්ට පොතපත කියාදීම් කිසිදා සිදකෙරේ; එමෙන් චෙතනා චෛතසිකය තමාගේ කම් සකස්කිරීමද, චිත්තයා අනුව පැවැත්මද වෙදනා සංඥාදී චෛතසික ධර්මයන් විඳීම් හැඳිනීම් ආදි ක්‍රියා විශෙෂයන්හි යෙදීමද සිදකෙරේ; තවද බැලීම් ඇසීම් ආදිය යාම් ඒම් ආදිය විඳීම් හැඳිනීම් ආදිය පව්පින් කිරීම් ආදිය යන සියල්ල චෙතනානම්වූ සිහිවිලිවල පිළිවෙලට සිදුවී යන බැවින් චිත්ත චෛතසිකයන් ඒ ඒ කටයුතුවල යොදන්නානම් සත්ව පුද්ගල වෙදක කාරක කිසිවක්හු නොවෑ චෙතනානම් අද්‍රව්‍ය ධාතුධර්මය මැයි; තවද සෙසු අතවැසියන් ඇතිනමුදු ප්‍රධාන ශිෂ්‍යකෑනම් ගුරුන්ට පැමිණී භාරය ඉසිලීමට ඉටුකිරීමට ව්‍යාවෘත වන්නාසේ සෙසු චෛතසිකයන් ඇතිනමුදු

වෙත්තා වෛතසිකධම්ම චිත්තානුවර්තකවැ ආරම්මණ භාරය තමා ටම පැමිණි බරක්මෙන් උසුලමින් කම් සිඹිය පිණිස ව්‍යාවෘතවේ, මෙහද ආත්ම පුද්ගලාදියක් නොවේ.

4. **සපශී වෛතසිකය**–රූපාදි අරමුණුවල වැදගැණීම් හැ පිම්ආකාරයෙන් පවත්නේයි. තමා සමග එක්ව යෙදුනාවූ චිත්ත වෛතසික ධර්මයන්ද අරමුණුවලපහස්නාකාරයෙන් පවත්වන්නේ මේ ධර්මශක්තියෙනැයි දතයුතු නිදර්ශනයක් මෙසේයි අන්පුහුලෙක් කන්නාවූ ඇඹුල්කරා තමාගේ රසදිව නොපැමිණිම ඇඹුලෙහි වැදී ගියාක්මෙන් හැපී ගියාක්මෙන් බලාසිටින්නවුන්ට කෙළ උනායාම සිරිතයි ඇඹුල්කන්නහු යම්සේද එමෙන් රූපාදි අරමුණු සය දත යුතු අන් පුහුලෙක් කන්නාවූ ඇඹුල් කරා තමාගේ රසදිව නොපැ මිණීම යම්සේද එමෙන් සපශීවෛතසිකය චිත්තය කෙළරෙන් අන් තැනකට නොගොස් වසතුරූපය ඇසුරුකොට පැමිණීම දතයුතුයි. තමාගේ රසදිව ඇඹුලේ වැදී ගියාක්මෙන් කෙළ උනා යාම යම් සේද එමෙන් අරමුණෙහි බැඳිගියාක්මෙන් හැපිගියාක්මෙන් උප දනා සපශීවෛතසිකය දතයුතුයි. තවද සඳ හිරු දෙදෙනාගේ රැස් කලඹ සඳහිරු අයත්මය සඳ හිරු උදාවූකල්හි ඔවුන්ගේ රැස් පොළොව මතුපිට වැදගණ පැහිර ගියාක්මෙන් පෙණේමය. මේ උපමාවේ හැටියට සඳහිරු දෙදෙනාමෙන් වසතුරූපයන් ඇසුරු කොට පවත්නා චිත්තය දතයුතුයි. සඳ හිරු දෙදෙනා අයත් රැස් කලඹ මෙන් චිත්තාශ්‍රිත ප්‍රවෘත්තී ඇති හෙවත් සිත සමග එකට පවත්නා සපශීවෛතසිකය දතයුතුයි. සඳ හිරු දෙදෙනාගේ රැස් පොළොව මතුපිට වැදහණ පැහිරගණ යැමමෙන් සිත හා එක්ව පැවති සපශීවෛතසිකය සිතෙන් අස්වී නොගොස් රූපාදී අරමුණු වල වැදගණ පැහිර පැවැත්ම දතයුතු ප්‍රදීපාලෝකයද මීට සාධ කයි. මෙසෙයින් සපශී නම්වූ අරමුණුපහස්නාකාරයෙන් පවත්නා ධාතුධර්මයෙක් අද්‍රව්‍යසවරූපයෙන් ඇත්තේයයි දතයුතුනි.

(5) **මනස්කාර වෛතසිකය**–රූපාදි අරමුණු ඉදිරියට චිත්ත වෛතසිකයන් සම්පාදනය කෙරේ ආරම්මණ සම්පාදක මනස්කා රය වීථිසම්පාදක මනස්කාරය ජවන සම්පාදක මනස්කාරයයි මනස්කාරය තුන්ආකාරවේ. ආරම්මණ සම්පාදක මනස්කාරය නම් අරමුණු අභිමුඛයට සහජාත චිත්තවෛතසික ධර්මයන් සප යන මෙකී මනස්කාර වෛතසිකය නම්වේ. වීථිසම්පාදක මනස්කාරය නම් පඤ්චවාරා වජ්ජන චිත්තයයි. ජවන සම්පාදක මනස්කාරය නම් මනොවාරාවජ්ජන චිත්තයයි. තදුභය මනස්කාරයෝ කුශලාකුශල වීථිසම්පාදක අවස්ථාවෙහිද කුශලා කුශල ජවන සම්පාදක අවස්ථා

වෙනිද යොනිසො මනසකාරය අයොනිසො මනසකාරයයි ව්‍යවහාරයට පැමිණේ. ආරම්මණ සම්පාදක මනසකාරයට ඇතුළත් මනසකාර චෛතසිකය රියදුරුථාමජව සම්පනන අසුන් සම්පාදනය කරන්නාක්මෙන් චිත්තචෛතසිකයන් ඉදිරියට අරමුණු මෙනෙහි කර කර සපයා දෙයි. රියැදුරු වීථිය නොඉක්ම අසුන් එළවන්නාසේ වීථිසම්පාදක මනසකාරය තෙම අතිමහන්ත මහන්ත පරිත්ත අති පරිත්ත විභූතා විභූතා ලම්බනවීථීන් උල්ලංඝනය නොකොට චිත්ත චෛතසිකයන් මෙහෙයයි රියැදුරු අශ්වයන් සමවිසම මෘදුඵරුසා කාරයෙන් මෙහෙයන්නාසේ ජවන සම්පාදන මනසකාරය තෙම කුශලා කුශල ජවන සැපයීමෙහි චිත්තචෛතසිකයන් මෙහෙයයි. මෙසෙයින් මනසකාරයද අද්‍රව්‍යවූ ධාතුධර්මයෙක්මුත් වේදකකාරක සත්ත්වපුද්ගලාන්තරයක්හු නොවේ.

(6) **ජීවිතෙන්ද්‍රිය චෛතසිකය**-තමත් සමග උපදනා චිත්ත චෛතසික ධර්මයන් ආරක්ෂාකෙරේ නෙළුම්මානෙල් දඹකුහරාගත ජලය නෙළුම් මහනෙල්මල් මලානික විගන්නොදී ආරක්ෂාකරන්නාක්මෙනි ඒ ඒ කෙණෙහි උපදනා චිත්ත චෛතසිකයන් පවත්වාලීමෙහි ප්‍රාණවන්කිරීමෙහි අධිපතිබව කරණ හෙයින් ජීවිතෙන්ද්‍රියයි නම්කරණ්ලැබේ. තහවුරුව පවත්නා ජීවිතෙන්ද්‍රියයක් නැති නමුත් පරම්පරා වශයෙන් බැසගණ යන මහ ගඟවතුරක් සෙයින් ක්ෂණ ක්ෂණයෙහි කැනිව ඇනිවීමෙන් පෙළ සැදී පවත්නාවූ මේ ජීවිතෙන්ද්‍රිය චිත්ත චෛතසික ධර්මපරම්පරාව පාලනය කෙරෙමින් සතක්ති පරිනිර්වාණය දක්වා පවතී.

(7) **එකාග්‍රතා චෛතසිකය**--චිත්ත චෛතසික ධර්මයන් එකඟ බවට පමුණුවයි යම්සේ නහනු සුණු සහල්සුණු ආදිය විසිර පවත්නාකල ජලයලා හැනීමෙන් එක්විමට කැටිබවට පැමිණේද එමෙන් වෙන් වෙන්ව පවත්නා විසිර පවත්නා චිත්ත චෛතසික ධර්මයන් එකාග්‍රතා චෛතසිකය තෙම එක්විමට කැටිවීමට පිඬුවීමට පමුණුවයි. යම්සේ නෙළුම් මකාලය තෙම තමා පිට හුණුවාවූ දියබිඳුරුස කැටිකිරීමට පිඬුකිරීමට පමුණුවාද එමෙන් එකාග්‍රතාව තමාට හාරවූ චිත්ත චෛතසිකයන් අරමුණෙහිලා එකඟබවට පමුණුවයි. තවද සුලන් හැනීතෙන දැල්වූ පහන්සිලනිසොල්මන්ව පවත්නාක් මෙන් එකාග්‍රතාව ඇතිතෙන චිත්ත චෛතසිකයෝද කලබල නොවී නිසොල්මන්ව පවතිත්. එසේ හෙයින් චිත්ත චෛතසිකයන් විසිර යානොදී අරමුණෙහිලා නිශ්චල බවට පත්කරන්නාවූ එකාග්‍රතා නම්වූ අද්‍රව්‍ය ධාතු සවරූපයෙක් ඇත ඒද සත්ත්ව පුද්ගලයෙක් නම් නොවේ.

(8) **විතර්ක චෛතසිකය**-විතර්ක චෛතසික ධර්මයන් රූපාදිවූ අරමුණෙහි නගාලයි.

(9) **විචාර චෛතසිකය**-විතර්ක චෛතසික ධර්මයන් රූපාදීවූ අරමුණෙහි අනුමාර්ජනාකාරයෙන් හෙවත් පිරිමදිනාකාරයෙන් පැවැත්ම කෙරේ.

යම්කිසි අරමුණෙක්හි විතර්ක විචාරයන්ගේ වෙත්නොවැ පැවැත්මක් ඇතිකල්හි විතර්කයාගේ කෘත්‍යය මූලින් මුලින් ඇති වන ඖදාරික ඝණතාරූපය මෙන්ද විචාරයාගේ කෘත්‍යය පසුව පසුව පැතිරී යන ඝණත්වයාගේ සූක්ෂම අනුරූපය මෙන්ද දතයුතුයි. තවද විතර්කය පියාඟඹා යනු කැමැති පක්ෂියාගේ ආරම්භයෙහි පියා තටු සැලීම්මෙන්ද විචාරය අහසට නැගී පියාපත් විදහා යන ගමන මෙන්ද දතයුතු තවද අරමුණකරා බස්නා විතර්කය පියුම්රොණෙහි බැඳුනු භෘඞ්ගයාගේ පියුම බලා පහත්වීමක් මෙන්ද අරමුණෙහි පැවැති විචාරය පියුම් මත්තෙහි බඹරාගේ පරිභ්‍රමණය මෙන්ද දතයුතුයි. තවද විතර්කයෙන් අරමුණු අල්වා ගැණීම මලබැඳුනු ලෝ බඳුනක් වමතින් දැඩිකොට අල්වාගැණීම මෙන්ද විචාරයෙන් අරමුණු පිරිමැදීම දකුණතින් පිරිමැද සුඛකිරීම මෙන්ද දතයුතුයි. තවද දඬුපහරින් සකබම්මා බඳුන් ඉදිකරන්නාවූ කුඹලාගේ සිරකරගෙණ සිටි අතමෙන් විතර්කයද ඉදිකිරීමට ඒ මේ අත හසුරුවන අතමෙන් විචාරයද දතයුතුයි. තවද කවකටුවකින් කවරෙඛාවක් අඳිනකල්හි විතර්කය තෙම මැද කෙලින් සිටි කටුවමෙන්ද විචාරය තෙම අවට සිසාරායන කටුවමෙන්ද දතයුතුයි.

(10) අධිමොක්ෂ **චෛතසිකය**-අරමුණු සනිටුහන් කිරීම ලක්ෂණ ඇත්තේය. එසේදෝ මෙසේදෝ කියා පවත්නා අරමුණෙහි සැලෙන බව චංචල බව මඬින සභාව ඇත්තේය. නොසෙල්විය හැකි මහගල්වැඹක්සේ තමාගේ නිශ්චල භාවය නිසා සහජාත විතර්ක චෛතසික ධර්මයන් සථිරභාවයෙහි පිහිටවීමෙන් අරමුණු විනිශ්චය කොට ගැන්ම කෙරේ. යම්සේ පෘථිවිය නිශ්චලව සථිරව පවත්නා තෙක් ඒ මතු පිට රඳනිබෙන ජඞ්ගමස්ථාවර වස්තූහු පවත්නාහුද එමෙන් අධිමොක්ෂ චෛතසිකය පවත්නාකල ඒ සමග උපදනා චෛතසිකයෝද නොසැලී පවත්නාහුය. හෙද අද්‍රව්‍ය ධාතු ධර්මයෙක්මුත් ආත්මාදී කිසිවක් නොවේ.

(11) **වීර්‍ය චෛතසිකය**-වැයම් කිරීම උත්සාහ කිරීම ලක්ෂණ ඇත්තේයි. හෙතෙම තමන් සමග උපදනාචිත්ත චෛතසික ධර්මයන්ට අරමුණු ගැන්මෙහි පසුබස්නට ඉඩනොදී අනුබලදීම් රූකුල්

දීම් තල්ලුකිරීම් ආකාරයෙන් පවත්නේයි ගෙපලසෙවෙනි ආදිය ගිලිහිය නොදී රැකුල්දෙන්නාවූ ආධාර කණුවක්මෙන් දතයුතු මේ චෛතසිකය උපන්කල මහත්වූකටයුත්ත අල්පකොටද කරන්ට නොහැකිදෙය කිරීමට පහසු දෙයක් කොටද බැරුරුම් ක්‍රියාව ලඝු කොටද සලකන්නේ මතුනොවෙයි. චිත්ත චෛතසිකයන්ගේ ආරම්මණභාරොවහනයෙහි උත්සාහය බලවත්කරන්නේය. යම් යම් සත්වයන්ගේ බර ඇදීම් බර ඉසිලීම් පොර බැඳීම් සරම කිරීම් ආදි ක්‍රියා විශෙෂ සාධනයෙහි කායික වීර්‍යයයි කියනලද හස්තපාදාදි ශරීරාවයවයන්ගේ දඹුමුගුරු ආකාරයෙන් ප්‍රවර්‍තනයට කාරණවූ පෘථිවී ධාතුය ආදී ධාතුක්ෂොභයක්වේද. ඒ වනාහි චෛතසික වීර්‍යය නොවේ. හේමෙහි අනභිමතයි.

(12) **ප්‍රීති චෛතසිකය**-රන් රිදී මසු කහවණු ආදි වස්තු ප්‍රතිලාභයෙහි පිනාගන දුගියක්හුමෙන් ආරම්මණ ප්‍රතිලාභයෙහි පිනා යන ලක්ෂණ ඇත්තේ තමා සමග උපදනා චිත්ත චෛතසික ධර්‍මයන් ඔදවැඩි බවට පමුණුවයි, වාජීකරණ රසායන ඖෂධ විශෙෂයෙකින් ශරීරාවයවයන් පුෂ්ටිමත් බවට පමුණුවන්නාක්මෙනි ඒ ප්‍රීති තොම්මෝ ඛුද්දිකා ඛණිකා ඔක්කන්තිකා උබ්බගා ඵරණාසී පඤ්ච ප්‍රකාරයෑ එයින් ක්ෂුද්‍රිකා ප්‍රීතිය ශරීරයෙහි ලොමුඩැහැගැණීම සිඹ කෙරෙයි. ක්ෂණික ප්‍රීතිය ක්ෂණ ක්ෂණයෙහි විදුලිය ඇනෙන්නාක් මෙන් උපදී. ඔක්කන්තිකා ප්‍රීතිය සමුද්‍රතීරයෙහි ඉපිල නැග නැග බිඳි යන්නාවූ රළපතරක් මෙන් උපදී උබෙඛා ප්‍රීතිය ශරීරය ඔසවා අහස්කුස බහාලන තරම් බලවත්වේ සඵරණ ප්‍රීතිය වාතයෙන් පුරා ගිය හසන්‍රාවක්මෙන්ද මහ වතුරෙන් පිරිගිය පඕවතකුක්ෂියක් මෙන්ද සකල ශරීරය පුරවා ඉතිරයයි.

(13) **ඡන්ද චෛතසිකය**-අරමුණු පිළිගැණීමෙහි කැමැති බව ලක්ෂණකොට ඇත්තේයි. අරමුණු සොය සොයා යන කිස ඇත්නේය. චිත්ත චෛතසිකයන්ගේ අරමුණු ගැන්මෙහිලා තෙමේ හසනකෘත්‍යය සම්පාදනය කරන්නාක්මෙන් පවත්නේය. ලොකයෙහි ඇතිතාක් ක්‍රියා විශෙෂයෝ ඡන්දය අනුව පවත්නාහ. මේ ඡන්දය වනාහි ඡන්දාධිපති ඡන්දිද්ධිපාද කෘත්‍යයන් පවා සිද්ධකරණ හෙයින් ඉතා බලවත් ධර්‍මයෙකි. මෙය අරමුණු ගැණීමෙහිද අරමුණු මුදාහැරීමෙහිද සමානාධිය ඇති හෙයින් වස්තු රැස්කිරීම් ආදියද වස්තු පරිත්‍යාග කිරීම් ආදියද සිදුවන්නේය. ඡන්දය කුශලා කුශලා ව්‍යාකෘත ත්‍රිවිධ පක්ෂ භජනය කරන්නාවූ ධර්‍මයක් හෙයින් ලොකයට ඉඳුරාම වෙනස් ධර්‍මයක් බැව් සැකහැර දතයුත්තේය.

---

(14) **මොහ චෛතසිකය**-යම් ධර්මයක් විසින් මුළාකරණු ලැබේනම් ඒ ධර්මය මොහනම්. යම් ධර්මයක් කරණකොට ගෙණ මුළාවේනම් ඒ ධර්මය මොහනම්. මුළාවීම් මාත්‍රය මොහනම්. මේ වනාහි අරමුණු මුවාකර දමන ලක්ෂණ ඇත්තේය. චතුරාර්යයෙන් යුත් බහලාන්ධකාරයෙන් වැසීගිය වස්තූන් ඇසට නොපෙණී යන්නාසේ මොහයෙන් වසාදැමූ අරමුණු හෝ කුශලපක්ෂය හෝ සහජාත චිත්ත චෛතසිකයන් විසින් මැනවැසි ඇතිසැටි දැනගත නොහැක්කේය. බහාලාන්ධකාරයෙන් වැසීගිය වස්තූන් වච්ලන් මහමූ තන්ට පෙණීයන්නාසේ මොහයෙන් වසාදැමූ අරමුණු හෝ අකුශල පක්ෂය සහජාත චිත්ත චෛතසිකයන්ට මැනවැසි වරදවා වැටහියන් නේය. මොහය කුශල පක්ෂයෙහිජාත්‍යන්ධයෙක් වැනිය අකුශල පක්ෂයෙහි ඇස් ඇත්තෙක් වැනිය. "පාපපක්ඛංපහිතා සෝ ඤාණගතිං කතෝ හොති" යනු කීහෙයින් මොහය අකුශල ලාමක අඹම්නීව පාප ක්‍රියා පක්ෂයට පැමිණ ඤාණයට බඳු පැවතුම් ඇත්තේයයි දතයුතු. ලොකයෙහි සත්ත්වයාතන්නාදිය උදෙසා තනන්නාවූ කාලතුවක්කු බෝම්බ මැෂින්තුවක්කු ටෝර්පිඩෝ යුද්ධනැව් ශ්‍රීනිලන්ඩ යුද්ධනෞකා යාත්‍රාදී උපකරණ ප්‍රඥාබලයෙන් ප්‍රඥාශක්තියෙන් ප්‍රඥානුභාවයෙන් සම්පාදනය නොකෙරෙති. ඒ සියල්ලක්ම අකුශලපක්ෂයහි ඤාණානුගතිකව ක්‍රියා කරන්නාවූ අතීතීක්ෂණ පටුතර මොහයාගේ ආනුභාවයෙන්ම සම්පාදනයකරන්නෝ සපයන්නහි නිසැකව දතයුතු. ප්‍රඥාවගේ පාපක්‍රියාවක් හා සමාගමයෙක් කිසිකලෙක නොවේ මය එසේම මොහයාගේද කුශලක්‍රියාවක් හා කිසිකලෙක සමාගමයෙක් නොවේමැයි. බ්‍රහ්මයාගේ පටන් ක්ෂුද්‍රකෘමිබුවා දක්වා සම්සත ලොකවාසීහු මොහයෙන් මුළාව සිටින්මය. කෙසේදයත්- මවන්නෙක් ඇත. ආත්මයක් ඇත. ජීවයෙක් ඇත සත්ත්වයෙක් ඇත පුද්ගලයෙක් ඇත විඳින්නෙක් ඇත කරන්නෙක් ඇත ඝනාදී වශයෙන්ද අනිත්‍ය දුඃඛ අනාත්ම සභාව ලක්ෂණ ධර්මයන් නිත්‍ය සුඛ ආත්මාදී වශයෙන්ද සඤ්ඤාදී ධර්මයන් ආත්ම ආත්මීය වශයෙන්ද භාරගෙණ මුළාවෙන් මුළාවී සිටින්මය. මේ සාරහත් මුළාවට නොදැනීවම අදුරට අඤ්ඤනබවට කතීවූයේ හෙතුවූයේ අන්කිසිවකු නොවැ අපි අපගේම පවත්නා මොහ චෛතසික නම්වූ අදෘශ්‍යධාතු ධර්මය මැයි. යටත් පිරිසෙසින්,

"උත්තානෝ වණ්ඨනාමණ්ඩුක පාටිතෝදර සන්නිභෝ
කෙලදිනිසන්ථිවණෝ ශකනිරක්‍රිමෝකස්‍යජායතෝ"

යන්නෙන්ද උඩුකුරුව සිරුර පුම්බවාගත් හෝ ඉදිමියාවූ මැඩියෙකුගේ මැදින් පැළූ උදර කුහරයක් වැනිවූ සෝදිය රුධිරවැනි

මෙන් තෙත්වූ සත්ත්වයෙහි පණුවෙකුට මිසක් පණුවෙක් නොවන්නාවූ අන් කවරෙකුව නම් මෛථුන රතියෙහි අභිලාෂයෙක් උපදනේදැයි කියා නිබෙන හෙයින් අනික් දෙයක් තබා මෙබඳු කුණප සථානයන් පවා හසුනසාරයක්මෙන් බාරගන්නා තරම් මොහය ගණබොල්නම් එසින්ම මොහය කෙබඳු ධර්මයෙක්දැයි සලකා බැලිය යුතු.

(15) **අස්‍රීක චෛත සිකය**—අශුචියෙහි පිළිකුල් බවක් නැති අශුචි අසුභවයට කිසිසේත් විලිනැති ගම්හුරකු මෙන් පාපයෙහි පිළිකුල්බවක් නැති හෙයින් සහජාත චිතත චෛතසික ධර්මයන් අර මුණුරස අනුභවයෙහි විලිනැති බවට පමුණුවයි. මේ අදව්‍ය ධාතු ධර්මයක්වූ අස්‍රීකයාගේ ආනුභාවයෙන් සහජාත ධර්මයෝද තදනුවර්තකවූවාහු කයින් පව්කිරීමෙහි වචසින් පව්කිරීමෙහි සිතින් පව් කිරීමෙහි යෙදෙත්. මේ වනාහි සමස්ත ලොකයාගේ ගුණශරීරය නසාදමා අගුණ ශරීරය පැවැත්මට ප්‍රධාන කාරණවූ ධර්මයෙකි.

(16) **අනොත්තපප චෛතසිකය**—ගින්නට නොබාවදින පල හැටියා මෙන් පාපයට නොබා අරමුණු ඉදිරියට වදනා ලක්ෂණ ඇත්තේය. කායාදිචාරත්‍රයෙන් කිසියම් පාපයක් කිරීමෙහිදී සහජාත ධර්මයන් නිර්භීත භාවයට විසාරද බවට පමුණුවමින් පවත්නේයි. මහා බලසමපන්න යොධයෙක් සංග්‍රාම භූමියෙහි බැසගැණීමට භයවනිත නොවන්නාසේ අනොත්තපපය පාපධර්මයෙහි බැසගැණීමට භයවකින නොවන්නේයයි දතයුතු මේද සමසතලොකයාගේ ගුණ ශරීරය මකාදමා අගුණ ශරීරය පැවත්වීමට ප්‍රධාන කාරණවූ ධර්මයෙකි.

(17) **ඖඛතය චෛතසිකය** – අවුස්සා දමනලද හළුගොඩක් ධූලිගොඩක්මෙන් චිතත චෛතසිකයන් අවුස්සා දමන ලක්ෂණ ඇත්තේය. පෙරලා හරිණලද පනුවක්මෙන් අරමුණෙහි නොසන්හුන් ආකාරයෙන් අනවසථිතා කාරයෙන් පවත්නේයි. අර්ථ වශයෙන් ඖඛතය නම් සහජාත ධර්මයන්ගේ නොනික්මුන් ගතියයි. අකීකරුවූ නොහික්මුනාවූ පුගුල්තෙම යහපතට නොනැමෙන්නාසේ අයහපතට නැමෙන්නාසේ ඖඛතයද කුශලපකෂයට නොනැමී අකුශල පකෂයට නැමී පවත්නේයි.

(18) **ලොභ චෛතසිකය**–ගලවාගත නොහැකිසේ අරමුණෙහි සහජාත ධර්මයන් අලවාතබයි. පුවරුකඩ ආලෙපකොට අවවා තැබූ වදුරුලාටු උගුලෙහි අත්පා ආදී කීප පලකින් බැඳියන්නාවූ වදුරෙකුමෙනි. උපමාසාම්‍යය මෙසේයි. පුවරුකඩ ආලෙපකොට අටවා

තැබූ වඳුරුලාටුව මෙන් රූපාදිඅඩාලම්බනය දනයුතුයි. අත්පාආදි කිහිපපලඟින් බැඳියන වඳුරාමෙන් චක්ඛුරාදි ෂඩ්ඩාරයන් ඇසුරු කොට උපදනා රූපතණ්හාදි වශයෙන් ප්‍රභෙදවූ සවැදෑරුම්වූ ළෝභය දනයුතුයි.

(19) **දෘෂ්ටි චෛතසිකය**—වරදවා අරමුණු බාරගැණීම වර දෙහි බැසගැන්ම කෙරේ. මුවපොල්ලන් මිරිඟුදියෙහි ජලබුබිය ඉපිද දුව වෙහෙසට පැමිණෙන්නාක්මෙන් දෘෂ්ටිය අරමුණෙහි තත්වාකාරය නොවැටහීමනිසා විපරීතාකාරයෙන් වවහාරගණ අනිඛාවහාය කොට අනයව්‍යසනයට පමුණුවයි. බාල දරුවෙකු හෝ මූඪයෙකු කෙණසල්කඳක් ලැබ ඝරයක් ඇත සිතා පතුරු ඟලවා ඟලවා බලා අසාරයක්ම ලැබගන්නාක්මෙන් දෘෂ්ටිද පඤ්චසකායයි කියන ලද ආත්මභාවය ලැබ මෙහි නිත්‍ය සුඛ ශුභ ආත්මසාරයෙක් ඇත සිතා කාමසුඛල්ලිකානුයොග අත්තකිල මථානුයොගයයි කියනාලද දෙකොළවරට බැස බැස අසාරයක්ම පරීක්ෂාකොට ගන්නේය.

(20) **මාන චෛතසිකය**—උඩඟුබව ලක්ෂණකොට ඇත්තේය. සහජාත චිත්ත චෛතසික ධර්මතැනි භූමියෙහි ජයසම්භෘතයක් කැණ සිටෙව්වාක්මෙන්ද ජයකොඩියක් එසෙව්වාක් මෙන්ද පවත්නා ධර්මසභාවයකි. මේ මානය උපන්කළ මමත් එක්තරා පුද්ගලයෙක් වෙමැයි මමත් පණ්ඩිතයෙක් වෙමැයි මමත් කාරණා කාරයෙක් වෙමැයි යනාදී වශයෙන් මත්වූ සවභාවක් උමතුවූ සවභාවක් ඇති වන්නේය, "සෙය්‍යස්‍ය සෙය්‍යොහම්ඝම්" යනාදි වශයෙන් මානය නවවිධවේ." නඟුලිස ගිලදැමූ පිඹුරා දරදඬු ආකාරයෙන් පවතින්නාක් මෙන් මානය උපදවාගත් පුහුල්තෙම යටත්පිරිසෙයින් මව් පියන් කෙරෙහිද ගරු සරු නොකරන්නේය.

(21) **ෙෂ චෛතසිකය**—දණෙඹන් පහළ විෂසෝර සර්පයකු මෙන් වණඩබව ලක්ෂණකොට ඇත්තේය විෂධූමයක් මෙන් අරමුණු ඉදිරියට පැනිරයන සිසඇත්තේය නොහොත් ලැව් ගින්නක් මෙන් සවසන්තානය හෙවත් සහජාතධර්මයන් තවනසිස ඇත්තේය අවකාශලත් පසම්තුරෙකු මෙන් දූෂණය කිරීම් ඇත්තේය. නවවිධ ආඝාත වස්තූහු මිට කරුණුවෙන්.

(22) **ඊර්ෂ්‍යා චෛතසිකය**–මෙරමා යසඉසුරු නොඉවසීම් ලක්ෂණ ඇත්තේය, හේවනාහි අනුන්ලත් යසඉසුරක් අසා හෝ දැක හෝ සිතා හෝ ඉවසිය නොහැකිවන්නේය. ඔහුට මෙබදු යසඉසුරක් නොවේවායි යන ආකාරයෙන් මෙන් පවත්නේය. අනුන්ගේ සිලාදී ගුණයක් අසාදැන හෝ අනුන්ට ලැබෙන ලාභසත්කාරදියක්

අසා දැක හෝ අසා දැන හෝ මේ ඊෂ්‍යාව උපන්කළ මහත් කළ කිරීමට පැමිණියාක් මෙන් මූන හපුටුවන්නේය. ඇස් පවා මලා නික වන්නේය.

(23) **මාත්සර්‍ය්‍ය චෛතසිකය**—තමාගේ සම්පත් සහවා ගැණීම ලක්ෂණකොට ඇත්තේය. මේ සම්පත් මවම වෙන්වා අනුන්ට නොවෙන්වා යන සවභාවයෙන් පවත්නේහි. මේ වනාහි ආවාස මාත්සර්‍ය්‍ය කුලමාත්සර්‍ය්‍ය ලාභමාත්සර්‍ය්‍ය වණීමාත්සර්‍ය්‍ය ධර්මමාත් සර්‍ය්‍ය කියා පඤ්චප්‍රකාරවේ.

(24) **කුකෘකුච්ච චෛතසිකය**—පෙර පව්කළබව අරමුණුකොට හෝ පෙර පින්නොකළ බව අරමුණු කොට හෝ පව් රැස්වගියේය පින්රැස්ව නොගියේයයි එකාන්ත අදිත අරමුණක් ගෙණ පසු තැවීම් ලක්ෂණකොට ඇත්තේය. ඒ වනාහි තමා හා එක්ව යෙදුනාවූ චිත්ත චෛතසික ධර්මයන් පාපප්‍රගුප්සාකාරයෙන් නොහකුළුවා ලාමකාකාරයෙන් හකුළුවා දැයි නොහොත් තමා හා යෙදුනාවූ චිත්ත චෛතසික ධර්මයන් කෙළෙස් ලියා දමනාකාරයෙන් නොපවත්වා ඊට විරුද්ධාකාරයෙන් පවත්වයි. පරිඩීනවූ දැසපුරුෂයෙක් වරදවා කළාවූ කුදුමහත් කටයුතු මෙනෙහි කොට හෝ නිමියන් නියම්කළ කටයුතු නොකළබව මෙනෙහි කොට හෝ මහත් පසුතැවීමට විපිළිසරට යම්සේ පැමිණේද මේ චෛතසිකයද එමෙන් කළතොකළ පව්පින් අරමුණෙහි විපළිසර බවට පැමිණේ.

(25) **ථීන චෛතසිකය**—චිත්තයාගේ අරමුණුගැන්මෙහි මඳ මඳ පසුබැස්ම කෙරෙයි. යම්සේ ගිලන්බව ගිලන්නාගේ සිත දුබල බවට පමුණුවද එමෙනි.

(26) **මිඛ චෛතසිකය**—වෙදනාදී සකඬිත්‍රයාගේ අරමුණු ගැන්මෙහි මඳ මඳ පසුබැස්ම කෙරේ යම්සේ ගිලන් බව ගිල නාගේ අඟපසඟ සිරුර දුබල බවට පමුණුවද එමෙනැහි දතයුතුයි.

(27) **විචිකිච්ඡා චෛතසිකය**-අරමුණ නිශ්චයකර ගැණීමෙහි අසමර්ථතායෙන් පිළියම් කටැටි නොවන රොගයක් මෙන් දුසසා ධ්‍යවූ සැකකිරීම් ලක්ෂණ ඇති ධර්මයකි බුඩාදීවූ අවතැන්හි සැක කිරීම මේ ධර්මයෙන් සිඩයි. හේවනාහි නීවරණ විචිකිත්සාය ප්‍ර තිරූපක විචිකිත්සායයි මිශ්‍රකාරවේ. නීවරණ විචිකිත්සාව බුඩාදී අව තන්හි උපදනේහි ප්‍රතිරූපක විචිකිත්සාව සම්මෑනොවූ අන්‍යයන්ට මේ කිමෙක්දැයි මේ කෙසේදැයි යනාදි ආකාරයෙන් තම තමන්ට අවිෂය අරමුණෙහිලා උපදී කුශලාකුශල ක්‍රියා චිත්තජවශයෙන් එහි ප්‍රභෙද ඇත්තේය මොහය පටන් විචිකිත්සාව දක්වා ඇති චෛත සික තුදුස් (14) දෙන එකාන්ත අකුශල ධර්මයෝවෙත්යි දතයුතුයි.

(28) **ශ්‍රද්ධා චෛතසිකය**–සක්විති රජකුගේ පැන්පහදවනමිණි ජාවනක්වෙන් තමා හා සමග යෙදුනාවූ චිත්තචෛතසික ධර්මයන් පහදවන ලක්ෂණ ඇත. ඒ එසේමය උපදනාවූ ශ්‍රද්ධාතොමෝ පසුව නීවරණයන් බිඳා මැඩපවත්වන්නී ඔවුන් කෙරෙන් මිදුනාවූ චිත්ත චෛතසිකයන් පහදවන්නීය. තවද සම්පක්ඛන්දන ලක්ෂණ ශ්‍රද්ධාවකුදු ඇත. ඒවනාහි නොපැමිණියාවූ ගුණයටපැමිණීම පිණිසද සිඳුනොකළාවූ ගුණයාගේ සිඳකිරීම පිණිසද නොලත් මගඵල ලබාගැනීම පිණිසද පමුණුවන්නීය. නොඑහෙත් ශ්‍රද්ධාතොමෝ ඇදහීම විශ්වාසය පිහිටුවා ගැනීම ලක්ෂණයෙකොට ඇත්තීය. යම්සේ පිරිසිදුවූ ප්‍රසන්නවූ නොකැලඹුනාවූ ගඹගාජලය තෙම චන්ද්‍ර සූර්‍ය්‍ය නාරකාවන්ගේ පිළිබිඹුන් තමාකෙරෙහි මනාකොට පිහිටුවාගණ්නේද එපරිද්දෙන් මේ ශ්‍රද්ධා නොවේද තෙරුවන්ගුණ මනාකොට තමාකෙරෙහි පිහිටුවාගන්නීය ඉඹාදීවූ ඇදහියයුතු වස්තූන් විෂයෙහි චිත්තචෛතසිකයන්ගේ ප්‍රසාදාකාරයෙන් පවත්නාවූ ශ්‍රද්ධාවම මෙහි අභිමතයි එසින් අන්‍යවූ යම්ශ්‍රද්ධාවක් එනාහි තීර්ථකයන් කෙරෙහි හෝ තීර්ථකශ්‍රාවකයන් කෙරෙහි හෝ නොපැහැදිය යුතු නොඇදහිය යුතු වස්තූන්හි පැහැදීම් වශයෙන් ඇදහීම් වශයෙන් පවත්නීද ඕ නොමෝ එනාහි (ඔකප්පන ශ්‍රද්ධා ප්‍රතිරූපකවූ) වරදවා විශ්වාසකිරීම් සඞ්ඛ්‍යාතවූ මිථ්‍යා අධිමොක්ෂ චෛතසිකයයි. යම්සේ මනුෂ්‍යයෝ සවහසතය නැතිකල්හි සපුරුත්තයන් දැකත්ගන්ට නොහැකිවේද්ද ධනය නැතිකල්හි ඔවුනට සිතළු හොඟයෝ සම්බන්නොවෙද්ද බීජ නැතිකල්හි ශස්‍යාදීහු සම්බන්නොවෙද්ද එසේම ශ්‍රද්ධාහසතය නැතිකල්හි ශ්‍රද්ධාධනය නැතිකල්හි ශ්‍රද්ධාබීජය නැතිකල්හි පුණ්‍යක්‍රියා වස්තූහුද සම්බන්නොවෙත්. මෙසෙයින් ශ්‍රද්ධාව නම්වූ වේදකකාරකාදි රහිතවූ ඇදහීම් පැහැදීම් ලක්ෂණ නිඃසත්ව නිර්ජීව ධර්මසභාවයෙක් ඇතැයි දතයුතු.

**සතිනි චෛතසිකය**–යම් ධර්මයක් කරණකොට ගෙණ අරමුණු ඇතිසැටි සිහිකෙරේද ඒ ධර්මය සතිනම්වේ ඒ වනාහි සක්විති රජක්හට කුදුමහත් කටයුතු සිහිකර කරදෙන්නාවූ භාණ්ඩාගාරික යක්ෂයෙන් චිත්තචෛතසිකයන්හට අරමුණු සිහිකරවාදෙන (අපිලාපන) ලක්ෂණ ඇත්තීය. නොඑහෙත් සක්විති රජක්හට නිතානිත ජනයන් මතක්කර දෙන්නාවූ වැඩ අවැඩ සිහිකොට දෙන්නාවූ පරිනායක රත්නයමෙන් සම්ප්‍රයුක්ත ධර්මයන් සහිතවූ චිත්තයට අරමුණු පරීක්ෂාකරදෙන (උපගණ්හන) ලක්ෂණ ඇත්තීය. ඒ එසේමය සිහිය උපදනාකළ තමාවිසින් කළාවූද කළයුතුවූද සුවරිත කර්මයෝත් බුබගුණාදී ධර්මයෝත් පමානැතිව අරමුණුවීම වශයෙන්

නුදුරුව ලංවසිවිත්මය ඒ සිහිය වනාහි සම්‍යක්සමෘතිය මිථ්‍යාසමෘතිය කියා ත්‍රිවිධයැ එසින් සම්‍යක් සමෘතිය නම් වෙහි විස්තරකළාවූ සමෘති චෛතසිකයයි. මිථ්‍යාසමෘතිය නම් කළාවූද කළයුතුවූද පාප කර්මයන් පවානැතිව අරමුණුකිරීම් වශයෙන් පවත්නාවූ සමෘතිප්‍රතිරූපකවූ අකුශල චිත්තෝත්පාදමාත්‍රයෙක්වේ. යම් හෙයකින් මේ සමෘතිතොමෝ වනාහි සියළු අකුශල ධර්මයන් කෙරෙන් චිත්ත චෛතසික ධර්මයන් ආරක්ෂාකර ගැණීමටත් සියළු කුශලධර්මයන් හා ඵලපාගැණීමටත් හැකිවන්නේද එහෙයින් සමෘතිචෛතසිකය සකල කෘත්‍යයන්හි නියුක්ත මහා මාත්‍යයකු මෙන් සම්පාදී සිහි යට කාරණ වන්නේය. අරමුණෙහි දැඩිකොට පිහිටවන බැවින් එලිපතුකදක්මෙන්ද වක්‍ෂුරාදී වාරයන් රක්නාහෙයින් දෙරටුපාල යකු මෙන්ද දතයුතුයි. හෙදසහ පුද්ගලාන්තරයක්හු නොවැ සිහිකිරීම් ලක්ෂණඇති ධාතු ධර්මමාත්‍රයෙක්යයි දතයුතු.

(30) **හිරි චෛතසිකය**—පාපයෙහි පිළිකුල් කිරීම් ලක්ෂණ ඇත ලජ්ජා ආකාරයෙන් පාපධර්මයන් නොකොටහරණ කිස ඇත්තීය පාපධර්ම සමාදානයෙහි හැකිළීම් බව ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තීය ආත්මගෞරවය හිරියට ආසන්නකාරණයැ හිරිය නෙවත් ලජ්ජාව උපදනාකළ පාප පක්ෂය අසූචියක් මෙන් පිළිකුල්කොට උපදනා ධර්මයකි. ලජ්ජාකටයුත්තෙහි ලජ්ජාවට නොපැමිණෙද්ද ලජ්ජා නොකටයුත්තෙහි ලජ්ජාවට පැමිණෙද්ද ඒ වනාහි හිරිප්‍රතිරූපකවූ අනිකක්මුත් හිරි චෛතසිකය නම්නොවේ යම් හෙයකින් මේ හිරි නම්ලද ලජ්ජාව කරණකොට ගෙණ තමාකෙරෙහි ගෞරවයෙන් පාපකර්මසමාදානයෙන්තොරවැ සබඝන්නානය පිරිසිදුකොට පාලනය කෙරේද එහෙයින් හිරිය ලෝකපාලක ධර්මයකැයි දතයුතු. මෙද වනාහි සත්ත්ව පුද්ගලාන්තරයක්හුනොවැ ධාතුධර්මමාත්‍රයෙක් මැහි.

(31) **ඔත්තප්ප චෛතසිකය**—පාපොත්‍රාස ලක්ෂණ ඇත්තීය. පාපයට බියවීමෙන් පව් නොකරනරණ කිස ඇත්තීය පාපධර්ම සමාදානයෙහි හැකිළෙන බව ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තීය පරගෞරවය ඔත්තප්පයට ආසන්න කාරණයැ ඔත්තප්පය උපදනාකළ පාපපක්ෂයට බියවීම් වශයෙන් උපදනේසි භයවියයුතු පාපධර්මයෙහි භය නොවෙද්ද භයනොවියයුතු කාරණයෙහි භයවෙද්ද ඒ වනාහි ඔත්තප්ප ප්‍රතිරූපකවූ අනිකක්මුත් ඔත්තප්ප චෛතසිකය නම් නොවේ. යම් හෙයකින් මේ ඔත්තප්ප නම් ලද පාපභීරුකාව කරණ කොටගෙණ තමාකෙරෙහි ගෞරවයෙන් පාපකර්ම සමාදානයෙන් තොරවැ සබඝන්නානය පාලනය කෙරේද එහෙයින් ඔත්තප්පය ලෝකපාලධර්මයෙකැයි දතයුතු මේදවනාහි නිඃසත්ත්වනිර්ජීව ධාතුධර්මයෙකැමැයි.

මෙකල සත්ත්වපුරුෂයන් අතර ඔවුනොවුන් බැලීම් කථාබස්කිරීම් මෙට්ටුනයෙහි යෙදීම් ආදි ක්‍රියා විශෙෂයන්හි උපදනා යම් ලජ්ජා වක් ඇද්ද වණ්ඩභාවයන්ට සඝීයන්ට යකුන්ට දණ්ඩනයට නැති ගැණීව වශයෙන් උපදනා යම් භීතියක්වේද ඒ ලජ්ජා භය දෙක හිරිඔතප්ප දෙක නොවන බව දතයුතු.

(32) **අලොභ චෙතසිකය**—රූපාදි ෂඩාලම්බනයෙහි චිත්ත යාගේ ලොල්බව රහිත බැව් ලක්ෂණකොට ඇත්තේය. නෙළුම් පතෙහි නොඇලෙන දියත්තක්සේ අරමුණෙහි නොඇලෙන බව හෝ ලක්ෂණකොට ඇත්තේය කෙලශයන් කෙරෙන් මිදුන මහණක්සේ අරමුණු තමා අයත් නොකිරීම් කිසඇත්තේය. අශුචියෙහි වැටුන පුරුෂයකු මෙන් අරමුණෙන් මිදෙනු කැමතිබැව් ඇත්තේය තවද ලොභයට ප්‍රතිපක්ෂවූ ධර්මය තෙම අලොභතම්චේ යම්සේ ලොභය තමහට අභිතවූ අරමුණුවල ලග්නාකාරයෙන් (ඇලීයන ආකාරයෙන්)පවතීද එබදුවූ අරමුණුවල පැවැති ලොභය මැඩගෙණ ලොභයට වයතුවූ භවභොග සම්පත් අශුචිරාශියක්මෙන් පිළිකුල් කොට කිසියම් නෛෂ්කර්ම්‍ය ධාතුවක්ව පවත්නා නිඃසත්ත්වනිර්ජීව ධර්මශක්තියක් බව දතයුතුයි.

(33) **අදොෂ චෙතසිකය**—වණ්ඩනොවන බව නොදඩබව ලක්ෂණකොට ඇත්තේය. නොහොත් අනුකූල මිත්‍රයක්හුමෙන් විරුඬනොවන බව ලක්ෂණකොට ඇත්තේය. නවවිධ ආඝාත වස්තූන් සන්සිඳුවන කිස ඇත්තේය. නොහොත් චන්දනාලෙපයක් මෙන් චිත්තචෛතසිකයන්ගේ විඩාව සන්සිඳුවන කිස ඇත්තේය. පුන් සඳමඬලක්මෙන් සෞම්‍යබව වැටහීම් කොට ඇත්තේය. වෙෂයට ප්‍රතිපක්ෂවූ ධර්මය අදොෂ නම් වෙෂය වනාහි තමහට අභිතවූ අරමුණුවල දූෂනය කිරීම්වශයෙන් පවති එබදු අරමුණුවල පවත්නා වෙෂය මැඩගෙණ දුටු දුටු සත්ත්වයන් විෂයකොට පුණ්‍යචන්ද්‍රකානෑයක්සේ සෞම්‍යවූ සිත්සතන් උපදවා අව්‍යාපාද ධාතුවශයෙන් පවත්නා සත්ත්වපුද්ගලාදීන් නොරවූ ධර්මමාත්‍රයකි. මෛත්‍රිය නමුදු මේ ධර්මයමැයි.

(34) **තත්‍රමධ්‍යස්ථතා චෛතසිකය**—අලසබව නොඅන්හුන් බවයයි කියනලද උභය විෂම පක්ෂයන්ගේ මැදපිහිටි සවභාවධර්මය තෙම තත්‍රමධ්‍යස්ථතානම් ඒ ඒ චිත්තචෛතසිකධර්මයන් හා යෙදුනාවූ මැදහත් බව හෝ තත්‍ර මධ්‍යස්ථතානම් නොහොත් ඒ ඒ හිත පිණිස වූ ක්‍රියාවන්හි චිත්තචෛතසිකයන්ගේ මැදහත් බව තත්‍ර මධ්‍යස්ථතානම් එහෙයින් තත්‍රමධ්‍යස්ථතා නොමෝ සමසමවැ ජව

යෙන් දිවන්නාවූ ආජානෙය අසුන්දැක මැදහත් බවට පැමිණෙනු ලබන රියැදුරක්හුමෙන් කුශලධර්‍ම පක්‍ෂයෙහි සමව පැවති සම්ප්‍රයුක්ත ධර්‍මයන් මැදහත්බවට පමුණුවයි. බ්‍රහ්මවිහාර උපෙක්‍ෂානමුදු මේධර්‍මයමැයි මෙද සත්ති පුද්ගලාන්තරයක්හු නොවැ අද්‍රව්‍යධාතු ධර්‍මයකි.

(35) **කාය ප්‍රශ්‍රබ්ධි චෛතසිකය**—වේදනා සංඥාසංඛාර සකාන්ත්‍රයාගේ විඩාසන්සිඳුවන ලක්‍ෂණ ඇත්තේහි කායදරථය මැඩපියන කිසඇත්තේය. වේදනාදී සකාන්ත්‍රයාගේ නොසැලෙනබව හා සිහිල්බව ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තේය වේදනාදි සකාන්ත්‍රය ඊට ආසන්න කාරණවන්නේය යම් කෙණෙකුන්ට කාය ප්‍රශ්‍රබ්ධි චෛතසිකය දුර්‍වලවන්නීද ඔව්හු පින්කිරීමෙහිලා සිත සැපයක් නොලබන්වත් හැර බැහැර අරමුණෙක්හි ඔවුන්ගේ සිත පැන යන්නේය තවතලද ගල්පෝරුවෙක්හි තබනලද දිවිඇති මසෙකුමෙන් අරමුණෙහි නොසන්හුන්වන්නේය යම් කෙණෙකුන්ට කායප්‍රශ්‍රබ්ධිය බලවත්වේද ඔව්හුම පින්කිරීමෙහි ලා සිත සැපතවිඳින්මය ඔවුන්ගේ සිත සිහිල්ජලයෙහි බහාළූ මසෙකුමෙන් සන්හුන් වන්නේය. මෙද අද්‍රව්‍ය ධාතුධර්‍මයකි.

(36) **චිත්ත ප්‍රශ්‍රබ්ධි චෛතසිකය**—චිත්තයාගේ විඩා සන්සිඳුවන ලක්‍ෂණ ඇත්තේය විඥාණ සකාන්ධයාගේ නොසැලෙන බව හා සිහිල්බව එලඹසිටීම් කොටඇත්තේය විඥාණසකාන්ධය ඊට ආසන්න කාරණ වන්නේය යම් කෙණෙකුන්ට චිත්ත ප්‍රශ්‍රබ්ධි චෛතසිකය දුර්‍වලවන්නීද ඔව්හු පින්කිරීමෙහි සිත සැපතක් නොලබන්නවා පමණක් නොවැ බැහැර අරමුණෙක්හි ඔවුන්ගේ සිත පැනයන්නේය තවනලද ගල්පෝරුවෙක්හි තැබූ දිවිඇති මසෙකුමෙන් අරමුණෙහි නොසන්හුන් වන්නේය යම් කෙණෙකුන්ට චිත්ත ප්‍රශ්‍රබ්ධිය බලවත්වේද ඔව්හුම පින්කිරීමෙහිලා සිත සැපත විඳින්මය ඔවුන්ගේ සිත සිහිල් ජලයෙහි බහාළූ මසෙකුමෙන් සන්හුන් වන්නේය මෙද අද්‍රව්‍ය ධාතුධර්‍මයකි.

(37=38) **කායලඝුතා චිත්තලඝුතා චෛතසිකයුග්මය**—පිළිවෙලින් වේදනාදි සකාන්ත්‍රයාගේ හා විඥාන සකාන්ධයාගේ ගරුභාවය සන්සිඳුවන ලක්‍ෂණ ඇත්තේය වේදනාදිසකාන්ත්‍රයාගේ හා විඥානසකාන්ධයාගේගරුභාවය මැඩපියන කෘත්‍යඇත්තේය ඔවුන්ගේ නොදැඩිබව එලඹසිටීම් කොට ඇත්තේය කායචිත්තවල ඔවුනට ආසන්නකාරණයැ වේදනාදිසකාන්ධයාගේ හා විඥානසකාන්ධයාගේ බරබව කරන්නාවූ ථිනමිද්ධාදී කෙලෙසධර්‍මයන්ට විපක්‍ෂයැ. යම් කෙණෙක

කුන්ට කායලහුතා චිත්තලහුතා චෛතසිකයුග්මය දුර්ලභවේද ඔවුන්ගේ සිත පින්කිරීමෙහි විවෘතනොකෙරෙයි හෙවත් රත්කලාවූ ගල තලාවෙක්හි බහාළූ පද්මයක් මෙන් හකුළුවයි යම් කෙණෙකුන්ට ඒදෙක බලවත්වේනම් ඔවුන්ගේ සිත සිහිල්ජලයෙහි බහාළූ පද්මයක්මෙන් දිගහැරෙයි.

(39=40) **කායමුදුතා චිත්තමුදුතා චෛතසිකයුග්මය**—වේදනාදිසකඛන්ත්‍රයාගේ හා විඤ්ඤාණසකඛන්ධයාගේ තදබව සන්සිඳීම් ලක්ෂණ කොට ඇත්තේය. ඔවුන්ගේම තදබව මැඩපියන කිස ඇත්තේය ගැහැටීමක් නැතිබව එලඹසිටීම් කොට පවත්නේය කායචිත්තවයට ආසන්න කාරණ වන්නේය වේදනාදිසකඛන්ත්‍රයාගේ හා විඤ්ඤාණසකඛන්ධයාගේ තදබව කරන්නාවූ දෘෂ්ටිමානක්ලේශයන්ට ප්‍රතිපක්ෂයැ යම් කෙණෙකුන්ට කායමුදුතා චිත්තමුදුතාවය දුබලවේද ඔවුන්ගේ සිත පින්කිරීමෙහිලා සතුරන් මැදට පැමිණි මහා භටයෙකුමෙන් දැඩිබවට පැමිණේ. යම් කෙණෙකුන්ට ඒ දෙක බලවත්වේනම් ඔවුන් සිත සිංහසෙන්මැදට පැමිණි භටයෙකුමෙන් මෘදුත්වයට පැමිණේ.

(41-42) **කායකම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා චෛතසිකමය**—වේදනාදිසකඛන්ත්‍රයාගේ හා විඤ්ඤාණසකඛන්ධයාගේ ඒ ඒ කටයුත්තෙහි අයොග්‍ය බව සන්සිඳුවන ලක්ෂණ ඇත්තේය, කායචිත්තයන්ගේ කම්මැහි නොවන බව මැඩ පියනකිස ඇත්තේය. කායචිත්තවයාගේ අරමුණු ගැණීම එළඹ සිටීම් කොට ඇත්තේය කායචිත්තවය මෙයට ආසන්න කාරණවන්නේය. කායචිත්තවයාගේ අනම්ණ්‍යතාවය කරන්නාවූ හෙවත් ඒ ඒ කටයුත්තෙහි නුසුදුසු බව කරන්න වූ නීවරණාදී ධම්මයන්ට ප්‍රතිපක්ෂයැ පැහැදියයුතු තෙරුවන් කෙරෙහි ප්‍රසාදය ඇතිකෙරේ. හිනවැඩ පිණිසවූ ක්‍රියාවන්හි යොදවන සුළු ආහරණ විශෙෂ සම්පාදනයෙහි නැමෙන්නාවූ විසුඛ සවණීයක්මෙන් වේදනාදිසකඛන්ත්‍රයාගේ හා විඤ්ඤාණසකඛන්ධයාගේ ක්‍රියා සිඹියෙහි අනුකූලව නැමී පවත්නේයි යම් කෙණෙකුන්ට මෙකී කායකම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතාවය දුර්ලභවේද ඔවුන්ගේ සිත් පින්කිරීමෙහිලා කැමැත්තේ පිහිටුවන්ට නොලබයි. කෙසේදයත් වාතය උඩුකුරුව දමාගසාළූ බොල් වී මෙනි, යම් කෙණෙකුන්ට ඒ දෙක බලවත්වේද ඔවුන්ගේ සිත වනාහි ප්‍රතිවාතයෙහි දමාළූ සවණීභාරයක්සේ නොවිසිර පවත්නේයි. මෙය නිඃසන්නිර්ජීව ධම්මවයක්මුත් අත්කිසි ආත්මාදියක් නොවේ.

(43-44) **කායපාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා** චෛතසික යුග්මය. වේදනාදිසකඛන්ත්‍රයාගේ හා විඤ්ඤාණසකඛන්ධයාගේ නොගිලන්

බව ලක්‍ෂණකොට ඇත්තේය. කායචිත්තඋජුන්ගේ ගිලන් බව මැඩ පියන කිසඇත්තේය කාය චිත්ත දෙදෙනාගේ නිර්දෝෂ බව ඵලඹ සිටීම් කොට ඇත්තේය. කායචිත්තවය ආසන්නකාරණ කොට ඇත්තේය. කායචිත්තවයෝගේ ගිලන් බව කරන්නාවූ අශ්‍රද්ධාදි ධර්මයන්ට ප්‍රතිපක්‍ෂයෑ යම් කෙණෙකුන්ට මේ චෛතසික යුගමය දුර්ලවේද ඔවුන්ගේ සිත පින්කිරීමෙහි කම්පාවෙයි ගැඹුරු ජලාසයෙහි හසුවූ වදුරෙකු මෙනි. යම් කෙණෙකුන්ට මේ දෙක බලවත්වේද ඔවුන්ගේ සිත පින්කිරීමෙහි නොසැලෙයි. ගැඹුරු ජලාසයෙහි හසුවූ කිඹුලෙකු මෙනි. මේ චෛතසික යුග්මයද ධාතු ධර්මයනි ආත්මාදියක් නොවේ

(45–46) **කායුජුකතා චිත්තුජුකතා චෛතසික යුගමය**– වෙදනාදිස්කන්ධත්‍රයාගේ හා විඥානස්කන්ධයාගේ ඇද නැති බව ලක්‍ෂණකොට ඇත්තේය කායචිත්ත දෙදෙනාගේ කුටිලත්වය මැඩ පියන ලක්‍ෂණ ඇත්තේය අවඤ්ඤ බව ඵලඹ සිටීම්කොට ඇත්තේය කායචිත්තවය ආසන්න කාරණකොට ඇත්තේය. කාය චිත්ත දෙදෙනාගේ කුටිලත්වය කරන්නාවූ මායාශාඨෙය්‍යාදී අකුශල ධර්මයන්ට ප්‍රතිපක්‍ෂයෑ යම්කෙණෙකුන්ට මේ චෛතසික යුග්මය දුර්ලවේද ඔවුන්ගේ සිත පින්කිරීමෙහිලා විෂමගතික වන්නේය. සුරාමදයෙන් මත්වූ පුරුෂයන්ගේ ගමන මෙන් කිසිකලෙක අලස වන්නේය. කිසිකලෙක උඩඟුවන්නේය. කිසිකලෙක පහන්වන්නේය. කිසි කලෙක උසස් වන්නේය. යම් කෙණෙකුන්ට මේ දෙක බලවත් වන්නේද ඔවුන්ගේ සිත කියනලද අන්දමට වෙනස් ආකාරයෙන් උපදින්නේය. මෙද නිඃසත්ත්ව නිර්ජීව ධාතු ධර්ම මාත්‍රයෙකි.

මෙකී කාය ප්‍රශ්‍රබ්ධාදීන් අතුරෙන් ඒ ඒ සූත්‍ර දෙශනාවන් අසා ගිලන් බැවින් නැගීසිටීම් ආදී අවස්ථාවන්හි රූපකායයාගේ ප්‍රශ්‍රබ්ධි භාවය ප්‍රකටයෑ සෘර්ධිමතුන්ගේ සෘර්ධියෙන් අහසින් ගමන්කිරීම් ආදි අවස්ථාවන්හි ලඝුභාවය ප්‍රකටයෑ සෘර්ධිමතුන් විසින් ශරීරය කුදු මහත්කොට නිර්මිතකරණු ලබන අවස්ථාවෙහි මෘදුභාවය ප්‍රකටයෑ පර්වතය ඇතුළ හෝ පොළොව ඇතුළ හෝ නොපැකිලූ ගමන් කිරීම් ආදි අවස්ථාවන්හි කර්මණ්‍ය බව ප්‍රකටයෑ නාග වෙස ගරුඬ වෙශාදිය මවා දක්වන අවස්ථාවෙහි ප්‍රගුණ බව ප්‍රකටයෑ මෙහි කී සියළු සෘර්ධිකුර්ම්මයන්හි වැඩිකල් පැවැත්වීම් අවස්ථාවන්හි සෘජු භාවය ප්‍රකටයෑ දැනයුතුයි. මේ චෛතසික එකුන් විසිදෙන (19) ශොභණ සාධරණයෝ වෙති.

(47) **සම්මාවාචා චෛතසිකය**—කථාසම්මාවාචා චේතනා සම්මාවාචා විරතිසම්මාවාචා යන ත්‍රිවිධ සම්‍යක් වචනයන් අතුරෙන්

අනඤ්ඤ ධම්ම ප්‍රතිසංයුක්තත්වා සුභාෂිතා වාචා නාම. එබදු සුභාෂිත වචනයක් උපදවන්නාවූ චේතනා තොමෝ චේතනා සම්‍යග්වාචා නම්. මෘෂාවාදාදි ශික්ෂාපදයන් සමාදන් වන්නාට හෝ ඉවාඟන්නාහට හෝ සම්ප්‍රාප්ත අවස්ථාවෙහි වාග් දුශ්චරිතයෙන් වලකින්නාට හෝ පාප විරමනාකාරයෙන් යම් පැවැත්මක්වේද ඕ තොමෝ විරතිසම්මාවාචා නම්. මේ මෙහි අභිමතයි.

(48) **සම්මා කම්මන්ත චේතසිකය**—ක්‍රියාචේතනා විරති වශයෙන් ත්‍රිවිධවූ සම්‍යක් කර්මාන්තයන් අතුරෙන් යම්කිසි නිරවද්‍යකර්මයක් කරන්නාහුගේ කායික ක්‍රියා තොමෝ ක්‍රියා සම්‍යක් කර්මාන්ත නම්. එබදු කායික ක්‍රියාවක් උපදවන්නාවූ චේතනා තොමෝ චේතනා සම්‍යක් කර්මාන්ත නම් පාණාතිපාතා වෙරමණී ආදි ශික්ෂාපද සමාදන් වන්නාහවද ඉවාඟන්නාහටද සම්ප්‍රාප්ත අවස්ථාවෙහි කායදුශ්චරිතයෙන් වලකින්නාහවද පාපවිරමණාකාරයෙන් යම් පැවැත්මක් වේද ඒ වනාහි විරති සම්‍යක් කර්මාන්ත නම්. මේ මෙහි අභිමතයි.

(49) **සම්‍යගාජීව චේතසිකය**—වීර්‍ය්‍ය විරති වශයෙන් ත්‍රිප්‍රකාරවූ සම්‍යගාජීවයන් අතුරෙන් ප්‍රකෘතියෙන් නිරවද්‍යවූ කෘෂි වාණිජ්‍යකර්මාදිය හෝ භික්ෂාචර්‍යාදිය හෝ කොටැ ජීවිකාව කරන්නා වුන්හේ උඩාන වීර්‍ය්‍යයෙහි කියාන්නාලද යම් ව්‍යායාමයක්වේද ඒ වනාහි වීර්‍යසම්‍යක්ආජීවනම්. ආජීවශුද්ධිය අපේක්ෂාකොට තමන්ගේ ආජීව ශීලයට විපත්ති කාරණවූ කාය වාග් දුශ්චරිතයන් දුරුකරන්නාහට පාපවිරමණාකාරයෙන් චිත්තයාගේ යම් පැවැත්මක්වේද ඒ වනාහි විරති සම්‍යගාජීව නම් මේ මෙහි අභිමතයි නිඃසඛනිර්ජීව අද්‍රව්‍ය ධාතු ධර්මස්වරූපවූ මේ චෛතසික තුන්දෙන විරතිත්‍රයයි දන්නාලැබෙත්.

මේ විරතිත්‍රයඅතුරෙන් එකිනෙක සම්ප්‍රාප්තවිරති සමාදාන විරති සමුච්ඡේදවිරති වශයෙන් ත්‍රිවිධවේ යම්විරතියක් ශික්ෂාපදයන් සමාදන්නොවෙහෝ සමාදන්වූශික්ෂාපදයන් අපේක්ෂානොකොට හෝ හුදෙක්හිරිඔතප්බලයෙන්ම සම්ප්‍රාප්තවස්තුවනොඉක්මවන්නාහට උපදනේවීනම් සම්ප්‍රාප්තවිරතිනම් ඕතොමෝ වනීමානඅරමුණක්ගෙණ පවත්නීය යම්විරතියක් ශික්ෂාපදයන්සමාදන්වන්නාහට හෝ ඉවාඟන්නාහට හෝ සමාදන්වූපරිද්දෙන් ඉවාඟත්පරිද්දෙන් හොඳින්ආරක්ෂාකරමිසි සම්ප්‍රාප්තවස්තුවනොඉක්මවන්නා හටඋපදනේද ඕතොමෝ සමාදාන විරතියනම් හෙදප්‍රත්‍යුත්පන්න ලම්බනික අනාගතා ලම්බනිකවේ මිථ්‍යාඡීවයෙහි වනාහි සියළු දුසිරිත් මුල්සිදීම් වශයෙන් උපදනේවිනම් සමුච්ඡේදවිරතිනම්

ඔතොමෝ නිම්‍රාණෙ ලම්බනිකවෙයි ඔවුහතුරෙන් ලෙහනිකවිරතීහු ජීවිතෙන්ද්‍රියාදි ව්‍යතික්‍රමිතවය වසතුන් අරමුණුකොටැ ප්‍රාණඝාතාදී විරමිතබබ වසතුන් දුරුකෙරෙමින් උපදනාහ ලොකොත්තර විරතීහු නිවන්අරමුණුකොට ප්‍රාණඝාතාදි විරමිතවය වසතුන් දුරු කෙරෙමින් උපදනාහ මේ ඔවුන්ගේ වෙනසහි.

(50) **කරුණා වෙතසිකය** පරදුඃඛයෙකි සාධුන්ගේ හෘදය කම්පාකරවනමෙන් ඇතිවන සවභාව ධම්මයකි දුකටපත් ජනයන් දුක හෝ අසාදුනහෝ මේ ධම්මය උපදනේහි මව්පිය ගුරුවරයන්ට ව්‍යසනප්‍රාපත දූපුතුන් හෝලබාලයන් දුන උපදනා චිත්තඛෙදය ශොකාකාරයෙන්නොවැ හිතානුකම්පාකාරයෙන් පවත්නේවීනම් ඒ කරුණාවයහි දතයුතු.

(51) **මුදිතා වෙතසිකය** මෙරමාසම්පත් දුන අසාදුන තුෂ්ටි යට පැමිණීම්වශයෙන් උපදනා ධම්මයෙකි මව්පියනට දූපුතුන්ගේ යහඉසුරු දුක හෝ අහා දුනාලපදනා චිත්තප්‍රමොදය මෙන්ද ගුරු න්ට අතවැස්සන්ගේ යස ඉසුරු දුක අහාදුන උපදනා ප්‍රහමොදය මෙන්ද පරසම්පත් රිසිවනාකාරයෙන් උපදනේය

ඉම් කරුණාමුදිතා වෙතසිකයුග්මය මෙතෙක්දෙනා කෙරෙහි පවතීවා මෙතෙක්දෙනා කෙරෙහි නොපවතීවා යන පරිච්ඡෙද ප්‍රමා ණයක් නැතිහෙයින් අප්‍රමාණ්‍යයයි දතයුතුයි. ඇතැම්විට එක්සත් වයෙකුකෙරෙහි ඇතැම්විට අනෙක සත්වයන් කෙරෙනිත් මෙයපවත් නේයි බුඩාදි මහොතතවයන්ට වනාහි අනතත කරුණා වශයෙන් අනතනදුඃඛිත සත්ත්වාලම්බනයෙහි පැතිරපවත්නා හෙයින් අප්‍ර මාණසත්ත්වාලම්බනිකයයිද කීහ.

(52) **ප්‍රඥෙන්ද්‍රිය වෙතසිකය** හෙවත්(අමොහය)නම්හයට ප්‍රති ප්‍රක්ෂාකාරයෙන් උපදනේ අමොහයයි හෙවත් ප්‍රඥවයි ඒ අමොහය වනාහි යම් යම් ධම්මයන් යම් යම් අර්ථයන් යම් චතුරාර්‍ය්‍ය සත්‍යධම් කෙනෙකුන් අදුරුකොට පවත්නාවූ මොහයක් ඇද්ද ඒ මොහය එබදු තන්හි විහත විඛවංසනය කොට සඳ දහස් හිරු දහස් නැගි සිටි ආකාරයෙන් සම්ප්‍රයුකත ධම්මයන් දීපනිමත් කොට පවත්නාවූ මහානුභාව සම්පනනවූ මහාප්‍රඥිකම්හා විස්තීරවූ අද්‍රව්‍ය ධම්ධාතුවකි ඉන්ද්‍රයාගේ වජ්‍රායුධයමෙන් නොපැකිළ පවත්නා මේධම්ය තදඛහාදි වශයෙන් කෙලෙශප්‍රහාණකෘත්‍යයෙහි අග්‍රෙසරව පවත්නේය.

මෙසෙයින් චිත්තයයි කියනලද විඤ්ඤාණස්කන්ධය සමග උපදනා අද්‍රව්‍යධම්වූ වෙදනා සඤ්ඤා සඞ්ඛාරයන සංඛිප්තයට ඇතුළත් දෙපණස්දෙන වෙතසික නම්වෙත් මෙසේ සත්ත්වතෙමේ නාම රූපයයි දෙපරිද්දෙන් භෙදවනබව දතයුත්තේය.

තදනන්තරවැ රූපධර්ම නාමධර්ම සඞ්ඛ්‍යාත ද්‍රව්‍ය අද්‍රව්‍ය ධාතු සමූහය රූපස්කන්ධ වෙදනාස්කන්ධ සංඥාස්කන්ධ සංස්කාරස්කන්ධ විඥානස්කන්ධ වශයෙන් ස්කන්ධපඤ්චකට බෙදනුලැබේ ඔවුන්අතුරෙන් යම්කිසි ද්‍රව්‍යධාතු සමූහයක් ශීතෝෂ්ණාදියෙන් වෙනස්බවට පෙර ලෙන කැඩෙන බිඳෙන ලක්ෂණ ඇත්තේද වෙනස්බවට පෙරලෙන කැඩෙන බිඳෙන ලක්ෂණඇති ඒ ද්‍රව්‍යධාතු අවයවසමූහය රූපස්කන්ධයයි කියනලදී හෙද මහාභූත රූප උපාදාය රූපවශයෙන් දෙවැදෑරුම්වේ එයින් පඨවිධාතු ආපොධාතු තෙජෝධාතු වායොධාතු සතරදෙන දිව්‍යබ්‍රහ්ම මනුෂ්‍ය තිරශ්චීන වෘක්ෂපර්වත පෘථිවී සමුද්‍ර චක්‍රවාල චන්ද්‍රසූර්‍යාදි සවෙතනික අවෙතනික වස්තු කොඨාසයන්හි මහත්ව පහළවන අර්ථයෙන් මහාභූතයයිකියති තවදයම්සේ මායාකාරයෝ රන්රුවන් නොවූ කැටකැබිලිති ආදියක් රන්රුවන් කොට දක්වන්නාහුද එමෙන් සතරමහා භූතයෝතුමූ නිල්සුදු කළු පාට නැත්තාහු නිල්සුදු කළුපාට වශයෙන් හෙණහැර දක්වති මෙසේ මායාකාරයන්ගේ මායාවන් බඳුවූ අර්ථයෙන්ද ධාතුසතරදෙන මහාභූත නම්වෙති තවද යම්සේ අමනුෂ්‍යයෝ තමන්ගේ චණ්ඩඵරුහයානකගති නොපෙණෙනසේ වෙස්වලාගෙන ප්‍රියමනාප වණ්ණ සංස්ථානාදියෙන් සත්වයන් මුලාකෙරෙද්ද එමෙන් පඨවි ආපෝ තෙජෝ වායෝ යන ධාතුසතර දෙන ස්ත්‍රීපුරුෂ ශරීරාදීන්හි පිහිටියාහු ප්‍රියමනාප වණ්ණයෙන්ද සටහනින්ද යම්ර්ම් ඉදිම්සිටීම් සිනාසිම් ආදියෙන්ද ධාතූන්සතරදෙනාගේ ඇතිසඛාව මුවාකොට අඥාජනයා මුලාකෙරෙත්නුයි අමනුෂ්‍යයන් සමානවෙයින්ද මහාභූත නම්වෙති තවද දිනක්පාසා ආහාරපාන වස්ත්‍රාභරණාදියෙන් මහත්සේ පරිහරනය කටයුතු වෙයින්ද ධාතුසතරදෙන මහාභූතනම්වෙති තවද පෘථිවීධාතුවගේ කිපීමෙන් ශරීරය දරදඬුබවටයේද ආපෝධාතුව කිපීමෙන් කුසුවීමටයේද තෙජෝධාතුව කිපීමෙන් දවන තවනබවටයේද වායොධාතුව කිපීමෙන් ඉදිම්ම් පිපිරීම් සැලීම් පිරීම් ආදිබවටයේද මෙසේ මහත් විකාරබවට පමුණුවන හෙයින් ධාතු සතරදෙන මහාභූතනම්වෙති.

මහාභූත රූප සතරදෙනාගෙන් අන්‍යවූ රූප 24 ක් උපාදාය රූපයයි ව්‍යවහාරකරණු ලැබේ. උපාදයරූප සුවිසිදෙන අතුරෙන් චක්ඛු ප්‍රසාදරූපය ශ්‍රෝත්‍රප්‍රසාදරූපය ඝ්‍රාණප්‍රසාදරූපය ජිව්හා ප්‍රසාදරූපය කායප්‍රසාදරූපය යනමේ පස්දෙන සවිඤ්ඤාණක ශරීරගත පෘථිවී ආදි ධාතු සතර පහදවා එලිකරදෙන හෙයින් ප්‍රසාදරූප නම්වෙති. එයින් චක්ඛු ප්‍රසාදය නම් ඇස්බෙණය තුළ පිහිටි මස්ලේ ආදියෙන් හැවසීගත් ඇස් ගුලිය නොවැ ඇසේ කලුරුවා මැද

පටලහත පැතිරගිබෙන රූපඅරමුණුගැටීමෙසථානවූ ඉන්ද්‍රියධර්මයකි ශ්‍රොත්‍රප්‍රසාදයනම් මස්ලේවලින් යුක්තවූ කන්සැකිලි සහිත මුළු කණමොව කන්අඩියේ පිහිටි ඉතාසිහින් තඹපාටලොම්ඇති ඇඟිලි මුදුවක සටහන්ඇති සියුම් සමෙහි පැතිරසිටි ශබ්දවිශෙෂ ගැටීමට සථානවූ ඉන්ද්‍රියධර්මයකි. ඝ්‍රාණප්‍රසාදයනම් මස්ලේවලින්යුත් නාස යසි කියනලද මස්පිඩ මොවැ නාස්සිදුර කෙළවර එළකුරයක සටහනක්බදු දෙබැවගිය මස්දළුවෙක්හි පැතිරසිටි ගඳසුවඳ අර මුණු ගැටීමට සථානවූ ඉන්ද්‍රියධර්මයකි ජිහ්වාප්‍රසාදයනම් මස්ලේ වලින්යුත් දිවයසිකියනලද මස්කැටිය මොවැ මහනෙල්පෙති අග කටබදු දිවමැද පිහිටිනන්හි පැතිරසිටි කටුකාතික්තාදි රසඅරමුණු ගැටීමට සථානවූ ඉන්ද්‍රියධර්මයකි කායප්‍රසාදයනම් මස්ලේනහර ඇට ආදියෙන් ගැවසීගත් සකලශරීරය මොවැ හිසකෙස්අග ලොම්අග නියපොතුඅග වියලි සම්ආදි සථානතැර අවශෙෂ සකල ශරීරයේ ඇතුළපිට සැමතැනම පුළුන්වල තෙලක්මෙන් පැතිරසිටින සජාති අරමුණුගැටීමට සථානවූ ඉන්ද්‍රියධර්මයකි.

ඇසට හමුවන්නාවූ සිත්ඇතිසිත්නැති සියළු වස්තූන් ආශ්‍රිත නිල් සුදු කළු රතු ඝනාදිපැහැය නා දිග කොට මහත පලල උස්මිටි සතරස් පෙතැලි වටකුරු ආදිඝැඩහුරුකම් රූපාලම්බනරූපයයි, කනටහමුවන්නාවූ චිත්තවේගයෙන් උපදවනකථාබස්කිරීම් හිසිහූ කිම් හැඬීම් දෙඩිම්ආදිශබ්දහා සෘතුබලයෙන් උපදනාහෙරිවීණා මෙඝශබ්දාදිය ශබ්දාලම්බනරූපයයි නාසයටහමුවන්නාවූ සිත්ඇති සිත්නැති සියළුවස්තූන් ඇසුරුකළාවූ යම්කිසි ගඳසුවඳ විශෂයක් ඇත්නම් ඒගන්ධාලම්බනරූපයයි දිවටහමුවන්නාවූ සියළුසිත්ඇති නැති වස්තූන්ඇසුරුකළ කටුකතික්තාදි රසවිශෙෂ රසාලම්බනරූප යයි ඇඟට වදින්නාවූ සියළු සිත්ඇතිනැති වස්තූන් පිළිබඳ පඨවී තෙජොවායොයන මහාභූතරූපත්‍රය සජාතීලම්බනරූපයයි.

කියනලද මහාභූතරූපතුණමුත් සජාතීය උපාදායරූපයෙක් නොවේ තවදසතිශරීරයෙහි භාවරූපවයෙක්ඇත සත්‍රීභාවරූපය පුරුෂභාවරූපය යනදෙකයි සත්‍රීන්ගේ ක්‍රියා ඝැඩහුරුකම් කථාබස් යාම්ඒම් සිනාසීම් අවයවසියල්ලම පුරුෂයන්ට වෙනස්වේ පුරුෂ යන්ගේ ක්‍රියාඝැඩහුරුකම කථාබස් යාම්ඒම්සිනාසීම් අවයව සියල් ලම සත්‍රීන්ට වෙනස්වේ සත්‍රීන්ගේ සියළු සත්‍රීගති වෙන්කිරීමට මූල ප්‍රකෘතිවූ ඉන්ද්‍රියශක්තිය සත්‍රීභාවරූපයයි පුරුෂයන්ගේ සියළු පුරුෂ ගතිවෙන්කිරීමට මූලප්‍රකෘතිවූ ඉන්ද්‍රියශක්තිය පුරුෂභාවරූපයයි මේ භාවරූපවයද සත්‍රීපුරුෂ ශරීරයන්හි සැමතැනම කායප්‍රසාද රූපය මෙන් පැතිර පවත්නේය.

හෘදයවස්තු රූපයනම් උපාදාය රූපයෙක්ඇත ඒවාහි හෙ එම්මල් මොට්ටුවක් බඳු ශරීරාභ්‍යන්තරයෙහි පිහිටි හැඩිවශයෙන් බෙදුනු ඇතුළු කුහරයක්ඇති මස්පිඬක් අස්සේ පවත්නා අඩපතක් හෙවත් එක්අතලොස්සක්පමණලේඛාතුව ආශ්‍රයකොට චිත්තවෙත සිකඛම්යන්ගේ ඉපදීමටසථානවූ ඉන්ද්‍රිය ධම්මවිශෙෂයක්වෙයි. ඒරූප වත් ඉන්ද්‍රියධම්ය හෘදයවස්තුරූපනම්.

කම්යෙන් හටගන්නාවුරූපධම්යයිකියනලදදව්‍යසමූහය පාල නයකරන්නාවූ ඉන්ද්‍රියශක්තිය රූපජීවිතෙන්ද්‍රියයි කියනුලැබේ මහ නෙල්නෙළුම් ආදිය පිනවන්නාවූ දණ්ඩගතජලයමෙන් කම්ජරූප යන් වැළඳගෙණ පවතින්නාවූ උපාදාය රූපවිශෙෂය ජීවිතෙන්ද්‍රිය රූපනම්. තවද කනබොනු ලබන්නාවූ ආහාර පානවනී මලමූත්‍රාදි භාවයට වෙන්කරදමා ඔජාශක්තියක් ඇතිකෙරේද නහරවැල්අනු සාරයෙන් පැතිරපවත්නා ඒරසඔජාව ශරීරයෙන් පිටවනොගොස් ශරීරයෙහිම නතුවී ක්‍රියාකෙරේ ඊටආහාරරූපයයිකියති සකල ශරීරයෙහිපවත්නා ඇස්නන්නාසාදිරූපකොටස් ඔවුනොවුන් මිශ්‍ර වෙත්වකොදී රූපකළාපයන්ගේ අතරමාසිම්බෙදබෙද, ජිදුවිවර කාරයෙන්පරිවෙජ්දකරණුලබන උපාදාරූපය ආකාශධාතුනම්.

කථාබස්කිරීම් ආදිය උපදවන චිත්තවේගයෙන් පහළවූ පෘථිවී ධාතුහුගේ කම්ජරූපයන්ගැටීමව උපකාරවූ රූපවිකාරයතෙම වාග් විඥප්තිරූපනම් අත්පාවකුටුකිරීම්, අත්පාදිහුනිරීම්, යෑම්ඊම්ආදිය උපදවන චිත්තජවායොධාතුහුගේ රූපාවයවසෙලවීමටකාරණවූ ආකාරවිශෙෂයතෙම කායවිඥප්තිරූපනම් ශරීරයාගේ දැඩිබව කරන්නාවූ ධාතුකොපයටවෙනස් ආකාරයෙන්උපදනා ධාතුවිකා රය ලහුතාරූපතානම් ඒ ශරීරයාගේ බරගති සන්සිදුවා සැහැල්ලු බව කෙරේ, ශරීරයාගේ තදබවකරන්නාවූ ධාතුකොපයට වෙනස් ආකාරයෙන් උපදනාධාතු විකාරය මුදුතාරූපනම්. තලාමෘදුබවට පැමිණවූ හරක්හම්එළහම් ආදියක්මෙන් එය ශරීරයාගේ තදබව සන්සිඳීම කෙරේ ශරීරයෙන් කරන්නාවූ කටයුතුවලට එකඟනොවනාකාර ධාතුකොපයට වෙනස්ව උපදනාධාතු විකාරය කම්ඤ්ඤතාරූපනම් එයනින්නෙන්දවාගත්ත්‍රන්මෙන් ශරීරයාගේ ක්‍රියා පැවැත්මෙහි අනුකූලබවකෙරෙහි සියළුරූපධම්යන්ගේ හැදෙන ආකාරවිශෙෂය උපචයරූපනම් සැදෙනරූපයන්ගේ පරමපරාව ප්‍රවෘත්තිපවත්වාගෙණයන ආකාරවිශෙෂය සන්තතිරූපනම් සැදුනාවූ රූපධම්යන්ගේ මුහුකුරායන ආකාරවිශෙෂය ජරතාරූපනම් සැදුනාවූ රූපධම්යන්ගේ බිඳීයනආකාරවිශෙෂය අනිත්‍යතාරූප නම් මෙසේමහාභූත සතරක්හා චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය,

රූප, ශබ්ද, ගන්ධ, රස, (ඝ්‍රාණ) ස්ත්‍රීභාවරූප, පුරුෂභාවරූප, හෘදය වස්තුරූප, ජීවිතේන්ද්‍රියරූප, ආහාරරූප, ආකාශධාතුරූප, කාය විඤ්ඤත්තිරූප, වාග්විඤ්ඤත්තිරූප, ලහුතාරූප, මුදුතාරූප, කම්මඤ්ඤතා රූප, ඌපචයරූප, සන්තතිරූප, ජරතාරූප, අනිත්‍යතාරූප, වශයෙන් උපා දාරූප (24) සුවිසිදෙනෙකුත් එකතුව රූපකැබලි (28) කට රූප සකාභියනිකායඋලැබේ දෙපනස්වෙනසිකයන්අතුරෙන් අද්‍රව්‍යවූ විඳීම්රාශිය වේදනාසකන්ධනම්. අද්‍රව්‍යවූඇඳිනීම්රාශිය සඤ්ඤාසකන්ධනම්. ඉතිරිවූ ලොභමොහාදි චෛතසික පණස්දෙන සංඛාරසකන්ධනම්. දැකීම්ඇසීම්ආදියකරන්නාවූ චිත්තයන්කරන්නාවූ එහිවිපාකවිඳින් නාවූවිඤ්ඤාණරාශිය විඤ්ඤාණසකන්ධනම්. මෙසේ මේශරීරයෙහිපවත් නාවූ ද්‍රව්‍යඅද්‍රව්‍යධාතුසියල්ල සන්ධිපහකට ඇතුළත්වන්නාබව උපමා කරුණුසහිතව සම්සන්දනවදහයුතුයි.

## රූපාරූපධම්මුන් අන් සත්වයෙක් නැත.

රූපාරූපධම්මයන්ගෙන්සෑදුම්ලත් මේආත්මභාවයට සත්වයාය, පුද්ගලයාය, ස්ත්‍රීය, පුරුෂයාය, අත්මය, යන ව්‍යවහාරය ලොක යාගේ නැඳිනීම ආකුලනොවිම්පිණිස යොදාගන්නාලදු නාම්ලැයි සත්‍යවක්බවක් පරමාර්ථවශයෙන් ලිහාබලනවිට මේආත්මභාවයෙහි සත්ව, පුද්ගල, ස්ත්‍රී, පුරුෂ, ආත්මවේදකකාරක කිසිවෙක්නැතිබවත් තීරණෙන්නේ රූපඅරූපසඞ්ඛ්‍යාත ද්‍රව්‍ය අද්‍රව්‍ය ධාතුසමූහයක්බවත් සිතිවැ දතයුතුයි. ශරීරගතවපවත්නා ඝණද්‍රව්‍යධර්මසමූහයක් ඉපිද බිඳෙනපෙරළෙන ලක්ෂණ ඇත්තේද ඒධර්මසමූහය රූපධර්මයයි කියාහැඳින අවබෝධකරගැණීමෙන්ම සත්ව, පුද්ගල, ස්ත්‍රී, පුරුෂ, ආත්මයනම්ථ්‍යාමතසියල්ලම දුරුකරගතහැක්කේය. එසේම සිතද සිතසමඟ එකටඉපිදනස්නාසුලුවූ රූපාදිඅරමුණුවල නැමිපවත්නාවූ අද්‍රව්‍යඅරූපධර්මවූ චෛතසිකයෝද නාමධර්මවෙන්හී හැඳින අවබෝධ කරගැණීමෙන්ම සත්ව, පුද්ගල, ස්ත්‍රී, පුරුෂ, ආත්මයන මිථ්‍යාමත සියල්ලම දුරුකරගතහැක්කේය. මේආත්මභාවයෙහි සත්ව, පුද්ගල, ස්ත්‍රී, පුරුෂාදිආකාරයෙන් පෙන්වතුලබන නාමරූපධර්මසමූහය සත්ව, පුද්ගල, ස්ත්‍රී, පුරුෂ, ආත්මආදිවශයෙන්ගතයුතු ගම්ක් නොවනබව ඇත්තඇතිසැටි පරීක්ෂාකිරීමට ශක්තිමත් සාධාරණ නුවණමෙහෙයාබලන සඤ්ඤාවන්තයන්වම වැටහෙනවාමිස යුක්තිය යටවෙනස්ව පක්ෂයක් භජනයකිරීමෙන් ඇත්තනැතිකොට කල්ප නානාතරහන්නාවූ මිථ්‍යාමත මිථ්‍යාදෘෂ්ටිවලින් ආකුලවගියසිත්ඇති මඳබුද්ධිකකාහවවුවත් අවබෝධනොවේමය මේ ආත්මභාවයෙහි සත්ව, පුද්ගල, ස්ත්‍රී, පුරුෂ, ආත්මාදියෙන්තොරවූ නාමරූපධර්මසමූහ යක්ම පවත්නාබැව් අවබෝධකිරීමකරවීම මෙතරම් දුෂ්කරවන්නේ කල්පඅසඞ්ඛ්‍ය ගණනින්වත් ප්‍රමාණකළ නොහැකිතරම් විර

දීඝීකාලයක්මුළුල්ලෙහි අඤ්ඤවිරහිතවැ හෙතුඵලපරම්පරාවගේ වශයෙන් සංසාරඝතඵපවත්නා මේනාමරූපධම්මසමූහය සත්වයෙක් කොට පුද්ගලයෙක්කොට සත්‍රියක්පුරුෂයෙක්කොට ආත්මයක්කොට විඳින්නෙක්කොට මවනකෙනෙක් ඇතිකොට වරදවා සිතසිතා පිළිගන්පුරුද්දම දුනවත් සත්ව, පුද්ගල, ආත්මාදිවශයෙන් ලබ්ධිනැණිවට ප්‍රධානහේතුවක්වීනිබිමය. බොහෝ දීඝීකාලයකපටන් සත්ව, පුද්ගල, සත්‍රී, පුරුෂ, ආත්මාදිආකාරයක්නොවූ නාමරූපධම්මසමූහය සත්ව, පුද්ගල, සත්‍රී, පුරුෂ, ආත්මාදිවශයෙන් භාවිතාකළාවූ මිථ්‍යාලබ්ධියගේද ආලයකළඹලවත් ලොභයාගේද මුළාවූමොහයාගේද ඝණබහලභාවය පියා විදර්ශනා ඥානයෙන් පිරිසිඳබලන්නාවූ ප්‍රඥාවරනයන්ට නාමරූපධම්මරාශියක්මුත් එසින්අන්‍යවූ කිසිවක්මේ ආත්මභාවයෙහි නොමැතිබව හසහාමූලකයක්මෙන් පෙණීයන්නේය නාමරූපධම්මය තත්ත්වාකාරයෙන් තේරුම්නොගත් කුරුකුහුඹුවන්ගේපවත් දිව්‍යබ්‍රහ්මමනුෂ්‍යාදි සියලු ලොවාසීන්විසින් සත්ව, පුද්ගල, සත්‍රී, පුරුෂ, ආත්මාදිවශයෙන්ගත් දෘෂ්ටිවල මාසිමක්නැත ඒ අනන්ත දෘෂ්ටිසියල්ලම භාග්‍යවතුන්වහන්සේගේ ලොවපහළවීමෙන් පසු ඉතා පැහැදිලිකොට දෙසැටක් මිථ්‍යාලබ්ධීන්හි ඇතුළත්වන බව ප්‍රකාශකරණලදි. දුනවලොකයේ මේනාමරූපාත්ම භාවයගැණපවත්නා සියළු මිථ්‍යාමතද මිථ්‍යාතයිද ඒවදුළ දෙසැටක් මිථ්‍යාදෘෂ්ටීන්හි ඇතුල්වීපවත්නේයැ අතීතයෙහි යම්පමණ මිථ්‍යාලබ්ධීහු ඇතිවූවාහුද වර්තමානයෙහි යම්පමණ මිථ්‍යාලබ්ධීහු ඇතිවෙත්ද අනාගතයෙහි යම්පමණ මිථ්‍යාලබ්ධීහු ඇතිවන්නාහුද ඒසියලු මිථ්‍යාලබ්ධීහුම නාමරූපධම්මසමූහය සත්වයෙක්කොට පුද්ගලයෙක්කොට සත්‍රියක්කොට ආත්මයක්කොට විඳින්නෙක්කොට මවන්නෙක් ඇතිකොට හිතාගන්ට යෑමෙන්ම පැවැත්තාහ. දුන්පවත්නාහ. මතුපවතින්නාහ. යම්යම්ධම්මීශාසනාභ්‍යන්තරවැ සාධාරණඤ්ඤණයට එකඟවූ ධම්මකථා ඇසීමෙන් සත්ව, පුද්ගල, සත්‍රී, පුරුෂ ආත්මවෙදනාකාරක කිසිඑක්නැතිබව විදුලිඑලියෙන් පෙණීයන වස්තුවක්මෙන්ද සිහිනයෙන් දකින දෙයක්මෙන්ද මදවේලාවක් වැටහීයනනමුත් තමතමන් ලබාගත් ඇස්කන් නාස්ආදි ඉන්ද්‍රිය ධම්මයන්හා රූපාදිඅරමුණු හැපීමෙන් ඇතිවන චිත්තචෛතසික ධම්මයන්ගේ දුනිමිදීම් ඇදිනීම් හැපීම් ඇලීම්මුලාවීම් ආදික්‍රියාවිශෙෂය ආත්ම ආත්මීය වශයෙන්ගෙණ විඳින්නෙක්ඇත කරන්නෙක්ඇත ආතම යක්ඇත ඝනාදිවශයෙන් මිථ්‍යාදෘෂ්ටිඇණීම පෘථග්ජනයන් විසින් දීඝීකාලයක් භාවිතාකළ ලොභමොහාදි කෙලෙශධම්මයන්ගේම ශක්තියවත්. ආත්ම ආත්මීයවශයෙන් පුරුදුකරගණගන්නාවූ දෘෂ්ටි රාග මොහඝඛ්‍යාත කෙලෙශවාසනාශක්තිය පුරුදුකරනොගෙණ නුවණ

ඉදිරියටගෙණ මේ ශරීරයෙහි නිස්සේපටන් පතුලදක්වාඇති ද්‍රව්‍යකොටස්වූ රූපධර්මත් අරූපඅදව්‍ය කොටස්වූ නාමධර්මත් එකක්පාසා විසඳාරකරණු ලබනබැවින් ඒ විසඳාරකථාවසානයෙනිවත් සත්ව, පුද්ගල, ස්ත්‍රී, පුරුෂ, වෙදකකාරකකිසිවක් මෙනිඇත්තේද නැතහොත් නාමරූප ධර්මසමූහයක් මෙහි ඇත්තේදැයි සලකාබැලීම යුතුය.

පින්වත්නි! අපහැම්දෙනාගේ ආත්මභාවයෙහි ඇතිනිසකේ කුමන හෙතුවකින් සැදුනාවූ කෙතෙක් ද්‍රව්‍යවලින් යුකතදැයි පරීක්ෂා කරණවිට පූර්භවයෙහි කළාවූ කර්මබලයෙන් පස, වතුර, හින්දර, හුලඟ, පෑස, ගඳ, රස, ආහාරඝනතිය, ජීවිතෙන්ද්‍රිය, කායප්‍රසාදය යන කායදශකනම් රූපකැබලි 10 ක්ද දැන්දැන්උපදනා චිත්තබලයෙන් පස, වතුර, හින්දර, හුලඟ, පෑස, ගඳ, රස, ආහාරඝනතියයි කියනලද චිත්තජරූපකලාපානතගීත රූපකැබලි 8 ක්ද අඛ්‍යතන රගත ශීතොෂ්ණඉණ සඛ්‍යාත සෘතුබලයෙන් පස, වතුර, හින්දර, හුලඟ, පෑස, ගඳ, රස, ආහාරඝනතියයි කියනලද සෘතුජකලාපාන්තර්ගත රූපකැබලි 8 ක්ද කනබොනුලබන ආහාරයෙන්වැනී ශරීරගතවූ ඔජාබලයෙන් පස, වතුර, හින්දර, හුලඟ, පෑස, ගඳ, රස, ආහාරඝනතියයි කියනලද ආහාරජකලාපානතගීත රූපකැබලි 8 ක්දැයි මෙසේ කම්මචිත්තඍතුආහාර, යන වතුර්විධ හෙතූන්නිසා රැදහවල් කඩනැතිව තොරනැතිව ඉඝකෝගසේ රූපකැබලි 34 ක් ලියලලියලා පෙරලිපෙරලි බිඳිබිඳියනබැවපෙණේ. ඉඝකෝණසේ ද්‍රව්‍යකොටස් සෝදිසිකලාක්මෙන් ලොම් නිය දත් සම් මස් නහර ඇට ඇටමිදුලු වකුගඩු හදවත් අක්මා දලබුව බඩදිව පපුමස් අතුනු අතුනුබඳත් හිස්මුල් පින් සෙම් සෑරව ලේ මේදඇතුළු වුරුණුතෙල් සඳමිදුළුයන තෙවිසි (23) වැදැරුම්කුණපවල ද්‍රව්‍ය වෙන්කරබලනවිට කොටසක්පාසා ඉහතකිපරිද්දෙන් රූපකැබලි 24 බැගින් ලියලලියලා පෙරලිපෙරලි බිඳිබිඳියනබවපෙණේ තවද මේශරීරයෙහි දහඩිය කෙළ සොටු කදුලු යනකුණපකොටස්සත රෙහි චිත්තබලයෙන් පස, වතුර, හින්දර, හුලඟ, පෑස, ගඳ, රස, ආහාරඝනතියයිකියනලද රූපකැබලි 8 ක්ද ඍතුබලයෙන් පස, වතුර, හින්දර, හුලඟ, පෑස, ගඳ, රස, ආහාරඝනතියයිකියනලද රූපකැබලි 8 ක්ද එකතුව රූපකැබලි 16 බැගින් ලියලලියලා පෙරලිපෙරලි බිඳිබිඳියනබැව්පෙණේ උදරිය, මළ, සෑරව, මූත්‍රයන කුණපකොටස්සතරෙහි ඍතුබලයෙන්පමණක් පස වතුර හින්දර හුලඟ පෑස ගඳ රස ආහාරඝනතියයි කියනලද රූපකැබලි 8 ක් බැගින් ලියලලියලා පෙරලිපෙරලි බිඳිබිඳියනබැව්පෙණේ. චතුර්විධ තෙජොධාතුකොටස්අතුරෙන් පාචකතෙජොධාතුවෙහිපමණක් කර්මයෙන්හටගත්තාවූ පස වතුර හින්දර හුලඟ පෑස ගඳ රස

ආහාරශක්තිය ජීවිතෙන්ද්‍රියයනරූපකැබලි 9 ක් ලිඝලලියලා පෙරලි පෙරලී බිඳිබිඳියනබැව්පෙණේ. ජීර ණතෙජෝධාතු දහනතෙජෝ ධා ණ සන්තාපන තෙජෝධාතු නොවිස්තුණෙනි කම්යෙන්භවගන්න වූ පස, වතුර, ගින්දර, හුළඟ, පැය, ගඳ, රස, ආහාරශක්තිය, ජීවිතෙන්ද්‍රියඝන රූපකැබලි 9 ක්ද චිත්තසෘතු ආහාරබලයන්ගෙන් හටගන්නාවූ පස, වතුර, ගින්දර, හුළඟ පැය, ගඳ, රස, ආහාර ශක්තියකියනලද රූපකැබලි අවඅවබැගින් සුවිස්සක්ද එකතුව රූපකැබලි තෙතිස් (33) බැගින් ලිඝලලියලා පෙරලිපෙරලී බිඳිබිඳී යනබැව් පෙණේ. තවද මේශරීරයෙහි පැවති ෂඩ්විධවායොධාතු ශකොවිස් අතුරෙන් ආශ්වාසප්‍රශ්වාස වායොධාතු කොටසෙහි චිත්ත යෙන් පමණක් උපදනා පස වතුර ගින්දර හුළඟ පැය ගඳ රස ආහාරශක්තිය ශබ්දයකියනලද රූපකැබලි 9 ක් ලිඝලලියලා පෙරලිපෙරලී බිඳිබිඳියනබැව්පෙණේ. ඉතිරිවූ උඩඬගම්වාත අධොගම්වාත කුච්ඡිසයවාත කොට්ඨාසයවාත අඞ්ගමඞ්ගානුසාරීවාත යන මේවායොධාතුකොටස්පහෙහි කම්යෙන් පස, වතුර, ගින්දර, හුළඟ, පැය, ගඳ, රස, ආහාරශක්තිය, ජීවිතෙන්ද්‍රියඝනරූපකැබලි 9 ග් හා චිත්තසෘතුආහාරහෙතුබලයෙන් පස වතුර ගින්දර හුළඟ පැය ගඳ රස ආහාරශක්තියකියනලද රූපකැබලි අවඅවබැගින් සුවිස්සක් හා එකතුව රූපකැබලි තිස්තුනබැගින් ලිඝලලියලා පෙරලිපෙරලී බිඳිබිඳී යනබැව්පෙණේ. මෙසේකම්චිත්තසෘතු ආහාර සඤ්ඤාත වතුර්ධහෙතුබලයෙන් රූපකැබලි උපදවඋපදවා කෙශලොමාදි ආකාරයෙන් නොයෙක්මොස්තරවලව දක්වනුලබන්නාවූ රූපධර්ම සමූහයාගේ යථාසභාවය හඳුනාගැණීමට අපොහොසත්වූ අඤ්ඤා ලජනතෙමේ කෙශලොමාදි පෘථිවීධාතුකොවස් 20ත් පිත්සෙම්ආදි ආපොධාතුකොවස් (12) දෙලසත් පාචකතෙජෝධාතුආදි තෙජෝ ධාතුකොවස් (4) සතරක් උඩඬගම්වාතාදි වායොධාතුකොවස් (6) සයක් සත්වපුද්ගල සත්‍රීපුරුෂ ආත්ම්ආත්ම්ය විශයෙන් ලබ්ධිගෙණ මූලාවේමය. මෙපරිද්දෙන් ශරීරයෙහි ද්‍රව්‍යවූ රූපධර්මසමූහය එකක් පාසා පෙන්කරබැළුවිට ආත්මාදිවිශයෙන් ගතයුතුනිසිවක් නැති බැව් පෙණේ.

මේ ආත්ම්භාවයෙහි පැවති චක්ඛුරාදි ඉන්ද්‍රියධර්මයන්හා රූපාදි අරම්මණ්ණැටීම් හේතුවෙන් උපදනා සිත්රාශියද ඒසිත් සමඟ එකට ඉපිදුනස්නාසුළු වෙදනාසංඥාදි ඇදපණස්චෙතසිකයෝද පූර්වකම්ශක්තී ආලම්බනශක්ති සහජාතශක්තන් අනන්තරශක්ති ආදිප්‍රත්‍යය බලයෙන්ම ඉපිදනිරුඬවෙති සඤ්ඤක්ඛණයෙහිඉපිද නාරුඬවනාසුළුවූ චිත්තාචෙතසික සඤ්ඤාතනාම ධර්මසමූහය හැර අන්කිසි අද්‍රව්‍ය ධර්මසමූහයක් මේආත්මභාවයෙහිනැත. එනාකාරයෙන් පවත්නාවූ

වෙනස්නොවන අද්‍රව්‍යධර්මයක් මේ ආත්මභාවයෙහි ඇතකියාහෝ එබන්දක් ඊශ්වර බ්‍රහ්ම දිව්‍යාදීන්ගේබලයෙන් නිර්මිතවිපවත්නේයකියා හෝකරණ්ඩුලබ්ධප්‍රකාශය හෙතුරහිතවන්නේය එසේනැත්තාවූසත්ව යෙක්නැණ නැත්තාවූ ආත්මයක් ගැණ සත්වයෙක් ඇත ආත්මයක් ඇත විඳින්නෙක් ඇත කරන්නෙක්ම වන්නෙක් ඇතැයි ලබ්ධිගැණීම හා අන්සෙවීමක්මෙන් ඉබිලොම්සෙවීමක් අත්තික්කාමල් සෙවීමක්මෙන් ලැබියනොහැක්කේමය. එහෙයින් ද්‍රව්‍යඅද්‍රව්‍ය රූපා රූපධර්ම පුඤ්ජයෙහි සත්ව පුද්ගල සත්‍රී පුරුෂ වෙදක කාරක ආත්ම ආත්මීයවශයෙන් කිසිවක් නැතිබවත් නාමරූප ධර්මඃඛ්‍යාත ශුද්ධ ධර්මසමූහයක් ඇතිබවත් උපමාකරුණු සහිතව පරීක්ෂාකරණවිට වැටහේ.

## නාමරූප ධර්මයන්ගේ ඇතිවීමට හෙතු කිමයත්

දක්ෂවූවෙදෙක් යම්කිසිකුගේ රොගපීඩාවක් පරීක්ෂාකරණවිට ඒඅසනීපය සැදීමට මුල්වූයේ වාතපිත්සෙම්වලින් කුමනහේතුවක් දැයි පරීක්ෂාකරන්නේ යම්සේද එසේම කරුණාවන්ත මනුෂ්‍යයෙක් විපියක වැදහොත් ඉතාඅඩා දරුවකුදැක ඔහුගේ මව්පියවරු කවු රුහුදැයි සෝදිසිකරන්නේ යම්සේද එමෙන්ම සත්වපුද්ගල සත්‍රී පුරුෂ ආත්මාකාරයක්නොවූ නාමරූපධර්ම සමූහය ඉබේත් නොසැදුනේනම් ඊශ්වර බ්‍රහ්මාදි කෙනෙකුන් විසින් මවනලද්දේත් නොවේනම් කුමනහෙතුවකින් සැදුනේදැයි පරීක්ෂාකටයුතුවේ මේ නාමරූපධර්මසමූහය හෙවත් ශරීරනතව පවත්නා ද්‍රව්‍ය අද්‍රව්‍ය ධාතු සමූහය අතීතානාගත වර්තමාන යන හැමකල්හි දිව්‍යමනුෂ්‍ය තිරශ්චීනාදි සියළු ගතිවල සියළුදෙනාට එකාකාරව නොලැබෙන හෙයින් එසේවීමට හෙතුවක් ඇතිවය යුතුමය. තවද නාමරූපධර්මයන් කෙරෙන් අයින්වූ දෙවියෙක්වත් ඊශ්වරයෙක්වත් බ්‍රහ්මයෙක්වත් කිසිතැනක කිසිකලෙක නොලැබිය හැකිබැවින් මැවුම්කාරයෙකු විසින් නිර්මිතකරණලද්දැයි යනකීමද හෙතුරහිතා ඉතා දුර්ලකීමක් වියයුතුය දිව්‍යබ්‍රහ්මඊශ්වරාදිවූ මැවුම්කාරයෙක් ඇතැයි කීවහොත් ඒමැවුම්කාරයාද නාමරූපධර්මයන් අතුරෙන් එක්තරා එකක් විය යුතුය එවිට ඉශ්වරාදී මැවුම්කාරයන් කෙරෙහි නාමරූපධර්මයාගේ ලැබීමවනාහෙයින් මැවුම්කාරයාය කියනනාමරූපධර්මය ඇතිවීමට හෙතුඇතිවියයුත්නේය එබැවින් සත්වයෙක්ඇත, පුද්ගලයෙක්ඇත, ආත්මයක්ඇත, විඳින්නෙක්ඇත, මවන්නෙක්ඇත යනමුඛලොක සාගේ හෙතුඃඛ්‍යාතනිස්සාරයුම් ඉගැන්වීම් අත්හැරදමා හෙතුඋදාහරණසහිතව පැහැදිලිකරනලද ද්‍රව්‍යධර්මවූ රූපධර්මසමූහයාගේද චිත්තසෛතසිකවශයෙන්හෙදවූ නාමධර්මසමූහයාගේද ඇතිවීමට ඇති හෙතුමොනවාදැයි සොයාදැනගැණීම හැමදෙනාගේම යුතුකමක්බැවි මෙහිදී මතක්කරමහ–

මේසත්ත්‍රීපුරුෂාකාරයෙන් දක්නාලබන්නා රූපකාය උපදිනවිට නෙළුම් මහනෙල් හෙලපියුම් හෙල්මැලිආදීවූ කුසුම්ජාතීන්ගේ ඇතුළත උපදනේද නොවෙයි රන්රිදීමුතුමැණික් ආදියමක් ඇතුළත උපදනේද නොවෙයි වැලිකුමක්ඇතුළතඋපදනේදයත් ආමාසය පක්වාසය දෙකටඅතරෙහි උදරපටලයටපිටපා පිටිකටුවටමුහුනලා අතුණු අතුණුබඳින් පිරිවරණලදුව අතිශයින්දුගඳකිවූ අතිශයින් පිළිකුල්වූ ඉතාඅවහිරවූ තැනෙක්හි කුණුවස් පිළිකුබොජුන් ගම් දොරගවරවල් ආදි අපවිත්‍ර ඉඩමෙක්හි උපදනා පණුවකුමෙන් උපද නේයි මව්පියන්නේ ශුක්‍රශ්‍රෝණිත මිශ්‍රවීමෙන් ඇතිවනඋපකාරය තරමටවත් සවලප උපකාරමාත්‍රයකුදු දිව්‍යබ්‍රහ්මඊශ්වරාදීන්ගෙන් නොලැබ මේසේ උපදිනුලබන්නාවූ මාංසඵලාහිතාදි ආකාරවත්වූ පෘථිවීආපොධාතු ආදි රූපධර්මසමූහයට අවිද්‍යාව හෙවත් මෝඩකම යයි කියනලද අරූපී අද්‍රව්‍යධර්මයක්ද තෘෂ්ණාව හෙවත් ලෝබකම යයිකියනලද අරූපීඅද්‍රව්‍යධර්මයක්ද උපාදානයයිකියනලදඇඹෙකොට අල්වාගැණීම්ලක්ෂණ අරූපිඅද්‍රව්‍යධර්මයක්ද සුචරිතදුශ්චරිත රැස් කිරීම් ලක්ෂණ කර්මයයි කියනලද අරූපී අද්‍රව්‍ය ධර්මයක්ද යන මේ සතරදෙන ජනකප්‍රත්‍යය නම්වෙති. ආහාරයතොම් උඩඋතුරු රූප යට රැකුල්දෙන හෙයින් උපස්තම්භක ප්‍රත්‍යය වන්නේය. මේසේ අවිද්‍යා තෘෂ්ණා උපාදාන කර්ම යන නාමධර්ම සතරදෙනෙක් හා ආහාර යන රූපධර්මයෙක්ද එකතුව පස්දෙනෙක් රූපධර්ම ඉපදවීමට ප්‍රත්‍යය වන බව දතයුතුය. මෙහි හෙතුධර්ම පස්දෙනා අතුරෙන් අවිද්‍යා තෘෂ්ණා උපාදාන යන අරූපි ධර්ම තුනදෙන දරුවාට මවගෙන් ඇති උපකාරය මෙන් මේ රූපකාය ඉපදවීමට උපකාර වෙති. කර්මය පුත්‍ර යාගේ උත්පත්තියට පියාගෙන් ඇත්තාවූ උපකාරය මෙන් මේ රූපකාය ඉපදවීමට ජනක ප්‍රත්‍යයවශයෙන් මහඟුපකාරවේ. ආහාරය තෙම දරුවාගේ පරිහරණයට කිරි ඒවගෙන් ඇති උපකාරය මෙන් මේ රූපකාය තාඩත්තුකිරීමට උපකාර ඇත්තේ වේ. මෙසේ සියළු සත්වයන්ගේ ද්‍රව්‍යකොට්ඨාස සඞ්ඛ්‍යාත රූපධර්ම රාශිය හටගැණීමට ප්‍රත්‍යය ධර්ම එක්ක්‍රමයකින් පස් දෙනෙකු ඇති බව කල්පනාවට ගෙණ අද්‍රව්‍යවූ චිත්තචෛතසික යන්ගේ ඉපදීමවද නොයෙක් හෙතු ඇතිබව විමසියයුතුවේයි. අප සුගත තථාගතයන්වහන්සේ විසින් පඨානප්‍රකරණයෙහිදී "රූපායතනං චක්ඛු විඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයෝ—සද්දායතනං—පෙ—ගන්ධායතනං—පෙ—රසායතනං—පෙ—පොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයෝ—රූපායතනං සද්දායතනං ගන්ධායතනං

රසායතනං පොට්ඨබ්බායතනං මනොධාතුයා තං සම්පයුත්තකා නඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං පොට්ඨබ්බායතනං ධම්මා යතනං මනොවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො"යි වදාරණලද හෙයින් ඇසට හැපෙන රූපය චක්ඛුර්විඤ්ඤාණ නම්වූ දකින සිත හා ඒ සිත සමග ඇතිවෙන ඵස්සවෙදනාදි චෛතසිකයන්ගේ ඉපදීමට ආරම්මණ ප්‍රත්‍යය වන බවත් එසේම කණට වදින ශබ්දය සොතවිඤ්ඤාණ නම්වූ අසන සිත හා ඵස්සවෙදනාදි චෛතසිකයන්ගේ ඉපදීමට ආරම්මණ ප්‍රත්‍යය වන බවත් නාසයට වදින ගඳසුවඳ ඝ්‍රාණවිඤ්ඤාණ නම්වූ ගඳසුවඳ දැනගන්නා සිත හා ඵස්සවෙදනාදි චෛතසික යන්ගේ ඉපදීමට ආරම්මණ ප්‍රත්‍යය වන බවත් දිවට වදින රසය ජිව්හා විඤ්ඤාණ නම්වූ රස දැනගන්නා සිත හා ඵස්සවෙදනාදි චෛතසිකයන්ගේ ඉපදීමට ආරම්මණ ප්‍රත්‍යය වන බවත් කයට වදින පඨවී තෙජෝ වායෝ යන ඵොට්ඨබ්බ කායවිඤ්ඤාණ නම්වූ ඵොට්ඨබ්බ දැනගන්නා සිත හා ඵස්සවෙදනාදි චෛතසිකයන්ගේ ඉප දීමට ආරම්මණ ප්‍රත්‍යයවන බවත් රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ යන අරමුණු පස පඤ්චවොකාරවජ්ජන සම්පටිච්ඡන නම්වූ සිත් හා ඵස්සවෙදනාදි චෛතසිකයන්ගේ ඉපදීමට ආරම්මණ ප්‍රත්‍යය වන බවත්, රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම යන අරමුණු සදෙන සියළු කුසල් සිත් අකුසල් සිත් ක්‍රියා සිත් විපාක සිත් හා ඒ ඒ සිත් සමග යෙදෙන ඵස්සවෙදනා දි චෛතසික ධම්මයන්ගේ සුදුසු සුදුසු පරිද්දෙන් ඉපදීමට ආරම්මණ ප්‍රත්‍යය වන බවත් දන ගතුයි. විඤ්ඤාණචෛතසිකයන්ගේ ඉබේ සෑදීමකුත් නැත්තාම් දිව්‍ය බ්‍රහ්මාදි කිසිවකු විසින් මවා නිර්දකුත් නොවේනාම් කුමන හේතුවකින් චිත්ත චෛතසික ධම්ම රාශිය සෑදේදැයි ගෞතමයන් ප්‍රශ්න කළොත් රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම, යන අරමුණු සදෙ නාගේ මුනගැසීමම සිත හා චෛතසිකයන් ඇතිවීමට එක්තරා හෙතුවක් බව පෙන්වා උත්තරදීම යුතුයි. රූපාදි අරමුණු සදෙ නම අරූප ධම්මයන්ගේ ඇතිවීමට එක් ක්‍රමයක නතීරණ මෙන් ගණන්ගතයුතුවා වූ දිව්‍යබ්‍රහ්මාදි කතීෘවරයෙකුගේ සෑදීමක් යයි සිතීමට හෙතුනැත්තේ ය. යම්සේ වර්තමාන කාලයෙහි ඇතිව පවත්නා නාමරූප ධම්මයෝ ඉබේක්නොසෑදී මවන්නෙකුගේ බල යෙනුත් නොසෑදී තියනලද ප්‍රත්‍යයධම්මයන්ගේ බලයෙන්ම පවත් නාහුද එසේන් අනිතකාලයෙහි ඇතිවී පැවති නාමරූප ධම්මයෝද අනාගත කාලයෙහි ඇතිවන්නාවූ නාමරූප ධම්මයෝද ඉබේ වත් දිව්‍ය බ්‍රහ්ම ඊශ්වරාදීන්ගේ බලයෙන්වත් නොපැවැත කිසිත

ලද හෙතුප්‍රත්‍යයන්ගේ බලයෙන්ම පැවැත්තාහුය පවතින්නාහු යයි යමෙක් නුවණින් කල්පනාකරන්නේවීනම් ඕනට පූර්භව යන්හි ඇතිවූ නාමරූප ධර්ම සඞ්ඛ්‍යාත සකඤ්ඤ කොඨාසයන් ගැණ ඇතිවියහැක් "අහොසිං නුඛෝ අහං අතීතමඞ්ධානං" යී සත්ව පුද්ගල සත්‍රී පුරුෂාකාරවූ මම අතීතකාලයෙහිත්වූයෙම් නොවේදැයි ශාශ්වතදෘෂ්ටි වශයෙන් සැකකිරීමද "න නුඛෝ අහොසිං අහං අතීත මඞ්ධානං" යි සත්ව පුද්ගල සත්‍රී පුරුෂාකාරවූ මම අතීත කාලයෙහි නූපත්තෙම් වේදැයි නිෂ්කාරණොත්පත්ති වශයෙන් සැක කිරීමද "කිංනුඛෝ අහොසිං අහං අතීත මඞ්ධානං" මම අතීත කාලයෙහි ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ශූද්‍රයන් අතුරෙන් කවරෙක්වූයෙම්ද දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදීන් අතුරෙන් කවරෙක්වූයෙම්දැයි අතීත සඤ්ඤ කොඨාසයන් ගැණ සැක කිරීමද "කථංනුඛෝ අහොසිං අහං අතීත මඞ්ධානං" යී සත්ව පුද්ගල සත්‍රී පුරුෂාකාරවූ මම අතීත කාලයෙහි උස්මිටිකොට මහත කළු සුදු රතු එලළු සවහන්වණී ඇත්තවුන් අතුරෙන් කෙබඳු හැඩහුරු කම් ඇත්තෙක් කෙබඳු පාට ඇත්තෙක්වූයෙම්දැයි නොහොත් දිව්‍ය බ්‍රහ්මාදී මැවුන්නාරයන් නිසා කෙබඳු ආකාර ඇත්තෙක්වූ යෙම්දැයි අතීත සඤ්ඤ කොඨාසයන්ගැණ සැක කිරීමද "කිං නුඛෝ කිං" අහොසිංනුඛෝ අහං අතීත මඞ්ධානං" යි මම අතීත කාලයෙහි ක්ෂත්‍රිය ජාතියෙන් බ්‍රාහ්මණ ජාතියම බ්‍රාහ්මණ ජාතියෙන් වෛශ්‍ය ජාතියට වෛශ්‍ය ජාතියෙන් ශූද්‍ර ජාතියට හෝ බ්‍රහ්ම ආත්මයෙන් දිව්‍ය ආත්මයම දිව්‍ය ආත්මයෙන් මිනිස් ආත්මයට භවයෙන්භවය උත්පත්තිවිඤ්ඤාණයෙන් ආයෙම්ඒහෝයි අතීත සඤ්ඤ කොඨාස යන් ගැණ සැකකිරීමද යන මෙසේ අතීත සඤ්ඤයන් අරබයා සැක පසක් දුරුව යන්නේය. එසේම අනාගතසඤ්ඤයන් අරබයාද "භවිස්සාමි නුඛෝ අහං අනාගත මඞ්ධානං" යි සත්ව පුද්ගල සත්‍රී පුරුෂාකාරවූ මම අනාගත කාලයෙහි වන්නෙම් නොවේදැයි ශාශ්වතාකාරයෙන් සැකකිරීමද "න නුඛෝ භවිස්සාමි අහං අනා ගත මඞ්ධානං" යි සත්ව පුද්ගල සත්‍රී පුරුෂාකාරවූ මම අනාගත කාල යෙහි නොවන්නෙම් වේදැයි නිෂ්කාරණොත්පත්ති වශයෙන් සැක කිරීමද "කිංනුඛෝ භවිස්සාමි අහං අනාගත මඞ්ධානං" යි මම අනා ගත කාලයෙහි ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ශූද්‍රයන් අතුරෙන් කව රෙක් වන්නෙම්ද දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදීන් අතුරෙන් කවරෙක් වන් නෙම්ද්‍යෙහෝයි අනාගත සඤ්ඤ කොඨාසයන් ගැණ සැක කිරීමද "කථංනුඛෝ භවිස්සාමි අහං අනාගත මඞ්ධානං" යි සත්ව පුද්ගල සත්‍රී පුරුෂාකාරවූ මම අනාගත කාලයෙහි උස් මිටිකොට මහත සුදු කළු රතු එලළු සවහන්වණී ඇත්තවුන් අතුරෙන් කෙබඳු හැඩ

හුරුකම් ඇත්තෙක් කෙබඳු පාවැත්තෙක් වන්නෙම්ද නොහොත් දිව්‍යබ්‍රහ්ම ඊශ්වරාදි මැවුන්කාරයන් නිසා කෙබඳු ආකාර ඇත්තෙක් වන්නෙම්දෝහෝයි අනාගත සකඤ්ඤකොඨාසයන් ගැණ සැක නිරීමද "කිං නුත්වා කිං හවිස්සාමි නුඛෝ අහං අනාගත මද්ධානං"යි මම අනාගත කාලයෙහි ක්ෂත්‍රිය ජාතියෙන් බ්‍රාහ්මණ ජාතියට බ්‍රාහ්මණ ජාතියෙන් වෛශ්‍ය ජාතියට වෛශ්‍ය ජාතියෙන් ශූද්‍ර ජාතියට හෝ බ්‍රහ්ම ආත්මයෙන් දිව්‍ය ආත්මයට දිව්‍ය ආත්මයෙන් මනුෂ්‍ය ආත්මයට භවයෙන් භවය උත්පත්තිවීම් වශයෙන් හුවමාරු වන්නෙම් දෝහෝයි අනාගත සකඤ්ඤ කොඨාසයන් ගැණ සැක නිරීමදැයි අනාගත සඤ්ඤයන් අරබයා පැවති සැක පසක් දුරුවී යන්නේය. වර්‍තමාන ආත්මභාවයට ඇතුළත් සඤ්ඤයන් අරබයා "අහංනුඛෝස්මි" යන්නෙන් මම සත්වයෙක් වෙම්ද පුද්ගලයෙක් වෙම්ද ස්ත්‍රියක් පුරුෂයෙක් වෙම්ද ආත්මයෙක් වෙම්ද විදින්නෙක් වෙම්ද යනාදි වශයෙන් වර්‍තමාන සඤ්ඤයන් ගැණ ආත්ම ආත්මීය වශයෙන් සැක නිරීමද "නොනුඛෝස්මි" යන්නෙන් සර්ව පුද්ගල ස්ත්‍රී පුරුෂාකාරවූ මම නිකරුණේ උපන්නෙම් වේදැයි තමන්ගේ අවිද්‍යමාන බව කැමැත්තේ වර්‍තමාන සඤ්ඤයන් ගැණ සැකනිරීමද "කින්නුඛෝස්මි" යන්නෙන් මම ක්ෂත්‍රියයෙක් බ්‍රාහ්මණයෙක් වෛශ්‍යයෙක් ශූද්‍රයෙක්ම වෙමැයි වර්‍තමාන සඤ්ඤයන් ගැණ සැක කිරීමද 'කථන්නුඛෝස්මි' යන්නෙන් මම දිව්‍ය බ්‍රහ්ම ඊශ්වරාදි මැවුන්කාරයන් නිසා කෙබඳු හැඩහුරුකම්ඇති කෙබඳු පාවඇති කෙබඳුආකාර ඇත්තෙකු වෙම්දැයි කියා හෝ නොහොත් ශරීරාභ්‍යන්තරයෙහි ආත්මයක් ඇතැයිද ඒ ආත්මය වනාහි දිගය කොටය මහතය වටකුරුය පෙතැලිය සුදුය රතුය කළුය කියා හෝ සපශීකඳ නොහැකිය දැක්ක නොහැක්ය කියා හෝ ඉතා සියුම් බැවින් විඤ්ඤාණමිශ්‍රය නොවේය කියා හෝ ආහාර මාත්‍රයක් සැලකීම් වශයෙන් වර්‍තමාන සඤ්ඤයන් ගැණ සැකනිරීමද "අයං නුඛෝ සත්තෝ කුත්තෝ ආගතෝ" යන්නෙන් සත්ත්‍ව පුරුෂ සර්ව පුද්ගලවූ මේ ආත්මභාවයතෙම කොයිබින් මෙහි ආයේ වේදැයි වර්‍තමාන සඤ්ඤයන් ගැණ සැකකිරීමද "සෝ කුහිංගාමී භවිස්සති" යන්නෙන් සර්ව පුද්ගල ස්ත්‍රී පුරුෂාකාරවූ මේ ආත්මභාවය තෙම මේ භවයෙන් ගොස් කොයිබ උපදින්නේවේදැයි වර්‍තමාන සඤ්ඤයන් ගැණ සැකකිරීමද යන නාමරූප ධර්මයන්ගේ හෙතුප්‍රත්‍යයන් සලකන්නා හට වර්‍තමාන සැක සයක් දුරුවයන්නේය.

මෙසේ දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදීන්ට තමතමන් ලත් ආත්මභාව සඞ්ඛ්‍යාත අතීත සඤ්ඤ කොඨාසයන් අරබයා සැක පසක් ඇතිවීමට අනාගත සඤ්ඤ කොඨාසයන් අරබයා සැක පසක් ඇති

වීමට වර්තමාන සකාසු කොඨාසයන් අරබයා සැක සහක් ඇතිවීමට කරුණු කුමක්දැයි පරීක්ෂාකරණවිට සත්ව පුද්ගල සත්ත්ව පුරුෂ කාර නොවූ නාමරූපධර්ම සමූහය සත්ව පුද්ගල ආත්ම ආත්මීය වශයෙන් සලකා මැවුන්කාරයෙක් ඇත යනාදි ලබ්ධිගැණීම් සඩ්ඛ්‍යාත කරුණු බැව් දැටහේ. අතීතානාගත වර්තමාන සකාසු කොඨාසයන් පිළිබඳව ඇතිවියහැකි සොළොස්විධවූ සියළු සැක දුරුකරගැණීමටනම් ධර්මයට එකඟව සාධාරණ නුවණ මෙහෙයා නාමරූප ධර්මයන්ගේ ඇතිවීමට හෙතු මොනවාදැයි සෝදිසිකළ යුතුයි. එසේ සෝදිසිකරණවිට එක් ක්‍රමයකින් රූපධර්ම සඩ්ඛ්‍යාත ද්‍රව්‍ය කොටස් පහළවීමට අවිද්‍යාව, තෘෂ්ණාව, උපාදානය, කර්ම, ආහාරය යන හෙතුධර්ම පසක් ඇති බවත් නාමධර්ම සඩ්ඛ්‍යාත අද්‍රව්‍ය කොටස් පහළවීමට චක්ෂුරාදි චාර හා රූපාදි අරමුණු ගැටීමම හෙතුවන බවත් උපමා කරුණු සහිතව පැහැදිලිකොට දැන නාමරූපධර්ම ඉබේ නොසැදෙන බවත් මැවුන්කාරයෙක් නොමවන බවත් අවිද්‍යා තෘෂ්ණා උපාදාන කර්ම ආහාර යන හෙතු ප්‍රත්‍යය ධර්ම බලයෙන් වර්තමානයෙහි පවත්නා බවත් හෙතුප්‍රත්‍යය බලයෙන්ම අතීත යෙහි පැවති බවත් අනාගතයෙහි පවතින්නාවූ බවත් නුවණින් විමසියයුතුයි.

නාම ධර්ම සඩ්ඛ්‍යාත චිත්තචෛතසිකයන්ගේ පහළවීමට සාධාරණ හෙතු අසාධාරණ හෙතු වශයෙන්ද හෙතු දෙකක් ඇත්තේය. ඇසින් රමණීයි රූපයක් දැක මේ රූපය අශුභය අනිත්‍යය දුඃඛය අනාත්මයයි අදහස් කළවිට කුසල් සිත් හා මේ රූපය ශුභය නිත්‍යය සුඛය ආත්මයයි අදහස්කළවිට අකුසල් සිත්ද උපදනා හෙයින් "ඇසින් රූපයන්" කුශලාකුශලාදි වශයෙන් ප්‍රභෙදවූ නාමධර්මයන්ගේ උත්පත්තියට සාධාරණ හෙතුනු වෙති. කණින් රමණීයි ශබ්දයක් අසා මේ ශබ්දය අශුභය අනිත්‍යය දුඃඛය අනාත්මයයි අදහස්කළවිට කුසල් සිත් හා මේ ශබ්දය ශුභය නිත්‍යය සුඛය ආත්මයයි අදහස්කළවිට අකුසල් සිත්ද උපදනා හෙයින් "කණින් ශබ්දයන්" කුශලාකුශලාදී වශයෙන් ප්‍රභෙදවූ නාම ධර්මයන්ගේ උත්පත්තියට සාධාරණ හෙතුනු වෙති. නාසයෙන් ගඳ සුවඳක් ආඝ්‍රාණය කොටැ මේ ගඳ සුවඳ අශුභය අනිත්‍යය දුඃඛය අනාත්මයයි අදහස්කළවිට කුසල් සිත් හා මේ ගඳ සුවඳ ශුභය නිත්‍යය සුඛය ආත්මයයි අදහස්කළවිට අකුසල් සිත්ද උපදනා හෙයින් "නාසයෙන් ගඳ සුවඳින්" කුශලා කුශලාදි වශයෙන් ප්‍රභෙදවූ නාම ධර්මයන්ගේ උත්පත්තියට සාධාරණ හෙතුනු වෙති. දිවෙන් රමණීයි රසයක් ආස්වාදනයකොට මේ රසය අශුභය අනිත්‍යය දුඃඛය අනාත්මයයි අදහස්කළවිට කුසල් සිත් හා මේ රසය ශුභය

නිත්‍යය සුඛය ආත්මයයි අදහස්කළවිට අකුසල් සිත්ද උපදනා හෙයින් "දිවත් රසයත්" කුශලා කුශල වශයෙන් ප්‍රභෙදවූ නාම ධර්මයන්ගේ උත්පත්තියට සාධාරණ හෙතුහු වෙති. කයින් යම්කිසි සපශීයක පහසලැබ මේ සපශීය අශුභය අනිත්‍යය දුඃඛය අනාත්මයයි අදහස්කළවිට කුසල්සිත් හා මේ සපශීය ශුභය නිත්‍යය සුඛය ආත්මයයි අදහස්කළවිට අකුසල් සිත්ද උපදනා හෙයින් "කයත් සපශීයත්" කුශලාකුශලාදි වශයෙන් ප්‍රභෙදවූ නාම ධර්මයන්ගේ උත්පත්තියට සාධාරණ හෙතුහුවෙති. මනොවාරයෙන් යම්කිසි අරමුණක් ගෙණ මේ අරමුණ අශුභය අනිත්‍යය දුඃඛය අනාත්මයයි අදහස්කළවිට කුසල්සිත් හා මේ අරමුණ ශුභය නිත්‍යය සුඛය ආත්මයයි අදහස්කළවිට අකුසල් සිත්ද උපදනා හෙයින් මනොවාරයත් ඊට ගොවරවූ අරමුණුත් කුශලාකුශලාදි වශයෙන් ප්‍රභෙදවූ නාම ධර්මයන්ගේ උත්පත්තියට සාධාරණ හෙතුහුවෙති.

නාම ධර්මයන්ගේ පහළවීමට ඇති අසාධාරණ හෙතු කවර හුදයත්? නුවණින් මෙනෙහිකිරීමක් හෝ සඬර්ම ශ්‍රවණයක් හෝ කල්‍යාණ මිත්‍ර සෙවනයක් හෝ ප්‍රතිරූප දෙශයන්හි විසීමක් හෝ ඇති කල්හිම අකුශලචිත්ත චෛතසික ධර්මයන් නොඉපිද කුශල චිත්ත චෛතසික ධර්මයන්ගේ උත්පත්තිය වන හෙයින් නුවණින් මෙනෙහිකිරීම සඬර්මශ්‍රවණය කල්‍යාණමිත්‍රසෙවනය ප්‍රතිරූපදෙශ වාසය කුශලචිත්ත චෛතසික ධර්මයන්ගේ පහළවීමට අසාධාරණ හෙතුහු වෙති. අනුවණින් මෙනෙහිකිරීමක් හෝ මිත්‍යාධර්ම කථා ශ්‍රවණයක් හෝ පාපමිත්‍ර සෙවනයක් හෝ ප්‍රතිරූප දෙශයන්හි නොවිසීමක් හෝ ඇතිකල්හිම කුශලචිත්ත චෛතසිකයන් නොඉපිද අකුශලචිත්ත චෛතසික ධර්මයන්ගේ උත්පත්තිය වනහෙයින් අනුවණින් මෙනෙහිකිරීම මිත්‍යාධර්ම කථා ශ්‍රවණය පාපමිත්‍ර සෙවනය නුසුදුසු ප්‍රදෙශ වාසය අකුශල චිත්ත චෛතසික ධර්මයන්ගේ පහළවීමට අසාධාරණ හෙතුහු වෙති. කර්මයද අභිඥාවද උපාදාන යද තෘෂ්ණාවද දිව්‍යමනුෂ්‍යාදි ගතිද කාලයද යන මේ ආදිය ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති වශයන් පවත්නා විපාක ධර්මසඞ්ඛ්‍යාත නාමධර්මයන්ගේ උත්පත්තියට අසාධාරණ හෙතුහු වෙති. භවාඞ්ග සිත්හු පඤ්චද්වාරවජ්ජන මනොද්වාරවජ්ජන ක්‍රියා චිත්තයන්ගේ උත්පත්තියටද සන්තීරණ සිත ව්‍යවස්ථාපන චිත්තයාගේ උත්පත්තියටද කාමවචර ක්‍රියාසිත් කාමරූපාරූප ක්‍රියා චිත්තයන්ගේ උත්පත්තියටද රහත් ඵල සිත ආවර්ජනා රහිත සියළු ක්‍රියා සිත් උපදවාගැණීමටද අසාධාරණ හෙතුහු වෙති. මෙසේ නාම ධර්මයන්ගේ උත්පත්තියට ඇති සාධාරණ අසාධාරණ හෙතු මෙන් ශරීරගත ද්‍රව්‍ය අවයවවූ රූපධර්මයන්ගේ උත්පත්තියට කර්මය චිත්තය ඍතුව ආහාර යන ප්‍රත්‍යය

සතරදෙනෙක් උපකාරවෙති. ඒ හෙතු සතරදෙනා අතුරෙන් කර්මය අතීත භවයෙහිදී රැස්කරනලද්දේම හෙවත් ඉහත භවයෙහි කළාවූ කුසල් අකුසල් දෙනා මේ භවයෙහි ප්‍රතිසන්ධියෙහි පටන් ඇතිවන කර්මජරූපයන් කෙස් ලොම් නිය දත් ආදි ආකාරයෙන් උපදවාලීමට ප්‍රත්‍යය වෙති. වර්තමාන කර්මය වර්තමාන රූපයන් නුපදවන බව මේ කීමෙන් සිහිකෙරේ. ඉදින් වර්තමාන කර්මයෙන් වර්තමාන රූපධර්මයන් උපදවන්නේවීනම් කායික කුශලාකුශල කර්මයක් හෝ වාචසික කුශලාකුශල කර්මයක් හෝ මානසික කුශලාකුශල කර්මයක් හෝ රැස්කළ මොහොතෙහිම විපාකයද ලැබියයුතුවන්නේය. එසේ ලැබෙක් නොවන හෙයින් අතීතකර්මයම රූපාරූප විපාක උපදවන බව ප්‍රත්‍යක්ෂවශයෙන්ද ආගමශ්‍රුතානුමිති වශයෙන්ද දතයුත්තේය. ප්‍රත්‍යක්ෂ වශයෙන් දතහැකිය කීවේ ලොකයෙහි කෘෂි වාණිජ කර්මාන්ත කරන්නාවූ මිනිසුන්ට ඒ ඒ කර්මාන්තකරණලබන මොහොතෙහිම එහි ඵලවිපාකයෝ නොදෙන්නාහ. කළාහින් පසුවම අස්වැන්න වශයෙන් හෝ ලාභවශයෙන් හෝ ඵලවිපාක දෙන්නාහුය. එමෙන් අතීතකර්මයම මේ ආත්මභාවය පිළිසිඳගත්තැන් පටන් රූපකැබලි උපදවමින් විපාකදෙන බව නියත හෙයින් අතීතකර්මය රූපධර්මයන්ගේ උත්පත්තියට ප්‍රත්‍යයවූ උපකාර ධර්මයක් බව දතයුත්තේය. ''කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කටත්තා උපචිතත්තා විපාකං චක්ඛුවිඤ්ඤාණං උප්පජ්ජනං හොති'' යනාදි ආගමශ්‍රුතානුමිති වශයෙන්ද පූර්වයෙහි කාමාවචර කුශලය රැස්කළ බැවින් වර්තමාන භවයෙහි කුශල විපාක චක්ෂුර්විඤ්ඤානය උපන්නේ වේයයි වදාළ පරිදි අතීත කර්මයම දැන්පවත්නා රූපාරූප ධර්මයන්ගේ උත්පත්තියට හෙතුවනබව දතයුත්තේය. මෙසේ අතීත කර්මය දැන් පවත්නා රූපයන්ගේ උත්පත්තියට හෙතුවන්නාක්මෙන් මේ භවයෙහි ප්‍රතිසන්ධිචිත්තයාගේ උත්පාදක්ෂණයෙහි පටන් ඇතිවන සිත්නු හෙස් ලොම් නිය දත් ආදි ආකාර දක්වන චිත්තජ රූපයන්ගේ උත්පත්තියට හෙතුහු වෙති. උත්පාදක්ෂණය සන්තික්ෂණය භඞ්ගක්ෂණයයි චිත්තයාගේ ක්ෂණ තුණකි. ඔවුන් අතුරෙන් සන්තික්ෂණ භඞ්ගක්ෂණ දෙකෙහි චිත්තයාගේ දුර්ලභභාවය නිසා රූපනුපදවනු ලැබෙන්. උත්පාදක්ෂණයෙහි බලවත් හෙයින් රූපඵලපදවන්ට පොහොසත් වෙයි. යථාගිය ජාතියෙහි අන්තිම සිතතම් ඒ ආත්මභාවයෙහිවූ ව්‍යුති සිතයි. මේ අන්මභාවයෙහි පටන්ගත් සිතතම් ප්‍රතිසන්ධි සිතයි. යථාගිය භවයාගේ අන්තිමවූ චුතිචිත්තයෙන් අනන්තරප්‍රත්‍යය සමනන්තර ප්‍රත්‍යය ප්‍රුරෙජාතප්‍රත්‍යය යනාදි වශයෙන් ලබනලද උපකාරඇතිව මේ භවයෙහි ප්‍රතිසන්ධි චිත්තයාගේ හටගැන්මවේ. කියනලද ප්‍රත්‍යයන්ගේ ලැබීමෙන් ප්‍රතිසන්ධි චිත්තයා

ගේ උත්පත්ති ක්ෂණයම බලවත්වූ හෙතුවෙන් ප්‍රතිසන්ධිචිත්තයාගේ උපන් ඇසිල්ලේ පවත් චිත්තක්ෂණයක් පාසා කෙස ලොමාදි ආකාර දක්වන ආපො තෙජො වායො පඨවි වණ්ණ ගන්ධ රස ඔජා යන චිත්තජ රූපයන් උපදවන හෙයින් චිත්තයද රූපධර්මයන්ගේ උත්පත්තියටහෙතුවේ, සප්තශරීරාබ්භ්‍යන්තරගත ශීතොෂ්ණ සෘතුව මේ භවයපවත් ගත්ප්‍රතිසන්ධි චිත්තයාගේ සන්තතික්ෂණයෙහි පවත් ක්ෂණයක් පාසාකෙශ ලොමාදි ආකාරදක්වන රූපධර්මයන්ගේ උත් පත්තියට හෙතුවේ, එසේම ශරීරයෙහි නහරවැල් අනුසාරයෙන් පැනිරීගිය ආහාරඔජා ශක්තිය මේ භවය පවත්ගත් ප්‍රතිසන්ධි චිත්ත යාගේ සන්තති ක්ෂණයෙහි පවත් ක්ෂණයක් පාසා කෙශ ලොමාදි ආ කාරදක්වන රූපධර්මයන්ගේ උත්පත්තියට හෙතුවේ. ඔම්සේ කිය නලද සාධාරණ අසාධාරණ හෙතූන්ගේ බලයෙන්ම චිත්තවෙත සික නාමධර්මත් කර්ම චිත්ත සෘතු ආහාර ප්‍රත්‍යය බලයෙන්ම රූප ධර්මත් මේ වර්තමාන අත්මභාවයෙහි පවත්නාහුද එමෙන් මීට ඉහත ආත්මභාවයන්හිද අනාගත කාලයෙහි ලබන්නාවූ ආත්මභාවයන් හිද සාධාරණ අසාධාරණ කර්ම චිත්ත සෘතු ආහාර සඞ්ඛ්‍යාත හෙ තූන්ගේ බලයෙන්ම නාමරූපධර්මයෝ පැවැත්තාහ පවතින්නාහයි කුවණමෙනෙයා බලන්නේවීනම් නාම රූපධර්මයන් ඉබ්බ් නොසෑදූ නබවින් දිව්‍ය බ්‍රහ්මාදි කිසිවකු විසින් නොමවනලද බවත් කියන ලද හෙතු ප්‍රත්‍යයන්ගේ බලයෙන්ම සෑදී යන බවත් හසහාමලක යක්සේ වැටහෙන්නේය.

තවද පටිලෝම පටිච්චසමුප්පාද ක්‍රමයෙන් නාමරූප ධර්ම යන්ගේ පහළවීමට ඇති හෙතු විමසියයුත්තේ කෙසේදයත්? නාමරූප ධර්මයහි කියනලද සංඝකාර ධර්මයන්ගේ ජරාවට පැමිණි මද ජරාවට පැමිණියාවූ සංඝකාර ධර්මයන්ගේ බිඳිමද වනහෙ යින් මේ ආත්මභාවයාගේ දිරීම බිඳිම දෙක උපන් නිසා වන් නේය. ඉපදීම කුශලාකුශලකර්ම භවය කාමරූපාදි උත්පත්ති භවය නිසා වන්නේය. කර්මභවය උත්පත්ති භවය පංචකාමාදිය දැඩිවශ යෙන් ගැණීම් සඞ්ඛ්‍යාත උපාදානය නිසා වන්නේය. උපාදානය හෙවත් පංචකාමාදිය දැඩිවශයෙන් ගැණීම පංචකාමාදිත්හි පව ත්නා ලොභය නිසා වන්නේය. පංචකාමාදීන්හි පවත්නා ලොභය පංචකාම සම්පත් ආදිය බිඳීම නිසා වන්නේය. පංචකාමයන් බිඳීම රූපාදි අරමුණුවල හැපීම නිසා වන්නේය. රූපාදි අරමුණුවල හැපීම ඇස් කන් නාසාදි ඉන්ද්‍රිය ධර්මයන් නිසා වන්නේය. ඇස් කන් නාසාදි ඉන්ද්‍රිය ධර්ම ඒ ඒ ඉන්ද්‍රිය නිශ්‍රිත නාම ධර්ම රූප ධර්මයන් නිසා වන්නේය. ඒ ඒ ඉන්ද්‍රියනිශ්‍රිත නාමරූප ධර්ම ප්‍රතිසන්ධිප්‍රවෘත්ති විඤ්ඤාණයන් නිසා වන්නේය. ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විඤ්ඤාණ

කුශලාකුශල කර්මය නිසා වන්නේය. කුශලාකුශල කර්මය අවිද්‍යාව හෙවත් මෝඩකම නිසා වන්නේයයි පටිලෝම පටිච්චසමුප්පාද වශයෙන් ජරාමරණයේ පටන් අවිද්‍යාව දක්වා නුවණින් මෙනෙහිකරන්නේවීනම් නාමරූප ධර්මරාශියකින් යුත් මේ ආත්මභාවයෙහි හෙතු පරම්පරාවකින් ඵල පරම්පරාවක් පවත්නා බව පෙණියන්නේය.

රූපාරූපධර්මයන්ගේ ඇතිවීමට හෙතු පරීක්ෂාකරන්නහු විසින් අනුලෝම පටිච්චසමුප්පාද වශයෙන්ද කරුණු සෙවිය යුතුවේ. සංස්කාරයට කාරණවූ අවිද්‍යාවයයි කියනලද හෙතුධර්මය පටිච්චසමුප්පාද නම්, එයින් උපදනා ඵලධර්මයක්වූ සංස්කාරය පටිච්ච සමුප්පන්න නම්, විඤ්ඤාණයට කාරණවූ සංස්කාරයයි කියනලද හෙතු ධර්මය පටිච්චසමුප්පාද නම්. එයින් උපදනා ඵලධර්මයක්වූ විඤ්ඤාණය හෙවත් ප්‍රතිසන්ධිප්‍රවෘත්ති චිත්තය පටිච්චසමුප්පන්න නම්, නාම රූපයන්ට කාරණවූ විඤ්ඤාණයයිකියනලද හෙතුධර්මය පටිච්ච සමුප්පාද නම්, එයින් උපදනා ඵලධර්මයක්වූ නාමරූපය පටිච්ච සමුප්පන්න නම්, ෂඩායතනයන්ට කාරණවූ නාමරූපයයි කියනලද හෙතුධර්මය පටිච්චසමුප්පාදනම්, එයින් උපදනා ඵලධර්මයක්වූ ෂඩායතනය පටිච්ච සමුප්පන්න නම්. සඵස්සයට කාරණවූ ෂඩායතනයයි කියනලද හෙතු ධර්මය පටිච්ච සමුප්පාද නම්, එයින් උපදනා ඵලධර්මයක්වූ සඵස්සය පටිච්චසමුප්පන්න නම්, වේදනාවට කාරණවූ සඵස්සයයි කියනලද හෙතුධර්මය පටිච්ච සමුප්පාද නම්, එයින් උපදනා ඵලධර්මයක්වූ වේදනාව පටිච්ච සමුප්පන්න නම්, තෘෂ්ණාවට කාරණවූ වේදනාවයයි කියනලද හෙතුධර්මය පටිච්චසමුප්පාද නම්, එයින් උපදනා ඵලධර්මයක්වූ තෘෂ්ණාව පටිච්චසමුප්පන්න නම්, උපාදානයට කරුණුවූ තෘෂ්ණාවයයි කියනලද හෙතුධර්මය පටිච්ච සමුප්පාදනම්, එයින් උපදනා ඵලධර්මයක්වූ උපාදානය පටිච්චසමුප්පන්නනම්, භවයට කරුණුවූ උපාදානයයි කියනලද හෙතුධර්මය පටිච්ච සමුප්පාද නම්, එයින් උපදනා ඵලධර්මයක්වූ භවය පටිච්ච සමුප්පන්න නම්, ජාතියට කරුණුවූ භවයයි කියනලද හෙතුධර්මය පටිච්චසමුප්පාද නම්, එයින් උපදනා ඵලධර්මයක්වූ ජාතිය පටිච්ච සමුප්පන්න නම්, ජරාමරණාදියට කාරණවූ ජාතියයි කියනලද හෙතු ධර්මය පටිච්ච සමුප්පාද නම්, එයින් උපදනා ඵලධර්මයවූ ජරාමරණාදිය පටිච්ච සමුප්පන්න නම්, මෙසෙයින් පටිච්චසමුප්පාදයන්නෙන් හෙතුධර්ම හා පටිච්චසමුප්පන්න යන්නෙන් ඒ ඒ හෙතූන් විසින් උපදවනු ලබන ඵලධර්ම ප්‍රකාශවෙති, අවිද්‍යාවෙන් පටන් ගෙණ ජරාමරණයෙන් අවසන් කොටැ පටිච්චසමුප්පාදය හෙවත් හෙතුඵල ධර්මපරම්පරාව දැහැමිකාරයන්ට ගැඹුරුනේ අඩුත්තනොවූ වැඩිත්තොවූ අවිද්‍යාදී

හෙතූන් විසින් අඩුත්නොවූ වැඩිත්නොවූ සංඝකාරාදීවූ ඵලධර්මයන් උපදවනුලබනබව දැක්වීම පිණිසත් අවිද්‍යාදි ප්‍රත්‍යයධර්මයන් ඔවුනොවුන්සම්බන්ධවීමට පෑමිණිකල්හි ඔවුන් විසින් උපදවනු ලබන සංඝකාරාදීවූ ඵලධර්මයන්ගේ මොහොතකුදු නොලැබීමක් නොවන හෙයින් ඒ බැව් දැක්වීම පිණිසත් අන්හෙතු ධර්මයකින් අන්ඵල ධර්මයක්නුපදවන බව දැක්වීම පිණිසත්යයි සැලකිය යුතුයි.

දෙසනා හෙදතෝ අත්ථලක්ඛණෙකවිධාදිතෝ,
අඞ්ගානඤ්ච වවත්ථානා විඤ්ඤූනඛෙබා විනිච්ඡයෝ'යි.

වදාළ හෙයින් පටිච්චසමුප්පාද ධර්ම දැනගන්නා කැමැත්තහු විසින් දෙශනාකිරීමේ ප්‍රභෙද වශයෙන්ද අර්ථවශයෙන්ද ලක්ෂණ වශයෙන්ද එකවිධාදි වශයෙන්ද අඞ්ගව්‍යවස්ථාන වශයෙන්ද විනිශ්චය දතයුත්තේය. ඔවුන් අතුරෙන් දෙශනාකිරීමේ ප්‍රභෙද කවරේද? භාග්‍යවතුන්වහන්සේගේ පටිච්චසමුප්පාද දෙශනාව ක්‍රම සතරක් ඇත්තේය. වැල්කපන්නාවූ මිනිසෙක් වැලක් දැක මූලපටන් අගදක්වා වැලබේරාගෙණවුත් කටයුත්තෙහි යොදන්නේ යම්සේද එමෙන් අප භාග්‍යවතුන්වහන්සේ අවිද්‍යාවෙන් පටන්ගෙණ ජරාමරණයෙන් අවසන් කොටැ මූලපටන් අගදක්වාත් පටිච්චසමුප්පාදය දෙශනාකරණසේක. වැල්කපන්නාවූ තවත් මිනිසෙක් වැලේ මැද හරිය දැක එතනපටන් අගදක්වා වැල බේරාගෙණවුත් කටයුත්තෙහි යොදන්නේ යම්සේද එමෙන් අප තථාගතයන්වහන්සේ තෘෂ්ණාවෙන් පටන්ගෙණ ජරාමරණයෙන් අවසන්කොටැ මැද පටන් අගදක්වාත් පටිච්චසමුප්පාදය දෙශනාකරණසේක. වැල්කපන්නාවූ තවත් මිනිසෙක් වැලේ අගකොටස දැක එතන පටන් මූල දක්වා වැල බේරාගෙණවුත් කටයුත්තෙහි යොදන්නේ යම්සේද එමෙන් අප සම්මාසම්බුදුරජාණන්වහන්සේ ජරාමරණයෙන් පටන්ගෙණ අවිද්‍යාවෙන් අවසන්කොටැ අගපටන් මූලදක්වාත් පටිච්චසමුප්පාදය දෙශනාකරණසේක. වැල්කපන්නාවූ තවත් මිනිසෙක් වැලේ මැද කොටස දැක එතන පටන් මූලදක්වා වැල බේරාගෙණවුත් කටයුත්තේ යොදන්නේ යම්සේද එමෙන් අප භාග්‍යවතුන් වහන්සේ තෘෂ්ණාවෙන් පටන්ගෙණ අවිද්‍යාවෙන් අවසන්කොට මැද පටන් මූලදක්වාත් පටිච්චසමුප්පාදය දෙශනාකරණසේක. කවරහෙයකින් මෙසේ දෙශනාකරණසේක්ද යත්? පටිච්චසමුප්පාදය වනාහි යථොක්ත චතුර්විධ දෙශනා ක්‍රමයෙන්ම න්‍යායාවබොධය පිණිස පවත්නා බැවින් සම්මාසම්බුදුරජාණන්වහන්සේද දෙශනා විලාශයට පැමිණි නිසාත් නානා නයින් ධර්මදෙශනාකරණ පරිදි දැක්වීමටය. එහෙයින් වදාළහ:-

"සමනනභදදකොනි පටිචචසමුපපාදෙ තතො තතො ඤයයපති වෙඩාය සංවතතතියෙව...පෙ...සො දෙසතා විලාසපපතතතතා නා නා නයෙහෙව ධමමං දෙසෙති"හි

තවද සතර පරද්දෙකින් පටිචචසමුපපාද ධර්මය දෙශනාකිරීමේ විශෙෂයකුදු ඇත කෙසේදයත් අවිද්‍යාවෙන් පටන්ගෙණ ජරාමරණ යෙන් අවසන්කොට මූලපටන් අගදක්වා යම් අනුලොම පටිචච සමුපපාද දෙශනාවක් ඇද්ද ඕතොමෝ සංසාර ප්‍රවෘත්තියට කරුණු කවරේදැයි විභාගකිරීමෙනි මුලාවූ වෙනෙය ජනයන් දුක වදුරා සුදුසු කරුණුවලින් පැවැත්ම දුක්වීම පිණිසත් උත්පත්ති ක්‍රම දුක් වීම පිණිසත් දෙශනාකරණ ලද්දීය. ජරාමරණයෙන් පටන් ගෙණ අවිද්‍යාවෙන් අවසන්කොට අග පටන් මුල දක්වා යම් පටිලොම පටිචචසමුපපාද දෙශනාවක් ඇද්ද ඕතොමෝ මේ ලෝකවාසී සත්ව තෙම මහත් දුකට පැමිණිෂ්‍යේ උපදනේද වෙයි ජරාවටද පැමිණෙයි මරණයටද පැමිණෙයි මෙහින් චුතවෑ නැවත උපදනේද වෙයි යනාදීවශයෙන් මහත් දුක් අනුභව කිරීමට පැමිණි සත්ලොකයා දුක වදුරා ඒ ඒ ජරාමරණාදි දුඃඛ රාශියගේ ප්‍රතිලාභයට හෙතුවූ කරුණු දුක්වීම සඳහා දෙශනාකරණ ලද්දීය. මධ්‍යයෙන් පටන් ගෙණ මුලදක්වා යම් පටිචචසමුපපාද දෙශනාවක් ඇද්ද ඕ තොමෝ වතීමාන භවයෙහි සිට අතීත භවය දක්වා කරුණු සොයා නැවත අතීතභවයෙහි පටන් හෙතු ඵල පරම්පරාව දුක්වීම පිණිස දෙශනා කරණ ලද්දීය. මධ්‍යයෙන් පටන්ගෙණ අග දක්වා යම් පටිචච සමුපපාද දෙශනාවක් ඇද්ද ඕ තොමෝ අනාගත භවය අවබොධ නොකලහැක්කවුන්ට ප්‍රත්‍යක්ෂ වතීමාන හෙතු දක්වා හෙතු ඵල පරම්පරා වශයෙන් පවත්නා අනාගත භවය දුක්වීම පිණිස දෙශනා කරණලද්දීය. යථොක්ත චතුර්විධ දෙශනා ක්‍රම අතුරෙන් සංසාර ප්‍රවෘත්තියට කරුණු කවරේදැයි විභාග කිරීමෙනි මුළාවට පැමිණි වෙනෙයජනයාට සුදුසු කරුණුවලින් පැවැත්ම දුක්වීම පිණිසත් උත්පත්ති ක්‍රම දුක්වීම පිණිසත් අවිද්‍යාවෙන් පටන්ගෙණ ජරා මරණයෙන් අවසන්කොටැ වදුළාවූ යම් අනුලොම පටිචචසමුපපාද දෙශනාවක් ඇද්ද ඕ තොමෝ මෙහි කථාශරීරකොට දක්වනු ලැබේ.

කවරහෙයකින් මෙහි අවිද්‍යාව මුල්කොට වදුරණ ලද්දීද කිමෙක්ද මූලක් ඇත මැවුන්කාරයෙක් ඇතැයි යනාදි ලබ්ධි ගත්ත වුන්ගේ හෙතුරහිත මූලපටන්ගැන්ම වාගේ අවිද්‍යාවගේ හෙතු රහිතවැ මූලපටන් ගැන්මෙක්ද යත් අවිද්‍යාව වතාහි මූලක්ඇත පටන්ගැන් මක් ඇත. මැවුන්කාරයෙක් ඇතැයි යනාදි වරදවා ලබ්ධිගත්ත

වූන්ගේ හෙතුරහිත මූලපටන් ගැණීමවාගේ එකක් නොවැ "අාසව සමුදයා අවිජ්ජාසමුදයො"යි, කාමාදිආශ්‍රවධර්මයන්ගේ හටගැණීමෙන් අවිද්‍යාවගේ හටගැණීමවේයයි වදාල බැවින් අවිද්‍යාවගේ හට ගැණීමටද කාරණ ඇත්තේය. ඒ එසේවේවා අවිද්‍යාවගේ හටගැණීමට කරුණු ඇතිනාම් ඒ කාරණයෙන් පටන්නොගෙණ අවිද්‍යාව මූලකාරණයක්කොට පටිච්චසමුපපාදය දෙශනාකළේමන්ද, සංසාර කථාව වදාරණ සමයෙහි අවිද්‍යාව හෝ භවතෘෂ්ණාව හෝ අවිද්‍යා භවතෘෂ්ණාවයම හෝ මුල්කොට දෙශනාකිරීම බුදුවරයන්ගේ සිරිතක් හෙයිනි කවර හෙයකින් භාග්‍යවතුන් වහන්සේ සංසාර කථාව අවිද්‍යාව හෝ භවතෘෂ්ණාව මුල්කොට වදාරණසේක්ද දුගතියට පමුණුවන්නාවූ අකුශලකර්මයව හා සුගතියට පමුණුවන්නාවූ කුශල කර්මයව අවිද්‍යාව හෝ භවතෘෂ්ණාව විශෙෂහෙතුවන හෙයින් අවිද්‍යාව හෝ භවතෘෂ්ණාව මුල්කොට වට්ටකථාව හෙවත් සංසාරකථාව වදාරණසේක. දුගතියට පමුණුවන්නාවූ අකුශල කර්මයව විශෙෂහෙතුවූයේ අවිද්‍යාවයි කවරහෙයිනයත්? ගින්නෙන් රත්කොට දඩුමුගුරු වලින් තලා මහත්පීඩාවට පමුණුවනලද මරණයට නියමවූ ගවයෙක් අධිකවූ සන්තාපය ඉවසිය නොහී තමහට විපත්තිදායකවූයේ නමුදු කකියනලද උනුවතුර පානය කරන්නේ යම්සේද එමෙන්ම අවිද්‍යාවෙන් හෙවත් මෝඩකමින් පිඬිතවූ පුරුෂ පුද්ගලතෙම කෙලශ සන්තාපයෙන් තවනහෙයින් සැනසීමක් නැති නමුදු දුගතියෙහි ලා හෙලනහෙයින් තමහට අනර්ථදායක නමුදු ප්‍රාණඝාත කිරීම් ආදීවූ අනෙකප්‍රකාර දුර්ගතිගාමී අකුශලකර්මයන් රැස්කෙරේමය.

සුගතිගාමිවූ කුශලකර්මයට විශෙෂ හෙතුවූයේ භවතෘෂ්ණාවයි. කවරහෙයින්දයත්? යථොක්ත ප්‍රකාර විඩාවට පැමිණි ගවයෙක් ඇල්වතුර බොනු කැමැත්තෙන් ආශ්වාදසහිතවූ විඩාව සන්සිඳුවන්නාවූ සිහිල් පැනක් ලැබ පානය කරන්නේ යම්සේද එමෙන් භවතෘෂ්ණාවෙන් පීඩිතවූ පුරුෂ පුද්ගලතෙම කෙලස සන්තාපයෙන් විමුක්තහෙයින් සැනසීම් ඇති සුගතියට පැමිණවීමෙන් දුර්ගති දුඃඛ පීඩාව දුරලන්නාවූ ප්‍රාණඝාත නොකිරීම් ආදීවූ අනෙකප්‍රකාර සුගතිගාමිවූ කුශලකර්මයන් රැස්කෙරේමය.

මේ ආදි යුක්ති සහගත කරුණු සලකා අවිද්‍යාව හෝ භවතෘෂ්ණාව සංසාර කථාව ප්‍රකාශකිරීමට අප භාග්‍යවතුන් වහන්සේ මුල් කරගත්බවමුත් අවිද්‍යාව සංසාරයාගේ මූලප්‍රකෘතියක් බව දක්වීමට වදාළානොවෙති.

පටිච්චසමුපපාදධර්මයට ඇතුළත්වූ අවිද්‍යාදි පදයන්ගේ අර්ථ වශයෙන්ද විනිශ්චය දතයුත්තේය. නොවින්දයුතුවූ හෝ නොලැබියයුතු කායදුශ්චරිතාදිය භිඳිනඅර්ථයෙන්ද වින්දයුතුවූ හෝ ලැබිය

යුතුවූ කායසුචරිතාදිය නොවිඳින නොලබන අර්ථයෙන්ද මෝඝ කම අවිද්‍යාවයයි කියනුලැබේ. රූපාදි සඤ්ඤයන්ගේ රාශි අර්ථය හෙවත් සමූහාර්ථයද චක්ඛායතනාදීවූ වාදශායතනයන්ගේ සසර දුක් දිගින් දිගට ගෙණයෑම් ආදිවූ ආයතනාර්ථයද චක්ඛුධාතු ආදි අටළොස් ධාතූන්ගේ සත්ව පුද්ගල සත්‍රීපුරුෂාකාරයෙන් තොරවූ ශූන්‍යවූ ධාතුමාත්‍රයෙන ගන අර්ථයද දෙවිසිවැදෑරුම් ඉන්ද්‍රිය ධර්මයන් ගේ දැනීම් ඇසීම් ගඳදැනීම් රසදැනීම් සපශීයදැනිම් ආදී ඒ ඒ කෘත්‍යයන්හි ප්‍රධානත්වය කිරීම් සඞ්ඛ්‍යාත අධිපති අර්ථයද දුඃඛ සත්‍යාදිවූ චතුස්සත්‍ය ධර්මයන්ගේ මෙය මෙසේ නොවේයයි බොරු කරලිය නොහැක්කාවූ ඒකාන්ත සත්‍යවූ අර්ථයද වැටහියනොදෙන් නාවූ හෙවත් තේරුම්නැණීමට ඉඩනොදෙන්නාවූ මෝඝකම අවිද්‍යාව යයි කියනුලැබේ. අනවරාග්‍ර සංසාරයෙහිද අණ්ඩජ ජලාබුජ සංසෙදජ ඔපපාතික යොනිවලද දිව්‍ය මනුෂ්‍යනිරය තිරශ්චීන ප්‍රේත ගති වලද කාම රූපාරූප භවත්‍රයෙහිද සපනවිධ ස්කන්ධසන්තතීන්හිද නව වැදෑරුම්වූ සත්ත්වා වාසයන්හිද සත්වයන් දුවවන අර්ථයෙන් මෝඝ කම අවිද්‍යාවයයි කියනුලැබේ. පරමාර්ථවශයෙන් අවිද්‍යමානවූ සත්‍රී පුරුෂාදීන් විෂයෙහි කෘ පරමාර්ථවශයෙන් විද්‍යමානවූ සඞ්ඛ්‍යාත ධාතු විෂයෙහි නුදුවවන අර්ථයෙන්ද මොහය හෙවත් මෝඝකම අවිද්‍යාවයයි කියනුලැබේ. ෂට්වාරික සිත්ද චක්ෂුරාදි ෂඩ්වාරයන්ද රූපාදි අරමුණු සයද අවිද්‍යාදිවූ පටිච්ච සමුප්පාදයෙහි කී හෙතුධර්ම යන්ද ජරාමරණාදි පටිච්ච සමුප්පන්න සඞ්ඛ්‍යාත ඵලධර්මයන්ද මුවා කරදමන අර්ථයෙන් මෝඝකම අවිද්‍යාවයයි කියනුලැබේ. මෙසේ අවිජ්ජා ශබ්දයාගේ අදහස සංක්ෂේපයෙන් දක්වා ඉක්බිති "පච්චය" ශබ්දයාගේ අදහස සඳහන් කරණ්ණුලැබේ. "යං පටිච්ච ඵලමෙති සෝ පච්චයෝ" යනු අටුවා වචන හෙයින් යම් හෙතුවක් යම් උපකාරයක් නිසා එයින් වෙන්නොවැ යම්කිසි ඵලවිපාකයක් උපදනේ වී නම් ඊට ප්‍රත්‍යයයි කියනුලැබේ. යම් හෙයකින් අවිද්‍යාදි ධර්මයෝ සංඝකාරාදි ධර්මයන් උපදවද්ද ඒ සංඝකාරාදි ධර්මයන් ඉපිදවීමට හෙතුවූ ප්‍රත්‍යයවූ උපකාරවූ අර්ථයෙන් අවිද්‍යාදි ධර්මයෝ අවිද්‍යා ප්‍රත්‍යය සංඝකාර ප්‍රත්‍යය යනාදි වශයෙන් ව්‍යවහාරකරණ්ණු ලැබෙති.

"සඞ්ඛතමභිසඞ්ඛරොන්තීති සඞ්ඛාරා" යනු වදාළහෙයින් යම් ප්‍රත්‍යයන් විසින් කරනලද්දක් නිසිහැටි රැස්කෙරෙද්ද ඔහුතුමූ සංඝකාරයෝ වෙත්. මෙහි අවිජ්ජාපච්චයා සඞ්ඛාරා යන්නෙන් ප්‍රකාශිතවූ සංඝකාරයෝද පෙළ අටුවා දෙක්හි යම් යම් තැන සංඝකාර යන ශබ්දමාත්‍රයෙන් ප්‍රකාශිතවූ සංඝකාරයෝ දැයි සංඝකාරයන්ගේ ප්‍රභෙද ඇත. එහින් අවිජ්ජාපච්චයා සඞ්ඛාරා යන්නෙන් පුණ්‍යාභි

සංඝකාර අපුණ්‍යාභිසංඝකාර ආනඤ්ජාභිසංඝකාර කායසංඝකාර වාක්සංඝකාර චිත්තසංඝකාරයයි කියනලද සංඝකාර සඳෙනකු ප්‍රකාශකරණු ලැබෙත්. මෙසේ පුණ්‍යාභි සංඝකාරාදි වශයෙන් ප්‍රභෙදවූ සංඝකාර සඳෙනා අර්ථවශයෙන් ලෞකික කුශලාකුශල චෙතනා මාත්‍රයෙකි. සාමාන්‍ය සංඝකාර ශබ්දමාත්‍රයයන් යම් යම් තැන සංඛත සංඝකාර අභිසංඛත සංඝකාර අභිසංස්කරණක සංඝකාර ප්‍රයොගාභිසංස්කාර වශයෙන් නොයෙක් සංස්කාර විශෙෂ දක්වනු ලැබෙත් ඒ මෙසේයි. "අනිච්චා වත සංඛාරා" යන්නෙහි සංඝකාර නාමයෙන් යම් යම් හෙතුධර්මබලයෙන් උපදනා සචෙතනික අචෙතනික ද්‍රව්‍ය අද්‍රව්‍ය රූපාරූප සකල ධර්මරාශියයි කියනලද සංඛත සංඝකාරයෝ ගැණෙති. එසේම කර්මයෙන් පමණක් පහළවූ කාමරූපාරූප භූමි වලට අන්තර්ගතවූ සත්ත්ව සන්තානාගත රූපාරූප ධර්මසමූහය අභි සංඛත සංඝකාරයෝ වෙති. ඔවුහුද "අනිච්චා වත සංඛාරා" යන් නෙන් දක්වනලද සංඛත සංස්කාරයන්ගේ එක්ක්‍රමයකින් ඇතුළත් බවට යෙන් කුමක්හෙයිනයත්? වෙන්වශයෙන් ඔවුන්ගේ ව්‍යවහාර කිරීම් මාත්‍රයෙක්මුත් විශෙෂයෙක් නැති හෙයිනි. කාමලොක රූප ලොක අරූපලොක පර්‍යාපන්නවූ කුශලා කුශල චෙතනාරාශිය අභි සංස්කරණක සංස්කාර නම්වේ. මෙසේ කායිකවීර්‍යය හා චෙත සිකවීර්‍යය ප්‍රයොගාභිසංඝකාර නම්වේ. සංඛාර ශබ්දයෙහි සාමා න්‍ය අර්ථදක්වා විඤ්ඤාණාදි පදයන්ගේ සාමාන්‍ය අර්ථ විසතරකොට අනතුරුව අවිද්‍යාදි පදයන්ගේ ලක්ෂණ කෘත්‍ය වැටහෙන ආකාර ආසන්න කාරණයන්ද සැකවින් දක්වා අවිද්‍යාදි පදයන්ගේ එක විධාදි ප්‍රභෙද දක්වනු ලැබෙත්.

කෙසේදයත්? අවිද්‍යාව වනාහි අඤ්ඤානබව ඇතිසැටියොපෙ ණෙනබව මුළාවනබව යන මේ වශයෙන් එක්වැදුරුම් වේ දුඃඛ සත්‍ය සමුදයසත්‍ය නිරොධසත්‍ය මාර්ගසත්‍යයන් නොදැනීම්සංඛ්‍යාත අප්‍රතිපත්තියගේද අඟුභවූ අනිත්‍යවූ දුඃඛවූ අනාත්මවූ ධර්මයන්ගේ ශුභය නිත්‍යය සුඛය ආත්මයයි වරදවා ඛාරහැණීම් සංඛ්‍යාත මිත්‍යා ප්‍රතිපත්තියගේද වශයෙන් දෙවැදුරුම්වේ දෘෂ්ටි විප්‍රයුක්ත සිත්හි ඇතුළත්වීම් සංඛ්‍යාත අප්‍රතිපත්තියගේද දෘෂ්ටිසම්ප්‍රයුක්ත සිත්හි ඇතුළත්වීම් සංඛ්‍යාත මිත්‍යා ප්‍රතිපත්තියගේද වශයෙනුත් දෙවැදුරුම්වේ. පසුබස්නා නොපසුබස්නා සිත්හි යෙදීම්වශයෙන්ද විප්‍රකාරවේ සොම්නස් සිත් දොම්නස්සිත් උපෙක්ෂා සිත්හි යෙදීම් වශයෙන්ද තුන්වැදුරුම්වේ චතුස්සත්‍ය ධර්මයන් සතරපරිද්දෙකින් වැටහියනොදීම් වශයෙන් චතුර්විධ වේ. දිව්‍ය මනුෂ්‍ය තිරශ්චීන ප්‍රෙතනිරයගතිපඤ්චකයෙහි ආදීනව මූවාකරදැමීම්වශයෙන් පස්වැදු රුම්වේ ඇස කණ නාසය දිව කය සිත යන දොරටු සයෙහිද රූප

ශබ්ද ගන්ධ රස ස්පර්ශ ධර්මාලම්බන යන අරමුණුස්යෙහිද පවත්නා වශයෙන් සවැදෑරුම් වේ. සවැදෑරුම්බව අවිද්‍යාවෙහි පමණක් නොවැ අනිකුත් පටිච්චසමුප්පාදයට ඇතුළත් සංස්කාරාදි අරූපී ධර්මයන් කෙරෙහිද ලැබේමය.

අවිද්‍යා හෙතුවෙන් ඇතිවන සංස්කාරය වනාහි කාමාදි ආශ්‍රව යන් සමඟ පවත්කාවශයෙන් එක්වැදෑරුම්වේ එසේම විපාකධර්මයන්ට නිදානව පවත්නා ධර්මවශයෙන්ද එක්වැදෑරුම් වේ කුශලාකුශලවශයෙන් දෙවැදෑරුම්වේ පරිත්ත මහත්ගත ධර්මවශයෙන්ද දෙවැදෑරුම්වේ හීන මධ්‍යමවශයෙන්ද නියම අනියමවශයෙන්ද දෙවැදෑරුම්වේ. පුණ්‍යාභිසංස්කාර අපුණ්‍යාභිසංස්කාර ආනඤ්ජාභිසංස්කාරවශයෙන් තුන්වැදෑරුම් වේ අණ්ඩජ ජලාබුජ සංසෙදජ ඔපපාතික යොනීන්හි උත්පත්තිකිරීමට හෙතුවශයෙන් සිවුවැදෑරුම්වේ. දිව්‍ය මනුෂ්‍ය තිරශ්චීන ප්‍රෙතනිරය ගතිපංචකයට පමුණුවන හෙයින් පස්වැදෑරුම් වේ.

සංස්කාර ප්‍රත්‍යයෙන් ඇතිවන විඤ්ඤාණය වනාහි ලෞකික විපාකාදි භාවයෙන් එක්වැදෑරුම්වේ සහෙතුක විපාක විඤ්ඤාණ අහෙතුක විපාක විඤ්ඤාණවශයෙන්ද සහෙතුක අහෙතුක සිත් වශයෙන්ද දෙවැදෑරුම්වේ, කාමරූපාරූපභවයන්හි ඇතුළත්වීම් වශයෙන් තුන්වැදෑරුම්වේ එසේම සුඛ දුඃඛ උපෙක්ෂා වෙදනාවශයෙන්ද අහෙතුක ඒහෙතුක ත්‍රිහෙතුක විපාකවශයෙන්ද තුන්වැදෑරුම්වේ අණ්ඩජ ජලාබුජ සංසෙදජ ඔපපාතික යොනීන්හි උත්පත්තිකිරීම්වශයෙන් සිවුවැදෑරුම්වේ දිව්‍යමනුෂ්‍ය තිරශ්චීන ප්‍රෙතනිරය යන ගතිපඤ්චකයෙහි පිළිසිඳගැණීම් පැවැතීම්වශයෙන් පස්ආකාරවේ.

විඤ්ඤාන ප්‍රත්‍යයෙන් ඇතිවන නාමරූපය වර්තමානකාලික වශයෙන්ද කර්මප්‍රත්‍යයවශයෙන්ද එක්වැදෑරුම්වේ. අරමුණු සහිතව අරමුණු රහිතව පවත්නාවශයෙන් දෙවැදෑරුම්වේ අතීතානාගත වර්තමානවශයෙන් තුන්වැදෑරුම්වේ අණ්ඩජ ජලාබුජ සංසෙදජ ඔපපාතික යොනිපර්‍යාපන්නවශයෙන්. චතුර්විධවෙ දිව්‍යමනුෂ්‍ය තිරශ්චීන ප්‍රෙතනිරය ගතිපඤ්චකයෙහි ඇතුළත්වීම්වශයෙන් පස්වැදෑරුම්වේ.

නාමරූප ප්‍රත්‍යයෙන් ඇතිවන ෂඩායතනය වනාහි චිත්ත චෛතසික ධර්මයන්ගේ උත්පත්තියට ප්‍රදේශවනබැවින්ද චිත්ත චෛතසික ධර්මයන්ගේ පැවැත්මට ස්ථානවන බැවින්ද එක්වැදෑරුම්වේ මහාභූතරූපයන් පභවනවශයෙන් හා චිත්තචෛතසික යන්ට නිශ්‍රය ස්ථානවශයෙන් දෙවැදෑරුම්වේ පැමිණි අරමුණු

ගැණීම් නොපැමිණි අරමුණු ගැණීම් තදුභයඅරමුණු ගැණීම්වශයෙන් තුන්වැදෑරුම්වේ අණ්ඩජ ජලාබුජ සංසෙදජ ඔපපාතික යොනීන්හි පවත්නාවශයෙන් සිවුවැදෑරුම්වේ දිව්‍ය මනුෂ්‍ය තිරශ්චීන ප්‍රෙතනිරය යන ගතිපඤ්චකයෙහි ඇතුළත්වන හෙයින් පස්වැදෑරුම්වේ.

ෂඩායතන ප්‍රත්‍යයෙන් ඇතිවන ඵස්සයවනාහි ස්පර්ශනාත්‍යය කරණ බැවින්ද ලෞකික බැවින්ද කාමාදි ආශ්‍රවයන් සමග පවත්නා බැවින්ද එක්වැදෑරුම්වේ සහෙතුක අහෙතුක වශයෙන්ද පටිඝසම්ඵස්ස අධිවචන සම්ඵස්ස වශයෙන්ද විප්‍රකාරවේ කාමරූපාරූපභවයන්හි ඇතුළත්වීම්වශයෙන්ද සුඛ දුඃඛොපෙක්ෂා වෙදනාවන් හා සමග පවත්නාවශයෙන්ද අහතුක ත්‍රිහෙතුක වශයෙන්ද තුන්වැදෑරුම්වේ යොනිවශයෙන් චතුර්විධවේ ගති වශයෙන් පස්වැදෑරුම්වේ.

සපර්ශප්‍රත්‍යයෙන් ඇතිවන වෙදනාව වනාහි අනුභවකිරීම් ලක්ෂණවශයෙන් එක්වැදෑරුම්වේ එසේම ලෞකික හෙයින්ද ආශ්‍රවධර්මීයන් හා පවත්නා හෙයින්ද එක්වැදෑරුම්වේ පඤ්චවොකාරික මනොවොකාරික වශයෙන් දෙවැදෑරුම්වේ සුඛ දුඃඛ උපෙක්ෂා වශයෙන් තුන්වැදෑරුම්වේ යොනිවශයෙන් චතුර්විධවේ ගතිවශයෙන් පස්වැදෑරුම්වේ.

වෙදනා ප්‍රත්‍යයෙන් ඇතිවන තෘෂ්ණාවවනාහි සකඛලොකයාගේ ඇතිවීමට නිදානවන බැවින් එක්වැදෑරුම්වේ දෘෂ්ටිසම්ප්‍රයුක්ත දෘෂ්ටිවිප්‍රයුක්ත සිත් සමග යෙදීම්වශයෙන් දෙවැදෑරුම්වේ කාමතෘෂ්ණා භවතෘෂ්ණා විභවතෘෂ්ණා වශයෙන් තුන්වැදෑරුම්වේ සතරමාගීඥානයෙන් ප්‍රහීණකටයුතුබැවින් චතුර්විධවේ රූපාදි අරමුණුපස පිළිබඳව පවත්නාහෙයින් පස්වැදෑරුම්වේ රූපතෘෂ්ණාදිවශයෙන් සවැදෑරුම්වේ.

තෘෂ්ණාප්‍රත්‍යයෙන් ඇතිවන උපාදානය දැඩිකොට ගැණීම් වශයෙන් එක්වැදෑරුම්වේ තෘෂ්ණා දෘෂ්ටිවශයෙන් දෙවැදෑරුම්වේ කාමරූපාරූප භවත්‍රයට උපනිශ්‍රයවශයෙන් තුන්වැදෑරුම්වේ කාමුපාදාන දිට්ඨුපාදාන සීලබ්බතුපාදාන අත්තවාදුපාදාන වශයෙන් චතුර්විධවේ දිව්‍ය මනුෂ්‍ය තිරශ්චීන ප්‍රෙත නිරය යන පඤ්චගති සංවත්තනිකවශයෙන් පස්වැදෑරම්වේ.

උපාදාන ප්‍රත්‍යයෙන් ඇතිවන භවය වනාහි ලෞකිකබැවින්ද ආශ්‍රවධර්මීයන් සමග පවත්නා බැවින්ද එක්වැදෑරුම්වේ කර්මභව උපපත්තිභවවශයෙන් දෙවැදෑරුම්වේ කාමභව රූපභව අරූපභව

වශයෙන් තුන්වැදෑරුම්වේ. චතුර්විධ උපාදානයන්ට ප්‍රත්‍යයවන බැවින් චතුර්විධවේ දිව්‍යමනුෂ්‍යාදි ගතිපසුබකයෙහි උත්පත්තිය ගෙණදෙන හෙයින් පස්වැදෑරුම්වේ කාමකර්මභව රූපකර්මභව අරූප කර්මභව කාමඋපපත්තිභව රූපඋපපත්තිභව අරූපඋපපත්තිභව වශයෙන් සවැදෑරුම්වේ. නානත්තකායා නානත්තසඤ්ඤී නානත්ත කායා එකත්තසඤ්ඤී එකත්තකායා නානත්තසඤ්ඤී එකත්තකායා එකත්තසඤ්ඤී සඤ්ඤී අසඤ්ඤී නෙවසඤ්ඤී නාසඤ්ඤී යන විසඳු ණ්ඨිතිවසයෙන් සත්වැදෑරුම්වේ කාමූපාදානයට ප්‍රත්‍යවූ කර්මභව උපපත්තිභව දිට්ඨුපාදානයට ප්‍රත්‍යවූ කර්මභව උපපත්තිභව සීලබ්බ තූපාදානයට ප්‍රත්‍යවූ කර්මභව උපපත්තිභව අත්තවාදූපාදානයට ප්‍රත්‍යයවූ කර්මභව උපපත්තිභව වශයෙන් අටවැදෑරුම්වේ කාම රූපාරූප එකවොකාර චතුවොකාර පඤ්චවොකාර සඤ්ඤීඅසඤ්ඤී නෙවසඤ්ඤී නාසඤ්ඤී භවවශයෙන් නවවිධවේ.

භව ප්‍රත්‍යයෙන් ඇතිවන ජාතිය වනාහී ඒ ඒ භවයෙහි පළමු කොට පහළවන බැවින් එක්වැදෑරුම්වේ රූපසකඛි සංස්කාර සකඛියන්හි සංග්‍රහවන බැවින් දෙවැදෑරුම්වේ කාමරූපාරූප භවත්‍රයෙහි ඇතුළත්වනබැවින් තුන්වැදෑරුම්වේ යොනිවශයෙන් චතුර්විධවේ ගතිවශයෙන් පස්වැදෑරුම්වේ මේ නයින් ජරාමරණාදි ධර්මයන්ගේද එක්වැදෑරුම් දෙවැදෑරුම් ආදි ප්‍රභෙද ඇති බව දක යුත්තේය ශොක පරිදෙව දුඃඛ දෞර්මනස්‍ය දුඃඛ ආයාසයන් ජරාමර ණයන්ගේ ඵලවශයෙන්ම ගන්නාලද බැවින් පටිච්චසමුප්පාදඞග වසයෙන් නොගෙණ සංසාරවක්‍රයාගේ නොසිඳ පැවැත්ම දක්වනු සඳහා වදාළේයි යම්හෙයකින් ජරාමරණයෙන් පීඩිතවූ අඤ්ඤබාලයා හට ශොක විලාපකර්ම දුක දෞර්මනස ඇතිවේද්ද එහෙයින් "අස්සු තවා භික්ඛවෙ පුථුජ්ජනෝ කායිකාය දුක්ඛාය වෙදනාය ඵුට්ඨෝ සමානෝ සොචති කිලමති පරිදෙවති උරත්තාලිං කන්දති සම්මොහ මාපජ්ජති" යනු වදාළසේක. අශ්‍රැතවත් පෘථග්ජනතෙම කායික දුඃඛවෙදනාවෙන් ස්පර්ශිතවූයේම සොකකෙරේ. කලාන්ත බවට පැමිණේ. විලාපයියයි ළෙහි අත්ගසා හඬයි මුලාවට පැමි ණෙයි. "යාව ච තෙසං පවත්තති තාව අවිජ්ජායානි ප්‍රුනපි අවිජ්ජා පඵවයා සඞඛාරාති සම්බන්ධමෙව හොති භවචක්කං" යනු වදාළ හෙයින් යම්තාක් කල් සොකපරිදෙව දුක්ඛ දෞර්මනස්‍ය උපායාසා දීන්ගේ පැවැත්මවේද ඒ තාක් අවිද්‍යාවගේද පැවැත්මවේනුයි. භාවිතද අවිද්‍යාප්‍රත්‍යයෙන් සංඛාරයෝ වෙත්යි මෙසේ භවචක්‍රය සම්බන්ධවේමය මෙසේ සොකපරිදෙවාදියද ජරාමරණ පදයෙහිම සඞග්‍රහවා පටිච්ච සමුප්පාදඞග දෙළඟසක්ම වදාරණලදැයි දතයුතු.

මෙතැන් පටන් විසතරය ගෙණහැර දක්වනුලැබේ. සූත්‍රදෙශනානයින් දුක දුක් ඉපදීමට හෙතුව දුක්නැතිකිරීම් සංඛ්‍යාත නිම්ණය එය ලබාගැණීමට හැකි උපාය මාර්ගය යන මේ සතර තැන්හි නොවැටහීම නොදැනීම අවිද්‍යාවයයි කියනු ලැබේ. අභිධම්ම දෙශනානයින් "තත්‍ථ කතමා අවිජ්ජා දුක්ඛෙ අඤ්ඤාණං පෙ දුක්ඛ නිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං පුබ්බන්තෙ අඤ්ඤාණං අපරන්තෙ අඤ්ඤාණං පුබ්බාපරන්තෙ අඤ්ඤාණං ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං"යි වදාළහෙයින් දුකාදිවූ අතතන්හි නොවැටහීම නොදැනීම අවිද්‍යාවයයි කියනුලැබේ. දුකාදි අටදෙනා අතුරෙන් ලොකොත්තරවූ නිරොධසත්‍යය හෙවත් නිර්‍වාණයත් ලොකොත්තරවූ මාර්ගසත්‍යයත් අවිද්‍යාව කිසිසේත් අරමුණු නොවන හෙයින් ඒ සත්‍යද්වය හැර ඉතිරි සයතැන්හි අරමුණු කිරීම්වශයෙන් අවිද්‍යාව උපදනේයි මුවාකිරීම් වශයෙන් ලොකොත්තර සත්‍යවය ඇතුළුවූ අටතන්හිම අවිද්‍යාව උපදනා හෙයින් ඒ අදහස මතුකොට නොවැටහීම නොදැනීම මුවාකර දැම්ම අවිද්‍යාවයයි දක්වනලදී.

යම් හෙයකින් අවිද්‍යාව දුඃඛසත්‍යය මුවාකොට සිටීද ඇති සවභාව වැටහීමට ඉඩනොදේද එසේම දුක් ඉපදීමට හෙතුවූ සමුදය සත්‍යය මුවාකොට සිටීද ඇතිසවභාව වැටහීමට ඉඩනොදේද දුක්නැතිකිරීම් සංඛ්‍යාත නිරොධ සත්‍යය මුවාකොට සිටීද ඇති සවභාව වැටහීමට ඉඩනොදේද දුක් නැතිකිරීමේ උපාය මාර්ග සංඛ්‍යාත මාර්ගසත්‍යය මුවාකොට සිටීද ඇතිසවභාව වැටහීමට ඉඩනොදේද පූර්‍වාන්තයයි කියනලද අතීතස්කන්ධපඤ්චකය මුවාකොට සිටීද ඇති සවභාව වැටහීමට ඉඩනොදේද අපරාන්තයයි කියනලද අනාගත සකන්ධපඤ්චකය මුවාකොට සිටීද ඇතිසවභාව වැටහීමට ඉඩනොදේද පුබ්බන්තාපරන්තසඞ්ඛ්‍යාත අතීතානාගත සකන්ධපඤ්චකයමුවාකොටසිටීද ඇතිසවභාව වැටහීමට ඉඩනොදේද ඉදප්‍රත්‍යයතා කියනලද සංසකාරාදී එලධම්මයන්ගේ ඇතිවීමට උපකාරවූ හෙතුධම්මයන් හා පටිච්චසමුප්පන්න ධම්මයයි කියනලද ජරාමරණාදී එලධම්මයන් මුවාකොට සිටීද ඇති සවභාව වැටහීමට ඉඩනොදේද මෙසේ දුක්ඛ සමුදය නිරොධ මාර්ග අතීතඅනාගත අනාගතසකන්ධ අතීතානාගතසකන්ධ හෙතුඵලධම්ම සඞ්ඛ්‍යාත සත්‍යාත අටක් මුවාකොට ඇති සවභාව ඇතිසැටි වැටහීය නොදෙන්නාවූ මෝඩකම අවිද්‍යාවයයි කියනුලැබේ. (ටීකාචාර්‍ය්‍ය මතවශයෙන්) "පුබ්බන්තාපරන්ත" යන පදයෙන් අතීතානාගත අන්තවයට මැදිවූ ප්‍රත්‍යුත්පන්න සකන්ධපඤ්චකයාගේ ගැන්මද උගන්වනලදී.

සංඝකාරයෝ නම් කවරහුද? පුණ්‍යාභිසංඝකාර අපුණ්‍යාභිසංඝකාර ආනඤ්ජාභිසංඝකාර කියෙන හා කායසංඝකාර වචීසංඝකාර චිත්තසංඝකාර යන තියෙන එකතුව සඳහනෙක් වෙති. විසතර වශයෙන් වනාහි දන්දීම් සිල්රැකීම් භාවනාකිරීම් වශයෙන් පැවති කාමාවචර කුශලචෙතනා අටදෙනා හා භාවනාකිරීම් වශයෙන් පමණක් පැවතිරූපාවචර කුශලචෙතනාපසදෙනකුවචෙතනාතෙළෙස් දෙන පුණ්‍යාභිසංඝකාර නම්වෙත්. පස්පව් දසඅකුසල්කිරීම් ආදි වශයෙන් පැවති දෙලොස් අකුසල චෙතනාවෝ අපුණ්‍යාභිසංඝකාර නමවෙන් භාවනාවශයෙන් පමණක් පැවති සතර අරූපාවර කුසල චෙතනාවෝ ආනඤ්ජාභිසංඝකාර නම්වෙත්. මේසේ පුණ්‍යාභිසංඝකාර අපුණ්‍යාභිසංඝකාර ආනඤ්ජාභිසංඝකාර තියෙන විසතර හෙයින් එකුන්තිස් චෙතනාඝනයෙක් වෙති. අනික් සංඝකාර තුණ අතුරෙන් කුශලා කුශල කම්යන් රැස්කරන්නාවූ අවස්ථාවෙහි කායවිඥප්ති රූප උපදවා කායද්වාරයෙහි පැවති කාමාවචර කුශල චෙතනා අටදෙනද අකුශල චෙතනා දෙලොස්දෙනද එකතුව චෙතනා විසිදෙනක් කායසංඝකාර නම්වෙති. වාග්විඥප්ති රූප උපදවා වාග්ද්වාරයෙහි පැවති ඔව්හු විසිදෙන වචීසංඝකාර නම් වෙති. කාය වාග්විඥප්ති රූප නුපදවා කාය වාග්ද්වාරයන්හි නොපැවත ශුද්ධමනොද්වාරයෙහිම පැවති ඉහතකී එකුන්තිස් චෙතනාතුමූ චිත්තසඞ්ඛාරයෝ නම්වෙත්. (අභිඤ්ඤ කුශල චෙතනාව මතු දක්වනු ලබන විඤ්ඤාණයට ප්‍රත්‍යය නොවනහෙයින් මෙහි සඳහන් නොකරණලදි. උඩුවවචෙතනාවද විඤ්ඤාණයට ප්‍රත්‍යය නොවන හෙයින් එයද අන්හැර චෙතනා විසිඅටදෙනෙක්ම විඤ්ඤාණයට ප්‍රත්‍යය වනබව දතයුතුයි. අභිඤ්ඤා කුශල චෙතනා උඩුවව චෙතනාවය විඤ්ඤාණයට ප්‍රත්‍යය නොවන්නාමුත් අවිද්‍යාහෙතුවෙන්ම ඔවුන්ගේ ලැබීමවේමය.)

මේ සංඝකාරයෝ වනාහි අවිද්‍යා ප්‍රත්‍යයෙන් වෙන්යයි කෙසේ දැනගතහැක්කේද අවිද්‍යාව ඇතිකල්හිම සංඝකාරයන්ගේ ඇතිවීම වනාහෙයින් දැනගත හැක්තේය. යමෙක්හට දුකබාදිඅවතන්හි අවිද්‍යා වශයෙන් කියනලද නොදැනීම නොවැටහීම ප්‍රහීන නොවූයේ වී නම් මහතම දුකබාදි අවතන් අතුරෙන් දුකෙහි මුලාවීමෙන් සංසාර දුන සැපයැයි සංඥාවෙන් භාරගෙණ ඒ සංසාර දුකට හෙතුවූ නිර්ධවූද සංඝකාරයන් රැස්කිරීමට පටන්ගණී සමුදයයි කියනලද දුක් හටගැණීමට ඇති හෙතුව නොවැටහීමෙන් දුකට හෙතුවූ තෘෂ්ණාවට ආහරණවූ නොහොත් තෘෂ්ණාවට පිරිවරවූ සංඝකාරයන් සැපතට හෙතුවශයෙන් හඟිමින් රැස්කිරීමට පටන්ගණී නිර්ධාණයයි

කියනලද නිරොධසත්‍යයෙහිද නිර්‍වාණාධිගමයට උපායවූ මාර්‍ගසත්‍ය යෙහිද මුළාවීමෙන් දුක අහක් නොකළාවූ යම් යම් දිව්‍යබ්‍රහ්මාදි ආත්මභාවයන්හි යම් යම් දිව්‍යාදි ගතිවිශෙෂයන්හි දුක අහක්කළ සංඥ ඇතිව හෝ එසේම නිවන් ලැබීමට උපායමාර්‍ගීය නොවන්නාවූ යාගහොම කිරීම් ආදිය හා දුෂ්කර ක්‍රියා මිථ්‍යාතපොව්‍රත සමාදානාදි අයහපත් මාර්‍ගයන් නිවහ් පමුණුවන මාර්‍ගයයි සංඥ ඇතිව හෝ දුක්නැතිකිරීම පතමින් ඉහතකී යාගහොම දුෂ්කර ක්‍රියා මිථ්‍යා තපොව්‍රත සමාදානාදිවශයෙන් ත්‍රිවිධසංඝස්කාරයන් රැස්කිරීමට පවන්ගණී. එතකුදුවුවත් ත්‍රිවිධ සංඝස්කාරයන් රැස්කරන්නාවූ පුද්ගලයෙම චතුස්සත්‍යයන් මුවාකොට වැටහියනොදීසිටි අවිද්‍යාව ප්‍රහීණ නොකළබැවින් ජාති ජරා ව්‍යාධි මරණාදීවූ නොයෙක් සිය ගණන් ආදීනවයෙන් ගැවසීගත් කුශලඵලසංඛ්‍යාතවූ දුක දුකවශයෙන් නොදැනා ඒ දුක ලබානැණීම පිණිස කායවාරික වාග්වාරික මනොවාරික වශයෙන් ප්‍රභෙදවූ පුණ්‍යාභිසංඝස්කාරය උපදවයි. දෙවගනන් කැමති පුරුෂයෙක් මරුප්‍රපාතයකට බැසගන්නාක්මෙනි. සැපයයි සලකනලද ඒ පුණ්‍යඵලයාගේ අවසානයෙහි මහත් සන්තාපශබ්දය එපරිණාම දුඃඛයාගේ සවභාවද කැපීම් කෙටීම් විනිවිදීම් අඟපසඟ කැඩීම්බිඳීම් ආදී සැනසීමක් නැතිබවද නොදකිමින් හෝ යඵොකුන දුඃඛරාශියට හෙතුවූ කියනලද ප්‍රකාරවූම පුණ්‍යාභිසංඝස්කාරය උපදවයි කවරෙකුමෙන්ද පහන්සිළුවකරායන පලඟැටියෙකුමෙන් හා මිපැනිඟල්වනලද කඩුමුවත ලෙවකන්නාවූ අයෙකුමෙනි දුක්විපාකදායකවූ කාමසෙවනාදියෙහි දොෂ නොදක්නාවූ පුද්ගලයෙම සැපැයි යන සංඥවෙන්ද කෙලශයන් විසින් මැඩගෙණ ගිවිබැවින්ද කායවාරාදී දොරටු තුණෙන් අපුණ්‍යාභිසංඝස්කාරයන් රැස්කිරීමට පවන්ගණී කවරෙකු මෙන්ද මලමූත්‍රගෙණ කෙළි සෙල්ලන්කරන්නාවූ බාල දරුවකුමෙන් හා මැරෙණු කැමැති පුරුෂයෙකු විෂ අනුභවකරන්නාක්මෙනි.

අරූපාවචර කුශලඵලයෙහි සංඝස්කාරවිපරිණාම දුක අවබොධ නොකෙරෙමින් අරූපාවචර ආත්මභාවසංඛ්‍යාත ඵලය සදුකාලිකය යනාදිවශයෙන් වරදවා ලබ්ධිගෙණ චින්තාසංඝස්කාරවූ ආනෙඤ්ජාභිසංඝස්කාරයන් රැස්කිරීමට පවන්ගණී කවරෙක්මෙන්ද මන්මුලාවූවෙක් අමනුෂ්‍යයන්ගෙන් ගැවසීගත් නුවරකට බැසගන්නාක්මෙනි මෙසේ අවිද්‍යාවගේ ඇතිබැවින්ම සංඝස්කාරයන්ගේ ඇතිබව වේ. අවිද්‍යාව නැතිනම් සංඝස්කාරයන්ගේ ලැබීමක් නොවෙන්ද? එබැවින් කියනලද මේ සංඝස්කාරයෝ අවිද්‍යාප්‍රත්‍යයෙන්ම වෙත්යි දතයුතුයි. එහෙයින් තථාගතයන්වහන්සේ "අවිද්‍යා නිකඛවෙ

අවිජ්ජාගතෝ පුඤ්ඤාභිසංඛාරං අභිසංඛරොති'' යනාදිය වදාළ සේක.

අවිද්‍යාව සංඝස්කාරයට ප්‍රත්‍යයවන අයුරුද සංඝස්කාරාදිය විඤ්ඤාණාදියට ප්‍රත්‍යයවන අයුරුද මෙතැන්සිට ප්‍රස්ථානප්‍රකරණයෙහි ආනයින් දතයුත්තේය.

---

## ප්‍රස්ථානප්‍රකරණාගත සූචිසි ප්‍රත්‍යය.

එහි **"හෙතුප්‍රත්‍යය ආලම්බනප්‍රත්‍යය අධිපතිප්‍රත්‍යය අනන්තර ප්‍රත්‍යය සමනන්තරප්‍රත්‍යය සහජාතප්‍රත්‍යය අඤ්ඤමඤ්ඤප්‍රත්‍යය නිශ්‍රයප්‍රත්‍යය උපනිශ්‍රයප්‍රත්‍යය පුරෙජාතප්‍රත්‍යය පශ්චාජාත ප්‍රත්‍යය ආසෙවනප්‍රත්‍යය කර්මප්‍රත්‍යය විපාකප්‍රත්‍යය ආහාර ප්‍රත්‍යය ඉන්ද්‍රියප්‍රත්‍යය ධ්‍යානප්‍රත්‍යය මාර්ගප්‍රත්‍යය සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය විප්‍රයුක්තප්‍රත්‍යය අත්‍යිප්‍රත්‍යය නාස්‍යිප්‍රත්‍යය විගත ප්‍රත්‍යය අවිගතප්‍රත්‍යය"**යි ප්‍රත්‍යය ධර්ම හෙවත් උපකාරධර්මශක්තිහු සූචිසිදෙනෙක් දක්වනලදහ. ඔවුන් අතුරෙන් **හෙතුප්‍රත්‍යය කවරේද** "හෙතු හෙතුසම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං හෙතුපච්චයෙන පච්චයෝ" යි වදාළ වචන හෙයින් ලොභ වෙෂ මොහ අලොභ අවෙෂ අමොහ යන මේ චෛතසික ධර්මඝදන ඔවුන් සමග එකව උපදනා චිත්තචෛතසික ධර්මයන්ගේද රූපධර්මයන්ගේද සිටුවා පිහිටීමට උපකාරවන බැවින් හෙතුප්‍රත්‍යයයි කියනුලැබේ. රූපය දක්නා සිත්ද ශබ්දය අසන්නාවූ සිත්ද ගඳසුවද දුනගන්නා සිත්ද රසදුනගන්නා සිත්ද ස්පර්ශය දුනනන්නා සිත්ද රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ අරමුණුපස පිළිගන්නා සිත්ද එකී අරමුණුපස තීරණය කරණ සිත්ද එකී අරමුණුපස නිශ්චයවශයෙන් දුනගන්නාසිත්ද ලොභාදී සම්ප්‍රයුක්ත හෙතුරහිතවූ කාරණයෙන් දියපිට සෑදෙන මුල්වලින් බැඳ ගැණීමක්නැති දියසෙවෙල් ආදියමෙන්සවිරූකාරයෙන් නොපිහිටනි ධර්මයේ පෘථිවී ඔජස් ඇදගන්නාවූ වෘක්ෂමූලයෝ අඹ දඹ ආදී වෘක්ෂයන්ගේ සවිරවැ පිහිටීමට උපකාරවෙද්ද එමෙන් ලොභ වෙෂ මොහ අලොභ අවෙෂ අමොහ යන මේ හෙතුධර්ම සෑදෙන ඒ සමග උපදනා කුශලාකුශලාදි චිත්තචෛතසික ධර්මයන්ගේ හා ඒ සමග උපදනා පෘථිවීධාතුවාදි රූපධර්මයන්ගේ සවිරවැ පිහිටීමට මුල්වීමෙන් උපකාරවෙන්මය මෙසේ යම් යම් චිත්ත චෛතසික රූපධර්මයන්ගේ සවිරවැ පිහිටීමට මුල්වූ ලොභාදි හෙතු ධර්මඝදනාගෙන් උපකාරශක්තියෙක් ඇද්ද ඒ හෙතුප්‍රත්‍යයනම්.

**ආලම්බනප්‍රත්‍යය** කවරේද? අරමුණුවීමෙන් උපකාරවන ධර්මය ආලම්බනප්‍රත්‍යය නම්වේ. හේවනාගී රූපාරම්මණය, සද්දාරම්මණය, ගන්ධාරම්මණය, රසාරම්මණය, ඵොට්ඨබ්බාරම්මණය, ධම්මාරම්මණය යැයි ෂඩ්විධවේ. ඔවුන් අතුරෙන් "රූපායතනං—: පෙ: —ආරම්මණපච්චයෙන පච්චයෝ" යනාදීන් වදාළ හෙයින් රූපාරම්මණය රූප විශෙෂ දක්නා චිත්තයාගේ හා ඒ සිත සමග ඇතිවන චෙතසිකයන්ගේ පහළවීමට ආලම්බනප්‍රත්‍යයවේ හෙවත් අරමුණුවීමෙන් උපකාරවේ සද්දාරම්මණය ශබ්දවිශෙෂ අසන්නාවූ චිත්තයාගේ හා ඒ සිත සමග ඇතිවන චෙතසිකයන්ගේ පහළවීමට අරමුණුවීමෙන් උපකාරවේ ගන්ධාරම්මණය ගඳ සුවඳ ආඝ්‍රාණයකරන්නාවූ චිත්තයාගේ හා ඒ සිත සමග ඇතිවන චෙතසිකයන්ගේ පහළවීමට අරමුණුවීමෙන් උපකාරවේ රසාරම්මණය රසාස්වාදනය කරන්නාවූ චිත්තයාගේ හා ඒ සිත සමග ඇතිවන චෙතසිකයන්ගේ පහළවීමට අරමුණුවීමෙන් උපකාරවේ ඵොට්ඨබ්බාරම්මණය ස්පර්ශය දැනගන්නා චිත්තයාගේ හා ඒ සිත සමග ඇතිවන චෙතසිකයන්ගේ පහළවීමට අරමුණුවීමෙන් උපකාරවේ රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශය යන මේ අරමුණුපස ඒඅරමුණු ආවර්ජනාකරන්නාවූ පඤ්චද්වාරාවර්ජන චිත්තයාගේද එකී අරමුණුපස පිළිගන්නාවූ සම්ප්‍රතෙච්ඡන චිත්තයන්ගේද ඒ සිත් සමග ඇතිවන චෙතසිකයන්ගේද පහළවීමට අරමුණුවීමෙන් උපකාරවෙති රූපාරම්මණ සද්දාරම්මණ ගන්ධාරම්මණ රසාරම්මණ ඵොට්ඨබ්බාරම්මණ ධම්මාරම්මණ යන මේ අරමුණුසය කියනලද චිත්තචෙතසිකයන්කෙරෙන් පිටත් කුශලාකුසල විපාක ක්‍රියා චිත්තයන්ගේ හා ඒ සිත් සමග ඇතිවන චෙතසිකයන්ගේ පහළවීමට අරමුණුවීමෙන් උපකාරවෙති. යම් යම් රූපාදි අරමුණක් අරමුණුකොට යම් යම් චිත්තචෙතසික ධර්මයෝ උපදිද්ද ඒ ඒ රූපාදි අරමුණු ඒ ඒ චිත්තචෙතසිකයන්ගේ පහළවීමට අරමුණුවීම්වසයෙන්ම උපකාරවෙත්මය. යම් දුම්ල පුරුෂකෙණෙක් දණ්ඩක් හෝ අත්වැලක් හෝ සැරයටියක් හෝ අල්වාගෙණ නැගිසිටිද්ද ගමනාගමනය කෙරෙද්ද එමෙන් සත්ව ශක්තියෙන්නැගිසිටීමට අසමර්ථවූ චිත්තචෙතසිකධර්මයෝද රූපාදි අරමුණක් ඵල්බගෙණම උපදනාහුද පවත්නාහුද වෙති. මෙසෙහින් චිත්තචෙතසිකධර්මයන්ගේ උත්පත්තියට හා ප්‍රවෘත්තියට හෙතුවූ රූපාදි අරමුණුසය ආලම්බන ප්‍රත්‍යයයි කියනුලැබේ.

**අධිපති ප්‍රත්‍යය** කවරේද? ප්‍රධානත්වයට පැමිණීමෙන් උපකාරවූ ධර්මය අධිපති ප්‍රත්‍යයනම් හේ වනාහි සහජාතාධිපති ආරම්මණාධිපතිවසයෙන් ද්විප්‍රකාරවේ. "ඡන්දාධිපති ඡන්දසම්පයුත්තකානං

ධම්මානං තංසමුට්ඨානානංච රූපානං අධිපතිපච්චයෙන පච්චයෝ" යනාදීන් වදාළ හෙයිනි ඡන්දය කියනලද කැමැත්තද චේතසික වීරිය්‍යයද චිත්තයද වීමංසායයි කියනලද ප්‍රඥාවද යන මේ ධම්මයෝ සතරදෙන චිත්ත චෛතසික රූපධම්මයන්ගේ අධිපතිභාවය කරණ හෙයින් අධිපති ප්‍රත්‍යයධම්මදේනි යම් සමාගමෙක්හි අනික් සියළු සාමාජිකයන්ට සභාපතිතෙම යම්සේ අධිපතිවේද එමෙන් ධාතු ධම්ම සංගමෙහි සාමාජිකයන්වැනි චිත්ත චෛතසිකධම්මයන්ට හා රූපධම්මයන්ට සභාපතියෙක්වැනි ඡන්දචෛතසිකය කිසිකලෙක අධිපතිවන්නේය කිසිකලෙක වීරිය්‍යචෛතසිකයද කිසිකලෙක චිත්තයද කිසිකලෙක ප්‍රඥාචෛතසිකයද ප්‍රධානත්වයට පැමිණෙන් නාහුය. සභා සමාජයට සභාපතිතැනගෙන් ඇත්තාවූ උපකාරයමෙන් චිත්ත චෛතසික රූපධම්මයන්ට ඡන්දවීරිය චිත්තවීමංසා යන ධම්මයන් සතරදෙනාගෙන් ඇත්ත වූ උපකාරශක්තිය අධිපතිප්‍රත්‍යයයි කියනුලැබේ. ඡන්දය හෙවත් කැමැත්තම (සහජාතවශයෙන්) එකව ඉපදීම්වශයෙන් යම් කුශලාකුශලාදී ධම්මයන්හි අධිපතිබවට පැමිණියේවීනම් එය ඡන්දාධිපති කුශලය ඡන්දාධිපති අකුශලයයි ව්‍යවහාරබවටයේ එමෙන් වීරිය්‍යාදීහු යම් කුශලාකුශලාදීන්හි අධිපතිබවට පැමිණෙත්නම් ඒ කුශලාකුශලාදීහුද වීරිය්‍යාධිපති කුශලය වීරිය්‍යාධිපති අකුශලය යනාදි වශයෙන් ව්‍යවහාර බවටයෙත්. මේ සහජාතාධිපති ප්‍රත්‍යය නියමයයි. රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ ධම්ම ලම්බන යන අරමුණු අතුරෙන් යම් යම් අරමුණක් ගරුකිරීම් වශයෙන් ඡන්දවීරිය චිත්තවීමංසා යන යම් යම් ධම්මයෝ උපදනාහුද ඒ ඒ ඡන්දවීරිය චිත්තවීමංසා යන ධම්මයෝ ඒ ඒ රූපාදි ආරම්මණයන් පිළිබඳව අධිපති භාවයෙන් උපකාරවෙති මේ ආලම්බනාධිපති ප්‍රත්‍යය නියමයයි.

**අනන්තර ප්‍රත්‍යය** කවරේද? ආසන්නභාවයෙන් උපකාරවූ ධම්මය අනන්තර ප්‍රත්‍යය නම් යම් හෙයකින් චක්ඛුර්විඤ්ඤණයට අනන්තරව සම්ප්‍රතිච්ඡන චිත්තයද සම්ප්‍රතිච්ඡන චිත්තයට අනන්තරවැ සන්තීරණ චිත්තයද යන මේ ආදී චිත්තනියම යෙක්වේද ඒ නියමයතෙම පළමු පළමු උපදනා චිත්තවශයෙන්ම සිඛාවනුයේ අන්පරිද්දෙකින් සිඛනොවේමය එහෙයින් ඒ ඒ සිත්වලට අනන්තරවැ තදනුරූපවූ චිත්තයන්ගේ උත්පත්තියට ශක්තිමත්වූ ධම්ම නියාමයතෙම අනන්තර ප්‍රත්‍යයයි කියනුලැබේ. එහෙතින් ප්‍රඥප්ති ප්‍රකරණයෙහි "චක්ඛුවිඤ්ඤණධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තංසම්පයුත්තකානං ච ධම්මානං අනන්තරප්පච්චයේන පච්චයෝ මනොධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනො

විඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයෝ" යනාදිය වදාළ හේක. චක්ඛුවාර විථියෙහිලා චක්ඛුර්විඤ්ඤාණය අනන්තරප්‍රත්‍යයවීමෙන් සම්ප්‍රතිච්ඡනය සම්ප්‍රතිච්ඡනය අනන්තරප්‍රත්‍යයවීමෙන් සන්තීරණ චිත්තයද සන්තීරණ චිත්තය අනන්තරප්‍රත්‍යයවීමෙන් ව්‍යවස්ථාපන චිත්තයද පහළ්වේ. ශ්‍රෝත්‍රද්වාරාදී වීථීන්හිද මේ ක්‍රමයමැයි. "පුරිමා පුරිමාකුසලාධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයෝ"යනාදිය වදාළ හෙයින් ප්‍රථම කුශලජවන චිත්තය අනන්තරප්‍රත්‍යය වීමෙන් ද්විතීය කුශල ජවනචිත්තයද තදනන්තරවැ තෘතීය කුශලජවන චිත්තයද තදනන්තරවැ චතුර්ථ කුශලජවන චිත්තයද තදනන්තරවැ පඤ්චම කුශලජවන චිත්තයද තදනන්තරවැ ෂෂ්ඨ කුශල ජවන චිත්තයද තදනන්තරවැ සප්තම කුශලජවන චිත්තයද පහළ්වේ. අකුශලජවනනියමයද මේ ක්‍රමයෙන්දතයුතුයි. මෙපරිද්දෙන් පළමු පළමු උපදනා අව්‍යාකෘතධර්ම පසුව පසුව උපදනා කුශලධර්මයන්ට හෝ අකුශලධර්මයන්වද පළමු පළමු උපදනා කුශලධර්ම හෝ අකුශලධර්ම පසුව පසුව උපදනා අව්‍යාකෘත ධර්මයන්වද අනන්තර ප්‍රත්‍යයවීමෙන් උපකාරවෙත්මය. මෙහි සම්පූර්ණභාවය පිඹුකොට චිත්තවීථියක් ගෙණහැරදක්වා පහදාදෙන්නමු. රූපාරම්මණයක් අරබයා චක්ඛුවාරයෙහි උපදනා චිත්තසන්තතිය මෙසේය. 1 වෙනුව. අතීතභවාඞ්ගචිත්තය ඉපිද නිරුද්ධවූ කල්හි 2. වනුව භවාඞ්ගචලනචිත්තයද එයනිරුද්ධවූ කල්හි 3. වනුව භවාඞ්ගුපච්ඡේදචිත්තයද; එය නිරුද්ධවූකල්හි 4. වනුව පඤ්චද්වාරාවජ්ජන චිත්තයද එය නිරුද්ධවූ කල්හි 5. වනුව චක්ඛුර්විඤ්ඤාන චිත්තයද එය නිරුද්ධවූ කල්හි. 6. වනුව සම්ප්‍රතිච්ඡන චිත්තයද එය නිරුද්ධවූ කල්හි. 7. වනුව සන්තීරණ චිත්තයද එය නිරුද්ධවූ කල්හි 8. වනුව ව්‍යවස්ථාපන චිත්තයද එය නිරුද්ධවූ කල්හි පිළිවෙළින්. 9. 10. 11. 12. 13. 14. 15. වන ජවන් සිත්සතද ඒ සිත් නිරුද්ධවූ කල්හි. 16. 17. වනුව තදුලම්බන සිත්දෙකක්ද පහළ්වචිත්ත වීථිය අවසන්වේ. මේ වීථියෙහි 1. 2. 3. 4. 5. 6. 7. 8. වන චිත්තයෝ අව්‍යාකෘතවෙති. 9. 10. 11. 12. 13. 14. 15. වන චිත්තයෝ කුසල් හෝ අකුසල් හෝ වෙති. 16. 17. වන සිත් අව්‍යාකෘතවෙති. මේ චිත්තවීථිය අනුක්‍රමයෙන් සලකා බලනවිට අව්‍යාකෘත සිත් අව්‍යාකෘත සිත්වලට අනන්තර ප්‍රත්‍යය වනබවත් අව්‍යාකෘත සිත් කුසල් සිත්වලට නැතහොත් අකුසල් සිත්වලට අනන්තරප්‍රත්‍යය වනබවත් කුසල් සිත් කුසල් සිත්වලට නැතහොත් අකුසල් සිත් අකුසල් සිත් වලට අනන්තරප්‍රත්‍යය වන බවත් කුසල් සිත් අව්‍යාකෘත සිත්වලට නැතහොත් අකුසල් සිත් අව්‍යාකෘත සිත්වලට අනන්තර

ප්‍රත්‍යය වන බවත් වැටහී යනවා ඇත. මේසේ යම් යම් චිත්ත චෛතසික ධර්මකෙනෙකුන්ට අනතුරුව යම් යම් චිත්තචෛතසික ධර්මකෙනෙක් උපදින්නම් ඒ ඒ ධර්මයෝ ඒ ඒ ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යයවේමෙන්ම උපදිති. මේ අනන්තරප්‍රත්‍යය නියමයයි. **සම නන්තර ප්‍රත්‍යයද** අනන්තර ප්‍රත්‍යයෙහි කීනයින් දතයුතුයි.

**සහජාතප්‍රත්‍යය කවරේද?** උපදින්නාවූ යම් ධර්මයක් තමත් සමග එකවම උපදින්නාවූ ධර්මයන්ට උපකාරවේ නම් ඒ සහජාත ප්‍රත්‍යයනම් ප්‍රදීපාසිඛාව සමග එකවට ඇතිවන ප්‍රදීපාලෝකයමේද සඳ හිරු දෙදෙනාගේ උදාවීම සමග එකවිට ඇතිවන ඔවුන්ගේ ආලෝකයවේද දතයුතුයි "චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤං සහජාතපච්චයේන පච්චයෝ" යනාදිය වදාළකෙයින් වේදනාසකන්ධ සඤ්ඤාසකන්ධ සංඛාරසකන්ධ විඤ්ඤාණසකන්ධ යන මේ අරූපි සතර දෙනා යම් කලෙකැ උපදින්නම් ඔවුනොවුන් ලබත්වමොහොඉපිද සමග එකවට ඉදිරිපසුනොව උපදින්නාය. එසේම පඨවීධාතු ආපොධාතු තෙජෝධාතු වායෝධාතු සතරදෙනද යම් කලෙකැ සංසන්දනික අවිනිභෝග වස්තූන්හි උපදින්නම් තනි තනිව නොඉපිද ඔවුනොවුන් සම්බන්ධවීමෙන් ඉදිරිපසුනොව එක වටම උපදිති ඒ එසේමැයි ගස් ගල් පර්වතාදියෙහි තද රළු ගුණ අධිකබැවින් පෘථිවීධාතුවය යන ව්‍යවහාරය ඇත්තේවීනමුදු ඒ සමග ආපෝ තෙජෝ වායෝ යන ඉතිරි මහාභූතයෝ පවත්නාහුමය ඇලුදෙලු ගඟ සමුද්‍රාදි ජලයෙහි ඇගිරෙන බැඳෙන ගති අධිකබැවින් ආපෝධාතු යන ව්‍යවහාරය ඇත්තේවීනමුදු ඒ සමග පඨවී තෙජෝ වායෝ යන ඉතිරි මහාභූතයෝ පවත්නාහුමය. ගින්නෙහි දවන උණුසුම්ගුණ අධික බැවින් තෙජෝධාතු යන ව්‍යවහාරය ඇත්තේවී නමුත් ඒ සමග පඨවී ආපෝ වායෝ යන ඉතිරි මහාභූතයෝ පවත්නාහුමය සුළඟෙහි සොලවන පුරවනගුණ අධිකබැවින් වායෝධාතුවය යන ව්‍යවහාරය ඇත්තේවීනමුදු ඒ සමග පඨවී ආපෝ තෙජෝ යන ඉතිරි මහාභූතයෝ පවත්නාහුමය මෙසේ පෘථිවීධාතු ආපෝධාතු තෙජෝධාතු වායෝධාතු සතරදෙනාගේ සියළුකල්හි සියළුතැන එකවි පැවැත්ම සහජාතප්‍රත්‍යය ශක්තියෙනැයි දතයුතුයි. එසේම පඤ්චවොකාර භවයෙහි පිළිසිඳ ගන්නාකෙණෙහි නාමධර්මසඞ්ඛ්‍යාත ප්‍රතිසන්ධි විඤ්ඤාණය හා චෛතසිකයන් රූපධර්මසඞ්ඛ්‍යාත හෘදයදශක භාවදශක වස්තුදශකාදි රූපකලාපයන් ඔවුනොවුන් සම්බන්ධවීමෙන් ඉදිරිපසුනොවැ සමග එක විට පහළවීමද එසේම භූමියෙන් මතුවන වැලිහතුමස්සකයෙන් පය්ගණු මතුවන්නාක්මෙන් චිත්ත චෛතසිකයන් උපදින

උපදින කෙණෙහි ඒ සමග ඉදිරිපසුනොවැ චිත්තජරූපයන්ගේ පහළවීමද එසේම බාහ්‍යසන්තානයෙහි සතරමහාභූතයන්ගේ හා වණී ගන්ධ රස ඕජාර ශබ්දතීන්ගේ එකවිට පහළවීමද අධ්‍යාත්මික සන්තානයෙහිනම් සතරමහාභූතයන්ගේ හා චක්ඛුප්‍රසාද ශ්‍රොත්‍ර ප්‍රසාද ඝ්‍රාණප්‍රසාද ජිව්හාප්‍රසාද කායප්‍රසාදවණී ගන්ධ රසාදී සූවිසි උපාදාය රූපයන්ගේ සුදුසු පරිද්දෙන් එකවිට පහළවීමද එසේම යම් යම් භවයෙක්හි හෘදයවස්තුරූපය ඇතිවේනම් ඒ ඒ භවයෙහි හෘදයවස්තුරූපය සමග ඉදිරිපසුනොවැ අරූපීධර්මයන්ගේ හෙවත් චිත්ත චෛතසිකධර්මයන්ගේ එකවිට පහළවීමද සහජාත ප්‍රත්‍යය ශක්තියෙනැයි දතයුතු.

**අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය කවරේද?** ඔවුනොවුන් උපදවාලීමෙහි උපස්ථම්භවීමෙන් උපකාරවූ ධර්මශක්තිය අන්‍යොන්‍යප්‍රත්‍යයයි. යම් සේ දඬුකැබලි තුණක් ඔවුනොවුන් සම්බන්ධවන හැටියට තුබුකල්හි බිම්නොවැටෙන පරිද්දෙන් පිහිටවාලිය හැක්කේද එමෙන් රූපා රූපධර්මයන්ගේ ඔවුනොවුන් උපස්ථම්භකවීමෙන් පැවැත්ම අන්‍යොන්‍ය ප්‍රත්‍යයනම්. හේ කෙසේදයත් වේදනාස්කන්ධයතෙම සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණ සහිතතුණසම්නද සංඥාස්කන්ධය වේදනාසඞ්ඛාර විඤ්ඤාණ සහිතතුණේ සමගද සංස්කාරස්කන්ධය වේදනාසඤ්ඤා විඤ්ඤාණ සහිතතුණ සමගද විඤ්ඤාණස්කන්ධය වේදනාසඤ්ඤා සඞ්ඛාර සහිතතුණ සමගද ඔවුනොවුන් උපස්ථම්භවීමෙන් පැවැත්ම අන්‍යොන්‍යප්‍රත්‍යය ශක්තියෙනැයි දතයුතුයි. තවද පඨවීධාතුව ඉතිරි මහාභූතත්‍රය සමගද ආපොධාතුව ඉතිරි මහාභූතත්‍රය සමගද තේජෝධාතුව ඉතිරි මහාභූතත්‍රය සමගද වායෝධාතුව ඉතිරි මහාභූතත්‍රය සමගද ඔවුනොවුන් සම්බන්ධවීමෙන් පැවැත්මත් අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙනැයි දතයුතුයි. එසේම පිළිසිඳගන්නා අවස්ථාවේදී ප්‍රතිසන්ධිචිත්තය හා චෛතසිකධර්ම කායදශක හෘදශක වස්තුදශකාදී රූපධර්මයන් හා කායදශකාදී රූපධර්ම ප්‍රතිසන්ධිචිත්ත චෛතසිකධර්මයන් හා ඔවුනොවුන් සම්බන්ධවැ උපස්ථම්භකවැ පැවැත්ම අන්‍යොන්‍යප්‍රත්‍යය ශක්තියෙනැයි දතයුතුයි මේ අන්‍යොන්‍ය ප්‍රත්‍යය නියමයයි.

**නිශ්‍රයප්‍රත්‍යය කවරේද?** ආධාරවශයෙන්ද නිශ්‍රයස්ථානවශයෙන්ද උපකාරවූ ධර්මය නිශ්‍රයප්‍රත්‍යයනම් ඒ චිත්තාදී වස්තූන්ගේ පිහිටීමට ආධාරවූ පොළොවෙන්ද සිත්නම්කිරීම් ආදියට ආධාරවූ භිත්තාදී වස්තු කඩදැසියෙන්ද උපකාරවූ ධර්මරීතියකි. කෙසේදයත්? වේදනාස්කන්ධය සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණ සහිතත්‍රයද සංඥාස්කන්ධය වේදනා සඞ්ඛාර විඤ්ඤාණ සහිතත්‍රයද සංස්කාරස්කන්ධය වේදනා සඤ්ඤා විඤ්ඤාණ සහිතත්‍රයද විඤ්ඤාණස්කන්ධය

වෙදනා සංඥා සංඛාරඝනඛන්ධත්‍රයද ඇසුරුකොටගෙණ ආධාරකොට ගෙණ ඉපදීමද පෘථිවීධාතුවාදී එක් එක් මහාභූතයෙක් ආපොධාතුවාදී අනික් අනික් මහාභූතයන් ඇසුරුකොටගෙණ ආධාරකොට ගෙණ ඉපදීමද පිළිසිඳගන්නාකෙණෙහි ප්‍රතිසන්ධිචිත්තය හා චෛතසිකධර්ම රූපකලාපයන් ඇසුරුකොටගෙණ ආධාරකොටගෙණ රූපකලාපයන් ප්‍රතිසන්ධිචිත්තය හා චෛතසිකධර්ම ආධාරකොට ගෙණ ඇසුරුකොටගෙණ ඉපදීමද තවද චිත්තචෛතසිකධර්මයෝ චිත්තසමුට්ඨාන රූපධර්මයන්ටද සතරමහාභූතරූපයෝ උපාදාය රූපයන්ටද නිශ්‍රයප්‍රත්‍යයවීමෙන් ආධාරශක්තිවශයෙන් උපකාර වෙති. තවද ඇසේ පිහිටාතිබෙන චක්ෂුඃප්‍රසාදරූපය රූපයදක්නා චිත්තචෛතසිකධර්මයන්ගේ පැවැත්මටද කණෙහි පිහිටාතිබෙන ශ්‍රෝත්‍රප්‍රසාදරූපය ශබ්දය දැනගන්නා චිත්ත චෛතසිකයන්ගේ පැවැත්මවද නාසයේ පිහිටාතිබෙන ඝ්‍රාණප්‍රසාදය ගඳ සුවඳ දැනගන්නා චිත්තචෛතසිකයන්ගේ පැවැත්මටද දිවෙහි පිහිටාතිබෙන ජිහ්වාප්‍රසාදරූපය රස දැනගන්නා චිත්තචෛතසිකයන්ගේ පැවැත්මටද ශරීරයේ ව්‍යාපනවතිබෙන කායප්‍රසාදරූපය ඵස්සය දැනගන්නා චිත්තචෛතසිකයන්ගේ පැවැත්මටද හෘදයවස්තුරූපය පඤ්චවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වොට්ඨප්පන ජවන තදාලම්බනාදි චිත්තචෛතසිකයන්ගේ පැවැත්මටද නිශ්‍රයස්ථාන ආධාරස්ථාන වශයෙන් උපකාරවෙත්මැයි. මේ නිශ්‍රයප්‍රත්‍යයනියමයයි.

**උපනිශ්‍රය ප්‍රත්‍යය** කවරේද? බලවත් කරුණුවීමෙන් උපකාරවූ ධර්මශක්තියතෙම උපනිශ්‍රයප්‍රත්‍යයනම්. හේතූනාහි ආලම්බනූපනිශ්‍රය අනන්තරූපනිශ්‍රය ප්‍රකෘත්‍යූපනිශ්‍රයවශයෙන් බුන්වැදුරුම්වේ. ඔවුන් අතුරෙන් දන්දී සිල්රැක්ක පෙහෙවස් සමාදන්ව එකී කුශලධර්මයන් ගරුකොට ප්‍රත්‍යවෙක්ෂාකෙරේද පෙර පුරුදු නළ යම් යම් කුශලක්‍රියාවක් ගරුකොට ප්‍රත්‍යවෙක්ෂාකෙරේද ප්‍රථම ධ්‍යානාදි ධ්‍යානයකින් නැගීසිට ඒ ඒ ධ්‍යානයන් ප්‍රත්‍යවෙක්ෂාකෙරේද සප්තවිධ ශෛක්ෂපුද්ගලයෝ ලොකෝත්තරචිත්තය ගරුකොට ප්‍රත්‍යවෙක්ෂාකෙරද්ද එසේම ලෞකිකචිත්තය ගරුකොට ප්‍රත්‍යවෙක්ෂාකෙරද්ද සප්තවිධ ශෛක්ෂපුද්ගලයෝ මාර්ගඵලයන් නැගීසිට මාර්ගසිත් ගරුකොට ප්‍රත්‍යවෙක්ෂාකෙරෙද්ද එකල්හි පළමු පළමු කුශලධර්මයෝ පසුව පසුව උපදනා කුශලධර්මයන්ට ආලම්බනූපනිශ්‍රය වශයෙන් උපකාරවෙත්. මේ ආලම්බනූපනිශ්‍රයප්‍රත්‍යය නානාවිත්ත ඒකීවශයෙන් සිවිසි. අනාගතයෙහි ඉක්මගියාවූ චිත්තයන්ගේ වශයෙන් පළමු පළමු උපදනා කුශලධර්මයෝ පසුව පසුව උපදනා කුශලධර්මයන්ට බලවත් කරුණුවීමෙද්ද මේ අනන්තරූපනිශ්‍රයනාම්. තමතමන්ගේ සන්තානයෙහි ගැටගන්න ශ්‍රද්ධා ශීල ශ්‍රැත ත්‍යාග ප්‍රඥා

ගුණාදිය හෝ සෙවනයකරණලද සෘතුභොජනාදිය හෝ ප්‍රකෘත්‍යුප නිශ්‍රයනම්. යමෙක් යම් ශ්‍රද්ධාවක් නිසා දන්දේද සිල්රකීද පෙහෙවස් සමාදන්වේද ධ්‍යාන විදර්ශනා මාර්ගඵල අභිඥ සමාපත්තීන් උපදවාද එසේම යමෙක් යම් සිලයක් නිසා යම් බහුශ්‍රැතභාවයක් නිසා යම් පරිත්‍යාග ගුණයක්නිසා යම් ප්‍රඥාවක්නිසා දන්දේද සිල්රකීද පෙහෙවස් සමාදන්වේද ධ්‍යාන විදර්ශනා මාර්ගඵල අභිඥ සමාපත්තීන් උපදවාද එසේම යමෙක් පුගලඋසපපාය හොජනසපපයාදිය නිසා ඉහතකී ගුණධර්මයන් සාත්කෙරේද ඔහුගේ ඒ ශ්‍රද්ධා ශීල ශ්‍රැත ත්‍යාග ප්‍රඥා සංඛ්‍යාතවූ පළමු පළමු කුශලධර්මයෝ පසුව පසුව උපදනා දානශීලාදි කුශලධර්මයන්ට ප්‍රකෘත්‍යුපනිශ්‍රයවශයෙන් උප කාරවෙති මෙපරිද්දෙන් පළමු පළමු කුශලධර්ම පසුවපසුව උපදනා කුශලධර්මයන්ට ආලම්බනුපනිශ්‍රය අනන්තරූපනිශ්‍රය ප්‍රකෘත්‍යුප නිශ්‍රයවශයෙන් උපකාරයන්නාක්මෙන් පළමු පළමු කුශලධර්මයෝ පසුව පසුව උපදනා ඇතැම් අකුශල ධර්මයන්ට නානාවිතතාවිත්ත ඔලා ආලම්බනුපනිශ්‍රය ප්‍රකෘත්‍යුපනිශ්‍රය යන භේදයාකාරයෙන් උප කාරවෙති. කෙසේදයත් ? දන්දී සිල්රැක පෙහෙවස් සමාදන්ව එහී කුශලයන් ආශ්වාදයකිරීම්වශයෙන් රාගය උපදවාගණිනම් දෘෂ්ටිය උපදවාගණිනම් පූජිතයෙහි පුරුදුකල පින්කම් සලකා රාගය හෝ දෘෂ්ටිය හෝ උපදවා ගණිනම් ධ්‍යානයෙන් නැගීසිටා තමාලත් ධ්‍යානය ගැණ රාගය හෝ දෘෂ්ටිය හෝ උපදවාගණිනම් එසමයෙහි පළමු පළමු කුශලධර්ම පසු පසු උපදනා අකුශලධර්මයන්ට ආලම්බ නුපනිශ්‍රයවශයෙන් උපකාරවෙති යම් යම් සන්තානානත ශ්‍රද්ධාශීල ශ්‍රැත ත්‍යාග ප්‍රඥාදි කුශලධර්මයන් නැණ ආස්වාදාභිනන්දනවශයෙන් රාගය හෝ දෘෂ්ටිය හෝ මානය හෝ ඊර්ෂ්‍යය හෝ මෝහය හෝ උපදින්නාම් පළමු පළමු කුසල් පසු පසු උපදනා අකුසල්වලට ප්‍රකෘ ත්‍යුපනිශ්‍රයවශයෙන් උපකාරවෙති. මෙපරිද්දෙන් පළමු පළමු අකුසල් පසු පසු උපදනා අකුශලයන්වද පළමු පළමු අකුසල් පසු පසු උපදනාකුශලයන්වද පළමු පළමු කුසල් පසුපසු උපදනා අබ්‍යා කෘතයන්ටද පළමු පළමු උපදනා අකුසල් පසු පසු උපදනා අබ්‍යා කෘතයන්ටද පළමු පළමු උපදනා අබ්‍යාකෘත පසු පසු උපදනා අබ්‍යාකෘතයන්ටද අනුරූපපරිද්දෙන් උපනිශ්‍රයවීමෙන් හෙවත් බල වත් කරුණුවීමෙන් උපකාරවෙති. මේ උපනිශ්‍රය ප්‍රත්‍යයයි.

**පුරෙජාත ප්‍රත්‍යය** කවරේද ? පූජිතයෙහි ඉපිද පැවති ධර්මයන් ගේ වශයෙන් උපකාරවූ ධර්මයකෙම පුරෙජාතප්‍රත්‍යයනම්. චක්ෂුඃ ප්‍රසාදරූපය ඉපිද පැවති බැව්න් පසුව උපදනා චක්ෂුර් විඥාන චෛතස්කධර්මයන්ගේ පහළවීමට පුරෙජාත ප්‍රත්‍යයවශයෙන් උප කාරවේ. එමෙන්ම පූජිතයෙහ ඉපිද පැවති ශ්‍රොත්‍රප්‍රාසාදරූපය ඝ්‍රාන

ප්‍රසාදරූපය ජිව්හාප්‍රසාදරූපය කායප්‍රසාදරූපය පසුව උපදනා ශ්‍රොත්‍රවිඤ්ඤාණ ඝ්‍රාණවිඤ්ඤාණ ජිව්හාවිඤ්ඤාණ කායවිඤ්ඤාණ චිත්තසෛතසික ධර්මයන්ගේ පහළවීමට පුරෙජාතවශයෙන් උපකාරවේ. එසේම පළමුවෙන් පහළවී පැවැත්තාවූ රූපාරම්මණ සද්දාරම්මණ ගන්ධාරම්මණ රසාරම්මණ පොට්ඨබ්බාරම්මණයෝද චක්ඛුර්විඤ්ඤාණාදී චිත්තසෛතසිකයන්ගේ ඇතිවීමට පුරෙජාත ප්‍රත්‍යයවේ. පූර්වයෙහි හටගෙණ නිරුද්ධවූ රූපාදි අරමුණුවල සහ හෘදය වස්තු රූපයාගේ පූර්වයෙහි පහළවීනිරුද්ධවීම මනොධාතු මනොවිඤ්ඤාණධාතුන්ගේ ඇතිවීමට අනුරූපපරිද්දෙන් පුරෙජාත ප්‍රත්‍යවේ.

**පශ්චාජ්ජාත ප්‍රත්‍යය** කවරේද? පූර්වයෙහි හටගෙණ නිරුද්ධවූ රූපධර්මයන්ට උපස්ථම්භකවීමෙන් උපකාරවූ අරූපධර්මසමූහය පසුව ඉපිද ඉපිද රැකුල්දෙන අවස්ථායෙන් පශ්චාජ්ජාතප්‍රත්‍යය නම් වේ. ඒ කෙසේදයත්? ගිජුලිහිනිපැටවුන්ගේ ශරීරයන්ට පසුව ඇතිවන ආහාරතෘෂ්ණා චෙතනාව රැකුල්දෙන්නාක් මෙනි, එහෙයින් වදාළසේක. "පච්ඡාජාතා චිත්තාචෙතසිකාධම්මා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස පච්ඡාජාතපච්චයෙන පච්චයෝ"යි.

**ආසෙවනප්‍රත්‍යය** කවරේද? අනන්තරූ අනන්තරූධර්මයන්ගේ බලවත් පරිවර්තනාවයෙන් හෙවත් බලවත් පුරුද්දෙන් උපකාරවූ ධර්මශක්තිය ආසෙවන ප්‍රත්‍යයනම්. පළමු පළමු භද්‍රාල ග්‍රන්ථාදිය පසු පසු හදාරණ ග්‍රන්ථයන්ටද පළමු පළමු අභ්‍යාසකළ ශිල්ප පසු පසු අභ්‍යාස කරන්නාවූ ශිල්පයන්ටද යම්සේ උපකාරවේද්ද එමෙනි එහි පළමු පළමු කුශලජවන් පසු පසු උපදනා කුශලජවනයන්ටද පළමු පළමු අකුශලජවන් පසු පසු උපදනා අකුශල ජවනයන්ටද පළමු පළමු ක්‍රියාජවන් පසු පසු උපදනා ක්‍රියාජවනයන්ටද ආසෙවනප්‍රත්‍යයවශයෙන් හෙවත් බලවපරිවර්තනවශයෙන් උපකාරවේ.

**කම්ප්‍රත්‍යය** කවරේද? චිත්තප්‍රයෝගයෙහි කියන්නාවූ ක්‍රියාවන්ගේ වශයෙන් උපකාරවූ ධර්මශක්තිය කම්ප්‍රත්‍යයනම්වේ. ඒ කම්ප්‍රත්‍යය වනාහී නානාක්ෂණික කුශලාකුශල චෙතනාවන්ගේ වශයෙන්ද සහජාතකුශලාකුශල චෙතනාවන්ගේ වශයෙන්ද දෙවැදෑරුම්වේ නොයෙක්වට හොයෙන් හවයෙහි රැස්කරනලද කුශලාකුශල චෙතනාවෝ විපාකසන්තානයන්ට හා කම්යෙන් හටගන්නාවූ රූපධර්මයන්ට නානාක්ෂණික කම්ශක්තිවශයෙන් උපකාරවෙත් සහජාතවශයෙන් හෙවත් ඒ ඒ කුශලාකුශල සිත්සමඟ උපදනා චෙතනාවෝ තදන්‍යවූ චිත්තචෛතසිකධර්මයන්ට සහජාත කම්ශක්තිවශයෙන් උපකාරවෙති.

**විපාකප්‍රත්‍යය** කවරේද ? උත්සාහවිරහිතව සැසුන්ලීලාවෙන් නිරුත්සාහවත්වූ ධර්මයන්ට උපකාරවූ ධර්මශක්තිය විපාකප්‍රත්‍යය නම්වේ ඒ විපාකප්‍රත්‍යය වනාහි භවඞ්ගාදි විපාකචිත්තයන් පැවත්නා ඇසිල්ලෙහි ඒ සිත් සමඟ උපදනා රූපධර්මයන්ටද ප්‍රතිසන්ධිස්ෂණයෙහි ඇතිවූ ප්‍රතිසන්ධිවිපාකචිත්තය ඒ සමඟ එකට උපදනා කායදශක භාවදශක වස්තුදශකාදි කර්මජරූපයන්ටද අතීතභවඞ්ග භවඞ්ගචලන භවාඞ්ගුපච්ඡේද විපඤ්චනා විඤ්ඤත්ති සන්ධි රණ තදාලම්බණ වුතිපටිසන්ධි භවාඞ්ගාදිවශයෙන් ප්‍රවෘත්තවූ සියළු විපාකචිත්තයන්ගේ පැවැත්ම ඒ හා සමඟ යෙදුනාවූ චෛතසිකයන්වද නිරුත්සාහ භාවයෙන් උපකාරවේද හේ විපාකප්‍රත්‍යයනම්.

**ආහාරප්‍රත්‍යය** කවරේද ? රූපාරූපධර්මයන්ට අනුබලදීම්වශයෙන් උපකාරවූ කබලිඞ්කාරාහාර ඵස්සාහාර මනොසඤ්චෙතනාහාර විඤ්ඤාණාහාර යන මේ සතරදෙන ආහාරප්‍රත්‍යයනම්වේ. කාබොහු ලබන ආහාරපානාදියෙන් වැඩී ශරීරයෙහි නාහරවැල් අනුසාරයෙන් පැතිරීගිය ඔජාශක්තියතෙම මේරූපකලෙබරයට ආහාරප්‍රත්‍යයවීමෙන් උපකාරවේ ඵස්සාහාර මනොසඤ්චෙතනාහාර විඤ්ඤාණාහාර යන මේ අරූපී අදෘශ්‍ය ආහාරයෝතුන්දෙන ඔවුන්සමඟ යෙදුනාවූ චිත්තචෛතසිකධර්මයන්ට හා ඔවුන් සමඟ උපදනා රූපධර්මයන්වද ආහාරප්‍රත්‍යයවීමෙන් උපකාරවෙති.

**ඉන්ද්‍රියප්‍රත්‍යය** කවරේද ? චක්ඛුරින්ද්‍රිය චක්ඛුර්විඤ්ඤාණයට හා ඒ සමඟ ඇතිවන චෛතසිකයන්ට අධිපතිකෘත්‍යය සිද්ධකිරීමෙන් උපකාරවේ. එසේම ශ්‍රොත්‍රෙන්ද්‍රිය ඝ්‍රාණෙන්ද්‍රිය ජිව්හෙන්ද්‍රිය කායෙන්ද්‍රිය යන මොහුද ශ්‍රොත්‍රවිඤ්ඤාණ ඝ්‍රාණවිඤ්ඤාණ ජිව්හාවිඤ්ඤාණ කායවිඤ්ඤාණ යන්ට හා ඒ සමඟ ඇතිවන චෛතසිකයන්ට අධිපතිකෘත්‍යය සිද්ධකිරීමෙන් උපකාරවේ. රූපජීවිතෙන්ද්‍රිය කර්මජරූපයන්ට අධිපතිකෘත්‍යය සිද්ධකිරීමෙන් උපකාරවේ අරූපී ඉන්ද්‍රියයෝ නම්වන් සඞ්ඛ්‍යා විරිසින්ද්‍රිය සතින්ද්‍රිය සමාධින්ද්‍රිය ප්‍රඥෙන්ද්‍රියයනාදී අදෘශ්‍යවූ ඉන්ද්‍රිය ධර්මයෝ ඒ සමඟ උපදනා චිත්තචෛතසිකධර්මයන්ට ඉන්ද්‍රියප්‍රත්‍යය වශයෙන් හෙවත් අධිපතිකෘත්‍යය සිද්ධකිරීමවශයෙන් උපකාරදෙති.

**ධ්‍යානප්‍රත්‍යය** කවරේද ? විතර්ක විචාර ප්‍රීති සුඛ එකාග්‍රතා යන ධ්‍යානාඞ්ගවූ චෛතසිකයෝ ඔවුන් සමඟ යෙදුනාවූ චිත්තචෛතසිකධර්මයන්ට හා ඔවුන් සමඟ එකට උපදනාවූ රූපධර්මයන්ට ධ්‍යානප්‍රත්‍යය වශයෙන් උපකාරවෙත්.

**මාර්ගප්‍රත්‍යය** කවරේද ? සම්මාදිට්ඨියෙහි කියනලද අමොහ චෛතසිකයද සම්මාසඞ්කප්පයෙහි කියනලද විතර්ක චෛතසිකයද සම්මාවාචා සම්මාකම්මන්තා සම්මාආජීව චෛතසිකයෝද සම්මා

වායාමයයි කියනලද වීර්යීවෛතසිකයද සම්මාසතියයි කියනලද සතිවෛතසිකයද සම්මාසමාධියයි කියනලද එකාග්‍රතා වෛතසිකයද යන මේ මාගීඞ්ග වෛතසිකයෝ අටදෙන ඔවුන් සමග යෙදුනාවූ චිත්තවෛතසිකධර්මයන්ට හා ඔවුන් සමග ඇතිවන රූපධර්මයන්ට මාගීප්‍රත්‍යය භාවයෙන් උපකාරවෙත්මය.

**සම්ප්‍රයුක්තප්‍රත්‍යය** කවරේද ? එකම චක්ෂුඃප්‍රසාදාදී වස්තුවක් ඇසුරුකිරීම එකට නිරුඬවීම එකට ඉපදීම එසේම අරමුණෙක්හි ක්‍රියාකිරීමයයි කියනලද චතුර්විධ සම්ප්‍රයොගභාවයෙන් උපකාරවූ ධර්මශක්තිය සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය නම්වේ. ඒ වනාහි "චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤං සම්පයුත්තපච්චයේන පච්චයෝ" යන්නෙන් වදාරණලදි. එහි අදහස මෙසේයි. සතර අරූපී සඤ්ඤා වේදනා සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණ යන සඤ්ඤාවෝ සතරදෙනා ඔවුනොවුන් එකට උපදනා බැවින්ද එකට නිරුඬවන බැවින්ද එක අරමුණෙක්හිම ක්‍රියාකරණ බැවින්ද චක්ෂුප්‍රසාදාදී යම්කිසි එකම වස්තුවක් ආශ්‍රයකොට පවත්නා බැවින්ද චතුර්විධ සම්ප්‍රයොග ලක්ෂණයෙන් යුක්තවනාහෙයින් සම්ප්‍රයුක්තප්‍රත්‍යය ශක්තියයි කියනුලැබේ.

**විප්‍රයුක්තප්‍රත්‍යය** කවරේද? එකවස්තුක එකාරම්මණ එකුපපාද එකනිරෝධභාවයට නොපැමිණීමෙන් උපකාරවූ ධර්මයතෙම විප්‍රයුක්තප්‍රත්‍යය නම්වේ. රූපීධර්මයෙහෙවත් ද්‍රව්‍යධර්ම අරූපීධර්මයන්ට හෙවත් අද්‍රව්‍යවූ චිත්තවෛතසික ධර්මයන්ට එකට ඉපදීම් එකට නිරුඬවීම් එක අරමුණක ක්‍රියාකිරීම් එනවස්තුවක් ඇසුරුකිරීම් ආදී මේ චතුර්විධ සම්ප්‍රයොගලක්ෂණ නැතිව ඉපිද උපකාරවන හෙයින් විප්‍රයුක්තප්‍රත්‍යයයි කියනුලැබේ. එසේම අරූපීධර්මී හෙවත් චිත්තවෛතසිකධර්ම රූපීධර්මයන්ට හෙවත් ද්‍රව්‍යධර්මයන්ට කියනලද චතුර්විධ සම්ප්‍රයොගලක්ෂණ නැතිව ඉපිද උපකාරවන හෙයින් විප්‍රයුක්තප්‍රත්‍යයයි කියනුලැබේ.

**අඝනිප්‍රත්‍යය** කවරේද? පවත්නා කාලයෙහි විද්‍යමානලක්ෂණය ඇතිබැවින් උපකාරවූ ධර්මශක්තිය අඝනිප්‍රත්‍යයයි කියනුලැබේ. කෙසේදයත් අරූපී සඤ්ඤා සතරදෙනා හෙවත් වේදනා සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණ සඤ්ඤා සතරදෙනා ඔවුනොවුන් (ප්‍රත්‍යුත්පන්න ලක්ෂණයෙනි) දැන් දැන් පවත්නා කෙණෙහි ඇතිබැවින් අඝනිභාවයෙන් උපකාරවෙති. එසේම සතරමහාභූතයෝ ඔවුනොවුන් පවත්නා කෙණෙහි විද්‍යමාන හෙයින් අඝනිභාවයෙන් උපකාරවෙති. පිළිසිඳගන්නා කෙණෙහි නාමරූපද්දෙනද ඔවුනොවුන් පවත්නා මොහොතෙහිම විද්‍යමාන හෙයින් අඝනිභාවයෙන් උපකාරවෙති.

චිත්තසෛතසිකධර්මයෝ චිත්තජරූපයන්ට පච්චත්තා මොහොතෙහිම උපකාරවන හෙයින් අසන්නිහාවයෙන් උපකාරවෙති. මහාභූතයෝ උපාදාය රූපයන් පච්චත්තා මොහොතෙනිම උපකාරවන හෙයින් අසන්නිහාවයෙන් උපකාරවෙති. එසේම චක්ඛායතන සොතායතන ඝාණායතන ජිව්හායතන කායායතනයෝ චක්ඛුර් විඤ්ඤාණාදි චිත්තසෛතසිකධර්මයන්ට පච්චත්තා මොහොතෙහිම යථාක්‍රමයෙන් උපකාරවන හෙයින් අසන්නිහාවයෙන් උපකාර වෙති. එසේම රූප ශබ්ද ගන්ධ රස ඵොට්ඨබ්බ ඉත්ථත්ත අරමුණුපස චක්ඛුර් විඤ්ඤාණාදි චිත්තසෛතසික ධර්මයන්ට පච්චත්තා මොහොතෙහිම උපකාරවන හෙයින් අසන්නිහාවයෙන් ප්‍රත්‍යයවෙති. හෘදයවස්තු රූපය මනොධාතු මනොවිඤ්ඤාණධාතූන්ට පච්චත්තා මොහොතෙහිම උපකාරවන හෙයින් අසන්නිහාවයෙන් උපකාරවෙති.

**නාසන්නිප්‍රත්‍යය** කවරේද? තමතමන්ට අනන්තරා අනන්තරාව උපදනා චිත්තසෛතසිකධර්මයන්ට අවසරදීම්වශයෙන් ආසන්න යෙහි ආසන්නයෙහි සිට බිඳිනිදී වත්තාවූ චිත්තසෛතසිකධර්මයෝ දැන් දැන් උපන්නා චිත්තසෛතසිකධර්මයන්ට නාසන්නිප්‍රත්‍යය වශයෙන් උපකාර වෙන්මය. **විගතප්‍රත්‍යයද** නාසන්නිප්‍රත්‍යයෙහිමේන් දතයුතුයි.

**අවිගතප්‍රත්‍යය** කවරේද? සතර අරූපී සඤ්ඤාස්කන්ධයෝ හෙවත් වේදනා සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණ සඤ්ඤාස්කන්ධ සතරදෙන ඔවුනොවුන් වෙන්නොවැ පවත්නා බවද සන්තතිසමූහාත්මක හෙවත් පඨවී ආපෝ තේජෝ වායෝ යන ධාතු සතරදෙන ඔවුනොවුන් වෙන්නොව පවත්නාබවද පිළිසිඳගන්නා කෙණෙහි කාමය හා රූපය ඔවුනොවුන් වෙන්නොව පවත්නාබවද චිත්තසෛතසිකධර්ම චිත්තජරූපයන් කෙරෙන් වෙන්නොව පවත්නාබවද මහාභූත සතර උපාදාය රූපයන් කෙරෙන් වෙන්නොව පවත්නාබවද චක්ඛුප්පසාදය එහි උපදනා චිත්තසෛතසිකධර්මයන් කෙරෙන් වෙන්නොව පවත්නා බවද ශ්‍රොත්‍රප්‍රසාද ඝ්‍රාණප්‍රසාද ජිව්හාප්‍රසාද කායප්‍රසාද රූපයන් ඒ ඒ ප්‍රසාදයන් ඇසුරුකොට උපදනා චිත්තසෛතසිකයන් කෙරෙන් වෙන්නොව පවත්නා බවද රූප ශබ්ද ගන්ධ රස ඵොට්ඨබ්බ ඉත්ථත්ත අරමුණු චක්ඛුවිඤ්ඤාණ සොතවිඤ්ඤාණ ඝාණවිඤ්ඤාණ ජිව්හාවිඤ්ඤාණ කායවිඤ්ඤාණ චිත්තයන් කෙරෙන් හා ඒ සමඟ ඇතිවන චෛතසිකයන් කෙරෙන් වෙන්නොව පවත්නාබවද රූපාදි අරමුණු පස මනොධාතුව කෙරෙන් වෙන්නොව පවත්නාබවද හෘදයවස්තු රූපය මනොධාතු මනොවිඤ්ඤාණ ධාතූන් කෙරෙන් වෙන්නොවැ පවත්නා බවද අවිගතප්‍රත්‍යය ශකානිවශයෙනැති දතයුතු.

**සුවිසිප්‍රත්‍යයන්ගේ සංක්ෂේප අදහස මෙපරිද්දෙනි.**

ප්‍රස්ථානප්‍රකරණයෙහි වදාළ සුවිසිප්‍රත්‍යයන් අතුරෙන් කවර නම් ප්‍රත්‍යය ශක්තියකින් හෙවත් උපකාරශක්තියකින් අවිද්‍යා තොමෝ සංස්කාරයන්ට ප්‍රත්‍යයවේදයත් ?.

**"පඨමෝ නොනි සුඤ්ඤානං දුට්ඨාතෙකධාපන**
**පරෙසං පඨිමානං සා එකධා පඨමෝ මතා"යි**

වදාළහෙයින් එකාන්ත සාවද්‍ය අකුශලධර්මයක්වූ මේ අවිද්‍යා තොමෝ එකාන්ත නිරවද්‍ය කාමාවචර රූපාවචර කුශලධර්මයන්ට ආලම්බන ප්‍රත්‍යය උපනිශ්‍රය ප්‍රත්‍යය යන දෙපරිද්දෙනින් උපකාර වේ. කෙසේදයත් ? අවිද්‍යාව බිඳෙන නාස්නාසුළු අරූප අදෘශ්‍ය ධාතු ධර්මයෙකැයි මෙනෙහිකරණ කාලයෙහි අටවැදෑරුම්වූ කාමාවචර කුශල චිත්තයන්ට අරමුණුවනහෙයින් මේ අවිද්‍යාතොමෝ කාමාවචර කුශල සංස්කාරයන්ට ආලම්බනප්‍රත්‍යයවශයෙන් උපකාරවේ. බුදුපසේබුදු රහතුන්ගේ ක්‍රියාභිඥ චිත්තයහැර තදවශෂෂවූ පෘථග්ජන ආර්‍යශ්‍රාවකයන්ගේ චෙතොපරියඤ්ඤණය පූර්වේනිවාසානුස්මෘතිඥනය අනාගතංශඥනයයි කියනලද කුශල අභිඥාචිත්ත යෙන් මෙරමාගේ හෝ තමාගේ හෝ මොහඝනිතසිත දූනගන්නා කාලයෙහි පස්වැදෑරුම් රූපාවචර කුශලසංස්කාරයන්ට අවිද්‍යා තොමෝ ආලම්බනප්‍රත්‍යයවශයෙන් උපකාරවේ.

තවද සියළු අකුශලධර්මයන්ගේ පැවැත්ම මෝඩකම මුල්කොට ගෙණය යම්කිසි විපත්තියකෙනෙක් ඇත්නම් ඒ සියල්ල මෝඩකම මුල්කොට ඇත්තාහයි මෙසේ අවිද්‍යාවගේ අදීනව දැක්වෙන් අවිද්‍යාව දුරලීම පිණිස නිවන්ලබාගැණීම පිණිස දන්දීම් සිල්රැකීම් භාවනා කිරීම් ආදිවූ කාමාවචර පින්කම් කරන්නාහට ද යටකී අදහසින් රූපාවචර ධ්‍යානයන් උපදවන්නාහට ද යන මේ විප්‍රකාර කාමාවචර රූපාවචර පුණ්‍යාභිසංස්කාරයන්ට අවිද්‍යාතොමෝ උපනිශ්‍රය ප්‍රත්‍යයවශයෙන් උපකාරවේ. එසේම භවොපපත්තියයි ඇති ආදිනව මූවාකරදමන්නාවූ මෝඩකම් මුළාවිනියබැහින් හටඅම්පත් ප්‍රහීනකොට කාමාවචර රූපාවචර පින්කම් කරන්නාහට ද අවිද්‍යාතොමෝ උපනිශ්‍රය ප්‍රත්‍යයවශයෙන් උපකාරවේමය. මෙසේ එකාන්ත අනිෂ්ට සාවද්‍ය පාපධර්මයක්වූ අවිද්‍යාව කාමාවචර රූපාවචර පුණ්‍යාභිසංස්කාරයන්ට ආලම්බන ප්‍රත්‍යය උපනිශ්‍රය ප්‍රත්‍යය යන ඳෙයාකාරයෙන් උපකාරවන්නාවූ ඒ "සං සං ධම්මං ආරබ්භ යෙ යෙ ධම්මා උප්පජ්ජන්ති චිත්තචෙතසිකාධම්මා තෙ තෙ ධම්මා තෙසං තෙසං ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයොහුත්වා පුරිමා පුරිමා අකුසලාධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං උපනිස්සයපච්චයෙන පච්චයෙ" යන හෙතුම් ප්‍රස්ථානපාඨ සාධකවෙත්.

අපුණ්‍යාභිසංඛාරයන්ට අවිද්‍යාව ප්‍රත්‍යයවනුයේ කිසේයත් ? මේ අවිද්‍යාවහාමෝ වහානි මෝඩකම අරමුණුකොට රාගයක් හෝ දෘෂ්ටියක් හෝ සැකයක් හෝ උද්ධච්චයක් හෝ දෞර්මනසක් හෝ උපදනාකාලයෙහි රාගාදි අකුශලධර්මයන්ට ආලම්බන ප්‍රත්‍යයවශයෙන් උපකාරවේ. තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් ගරුකොට ආස්වාදනය කරණ කාලයෙහි ආලම්බනාධිපති වශයෙන්ද ආලම්බනොපනිශ්‍රය වශයෙන්ද අවිද්‍යාතොමෝ තෘෂ්ණාදෘෂ්ටි අකුශලධර්මයන්ට උපකාරවේ.

මෝඩකමින් මුළාව සත්ත්වඝාතනාදි පාපධර්මයන්හිද කාම සෙවනාදියෙහිද ද්වේෂනොදුක ප්‍රාණඝාතාදිය කරන්නාහටද කාම සෙවනාදිය කරන්නාහවද ඉවහල්වනහෙයින් අවිද්‍යාතොමෝ පස් පව් දසඅකුසල් (කාමසෙවනාදි) පාපධර්මයන්ට උපනිශ්‍රයප්‍රත්‍යයවශයෙන් උපකාරවේ. එහෙයින් ''පුරිමා පුරිමා අකුසලාධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං උපනිස්සයපච්චයෙන පච්චයෝ''යි ප්‍රස්ථානප්‍රකරණයෙහි වදාරණලදී.

සතුන්මැරීම් සොරකම්කිරීම් පරදාරසෙවනය කිරීම් පුරපුරුෂ සෙවනය කිරීම් නාම්සෙවිනය කිරීම් බොරුකීම් කේලාම්කීම් රළු පරුසවචනයෙහි ප්‍රලාපදෙඩීම් මත්පැන් පානයකිරීම්ආදි පාපක්‍රියාවන් අතුරෙන් යම් පවක්කරණකල උපදනා අකුශල ජවනචිත්ත පඤ්චකයක්වේද ඒ ජවනචිත්තපඤ්චකයෙහි ප්‍රථම අකුශලජවන චිත්තය සම්ප්‍රයුක්ත ඇතිවන මොහචෛතසිකය හෙවත් අවිද්‍යාව චිරතරජවන චිත්තයටද චිරතරජවනයෙහි අවිද්‍යාව තෘතීයජවනයටද මේක්‍රමයෙන් සප්තම අකුශලජවන් සිතදක්වා උපකාරවනහෙයින් අනන්තර ප්‍රත්‍යයවශයෙන්ද සමනන්තරප්‍රත්‍යයවශයෙන්ද අනන්තරූපනිශ්‍රයප්‍රත්‍යයවශයෙන්ද ආසෙවනප්‍රත්‍යයවශයෙන්ද නාස්තිප්‍රත්‍යය වශයෙන්ද විගතප්‍රත්‍යයවශයෙන්ද අවිද්‍යාතොමෝ අපුණ්‍යාභිසංඛාරයන්ට ප්‍රත්‍යයවේමය. තවද සතුන්මැරීම් සොරකම්කිරීම් ආදිවූ යම්කිසි අකුසලක් කරන්නාහට හෙතුප්‍රත්‍යය සහජාතප්‍රත්‍යය අඤ්ඤමඤ්ඤප්‍රත්‍යය නිශ්‍රයප්‍රත්‍යය සම්ප්‍රයුක්තප්‍රත්‍යය අස්ථිප්‍රත්‍යය අවිගතප්‍රත්‍යය යන මේ ප්‍රත්‍යය ශක්තීන්ගේ වශයෙන්ද අවිද්‍යාතොමෝ අපුණ්‍යාභිසංඛාරයන්ට උපකාරවේමය.

ආනඤ්ජාභිසංඛාරයට අවිද්‍යාව උපකාරවනුයේ කිසේයයත් ? සියළු අකුශලධර්මයන්ගේ පැවැත්ම මෝඩකම මුල්කොටගෙණය යම්කිසි විපත්තිකෙනෙක් ඇත්නම් ඒ සියල්ලම මෝඩකම මුල් කොට ඇත්තාහයි මෙසේ අවිද්‍යාවගේ දෞෂදුක්මෙන් අවිද්‍යාව දුරලීම පිණිස ආකාසානඤ්චායතනාදිවූ අරූපාවචරධ්‍යානයන් උපද

වන්නාහවද සංසාරොත්පත්තියෙහි වරදනොදක්වා මූලාකරදම්න් නාවූ මෝඩකම්න් මුළාවගියබැවින් අරූපාවචර භවසම්පත් ප්‍රාර්ථි නාකොට අරූපාවචර කුසල් රැස්කරන්නාහවද පිහිටවනහෙයින් එකාන්ත අනිෂ්ටඝාවද්‍ය පාපධර්මයක්වූ මේ අවිද්‍යාතොමෝ එකාන්ත නිරවද්‍ය ඉෂ්ට අරූපාවචර කුශලධර්මයන්ට උපනිශ්‍රය ප්‍රත්‍යයවශ යෙන් එක් ආකාරයකින් උපකාරවනබවට **"චුතිමා චුතිමා අකු සලා ධම්මා පවත්තිමානං පවත්තිමානං කුසලානං ධම්මානං උපනි ස්සයපච්චයේන පච්චයෝ"** යන මේප්‍රස්ථානපාඨය සාධකවේ.

අවශෙෂ ප්‍රත්‍යය ධර්මසමූහයාගේ අභාවයෙහි නොලැබීමෙහි සං සකාරයන්ගේ ලැබීමක්නොවන හෙයින්; **අවිජ්ජාපච්චයා,** අවිද්‍යා ප්‍රත්‍යයෙන්; **සඞ්ඛාරා,** සංසකාරයෝ; **සම්භවන්තීව,** පහළවෙත්ම යැයි කියා මෙසේ ක්‍රියාවධාරණවශයෙන් නියමයකදුනැත ඒමන්ද අවිද්‍යාහෙතුවෙන් සංසකාරසංඛ්‍යාත ඵලධර්මය පෘණන්නොවැ තදව ශෙෂ ඵලධර්මයන්ගේ ලැබීමද වියයුතුම බැවිනි. **"අවිජ්ජාපච්චයා,** අවිද්‍යාප්‍රත්‍යයෙන්; **සඞ්ඛාරාඒව,** සංසකාරයෝම; **සම්භවන්ති,** පහළ වෙන්යැයි කියා මෙසේ ඵලාවධාරණයවශයෙන් නියමයකුදු නැත ඒමන්ද සංසකාරයන්ට ප්‍රත්‍යයවූ ලොභ වෙෂ මොහ උපාදාන වාර ලම්බන මනසකාරාදීවූ අනිකුත් ඵලධර්මයන්ගේද ලැබීමවනහෙයිනි. **"අවිජ්ජාපච්චයාඒව, අවිද්‍යාප්‍රත්‍යයෙන්ම; සඞ්ඛාරා, සංසකාරයෝ; සම්භවන්තී, පහළවෙන්ය කියා මෙසේ හෙතුඵාවධාරණ වශයෙන්** නියමයකුදු නැත කියනලද පරිදි අවධාරණවශයෙන් නියමයක් නැතිකල් හුදකලාවූ අවිද්‍යාව පමණක් සංසකාරයන්ට ප්‍රත්‍යයවේද නැතහොත් සංසකාරයන්ට ප්‍රත්‍යයවූ අන්‍යධර්මයෝත් ඇද්දැයි. මෙසේ වොදකතෙමේ විචාරාගැනී දැන ආචාර්‍යතෙම මෙසේ කියයි මෙහි අවිද්‍යාව පිළිබඳව අනික් ප්‍රත්‍යයකින් සම්බන්ධවීමෙහි අසම්බන්ධවීමෙහි තාවිසින් හෙණහැර දැක්විය යුතු කරුණු කුමක්ද තාගේ වොද නාව සම්පූර්ණනොවන්නීය ඉතිරි යමක් ඇතිනම් කියවයි යි කල්හි සංසකාරයට ප්‍රත්‍යයවූ අන්‍ය හෙතුධර්ම ඇත්නම් **"අවිජ්ජාපච්චයා සඞ්ඛාරා"** යන මේ පාඨයෙහි අවිද්‍යා සඞ්ඛ්‍යාත එක්හෙතුවක් හෙණ හැර දැක්වීම නොගැළපේය කියා වොදකතෙම දෙෂාරොපනය කරන්නම් ඒවොදභාව නිස්ප්‍රභාවනොට කරුණුදක්වනු ලබන ආචා ර්‍යතෙමේ එක්හෙතුවක් හෙණහැරදැක්වීමේ යුකති මේ මතු වක්ෂ්‍ය මාණපරිද්දෙන් ප්‍රකාශකළෝ.

**එකං න එකතෝ ඉධ නානෙක මනෙකතොපිනොඒකං**
**ඵලමත්ථ අපෙක්ඛන එකහෙතුඋලදීපනෙ අමතා**

ඉධ, මේ ලොකයෙහි; එකතෝ, එක් හෙතුධර්මයෙකින්; එකං, එක් ඵලධර්මයෙක්; න, නැත; එකතෝ, එක් හෙතුධර්මයෙකින්;

අනෙකං, නොඅඤ්ඤ එලධම්ම්ද; න, නැත; අනෙකතොපි, නොඅඤ්ඤ හෙතුධම්මඋඝන්ද; එකං එලං, එක් එලධම්මයෙක්; න අත්ථි, නැත; එකහෙතුඵලදීපනා, අවිජ්ජා හෙතුවෙන් සංඝකාරයෝද සංඝකාර හෙතුවෙන් විඤ්ඤාණයද යනාදිවශයෙන් එක් එක් හෙතු එක් එක් එලයන් දක්වීමෙහි; අථෝ, ප්‍රයොජනයෙක්; අත්ථපන, එතකුදු වුවත් ඇත්තේය; යතු මෙහි අවයවාත්ථයි.

මේ ලොකයෙහි එක් ප්‍රත්‍යයධම්මයෙකින් හෙවත් එක්කරුණක් එක් හෙතුවක් මුල්වීමෙන් එකම ප්‍රයෝජනයක් එලයක් විපාකයක් නොලැබියහැක්කේය එසේම එක්හෙතුවක් මුල්වීමෙන් නොඅඤ්ඤ ප්‍රයෝජන එලවිපාකද නොලැබියහැක්කේය. එසේම නොයෙක් හෙතුමුල්වීමෙන් එකම ප්‍රයොජනයක් එලවිපාකයක් නොලැබිය හැක්කේය එහෙයින් නොයෙක් හෙතුමුල්වීමෙන්ම නොයෙක් ප්‍රයොජන එලවිපාක ලැබියහැක්කේයයි කියනලද්දේවේ.

ඒ එසේවුයේ නොඅඤ්ඤක් හෙතු පෘථිවී බිජ ජලයයි කියනලද හෙතූන්කරණකොටගණ අනෙකවිධවූ වණී ගන්ධ රස ඔජා සම්පන්න වෘක්ෂලතාදි එලයක්හුගම්ම ලැබීම දෘශ්‍යමානවේමය. ලොකයෙහි නොයෙක් හෙතුඉඟන් නොයෙක් එලවිපාක ලැබිනම් පටිච්චසමුප්පාදය වදරන්නාවූ භාග්‍යවතුන්වහන්සේ එක් එක් පරම්පරා හෙතුඉඟන් එක් එක් එලධම්පරම්පරාවක්හුගේ ලැබීම දක්වා වදාළේ නොවරහෙයිද? අප භාග්‍යවතුන්වහන්සේ වහාහි ධම්දෙශනාකරණ කිසිතැනෙක්හි ප්‍රධානවූ කරුණක් මුල්කොටගණ හෝ ප්‍රකටකරුණක් මුල්කොටගණ හෝ අසාධාරණ කරුණක් මුල්කොටගණ හෝ ධම්ශ්‍රවණය කරන්නාවූ පෙළෙයාජනයාගේ අදහසට සුදුසුපරිද්දෙන් හෝ දෙශනාකළ යුතුවූ අදහස් බොහෝ ඇති නමුත් එහින් කැමැති අදහසක් මුල්කොටගණ දෙශනාකිරීම බුදුවරයන්ගේ දෙශනාවිලාසයක්බැවින් රිට සුදුසුපරිද්දෙන් හෝ එක්හෙතුවක් හෝ එක්එලයක් මුල්කොට දෙශනාකෙරෙහි. **"එසඵපච්චයා වෙදනා"** යන තන්හි ප්‍රධාන බැවින් එක්හෙතුඵලධම්යක් වදරුනිබේ **"චක්ඛුං ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං තිණ්ණං සඞ්ගති ඵස්සො"** යනාදි තන්හි, ඇහැන්සාත් රූපයනිසාත් චක්ෂුර්විඤ්ඤාණය උපදනේය ඇසත් රූපයත් චක්ෂුර්විඤ්ඤාණයන් යන තුන්දෙනාගේ සඞ්ගමය ඵස්සී කියාපසී ප්‍රත්‍යයෙන් වෙදනාව උපදනා ය. මෙසේයින් අන්‍ය ප්‍රත්‍යයන් හා සම්බන්ධවක් ඇතිනමුත් ඵස්සීය වෙදනාවට ප්‍රධාන හෙතුවක් බැවින්ද වෙදනාව වනාහි ඵස්සීයාගේ තවත් එල ඇති නමුත් ප්‍රධාන එලයක් බැවින්ද ප්‍රධාන කරුණු මුල්කොටගණ

ඵස්සපච්චයා වේදනාති වදළසේක. **"සෙම්හසමුට්ඨානා ආබාධා"** යනාදි නන්හි කම්ාදි අන්‍යහෙතූන්ගේ අප්‍රකටභාවය නිසා ශ්ලේෂ්ම හෙතුවගේ ප්‍රකටභාවයඟෙණ කිසිතැනෙක්හි ප්‍රකටකරුණ මුල්කොට වදරති. **"යෙකෙචි ගිකඛවෙ අකුසලධම්මා සඛෙඛනෙ අයොනිසො මනසිකාරමූලකා"** යනාදි නන්හි අකුශලධර්මයන් ඇතිවීමට සාධාරණවූ චක්ෂුරාදි චාර රූපාදිආලම්බන සහජාතධර්ම විද්‍යමානවතුදු අයොනිසො මනසිකාර සංඛ්‍යාත අසාධාරණ හෙතුව මුල්කොට වදළසේක.

එහෙයින් මේ අර්ථපක්ෂයෙහි අවිද්‍යාව වනාහී සංඝස්කාරයන්ට කාරණවූ අනිකුත් දෙරට්ට අරූණු සහජාතධර්මයන් විද්‍යමාන කල් හිදු **"අවිජ්ජා සමුදයා ආසවසමුදයෝ"**යි වදළ වචනයෙහින් තෘෂ්ණාදි අකුශල සංස්කාරයන්ට අවිද්‍යාව ප්‍රධාන හෙතුවක් බැව් සලකා ප්‍රධාන කරුණක්වශයෙන්ද **"අවිජ්ජා හිකඛවෙ අවිජ්ජා ගතො පුඤඤාභිසංඛාරම්පි අභිසංඛරොති"** යනාදිතන්හි අවිද්‍යාවගේ ප්‍රධානත්වය අසාධාරණත්වය සලකා අවිද්‍යාව ප්‍රධානකරුණන් අසාධාරණ කරුණක්වශයෙන්ද ගළපා එකධර්මමූලික දෙශනාව කළසේක. මෙතෙකින් අවිද්‍යාදි එක් එක් හෙතුදැක්වීමෙහිද සංස්කාරාදි එක් එක් ඵලධර්ම දැක්වීමෙහිද ප්‍රයෝජනය දතයුතුයි.

මෙසේ ප්‍රධානහෙතු ප්‍රසිද්ධහෙතු අසාධාරණහෙතු වශයෙන් සංඝස්කාරයන්ට අවිද්‍යාවගේ ප්‍රත්‍යයවීමක් ඇතිකල්හිදු එකානන අනිෂ්ට අකුශලධර්මයක්වූ අවිද්‍යාවෙන් එ කානන අනිෂ්ට ඵලයක්වූ අපුණ්‍යාභි සංඝස්කාරය පමණක් නූපදවා එකානන ඉෂ්ට ඵලයන්වූ පුණ්‍යාභි සංඝස්කාර ආනඤ්ජාභි සංඝස්කාරයන් ඉපදවීමට ඇති යුක්තිය කවරේද? කොහොඹ බිජුවටකින් නිකතවූ කොල අතු මුල් පොතු නෙඩි ඇති කොහොඹ ගසක්මුත් මධුරවූ කොල අතු මුල් පොතු නෙඩි ඇති අන් ගසක් උපදවන සිරිතක් නැත්තේය. ඒ එසේනමුත් මෙයට වෙනස් ලොකධර්ම ඇතිබැවින් ඒ වෙනස් අන්දමේ ලොකධර්මයන් හා සඳහා බලාගැනීමට අවිද්‍යා හෙතුවෙන් පුණ්‍යාභි සංඝස්කාරාදිය ඇතිවීමට කොහෝ යුතුකම් ඇත්තාහුමය.

ලොකයෙහි ඇතැම් (දෙයක) සභාවධර්මයන්ට විරුද්ධහෙතුහුද ඇතැම් (දෙයක) සභාව ධර්මයන්ට අවිරුද්ධ හෙතුහුද ඇතැම් (දෙයක්) සභාව ධර්මයන්ට සමාන හෙතුහුද ඇතැම් (දෙයක) සභාව ධර්මයන්ට අසමාන හෙතුහුද ප්‍රත්‍යය භාවයෙන් උපකාර වෙති. ඔවුන් අතුරෙන් විරුද්ධ අවිරුද්ධහෙතුහු සථාන වශයෙන්ද සභාව වශයෙන්ද කෘත්‍ය වශයෙන්ද උපකාරභාවයට පැමිණෙති. ඒ එසේමැයි. පළමු පළමු පැවැති සිත් පසුව පසුව ඇති

වන සිත්වලට සථානවශයෙන් විරුඬවූවාහු නමුදු ප්‍රත්‍යයවීමෙන් පවත්නාහුවෙති එසට නිදසුනයෙක් නම් පළමු පළමු දැන හදාළ ශිල්පශාසත්‍ර පසුව පසුව දැන හදාරන්නාවූ ශිල්පශාසත්‍රයන්ට සථානවශයෙන් විරුඬවූ ප්‍රත්‍යයවී පවත්නා පරිද්දෙනි. **කර්මය** අද්‍රව්‍ය අරූපාකාරයෙන්ද අරමුණු ගැණීමෙන්ද අරමුණෙහි නැමී පවත්නා ලක්ෂණයෙන්ද ද්‍රව්‍ය ධාතුවූ අරමුණුගැණීමක් නැත්තාවූ **සෂණයක්ෂණ**යෙහි ප්‍රකෘතිය අත්හරිමින් වෙනස් වෙනස් ආකාරයට පෙරළී **පෙරළීයන්නාවූ රූපඛර්මයන්ට** සවභාවයෙන් විරුඬවන්නේය. එසේනමුදු සවභාවයෙන් විරුඬවූ කර්මය සවභාවයෙන් විරුඬවූ රූපයට ප්‍රත්‍යයව පවත්නේමය. යම්සේ මධුර රස ඇත්තාවූ **කිරි** ඇඹුල් රස ඇත්තාවූ **දිවලට** හා තෙල්රස ඇත්තාවූ **ගිනෙල් වෙඩුරට** සවභාවයෙන් විරුඬවූ ප්‍රත්‍යයවී පවත්නේද එමෙනි. අරමුණු ඇදිනීමක් නැති **ආලෝකය**තෙම ඇතැම්කෙනෙකුන්ටද අරමුණු ඇදිනීමක් නැති **අන්ධකාර**යතෙම ඇතැම්කෙනෙකුන්ටද අරමුණු දැනගැන්මක් ඇති **චක්ෂුර්විඥාන** චිත්තයන්ගේ පහළවීමට කෘත්‍ය වශයෙන් විරුඬව ප්‍රත්‍යයවේමය. එසට නිදසුනෙක් නම් මත්බවට **කොපමුණුවන්නාවූ මිදියුස** හා **උක්පැණි නෙලිදිය** ආදිය මත්බවට පමුණුවන්නාවූ **ණ අරක්කු** ආදියට කෘත්‍ය වශයෙන් විරුඬව ප්‍රත්‍යයවන පරිද්දෙනි. මෙසේ ලෝකයෙහි යම් යම් සවභාවධර්මයන්ට සථාන සවභාව කෘත්‍යවශයෙන් විරුඬවූ ප්‍රත්‍යයෝත් ප්‍රත්‍යක්ෂවශයෙන් දක්නාහු ලැබෙති.

තවද ඇතැම් ධාතු ධර්මයන්ට සථානාදි වශයෙන් අවිරුඬවූ හෙතු ඇත්තාහ. ඒ කවරහුදයත් ? ඇසත් රූපයත් කණත් ශබ්දයත් නාසයත් ගන්ධයත් දිවත් රසයත් කයත් සප්‍රශීයත් රූපාදි අරමුණුත් හෘදය වසතුවත් ඒ ඒ සථාන ආශ්‍රයකොට උපදනා චක්ෂුර්විඥානාදි චිත්ත චෛතසික ධර්මයන්ට සථාන වශයෙන් විරුඬ නොවූවාහු ප්‍රත්‍යයෝ වෙත්. පළමු පළමු පැවති ජවන් සිත් පසුව පසුව පවත්නා ජවන් සිත්වලට සවභාව වශයෙන් විරුඬ නොවූවාහු ප්‍රත්‍යයෝ වෙති. එසේම පළමු පළමු ජවන්සිත් පසුව පසුව ඇතිවන ජවන්සිත්වලට කෘත්‍යවශයෙන්ද විරුඬ නොවූවාහු ප්‍රත්‍යයෝ වෙති.

මෙහි කියනලද ත්‍රිවිධාකාරයෙන් විරුඬවූද ත්‍රිවිධාකාරයෙන් අවිරුඬවූද ප්‍රත්‍යයෝ යම්සේ සවභාව ධර්මයන්ට ප්‍රත්‍යයෝ වෙද්ද එමෙන් සමානවූ අසමානවූ ප්‍රත්‍යයෝද උපකාරවෙත්මය ඒ කොසේදයත් ? ශරීරානුගතව පවත්නා ශීතොෂ්ණ සඞ්ඛ්‍යාත ගුණමය සෘතු රූපයහි. එසේම ශරීරානුගතව පවත්නා කන බොනු ලබන ආහාර විශෙෂයන්හෙන් වැඩී නව මාරයෙන් පිටතොවී

මෙහිම නතුවූ ආහාර ඔජාව ආහාර රූපයයි. කියනලද සෘතුරූප ආහාර රූප දෙක පස චතුර ගින්දර හුලඟ පෑය ගඳ රස ආහාර ශක්තිය යන රූප කැබලි අට අට බැගින් ශරීරයෙහි උපදවන බැවින් රූපධම්මී රූපධම්මීයන්ට සමාන භාවයෙන් ප්‍රත්‍යයෝ වෙති. ඒ එසේමැයි, හැල් වී මුන් උදු තල මැ කඩල කොල්ලු ඇට වගී ඒ ඒ වගීවලින් ලැබෙන අස්වැන්නට සමානවන පරිද්දෙනි. ද්‍රව්‍ය ධම්මීවූ චක්ඛුප්පසාදාදී රූපධම්මී අද්‍රව්‍යවූ චිත්තචෛතසික සඞ්ඛ්‍යාත නාමධම්මීයන්ට සමානභාවයක් නැතිවද ප්‍රත්‍යයෝ වෙති. එසේම අද්‍රව්‍යවූ චිත්තචෛතසික සඞ්ඛ්‍යාත නාමධම්මීයෝ ද්‍රව්‍යධම්මීවූ චක්ඛුප්පසාදාදී රූපධම්මී විශෙෂයන්ට සමානභාවයක් නැතිවද ප්‍රත්‍යයෝ වෙති. ඊට උදාහරණනම්, හරක්ලොම් රතු එළුලොම් දෙවගීය එකට පෝරකිරීමෙන් වදකසා ඇතිවන්නාක්මෙන්ද හරක්අන් කුඩු දී තලරොඩු සකුරු පෝරකිරීමෙන් හුසතාන හෙවත් පැහිරි මාන් ඇතිවන්නාක්මෙන්ද දියසෙවෙල්වලින් සුළුකුර සැදෙන්නාක්මෙන්ද කොටළුවා හා අස්වෙලඹගේ සංසර්ගයෙන් ආජානීය අශ්වයාගේ උත්පත්තියමෙන්ද අසමාන හෙතුවලින් එයට වෙනස් ඵල උපදවනබව සැකහැර දතයුත්තේය.

මෙසේ මේ අවිද්‍යාතොමෝ විපාකවශයෙන් එකාන්න අනිෂ්ට ඵලඇත්තී සවභාවවශයෙන් සාවද්‍යබව ඇත්තී සියලුම පුණ්‍යාභි සංසකාර අපුණ්‍යාභිසංසකාර ආනඤ්ජාභිසංසකාරයන්ට සුදුසුපරිදි සථාන සවභාව කෘත්‍ය විරුඬවශයෙන්ද සථාන සවභාව කෘත්‍ය අවිරුඬවශයෙන්ද සාමාන්‍යසමාන වශයෙන්ද ප්‍රත්‍යයවේයයි දත යුතුයි. යමෙකුට දුඃඛසමුදය නිරොධ මාගී යන චතුසසත්‍යයන්හි නොදැනීම් මුළාවීම් සංඛ්‍යාත අවිද්‍යාව ප්‍රහීන නොවීද හෙතෙම් දුක මෙයයි නොදැනීමෙන් සංසාරදුඃඛය සැපතෙක යන සංඥාවෙන් ලබ්ධිගෙණ සසර දුක අප්පත්කිරීමට හෙතුවූ ත්‍රිවිධ සංසකාරයන් සකස්කොරෙයි යනාදිවශයෙන් අවිද්‍යාගේ ප්‍රත්‍යයවීම ඉහතින් ප්‍රකාශකරණලද්දේමය. තවද අනික් ක්‍රමයකුදු ඇත.

චතුසපඤ්ඤෙ සංසාරෙ සඞ්ඛාරානඤ්ච ලක්ඛණෙ,
යො පඤ්ඤව සමුප්පන්න ධම්මෙසුච විමුඤ්ඣති.
අභිසඞ්ඛරොති යො එතෙ සඞ්ඛාරෙ තිවිධෙසතො,
අවිජ්ජාපච්චයො තෙසං තිවිධානං අයං තතො.

යහු වදුළුහෙයින් ඒ ඒ භවාදීන්හි රූපාදි සකන්ධයන්ගේ බිඳවැටීම යයි කියනලද මරණය තත්වූපරිද්දෙන් නොදන්නේ සබතෙම් විද්‍යමානවූයේම මැරෙයි. විද්‍යමානසත්වයාගේ අනික් ආත්මභාවයකට

අන් ආකාරයකින් සමාගමයවේය යනාදී වශයෙන් චුතියෙහි මුළාවී වරදවා කල්පනාකිරීමෙන්ද ඒ ඒ භවාදීන්හි රූපාදී සකඬ යන්ගේ පහළවීමයයි කියනලදජාතිය තත්වූපරිද්දෙන් නොදන්නේ විද්‍යමානවූ සත්වතෙමේ උපදී. මේ භවයෙහි දිරාගිය ශරීරයාගේ බහාතැබීමක් ඇතිකල්හි පරලෙව්හි අභිනව ශරීරයක්හුගේ ලැබ ගැණීම කෙරෙයි යනාදී වශයෙන් උත්පත්තියෙහි මුළාවී වරදවා කල්පනාකිරීමෙන්ද (නොහොත්)

**වත්ථානි ජීණ්ණානි යථා පහාය**
**නවානි ගණ්හාති නරොපරානි,**
**තථාපදෙහං ජිඛජීණ්ණ මෙවං**
**ගණ්හාති අඤ්ඤාභිනවං සුඛෙසි.**

යන්නෙන් දක්වනලද පරිදි යම් මනුෂ්‍යයෙක් දිරාගියාවූ වස්ත්‍ර හැරපියා අළුත් වස්ත්‍ර හැඳගන්නේ යම්සේද එමෙන් සදෘකාලික සත්වතෙම පරණව ජරාජීණීවගිය මේ ශරීරය හැරපියා පරලෙව්හි අභිනව ආත්මභාවයක් ලැබගණියයි උත්පත්තියෙහි මුළාවී වරදවා කල්පනාකිරීමෙන්ද

**ඛන්ධානංච පතිපාටිධාතු ආයතනානංච,**
**අභෙඛාවජ්ඣනං වඤ්ඤමානා සංසාරොති පවුච්චති.**

යන්නෙන් දක්වනලද රූපාදී සකඬයන්ගේ පිළිවෙළ නොසිඳ පැවැත්ම අටළොස්ධාතූන්ගේ පිළිවෙළ නොසිඳ පැවැත්ම දෙළොස් ආයතනයන්ගේ පිළිවෙළ නොසිඳ පැවැත්ම සංසාරය වේයයි තත්වූපරිද්දෙන් නොදන්නේ සකඬ ධාතු ආයතනයන් කෙරෙන් අන්‍යවූ සත්වයෙක් ඇතැයි ලබ්ධිගණ සත්වතෙමේ මේ ලොකයෙන් අනිත් ලොකයකටද ඒ ලොකයෙ න් මේ ලොකයටද ගමනාගමනය කෙරේයයි සංසාරයෙහි මුළාවවපැමිණ වරදවා කල්පනාකිරීමෙන්ද තවද සකඬයන්ගේ චුතියත් සකඬයන්ගේ උත්පත්තියත් සකඬාදීන්ගේ නොසිඳ පවත්නා පිළිවෙළයයි කියනලද සංසාර යත් තත්වූපරිද්දෙන් නොදත් නැනැත්තේ අවිද්‍යමානවූ සත්වයෙකු හැණ සත්ව පුද්ගල යන ව්‍යවහාර මාත්‍රය තහවුරු කීමක්සේ පිළි ගෙණ මේ සත්වතෙම දෙවියන් විසින් මවනලද්දේය, ඊශ්වර බ්‍රහ්ම යන් විසින් මවනලද්දේය, ඒ ඒ මැවුන්කාරයන්ගේ කැමැත්තට එයාගව සැපදුක් විඳින්නේය, ඔවුන්ගේ කැමැත්තට එකාගව පරණව ගිය ආත්මභාවය හැරදමා අළුත් ශරීරයක් ලැබගන්නේය යනාදී වශයෙන් ගෙතුඩමීයන්හි මුළාවීවෙන් වරදවා කල්පනාකිරීමෙන්ද රූපසකඬය විකාරයට පෙරළීම් සංඛ්‍යාත රූපපණ ලක්ෂණ

ඇත්තේය. පඨවීධාතුව කර්කශ ලක්ෂණ ඇත්තේය, ආපොධාතුව වැගිරෙන ලක්ෂණ ඇත්තේය, තෙජොධාතුව උෂ්ණ ලක්ෂණ ඇත්තේය, වායොධාතුව සුරවන ලක්ෂණ ඇත්තේය, වේදනාස්කන්ධය විඳීම්ලක්ෂණ ඇත්තේය, සංඥාස්කන්ධය ඇඳිනීම් ලක්ෂණ ඇත්තේය, සංස්කාරස්කන්ධය චේතන ලක්ෂණ සංඛස්කරණ ලක්ෂණ ඇත්තේය, විඤ්ඤාණස්කන්ධය අරමුණු දැනීම් ලක්ෂණ ඇත්තේය, යන මේ ආදි සංස්කාර ධර්මයන්ගේ සවභාව ලක්ෂණද සකල සංස්කාරධර්මයෝ අනිත්‍ය දුඃඛ අනාත්ම ලක්ෂණ ඇත්තාහුයි සර්ව සංස්කාරයන්ගේ සාමාන්‍ය ලක්ෂණද තත්ත්වූපරිද්දෙන් නොදන්නාදැන්නේ සංස්කාරයන්හි මුළාවී වරදවා ලබ්ධි ගැණීමේ හේතුද නොවන් රූප වේදනා සංඥා සංස්කාර විඤ්ඤාණාදි සකල ස්කන්ධයන්ටඇතුළත් සකල සංස්කාරයන් අතුරෙන් කිසිවක් ආත්මවශයෙන්ද කිසිවක් ආත්මීසනාත්මක වශයෙන්ද සදාකාලික වශයෙන් ආත්මයෙක් ඇතැයිද සුඛ සුභවශයෙන් ආත්මයෙක් ඇත යනාදි වශයෙන්ද පටිච්චසමුප්පන්න ධර්මයන්හි මුළාවූයේ අවිද්‍යාදි හේතුවලින් සංසාරාන්ධකාරයේ පැවැත්මවේයයි නොනෙණෙ කපිලාදි දෘෂ්ටිගතිකයන් මෙන් ආත්මයතෙම අරමුණු දනියයිද කණාදදි දෘෂ්ටිගතිකයන් මෙන් ආත්මයතෙම අරමුණු නොදනියයිද යම් ආත්මයක් පරලොවැ සැපදුක් විඳිනම් ඒ ආත්මයතෙම මෙලොවදී පින් පව් කෙරේයි කරවයි කියාද ප්‍රතිසන්ධිවන අවස්ථාවෙහි ආත්මයතෙම පිළිසිඳගණ්හි කියාද පරමාණු මාත්‍රවූ හෙවත් අණුක දෙකක් පමණැති ආත්මාවයව ඉපිදවීම් වශයෙන් නළලරුපාදි ශරීරාවයව සම්පාදනයකිරීමෙන් දිව්‍ය බ්‍රහ්මාදීන් විසින් එහි ඉන්ද්‍රියයෝ සම්පාදනය කරණ්ඩුලැබෙත්සි කියාද ඉන්ද්‍රිය සම්පන්නවූ ඒ ආත්මයතෙම පසුව ඇපයිකිරීම් විඳීම් ඇඳිනීම් දැනීම් ආදිය කෙරේයයිද කලේබරයාගේ නිදහසින් මත්තෙහි අණුක දෙකක් පමණැති ආත්මය අගිරිකන්ත වූයේ භවාන්තරයට සංක්‍රමණය කෙරේයයිද සවකීය සවකීය ප්‍රත්‍යයානුරූපවැ පවත්නාවූ අවිද්‍යාදි ධර්මයන්ගේ සකල කෘත්‍ය විශේෂය ආත්මයාගේම කෘත්‍ය විශේෂයක් කොට සලකන්නාවූ දෘෂ්ටිගතිකයන්ම සියළු සත්වයෝ වනාහී හුයකින් අවුණෙන්නාලද පබළුවැව පොළුන්මෙන් ආත්මසඞ්ඛාතයා හුයෙන් අවුණන්නාලද ශරීරපරම්පරාව ඇතිහෙයින් නියතවූවාහුද නියතවූවාහුවත් ආත්මයාගේ හා ශරීර පරම්පරාවගේ සම්බන්ධම වන බැවින් සඞ්ඝාතිකවූවාහුයිද ආත්මය නියතා නිත්‍යාත් ආත්ම ශරීරයන්ගේ සමාගම්වීමයෙහි කියන්නාලද සඞ්ඝාතිය ඇති නිසාත් දිව්‍ය මනුෂ්‍ය පක්ෂි සර්පාදි නානාප්‍රකාර භවභෝග යට කැමි පවත්නාහුයයි මහත් මුළාවට පැමිණ ලබ්ධි ගැණීමෙන්ද අනාගතභවයට පැමිණේ. අවිද්‍යාවෙන් අන්ධබවට පමුණුවනලද්දාවූ

පුද්ගලතෙම මෙසේ වරදවා කල්පනාකරෙමින් සමහරකලෙක පුණ්‍යාභිසංඝකාරයද සමහරකලෙක අපුණ්‍යාභිසංඝකාරයද සමහර කලෙක ආනඤ්ජාභිසංඝකාරයද සකස්කෙරෙයි. එහෙයින් වදාරණ ලදී.

**සබ්බාපි නාමජච්චන්ධා නරෙ අපරිඤ්ඤකා,**
**එකදෘඝානි මඝෙඝන කුම්මඝෙඝනාපි එකදා.**

**සංසාරෙ සංසරං බාලෝ තථා අපරිඤ්ඤකෝ,**
**කරොති එකදා පුඤ්ඤං අපුඤ්ඤමපි එකදා.**

**සදාව ඤත්වා සෝ ධම්මං සබ්බානි අභිසමෙඝ්‍යති,**
**නදා අවිජ්ජූපසමා උපඝෙනා චරිඝ්‍යති.**

කිසි පිළිසරණක් නැති ජාත්‍යන්ධවූ පුරුෂයෙකු පොළවෙහි හැසිරෙන්නේ සමහර කලෙක මාංශයටද සමහර කලෙක නොමඟ වද බැසගන්නේ යම්සේද එසේම දිව්‍යබ්‍රහ්ම ඊශ්වරාදි කිසිවක්හුගේ කිසිපිළිසරණක්නැති අඥානවූ මේ සත්වතෙම සසරසැරිසරන්නේ කිසිකලෙක පුණ්‍යාභිසංඝකාරයද කිසිකලෙක අපුණ්‍යාභිසංඝකාර යද සකස්කෙරෙයි. අවිද්‍යාවෙන් අන්ධවගිය ඒ මේ සත්වතෙම යම් කලෙක්හි **දුක** මෙය, දුක් හටගැණීමට **හෙතුව** මෙය, දුක් නැති කිරීම් **සඞ්ඛ්‍යාත නිර්‍වාණය** මෙය, දුක් නැතිකිරීමට **උපාය මාර්ගය** මෙයයි බණඅසා දැනගණිද එකල්හි අවිද්‍යාවගේ නිරොධය කළහැකි වන්නේයි. අවිද්‍යාවගේ නිරොධයෙන් සංඝකාරයන්ගේ නිරොධයද මේ ක්‍රමයෙන් ජරා මරණය දක්වා හෙතු ඵලධර්මයන්ගේ නිරොධය කොට අජරාමර සඞ්ඛ්‍යාත සදාකාලික අද්‍රව්‍ය ධර්ධාතු සවරූපයක්වූ කෙලෂ දරථ ව්‍යුපශමයෙන් ශාන්තසවරූපවූ එකාන්ත විද්‍යමාන ධර්මයක්වූ සොපාදිශෙෂ නිර්‍වාණධාතුවට පැමිණ තෙල් හා වැටිය එකවිට ගෙවී නිවියන්නාවූ පහන් සිළුවක්මෙන් තෘෂ්ණා තෙලෙයෙන් ඇවිලිගණියන්නාවූ සඤ්ඤා පංචකය නමැති පහන්සිළුව නිවීගොස් අනුපාදිශෙෂ නිර්‍වාණධාතු නම්වූ අද්‍රව්‍යවූ සදාකාලිකවූ ධාතුසවරූපයට පැමිණීමෙන් සන්සිදෙන්නේයි. මේ අවිද්‍යාවගේ **හෙතුවෙන් සංඝකාරයෝ හටගණිත්** යන්නෙහි විස්තාර කථාමාර්ගයයි.

ඉක්බිති **සංඝකාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණය** ඇතිවන පරිදි විස්තරකිරීමට පළමු විඤ්ඤාණය කවරේදැයි සෙවිය යුතුවේ. චක්ෂුර් විඥානය, ශ්‍රොත්‍රවිඥානය, ඝ්‍රාණවිඥානය, ජිහ්වාවිඥානය කායවිඥානය, මනොවිඥානයයි ෂට්විධවේ. ඔවුන් අතුරෙන් චක්ෂුර්විඥානය කුශලවිපාක අකුශලවිපාක වශයෙන් විප්‍රකාරවේ. එසේම ශ්‍රොත්‍ර ඝ්‍රාණ ජිවහා කායවිඥානයෝද කුශලවිපාක අකුශලවිපාකවශයෙන්

දෙදෙන බැගින් වෙති. මනොවිඤ්ඤණයට වනාහි කුශලවිපාක අකුශලවිපාකවශයෙන් භෙදවූ සම්ප්‍රතේ‍යෂණ සිත් දෙදෙනද අකුශල විපාක සන්තීරණ සිතද කුශලවිපාක සන්තීරණ සිත් දෙදෙනද මහා විපාක සිත් අවදෙනද රූපාවචර විපාක සිත් පස්දෙනද අරූපාවචර විපාකසිත් සතරදෙනද ඇතුළත්වෙති. සියල්ල එකතුව විපාකසිත් දෙතිස්දෙනෙක් (32) **සංඛාර** ප්‍රත්‍යයෙන් ඇතිවන **විඤ්ඤණයෙහි** අන්තර්ගත බවට යෙත්. ලොකොත්තර විපාකයෝ සංසාරකථාවට අන්තර්ගත නොවන හෙයින් මෙහි සංග්‍රහ නොකරන ලදහ.

මෙහි කියනලද දෙතිසක් පමණ ඇති විපාක විඤ්ඤාණය සංඛාර ප්‍රත්‍යයෙන් වේය යනු කෙසේනම් දැනගත හැක්කේද සකස්කළාවූ කර්මයන් නැතිකල්හි විපාකයන්ගේ ලැබීමක් නොවන හෙයින්ද සකස්කල කර්මයන් ඇතිකල්හිම විපාකයන්ගේ ලැබීම වන හෙයින්ද දතයුත්තේය. සකස්කළ කර්මයන් නැතිකළ විපාකය නෙම නූපදීමය. ඉදින් සකස්කළ කර්ම නැතිකළ විපාකයෙක් උපදී නම් සියල්ලන්ට සියළු විපාකයෝ උපදින්නාහුය. එසේ සියල්ලන්ට සියළු විපාකයන්ගේ ලැබීමක් නැති කාරණයෙන්ද සකස්කළ කර්ම ප්‍රත්‍යය ශක්තියෙන්ම විපාක විඤ්ඤාණයෝ වෙත්යි දතයුතු. කවර නම් සංඛාරප්‍රත්‍යයකින් (හෙවත්) කවරනම් කර්මශක්තියකින් කවර නම්විපාක විඤ්ඤාණයෝ පහළවෙද්දයත්?

කාමාවචර කුසල්සිත් අවයහි කියනලද කර්මය පුර්ව භවයන්හි සකස්කළ හෙතුවෙන් කුශලකර්මවිපාකයක්වූ චක්ඛුර්විඤ්ඤාණනම් ඉෂ්ට මධ්‍යස්ථ රූපදර්ශන චිත්තයක්ද එසේමකුශල කර්මවිපාකයක්වූශ්‍රොත්‍ර විඤ්ඤාණනම් ඉෂ්ටමධ්‍යස්ථ ශබ්දශ්‍රවණයකරණ්ඩුබන චිත්තයක්ද කුශල කර්ම විපාකයක්වූඝ්‍රාණවිඤ්ඤාණනම් ඉෂ්ටමධ්‍යස්ථ ගන්ධය දැනගන්නාවූ චිත්තයක්ද කුශලකර්ම විපාකයක්වූ ජිව්හාවිඤ්ඤාණ නම් ඉෂ්ට මධ්‍යස්ථ රස දැනගන්නා චිත්තයක්ද කුශලකර්ම විපාකයක්වූ කායවිඤ්ඤාණනම් ඉෂ්ටමධ්‍යස්ථ ස්පර්ශ දැනගන්නා චිත්තයක්ද කුශලකර්ම විපාකයක්වූ සම්ප්‍රතේ‍යෂණ නම් රූපාදි අරමුණු පස පිළිගන්නාවූ චිත්තයක්ද කුශලකර්මවිපාකවූ සන්තීරණ නම් රූපාදි අරමුණු පස තීරණය කරන්නාවූසිත් දෙදෙනෙක්ද කාමාවචර මහා විපාකසිත් අටදෙනෙක්ද එකතුව මෙසේ කාමාවචර පුණ්‍යාභිසංඛාර ශක්තියෙන් හෙවත් කාමාවචර කුශලකර්ම ශක්තියෙන් කර්මවිපාක සිත් සොළොස් දෙනෙක් පහළවෙති. තවද රූපාවචර පුණ්‍යාභිසංඛාර ප්‍රත්‍යයෙන් හෙවත් රූපාවචර කුශලකර්ම ශක්තියෙන් රූපාවචර කර්ම විපාක සිත් පස්දෙනාක්ද. සියල්ල එකතුව පුණ්‍යාභිසංඛාර

ශකතියෙන් විපාක විඤ්ඤාණයන් 21 එක්විසිදෙනෙකුන් පහළවන බැව් දතයුත්තේය.

මා දශ අපුණ්‍යාභි සංඝකාරයයි කියනලද අකුශලකර්ම ශකතියෙන් අකුශලකර්ම විපාකයක්වූ චක්ෂුර්විඤ්ඤන නම් අනිෂ්ට රූපදර්ශන චිතතයක්ද එසේම අකුශලකර්ම විපාකයක්වූ ශ්‍රොත්‍රවිඤ්ඤානනම් අනිෂ්ට ශබ්දයන් අසනුලබන චිතතයක්ද අකුශලකර්ම විපාකයක්වූ අනිෂ්ට ගන්ධාඝ්‍රානයකරන්නාවූ ඝ්‍රාණවිඤ්ඤන නම් සිතක්ද අකුශලකර්ම විපාකයක්වූ අනිෂ්ට රස දැනගන්නාවූ ජිවහාවිඤ්ඤන නම් චිතතයක්ද අකුශලකර්ම විපාකයක්වූ අනිෂ්ට සපර්ශයදැනගන්නාවූ කායවිඤ්ඤන නම් අකුශල කර්මවිපාකයක්වූ සිතක්ද රූප ශබ්ද ගන්ධ රස සපර්ශ අරමුණු පස පිළිගන්නාවූ සම්ප්‍රතිච්ඡන සිතක් හා එකී අරමුණු තීරණය කරන්නාවූ සන්තීරණසිතක්ද යන මේ අකුශලකර්මවිපාක සිත් සත් දෙනෙක් පහළවෙති. අභිඤ්ඤාභි සංඝකාර ප්‍රත්‍යයෙන් හෙවත් අරූපාවචර කුශලකර්ම ශකතියෙන් අරූප විපාක සතරෙක් පහළ වෙති. මෙපරිද්දෙන් පුණ්‍යාභිසංඝකාර අපුණ්‍යාභිසංඝකාර අභිඤ්ඤාභිසංඝකාර හෙතුවෙන් කර්මවිපාකනම්වූ දෙතිස් විඤ්ඤාණ කෙනෙකුන් පහළවන බව දැන ඔවුන්ගේ විපාක වාරය ප්‍රතිසන්ධි විපාකවශයෙන් ප්‍රවෘතති විපාකවශයෙන් සිදුවන බව දතයුතුයි.

කියනලද විපාකවිඤ්ඤාණ දෙතිස්දෙන අතුරෙන් කාමාවචර පිණින් ලබාගන්නාලද චක්ඛුවිඤ්ඤාණ සොතවිඤ්ඤාණ ඝාණවිඤ්ඤාණ ජිවහාවිඤ්ඤාණ කායවිඤ්ඤාණ යන මේ විපාකයින් පස්දෙන ඉෂ්ටවූ හෝ ඉෂ්ට මධ්‍යස්ථවූ හෝ රූප ශබ්ද ගන්ධ රස සපර්ශ අරමුණු ඵල්ලබගෙණ චක්ඛුප්‍රසාද ශ්‍රොත්‍රප්‍රසාද ඝ්‍රාණප්‍රසාද ජිවහාප්‍රසාද කාය ප්‍රසාද ඇසුරුකොට දර්ශනකෘත්‍ය ශ්‍රවණකෘත්‍ය ආඝ්‍රාණකෘත්‍ය ආස්වාදනකෘත්‍ය ථුසනකෘත්‍ය සම්පාදනයකෙරෙමින් ප්‍රවෘතති විපාක වාරයෙහිම යෙදිපවත්නාහ. එසේම කුශලකර්ම විපාක සම්ප්‍රතිච්ඡන සිත දකුශල විපාක සන්තීරණ සිත් දෙදෙනද ඉෂ්ට ඉෂ්ට මධ්‍යස්ථ රූපාදී අරමුණු පස එල්ලබගෙණ භවඳවසානය ආශ්‍රයකොට සම්ප්‍රතිච්ඡන කෘත්‍ය හෙවත් අරමුණු පිළිගන්නා කෘත්‍ය අරමුණු තීරණය කරන්නාවූ කෘත්‍යයන් සම්පාදනයකෙරෙමින් පවත්නාහ.

අකුශල කර්මයෙන් ලබාගන්නාලද චක්ඛුවිඤ්ඤාණ සොත විඤ්ඤාණ ඝාණවිඤ්ඤාණ ජිවහාවිඤ්ඤාණ කායවිඤ්ඤාණ යන මේ විපාක සිත් පස්දෙන අනිෂ්ටවූ හෝ අනිෂ්ට මධ්‍යස්ථවූ හෝ රූප ශබ්ද ගන්ධ රස සපර්ශ අරමුණු ඵල්ලබගෙණ චක්ඛුප්‍රසාද ශ්‍රොත්‍රප්‍රසාද ඝ්‍රාණප්‍රසාද ජිවහාප්‍රසාද කායප්‍රසාදයන් ඇසුරුකොට දර්ශනකෘත්‍ය ශ්‍රවණකෘත්‍ය ආඝ්‍රාණකෘත්‍ය ආස්වාදනකෘත්‍ය ථුසන කෘත්‍ය සම්පාද

නයකෙරෙමින් පවත්නාහ. එසේම අකුශලකර්ම විපාක සම්ප්‍රතිච්ඡන චිත්තයද අකුශල කර්මවිපාක සන්තීරණ චිත්තයද අනිෂ්ට අනිෂ්ටමධ්‍යයෝ රූපාදි අරමුණු පස එල්බගෙණ හෘදයවස්තුව ආශ්‍රය කොට අරමුණු පිළිගැනීම් කෘත්‍ය අරමුණු තීරණකිරීම් කෘත්‍ය සම්පාදනයකෙරෙමින් පවත්නාහ.

කාමාවචර කුශලකර්ම ශක්තියෙන් ලබාගන්නාලද මහාවිපාක නම්වූ කර්ම විපාක සිත් අටදෙනෙක් භවාඞ්ගචලනාදී තදාලම්බන යන කතිපය කෘත්‍යයක් සම්පාදනයකෙරෙමින් හෘදයවස්තුව නිසා පවත්නාහ. එසේම රූපාවචර කුශලශක්තියෙන් ලබාගන්නාලද රූපාවචර විපාක නම්වූ කර්මවිපාක සිත් සතරදෙනෙක් භවාඞ්ගචලනාදී යන කතිපය කෘත්‍යයක් සම්පාදනයකෙරෙමින් හෘදයවස්තුව නිසා පවත්නාහ. අරූපාවචර කුශලකර්ම ශක්තියෙන් ලබනලද අරූපාවචර විපාකනම්වූ කර්මවිපාක සතරදෙනෙක් භවාඞ්ගචලනාදී යන කතිපයකෘත්‍යයක් සම්පාදනයකෙරෙමින් හෘදයවස්තුවආශ්‍රයනොකොට අදව්‍යවූ සකකිරියන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධ ශක්තීන් පවත්නාහ.

මෙසේ ප්‍රවෘත්තී විපාක වාරයෙහි දක්වනලද දෙතිස් විපාක විඤ්ඤාණයන්ට පුඤ්ඤාභිසංඛාර අපුඤ්ඤාභිසංඛාර ආනඤ්ජාභිසංඛාරයෝතුමූ නොයෙක් වාරයහිරිස්කළාවූ නානාක්ෂණිකකර්ම ප්‍රත්‍යය වශයෙන්ද උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන්ද දෙයාකාරයෙන් ප්‍රත්‍යය වූවාහු වේති. මේසේ ප්‍රවෘත්තී විපාකවාර සමයෙහි දෙතිස් විපාක විඤ්ඤාණයන් විපාක දෙනසැටි දක්වා ප්‍රතිසන්ධි විපාක වාර සමයෙහි දෙතිස් විපාක විඤ්ඤාණයන් අතුරෙන් විපාක සිත් එකුන් විසි දෙනෙකුන් ප්‍රතිසන්ධි වශයෙන් විපාක දෙනසැටි විස්තරකරනු පිණිස මෙතැන්සිට කරුණු ගෙනහැර දක්වනුලැබේ.

කාම භවයෙන් කාම භවය හෝ රූප භවය හෝ අරූප භවය හෝ රූප භවයෙන් කාම භවය හෝ රූප භවය හෝ අරූප භවය හෝ අරූප භවයෙන් කාම භවය හෝ අරූප භවය හෝ සුගති භවයෙන් දුගති භවය හෝ දුගති භවයෙන් සුගති භවය හෝ සන්ධි කිරීම් වශයෙන් හැළපීම් පැහීම් ප්‍රතිසන්ධියයි කියනුලැබේ.

සවභාවයෙන් තේරුම්කරගැනීමට දුෂ්කරවූ ඒ මේ ප්‍රතිසන්ධි ක්‍රමය සංක්ෂේපයෙන් කිවහොත් අවබෝධයට කොහෙත්ම පහසු නොවන හෙයින් **ප්‍රතිසන්ධිහු කෙනෙක්ද? ප්‍රතිසන්ධි සිත් කෙනෙක්ද? කවරඝනකින් කවරභවයෙක්හි ප්‍රතිසන්ධියවේද? ප්‍රතිසන්ධි චිත්තයන්ට ගොචරවූ අරමුණු කුමක්ද?** යන මේ ප්‍රශ්න සතර විසඳිය යුතුවේ.

අසංඥ සත්ව තලයෙහි ඇතිවන රූප මාත්‍රයක්හුගේ ප්‍රතිසන්ධි යත්සමන ප්‍රතිසන්ධීහු (20)විස්සෙකි, උපෙක්ෂා සහගත අකුශල විපාක කුශල විපාක සන්තීරණ සිත් දෙදෙන මහා විපාක සිත් අටදෙන රූපාවචර විපාක සිත් පස්දෙන අරූපාවචර විපාක සිත් සතර දෙන එකතුව විපාකසිත් එකුන් විසිදෙන (19) ප්‍රතිසන්ධි සිත්නම්, මේ එකුන්විසි ප්‍රතිසන්ධි සිත් අතුරෙන් අකුශල විපාක සන්තීරණ චිත්තයෙන් සතර අපායෙහි ප්‍රති සන්ධිය ගෙණදේ, කුශල විපාක සන්තීරණ චිත්තයෙන් මිනිස් ලොව ජාත්‍යන්ධ ජාතිබධිර ජාති උම් මත්තක ජාති එලමුන නපුංසකාදීන්ගේ ප්‍රතිසන්ධිය ගෙණදේ, මහා විපාක සිත් අටෙන් දෙව්ලෝ මිනිස්ලෝ දෙක්හි පිනැත්තවුන්ගේ ප්‍රතිසන්ධිය ගෙණදේ, රූපාවචර විපාක සිත් පසින් රූපාවචර බඹ ලොව උපදනා සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධිය ගෙණදේ, අරූපාවචර සිත් සතරෙන් අරූපී තලයන්හි උපදනා සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධිය ගෙණදේ, සංක්ෂේප වශයෙන් ප්‍රතිසන්ධි චිත්තයන්ට අතීතඅරමුණ ප්‍රත්‍යුත්පන්නා අරමුණ නවකතව්‍ය අරමුණයහි කියනලද අරමුණු තුණෙන් කිසිවක් සුදුසුපරිද්දෙන් අරමුණුවේ, අසංඥ සත්ව ප්‍රති සන්ධිය රූප මාත්‍රයක්හුගේම ප්‍රතිසන්ධියක් බැවින් කිසියම් අරමුණක් හුගේ ග්‍රහණයක කිරීමක් නැත, කියනලද එකුන්විසි ප්‍රතිසන්ධි විපාක සිත් අතුරෙන් විඤ්ඤාණඤ්චායතන තලයෙහි උපදනා සත්ත්වයන්ට ඇතිවන ප්‍රතිසන්ධි විපාක චිත්තයත් නෙවසඤ්ඤානාසඤ්ඤා යතන තලයෙහි උපදනා සත්ත්වයන්ට ඇතිවන ප්‍රතිසන්ධි විපාක චිත්ත යත් අතීතවූ අරමුණක්ම අරමුණුකෙරේ; ඒ කෙසේද?

විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය ලබන්නාවූ පුද්ගලතෙම ආකා සානඤ්චායතන සිත අරමුණුකොටද නෙවසඤ්ඤානාසඤ්ඤා යතන ධ්‍යානය ලබන්නාවූ පුද්ගල තෙම ආකිඤ්චඤ්ඤායතන සිත අර මුණුකොටද ලබති. මෙකී ධ්‍යානලාභී පුද්ගලයෝ දෙදෙන මේ භවයෙන් චුතවූ කල්හි දෙවන සතරවන අරූතලයන්හි විඤ්ඤා ණඤ්චායතන විපාක සිතින් හා නෙවසඤ්ඤා නාසඤ්ඤායතන විපාකසිතින් ප්‍රතිසන්ධිය ලබන්නෝ වෙති, ඔවුන් ලත් එකී ප්‍රතිසන්ධි විපාක චිත්තයන්ට ඉහත භවයෙහිදී මරණාසන්න ජවන්සිත්වලින් අරමුණු ගන්නාලද ආකාසානඤ්චායතනයිනත් ආකිඤ්චඤ්ඤායතන සිතත් වර්තමානයෙහිලත් අත්බැව්හිද අරමුණුවන බැවින් ඒ අදහස සලකා විඤ්ඤාණඤ්චායතනතලයෙහි ඇතිවන සත්ත්වයන්ගේ ප්‍රති සන්ධිසිතට හා නෙවසඤ්ඤා නාසඤ්ඤායතන තලයෙහි ඇතිවන සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධිසිතට අතීත අරමුණුවැටහෙන්යයි කියනලදී

උපෙක්ෂා සහගත කුශල විපාක අකුශල විපාක සන්තීරණසිත් දෙදෙන හා මහා විපාක සිත් අටදෙන එකතුව යනමේ දශයෙන්

ප්‍රතිසන්ධිය ලබාදෙනවිට ඒ සිත් අතීතවූ අරමුණක් හෝ වර්තමානවූ අරමුණක් අරමුණුකොට පවත්නාක. රූපාවචර බඹලෙව්හි උපදනා සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධිය ගෙණදෙන රූපාවචර විපාක සිත්පසවත් ආකාසානඤ්චායතන අරූතලයෙහි උපදනාසත්ත්වයන්ගේ ප්‍රතිසන්ධිය ගෙණදෙන ආකාසානඤ්චායතන විපාකසිතවත් ආකිඤ්චඤ්ඤායතන අරූතලයෙහි උපදනා සත්වයන්ගේ ප්‍රතිසන්ධිය ගෙණදෙන ආකිඤ්චඤ්ඤායතන විපාකසිතවත් අතීතාදී ආලම්බනකාමයෙන් නොකියනලද හෙයින් නවක්ත්‍යාලම්බනයයි නම්ලද යම් කිසි කසිණනිමිත්තක් හෝ කිසුණු ඉගුළු අහස හෝ නාස්‍යභාව අරමුණක් හෝ යථා ක්‍රමයෙන් අරමුණු වෙත්.

මෙසේ අතීත අරමුණු ප්‍රත්‍යුත්පන්න අරමුණු නවකත්‍ය අරමුණු යන මේ තුන්වැදෑරුම් අරමුණුනි නැමිපවත්නා ප්‍රතිසන්ධිතෝමෝ යම්කෙයකින් අතීත අරමුණක් ගන්නාලද්දුවූ හෝ නවකත්‍ය අරමුණක් ගන්නාලද්දුවූ හෝ චුති සිතට අනතුරුවම උපදීද එහෙයින් අතීත අරමුණු නවකත්‍ය අරමුණු දෙක අතුරෙන් එක්තරා අරමුණක් අරමුණුකොට ඇති චුති සිතට අනතුරුවැ අතීත අරමුණක් හෝ ප්‍රත්‍යුත්පන්න අරමුණක් හෝ නවකත්‍ය අරමුණක් හෝ අරමුණුකොට ඇති ප්‍රතිසන්ධි චිත්තයාගේ සුගති දුගති භවයෙහි පිහිටීම වේ. ඒ කෙසේද?

කාම සුගති භූමියෙහි සිටියාවූ අකුසල් කළාවූ පුද්ගලයාට වනාහි මරණාසන්න අවස්ථාව පැමිණේවිට යම්සේ සවස් කාලයෙහි මහත්වූ පර්වත වෘක්ෂාදීන්ගේ සෙවනැල්ල පොළවෙහි පැතිරසිටීද එමෙන් පූර්ව භවයෙහි කළාවූ අකුශලකර්ම හෝ අකුසල් කිරීමට උපකාරවූ කඩු දුනු තුවක්කු ආදිවූ කර්ම නිමිති හෝ මනොද්වාරයෙහි එළඹ සිටින්නාහුවෙති, එසේ එළඹ සිටි කර්ම හෝ කර්මනිමිති හෝ අරමුණුකොටැ උපදනාවූ තදාලම්බන සිත් අවසන්කොට ඇති මරණාසන්න ජවන් වීථි සිතට අනතුරුවැ භවාඞ්ගසිතට විෂයවූ යම් අරමුණක් ඇත්නම් ඒ අරමුණ එල්බගෙණ චුතිචිත්තය උපදනේසි. ඒ චුතිසිත උත්පාද ක්ෂණයෙහි ජාතිදුක දක්වා සිටිනි ක්ෂණයෙහි ජරාදුක දක්වා භඞ්ග ක්ෂණයෙහි මරණ දුක දක්වා නිරුඬවූ අනතුරුවම මරණාසන්න ජවන චිත්ත වීථියෙහි ලාඅරමුණු ගන්නාලද කර්ම කර්ම නිමිති අතුරෙන් එක්තරා අරමුණක් එල්බගෙණ මුල් සුන් නොවූ අවිද්‍යා තෘෂ්ණා ආදී ක්ලේශයන්ගේ බලවත් භාවයෙන් අවනතකිරීම් ඇතිව දුගති භවයට ඇතුළත්වූ ප්‍රතිසන්ධි චිත්තය උපදනේසි.

මේ ප්‍රතිසන්ධිවේදනාකි අත්ත අරමුණුගත් වුනිසිතට අනන්තරුවේ සිදුවන අතීතකර්ම කර්මනිමිත්ත අරමුණුකොට ඇතිවූපදනා ප්‍රතිසන්ධි යයි, කාම සුගති භවයෙහි සිටියාවූ ඇතැම් පව්කළු කෙනෙකුන්ට වනාහි මරණාසන්න කාලයෙහි තමාකළ පාප කර්ම බලයෙන් නිරය ගිනිදැල් පැහැයක් හෝ මෙතරණි ඔබලී අසි පත්‍රවනාදී ඔසුපත් නිරයවල් වණී සටහනක් හෝ ප්‍රේත තිරිසන් සතුන්ගේ කැඩහුරු කමක් හෝ ප්‍රේත තිරිසන්සතුන් නිතර හැසිරෙන ඉඩම්වල වණී සටහනක් හෝ යන මේ ආදී සතර අපාදුගතියට ඇතුළත් දුගති නිමිත්තක් සිහිවෙන් වැටහෙන්නාක්මෙන්ද දිවැසට පෙනෙදයක් මෙන්ද මනොද්වාරයෙහි අරමුණුවේවා පැමිණේ, කෙසේද?

පළමුකොට භවාඞ්ගචලනා සිත ඉපිද නිරුද්ධවී දෙවනුව භවාඞ්ග පෙරෙජ්ද සිත ඉපිද නිරුද්ධව තුන්වනුව මනොද්වාරාවර්ජන සිත කියනලද ක්‍රමයෙහි දුගති නිමිත්තක් අරමුණුකොට ඉපිද නිරුද්ධවේ. මරණයට ඉතා ලංවූ චිත්ත පරම්පරාවගේ දුබලබවනිසා ජවන්සිත් පස්දෙනෙක් ඒවා අනන්තරුවේ උපදනාහ, ඒ ජවන්සිත් පස්දෙනාද මනොද්වාරාවර්ජන සිතින් ගන්නාලද දුගති නිමිත්තම අරමුණු කිරීමෙන් ඉපිද නිරුද්ධවෙති. ඒවා අනන්තරුවේ තදාලම්බන සිත් දෙදෙනෙක් ඉපිද නිරුද්ධවෙති. ඒවා අනන්තරුවේ භවාඞ්ග විෂයවූ අරමුණෙහි එල්බගෙණ වුනි චිත්තය ඉපිද නිරුද්ධවේ. වුනි චිත්තයාගේ නිරුද්ධ වීමෙන් මෙහවුයෙහි චිත්තයන්ගේ ප්‍රවෘත්තියසම්පත්තවේ මෙතෙකින් භවාඞ්ග චලනා සිතේ පටන් වුනිසිතදක්වා එකොළොස් චිත්ත ක්ෂණ කෙණෙහුන් ඉක්ම ගොස් ඒ චිත්තාවීථිය අවසන්වීමට චිත්ත ක්ෂණ පස්දෙනෙකුන්ට ආයුෂ ඇතිකල්හි එම දුර්ගති නිමිති සංඛ්‍යාත අර මුණෙහි එල්බගෙණ ප්‍රතිසන්ධිචිත්තය උපදී. මේ ප්‍රතිසන්ධිය වනාහි අතීත අරමුණු ගත් වුනිසිතට අනන්තරුවෑ ප්‍රකෘත්‍යුපපන්න අරමුණ ගෙණ උපදනා ප්‍රතිසන්ධියයි.

කාම සුගති භවයෙහි සිට පව්කළාවූ ඇතැම් කෙනෙකුන්ට මරණාසන්න කාලයෙහි වඤ්චනාදී පඤ්චවිධාරක්ෂන් අතුරෙන් එක්තරා දෙයක්හි රාගාදී අකුසල් ඉපදීමට හෙතුවූ අරමුණක් විෂයබවට පැමිණේද මිටට භවාඞ්ගචලනාගෙන පටන් ව්‍යවස්ථාපන චිත්තය දක්වා පිළිවෙලින් සත් ඉපද නිරුද්ධවූ කල්හි මරණාසන්න භාවයෙන් චිත්තවීථිය මඳව පැවති බැවින් ජවන්සිත් පස්දෙනෙක්ද තදාලම්බන සිත් දෙදෙනෙක්ද ඉපිද නිරුද්ධවෙති, ඒවා අන තුරුවෑ භවාඞ්ග විෂයවූ අරමුණෙහි එල්බගෙණ වුනි චිත්තය ඉපිද නිරුද්ධවේ. මේතෙක්හි භවාඞ්ග චලනා භවාඞ්ගුපරෙජ්ද ආවර්ජන දස්සන සම්පටිච්ඡන සන්තීරණ ව්‍යවස්ථාපන ජවන් සිත් පස තදා

ලබන සිත් දෙදෙන චුති සිත යන චිත්තක්ෂණ පසළොස්දෙනෙක් ඉක්මගියාහු වෙති, යම්හෙයකින් මේ චිත්තවීථිය අවසන්වීමට එක් චිත්තයකට ආයුෂ ඇත්තේද එහෙයින් එක චිත්තක්ෂණයකට ආයුෂ ඇතිපවවාරයත් විසින් ගන්නාලද එකී හීන අරමුණෙන් එල්බගෙණ දුගති භවයෙහි ප්‍රතිසන්ධි චිත්තය උපදනේසි. මේ ප්‍රතිසන්ධිය වනාහි අතීත අරමුණු ගත් චුති සිතට අනතුරුවැ ප්‍රත්‍යුත්පන්න අරමුණු ගෙණ උපදනා ප්‍රතිසන්ධියසි.

මෙසේ අතීත අරමුණුගත් සුගති චුතියෙන් අනතුරුව අතීත වර්තමාන අරමුණුගෙණ දුගතියෙහි පිළිසිඳගැණීම සිදුවෙනබැව් දතයුතුසි.

සතර අපා දුගති භවයෙහි සිටියාවූ රුස්කළ කුසල් ඇත්තාවූ ඇතැම් පුද්ගල කෙනෙකුන්ටවනාහි මරණාසන්න අවස්ථාව පැමිණි විට යම්සේ සවස් කාලයෙහි මහත්වූ පර්වත ශ්‍රේණිලතාදීන්ගේ සෙව නැල්ල පොළවෙහි පැනිර සිටීද එමෙන් පූර්වභවාදියෙහි කළාවූ කුශල කර්ම හෝ කුසල් කිරීමට උපකාරවූ මල්ගඳවිලවුන් සිවුරු පිළි ආදිවූ කර්ම නිමිති හෝ මනොද්වාරයෙහි එළඹ සිටින්නාහුවෙති. එසේ එළඹ සිටි කර්ම හෝ කර්ම නිමිති හෝ අරමුණුකොටැ උපදනාවූ තදාලම්බන සිත් අවසන්කොට ඇති මරණාසන්න ජවන් වීථි සිතට අනතුරුවැ භවාඞ්ග සිතට වැටහී ගිය අරමුණ එල්බගෙණ චුති සිත උපදනේසි ඒ චුති සිත උත්පාදක්ෂණයෙහි ජාති දුක දක්වා සිති ක්ෂණයෙහි ජරා දුක දක්වා භංග ක්ෂණයෙහි මරණ දුක දක්වා නිරුඬවූ අනතුරුවමැ මරණාසන්න ජවන් සිව් වීථියෙන් අරමුණු ගත්නාලද කර්ම කර්ම නිමිති අතුරෙන් එක් තරා අරමුණක් එල්බගෙණ මුල් සුන් නොවූ අවිද්‍යා තෘෂ්ණාදී ක්ලේශයන්ගේ බලවත්භාවයෙන් අවනතකිරීම්ඇතිව (නමනලදුව) සුගතිභවයට අනන්තරීතවූ ප්‍රති සන්ධි සිත උපදනේසි. මේ ප්‍රතිසන්ධිය වනාහි අතීත අරමුණු ගත් චුති සිතට අනතුරුවැ සිදුවන අතීත කර්ම කර්මනිමිති අරමුණුකොට ඇතිව උපදනා ප්‍රතිසන්ධි සිතසි.

සතර අපා දුගති භවයෙහි සිටියාවූ ඇතම් පින්කළ කෙනෙක්ම වනාහි මරණාසන්න කාලයෙහි තමාකළ පුණ්‍ය කර්ම බලයෙන් දෙව්ලොව උපන්න විමාන කල්පවෘක්ෂාදියක් හෝ මිනිස් ලොව මානෘකුක්ෂි චණ්ඩී සටහනක් හෝ යන මේ ආදි සුගති භවයට ඇතුළත්වූ නන නිමිත්තක් සීනයෙන් වැටහෙන්නාක්මෙන්ද දිවැ සවි පෙණියන දෙයක්මෙන්ද මනොද්වාරයෙහි අරමුණුබවට පැමිණේ, කෙසේද? පළමුකොට භවාඞ්ගචලන සිත ඉපිද නිරුඬවැ

දෙවනුවැ භවාංගුපවෙඡ්දසිත ඉපිද නිරුඩවැ තුන්වනුව මනොවාරවජ්ජන සිත කියනලදුද යම් කිසි සුගති නිමිත්තක් අරමුණුකොටැ ඉපිද නිරුඩවේ මරණයට ඉතා ලංවූ චිත්ත පරම්පරාවගේ දුබල බව නිසා ජවන් සිත් පස්දෙනෙක් අනතුරුව උපදනාහ. එකී ජවන් සින්නුද මනොවාරවජ්ජන සිතින් ගන්නාලද සුගති නිමිත් තම අරමුණු කිරීමෙන් ඉපිද නිරුඩවෙති. ඊට අනතුරු තදුලම්බන සිත් දෙදෙනෙක් ඉපිද නිරුඩවෙති. ඊට අනතුරුව භවාංගවිෂයවූ අරමුණෙහි එල්බගෙණ වුනි සිත ඉපිද නිරුඩවේ. වුනිසිතගේ නිරුඩවීමෙන් මේ භවයෙහි චිත්තප්‍රවෘත්තිය සමාප්ත වේ. මෙතෙකින් භවාංග චලන සිතේ පටන් වුතිසිත දක්වා එකොළොස් චිත්ත ක්ෂණ තෙමේ කුන් ඉක්ම ගොස් ඒ චිත්ත ස්ථිතිය අවසන්වීමට චිත්ත ක්ෂණ පස්දෙනෙකුන්ට ආයුෂ ඇතිකල්හි එම සුගති නිමිති සඞ්ඛ්‍යාත අරමුණෙහි එල්බගෙණ ප්‍රතිසන්ධි චිත්තය උපදී. මේ ප්‍රතිසන්ධිය වනාහි අතීත අරමුණු ගත් වුති සිතට අනතුරුව ප්‍රත්‍යුත්පන්න අරමුණගෙණ උපදනා ප්‍රතිසන්ධියයි.

සතර අපා දුගති භවයෙහි සිට පින්කළාවූ ඇතම් කෙනෙකුන්ට මරණාසන්න කාලයෙහි චක්ඛුරාදි ද්වාරවූ පස අතුරෙන් එක්තරා ද්වාරවූවෙක්හි කුසල් ඉපදීමට හෙතුවූ ඉෂ්ට අරමුණක් විෂය බවට පැමිණෙද්ද ඔහුට භවාංග චලනයෙහි පටන් ව්‍යවස්ථාපන චිත්තය දක්වා පිළිවෙලින් සිත් ඉපිද නිරුඩවූ කල්හි මරණාසන්න භාවයෙන් චිත්ත වේගය දුර්වලව පැවති බැවින් ජවන්සිත් පස් දෙනෙක්ද තදුලම්බන සිත් දෙදෙනෙක්ද ඉපිද නිරුඩවෙති ඊට අනතුරුවැ භවාංග විෂයවූ අරමුණෙහි එල්බගෙණ වුති සිත ඉපිද නිරුඩවේ. මෙතෙකින් භවාංග චලන භවාංගුපවෙඡ්ද ආවජ්ජන දර්ශන සම්ප්‍රතිච්ඡන සන්තීරණව්‍යවස්ථාපන ජවන්සිත් පස තදුලම්බන සිත් දෙදෙන වුති සිත යන චිත්ත ක්ෂණ පසළොස්දෙනෙක් ඉක්ම ගියාහු වෙති. මේ චිත්ත ස්ථිතිය අවසන්වීමට එක් චිත්තක්ෂණකට ආයුෂ ඉතිරිව නිබෙන බැවින් පඤ්චවාරයන් විසින් ගන්නාලද එකී ඉෂ්ට අරමුණෙහි එල්බගෙණ දුගති භවයෙහි ප්‍රතිසන්ධි චිත්තය උපදනේහි. මේ වනාහි අතීත අරමුණු ගත් වුති සිතට අනතුරුව ප්‍රත්‍යුත්පන්න අරමුණගෙණ උපදනා ප්‍රතිසන්ධික්‍රමයයි.

මෙසේ අතීත අරමුණුගත් දුගති වුතියෙන් අනතුරුව අතීත වර්තමාන අරමුණුගෙණ සුගතියෙහි පිළිසිඳගැණීම තත් පරිද්දෙකින් සිදුවනබැව් දතයුතුයි.

කාමාවචර සුගති භූමියෙහි සිටියාවූ රැස්කළ පින් ඇත්තාවූ මරණ මඤ්චකයෙහි හොත්තාවූ ඇතම් කෙනෙකුන්ට වනාහි

සකස්කළ දානසීලාදි කුශල කර්මයක් හෝ එකී පින්කරගැණීමට හේතුවූ ශ්‍රද්ධාමල්විලවුන් ධජපටාක වස්ත්‍ර පරිෂ්කාරාදි කර්ම නිමිත්තක් හෝ ධ්‍යානලාභීයෙක්නම් කසිණ නිමිති ආදී කර්ම නිමිත්තක් හෝ මනොද්වාරයෙහි අරමුණුබවට පැමිණේ. ඒ කර්ම කර්මනිමිති අරබයා උපන්නාවූ තදාලම්බනසින් අවසන්කොට ඇති මරණාසන්න ජවන් සින් වීථියට හෝ කර්මනිමිති අරබයා උපන්නාවූ තදාලම්බන රහිත මරණාසන්න ජවන් සින් වීථියට හෝ අනාතුරුව භවාංග විෂයවූ අරමුණ ඵල්බෙණෙණ චුතිසිත ඉපිද නිරුද්ධවෙයි, චුති සිත නිරුද්ධව ගියකල්හි කාම සුගතියෙහි උපදින්නෙකුටනම් කර්ම කර්මනිමිති හෝ රූපාරූපභවයෙහි උපදින්නෙකුටනම් කර්මනිමිති හෝ අරමුණු කොට මුල්සුන් නොවූ අවිද්‍යා තෘෂ්ණා ආදී අනුශය කෙලෙසයන්ගේ බලවත් භාවයෙන් බහාලීම් ඇතිව කාම සුගති රූපාරූප සුගති භූමි පරිග්‍රහ කරන්නවූ ප්‍රතිසන්ධි චිත්තය උපදනේසි මේ වනාහි අතීතා රම්මණ චුතියෙන් අනාතුරුව අතීත අරමුණු නවකතව්‍යඅරමුණු ගණ උපදනා ප්‍රතිසන්ධික්‍රමයයි.

කාම සුගතියෙහි පින්කළ ඇතැම් කෙනෙකුන්ට මරණාසන්න කාලයෙහි සකස්කළ පුණ්‍යකර්ම බලයෙන් මිනිස්ලෝවිහි රකතවණ්ණ කම්බිලියක් බදුවූ මව්කුස වර්ණසටහනක් හෝ දෙව්ලොවෙහි උපන්න විමාන කල්පවෘක්ෂාදීන්ගේ වර්ණ සටහනක් හෝ යන මේ ආදී සුගති භවයට ඇතුළත් ගති නිමිත්තක් සිතයෙන් වැටහෙන් නාක්මෙන්ද දිවසට පෙණියන්නාක්මෙන්ද මනොද්වාරයෙහි අර මුණු බවට පැමිණේ. තදනන්තරවූ ජවන තදාලම්බන ඉපිද නියපසු භවාඞ්ගවිෂය අරමුණෙහි ඵල්බෙණෙණ චුති සිත ඉපිද නිරුද්ධවේ චුති චිත්තයෙන් මේ භවය අවසන්වූ අනාතුරුවම භවාඞ්ගවලන ඔහේ පටන් චුතිසිත දක්වා එකලොස් චිත්ත ක්ෂණයෙහිනුත් අතුත්ව ඒ සින්වීථිය අවසන්වීමට චිත්තක්ෂණ පසකට ආයුස ඇති කල්හි කියනලද සුගති නිමිති අරමුණෙහි ඵල්බෙණෙණ සුගති භව යෙහි ප්‍රතිසන්ධි සිත ඔටගණියි. මේ වනාහි අතීත අරමුණුගත් චුති සිතට අනාතුරුව ප්‍රත්‍යුත්පන්න අරමුණුගෙණ උපදනා ප්‍රතිසන්ධි ක්‍රමයයි.

කාම සුගති භූමියෙහි ඇතැම් කෙනෙකුන්ට මරණාසන්න කාලය පැමිණි කල්හි යම් කිසිවෙක් ඔහුවත පැමිණ දරුව තොප හදහා මෙබදු පින්කමක් කෙරෙයි ඒ ගැණ සිත පහදවයි කියා මල් මාලා ධජ පටාකාදි වශයෙන් රූපාරම්මණයක් හෝ ඛණ ඇස් ඔම තූගයී පූජාදිවශයෙන් සද්දාරම්මණයක් හෝ දුම් සුවඳ සඳුන් පිණිදිය සුවඳ ආදි වශයෙන් ගන්ධාරම්මණයක් හෝ ගුඩ මධුශර්කී

රූදී වශයෙන් රූපාරම්මණයක් හෝ චීන වස්ත්‍ර කාශික කොසෙය්‍ය වස්ත්‍රාදී වශයෙන් සුඛශීලම්බනයක් හෝ චක්ඛු සොත ඝාන ජිව්හා කාය සම්ඵස්සාත පඤ්චද්වාරයෙහි එලඹුවද්ද මරණාසන්න පුද්ගලයාහට ඒ අරමුණු එළඹුසිටිකල්හි භවාඞ්ග චලනයෙහි පටන් ව්‍යවස්ථාපන චිත්තය දක්වා පිළිවෙළින් සිත් ඉපිද නිරුද්ධ ගිය ඉක්බිති මරණාසන්න බැවින් චිත්ත වේගයාගේ දුර්බලභාවය නිසා ජවන් පස් දෙනෙක්ද, තදාලම්බන සිත් දෙදෙනෙක්ද, ඉපිද නිරුද්ධවෙති. ඊට අනතුරුව භවාඞ්ගවිෂය අරමුණෙහි එල්බ එක් වුති සිතක් ඉපිද නිරුද්ධවේ. ඊට අනතුරු මරණාසන්න විඤ්ඤත්තිය අවසන්වීමට චිත්තක්ෂණයක කාලය ශෙසවසිටි අරමුණෙහි එල්බගෙණ සුගති භවයෙහි ප්‍රතිසන්ධි චිත්තය පිහිටයි. මේ වනාහි අතීත අරමුණුගත් චුතියෙන් අනතුරුවූ ප්‍රත්‍යුත්පන්න අරමුණුගෙණ ඇතිවන ප්‍රතිසන්ධි ක්‍රමයයි.

පඨවීකසිණ භාවනාදී වශයෙන් රූපාවචර බඹලොව උපන් නාවූ ඇතැම් කෙනෙකුන්ට මරණාසන්නකාලය පැමිණිකල්හි දෙව් ලෝ මිනිස්ලෝ දෙක්හි උපදනේවීනම් කාමාවචර කුසලකම් කම් නිමිති ගති නිමිති අතුරෙන් එක්තරා නිමිත්තක් හෝ රූපාවචර බඹලොව හා ප්‍රථම තෘතීය අරූතලයන්හි උපදනේවීනම් කසිණ නිමිති ආදී නවකත්තව්‍යාලම්බනයක් හෝ දෙවන සතරවන අරූතල යන්හි උපදනේවීනම් මහද්ගත අරමුණක් හෝ මනොද්වාරයට සුපින්නයෙන් දක්නාක්මෙන් දිවැසට පෙනීගන දෙයක්මෙන් වැටහෙති.

ඇතැම්විට කාමසුගතියෙහි උපදින්ට සුදුසු බ්‍රහ්මකායික සත්ත්වයන්ගේ චක්ඛුද්වාර ශ්‍රොත්‍රද්වාරයන් අතුරෙන් එක්තරා දෙරටුවකට කුසල් ඇතිවීමට හෙතුවූ රූප ශබ්ද සම්ඵස්සාත ප්‍රණීත අරමුණක් හමුවීමට පැමිණේ. ඔහට පිළිවෙළින් ව්‍යවස්ථාපන සිත දක්වා සිත් ඉපිද නිරුද්ධව ගියකල්හි මරණාසන්නභාවයෙන් චිත්ත වේගය දුර්බලව සිටිබැවින් ජවන් සිත් පස්දෙනෙක් ඉහතකී අරමුණු එල්බගෙණ උපදිති. (මහද්ගත භවයෙන් චුතවන සත්වයන්ට තදාලම්බනයෙක් නැත.) ජවන්සිත් ඉපිද නිරුද්ධව ගිය ඉක්බිති භවාඞ්ගවිෂය අරමුණෙහි එල්බගෙණ එක් වුතිසිතක් ඉපිද නිරුද්ධවේ වුතිචිත්තයාගේ අවසානයෙහි කාමසුගතියෙහි හෝ රූපසුගතියෙහි අරූපසුගතියෙහි හෝ ඇතුළත්වූ ඉහතකී අරමුණු අතුරෙන් එක් තරා අරමුණක් ගෙණ ප්‍රතිසන්ධිචිත්තය උපදනේසි. මේ වනාහි නවකත්තව්‍ය අරමුණගන්නාලද සුගති චුතියෙන් අනතුරුවූ අතීත අරමුණු ප්‍රත්‍යුත්පන්න අරමුණු නවකත්තව්‍ය අරමුණු ගෙණ ඇතිවන සුගති ප්‍රතිසන්ධියගේ ආකාරයයි.

මෙහි කී අනුසාරයෙන් අරූපභවයෙහි ඇත්තාවූ සත්වයන්ගේ චුතියට අනතුරුව කාම භවාදීන්හි ප්‍රතිසන්ධියවන සැටි දතයුතුයි. අරූපභවයෙන් චුතවන සත්වයන්ගේ අනතුරු අත්බැව්හි රූපාවචර බඹතලයන්හි යම්හෙයකින් පිළිසිඳගැණීමක් නැද්ද එසේම මතු මතු අරූතලයන්හි සිටින්නාවූ සත්වයන්ගේ අනතුරු අත්බැව්හි ලා යව යව අරූතලයන්හි පිළිසිඳගැණීමෙක් නැද්ද තවද චතුර්ථාරූප්‍ය චුතියෙන් අනතුරුව නවකතව්‍ය අරමුණු ගත්නාලද ප්‍රතිසන්ධියක් නැද්ද එසේහෙයින් ඒ වෙනස සලකා යථාභූතාර්ථය දතයුතුයි. මේ වනාහි අතීත නවකතව්‍යාලම්බන සුගතියෙන් අනතුරුවැ අතීත නවකතව්‍ය ප්‍රත්‍යුත්පන්න අරමුණු ගෙණ ඇතිවන ප්‍රතිසන්ධි ක්‍රමයයි.

සතරඅපා දුර්ගතියෙහි සිටියාවූ පව්කරන්නාවූ පුද්ගලයාහට වනාහි කියනලද ක්‍රමයෙන් කර්මයක් හෝ කර්මනිමිත්තක් හෝ ගතිනිමිත්තක් හෝ මනොද්වාරයෙහිද, අකුසල් ඉපදීමට හෙතුවූ රූපාදි ලාමක අරමුණක් පඤ්චද්වාරයෙහිද අරමුණුබවට පැමිණෙ ඉක්බිති ඔහට යථාක්‍රමයෙන් චුතිචිත්තය ඉපිද නිරුද්ධවූකල්හි දුගතිභවයට ඇතුළත්වූ අරමුණු අතුරෙන් කිසියම් අරමුණක් අරමුණුකොට ගෙණ ප්‍රතිසන්ධි චිත්තය උපදනේයි මේ වනාහි අතීත අරමුණුගත් දුගති චුතියෙන් අනතුරුව අතීත වර්තමාන අරමුණුගෙණ උපදනා ප්‍රතිසන්ධියගේ පවත්නා ආකාරයයි.

**"පවත්තමානං සන්ධිමනි මෙධා කම්මමනවත්තති**
**මිස්සාදිට්ඨිව හෙදෙති භෙදස්ස දුව්ධාදිනෝ"** යි

වදාළ වචන හෙයින් මේ එකූන්විසිවැදෑරුම්වූ විපාක විඤ්ඤාණය වනාහි ප්‍රතිසන්ධිය හෙණදෙන අවස්ථාවෙහි පවත්නේවීනම් සමකීය යවකීය භවානුරූපවැ විපාකදෙන්නාවූ එකොකී ප්‍රතිසන්ධිචිත්තයට ජනකකර්මය නානාක්ෂණික කර්ම ප්‍රත්‍යයවශයෙන්ද උප නිශ්‍රය ප්‍රත්‍යය වශයෙන්ද යන දෙපරිද්දෙන් ප්‍රත්‍යයවේ. එහෙයින් ප්‍රසථාන ප්‍රකරණයෙහි **"කුසලාකුසලං කම්මං විපාකානං ඛන්ධානං කට ත්තාරූපානංච රූපානං කම්මපච්චයේන පච්චයෝ කුසලාකුසලං කම්මං විපාකස්ස උපනිස්සයපච්චයේන පච්චයෝ"** යි වදාළාසේක මෙයේ නානාක්ෂණික කර්මප්‍රත්‍යය උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තීන් පවත්නාවූ ප්‍රතිසන්ධි විපාක විඤ්ඤාණයාගේ රූපයෙන් මිශ්‍රවූද රූපයෙන් අමිශ්‍රවූද ප්‍රකාරාදිවූ වෙනස දතයුත්තේය. කෙසේදයත්? මේ එකූන්විසි විපාක විඤ්ඤාණය වනාහි ප්‍රතිසන්ධිවශයෙන් එක්අයුරකින් පවත්නේවීනමුත් රූපය හා මිශ්‍රාමිශ්‍රවශයෙන් ප්‍රකාරවේ. එසින්

රූපය හා මිශ්‍රවූ ප්‍රතිසන්ධිය සහාඞ්ගිපසක් ඇත්තාවූ එකොළොස් කාමභවයෙහිද අසංඥසත්වතලය හැර පසළොස් රූතලයෙහිද යන පඤ්චවොකාර භවයෙහි ලැබේ. රූපය හා අමිශ්‍රවූ ප්‍රතිසන්ධිය සහර අරූතලයයි කියනලදු චතුවොකාර භවයෙහි ලැබේ. හුදකලා රූප මාත්‍රයක්හුගේම ප්‍රතිසන්ධිය අසංඥසත්වතල සංඛ්‍යාත එකවොකාර භවයෙහි ලැබෙන හෙයින් එහි ප්‍රතිසන්ධි විඤ්ඤාණයාගේ කිසිසේත් ලැබී මෙක්නැත. එකුන්විසි ප්‍රතිසන්ධි විඤ්ඤාණය වනාහි කාමප්‍රතිසන්ධි රූප ප්‍රතිසන්ධි අරූප ප්‍රතිසන්ධිවශයෙන් තුන්වැදෑරුම්වේ. අණ්ඩජ ප්‍රතිසන්ධි ජලාබුජ ප්‍රතිසන්ධි සංසෙදජ ප්‍රතිසන්ධි ඔපපාතික ප්‍රතිසන්ධි වශයෙන් චතුර්විධවේ. දිව්‍යමනුෂ්‍ය නිරය තිරශ්චීන ප්‍රෙතගතීන්හි ප්‍රතිසන්ධිවීම් වශයෙන් පස්වැදෑරුම්වේ. නානත්තකායා නානත්තසඤ්ඤී යනාදි සපනවිඤ්ඤාණසථිතීන්හි ප්‍රතිසන්ධිවශයෙන් සත්වැදෑරුම්වේ. අසංඥසත්ත්වප්‍රතිසන්ධිය රූපමාත්‍රයක්හුගේම බැවින් එය මෙහි ඇතුළත්නොකොට සත්ත්වාවාසවශයෙන් ප්‍රතිසන්ධ්‍යඅටවැදෑරුම්වේ. කියනලද රූපමිශ්‍ර රූපයෙන් අමිශ්‍ර ප්‍රතිසන්ධිවය අතුරෙන් රූපමිශ්‍ර ප්‍රතිසන්ධිය වනාහි භාවරූපසහිත භාවරූපරහිත ප්‍රතිසන්ධි භෙදයෙන් දෙයාකාරයි. එහින් භාවරූප සහිත ප්‍රතිසන්ධිය වනාහි ස්ත්‍රීභාව රූප ප්‍රතිසන්ධි පුම්භාවරූප ප්‍රතිසන්ධි භෙදයෙන් දෙයාකාරයි. භාව රූපරහිතවූ ප්‍රතිසන්ධිය වනාහි ප්‍රථමකල්පික මිනිසුන්ටද රූපභවයෙහි උපදනා සත්ත්වයන්ටද කාමභවයෙහි උපදනා නපුංසක සත්ත්වයන්ටද ලැබේ හෙවත් ඔවුන්ට ස්ත්‍රීභාවයහෝපුරුෂභාවයහෝ නොලැබේ. තවද මෙහි රූපයෙන් මිශ්‍රවූ යම් ප්‍රතිසන්ධියක් කියනලදද ඒ ප්‍රතිසන්ධිවිපාක විඤ්ඤාණය සමග වසතුදශක කායදශකවශයෙන් රූප කලාප දෙකක් හෝ වසතුදශක කායදශක භාවදශක වශයෙන් රූප කලාප තුණක් හෝ පහළවෙති. ප්‍රතිසන්ධිචිත්තය සමග උපදනා රූපයන්ගේ මිටවඩා පිරිහීමෙක් නැත. කියනලද පිරිහීමද අණ්ඩජ ජලාබුජ සත්ත්වයන්ගේ වශයෙනැයිද දතයුතුයි. අණ්ඩජ ජලාබුජ යොනියෙන් අන්‍යවූ සංසෙදජ ඔපපාතික යොනීන්හි නොයෙක් රූප කලාප සමග ප්‍රතිසන්ධිවිඤ්ඤාණයාගේ පහළවීම වේ. හෙද බ්‍රහ්මාදිවූ මහා ආත්මභාවික සත්ත්වයන්ගේ ශරීරයන්හි නොයෙක් ගවුගණන් දිගුපුලුල් ඇතිව නොයෙක් රූපකලාපයන්ගේ ඇතිවීම වන බව දතයුතුයි.

අනන්තිම පරිවෙජද වශයෙන් අණ්ඩජ ජලබුජ යොනිවයෙහි පහළවන්නාවූ රූප කලාප තුණ හෝ රූප කලාප දෙක උණ්හාම් එළුවන්ගේ ලොමිගසකින් තවරාගන්නාලූද පිරිසිදු තිලතෙල් බිඳක් පමණවූගේ කලල රූපය යන ව්‍යවහාරය ඇතිව උපදනේයි.

එහි අණ්ඩජ ජලාබුජ සංසෙදජ ඔපපාතික යොනීන්ගේ ගති වශයෙන් ඇතිවන වෙනස මේලඟට දතයුතුයි. කෙසේදයත්?

**නිරයෙහුමමවජ්ජෙසු දෙවෙසු ච න යොනියො**
**නියෙසා පුරිමිකා හොනති චතසෙසාපි ගතිසනයෙ. සි**

දුක්වූ හෙයින් එක්සිය සතිස් නිරයෙහිද බ්‍රහ්මාටු දෙවියන් හැර අනික් දෙවියන් කෙරෙහිද නිජ්ඣාමතණ්හික ප්‍රෙතයන් කෙරෙහිද අණ්ඩජ ජලාබුජ සංසෙදජ යොනි සංඛ්‍යාත ත්‍රිවිධ ප්‍රතිසන්ධිහු නොලැබෙති ඔපපාතික ප්‍රතිසන්ධියම ඔවුන්කෙරෙහි ලැබේය යනු (ව්‍යතිරෙකාර්ථයි) භාවයි. මනුෂ්‍යගතියෙහිද තිරිසන්ගතියෙහිද ප්‍රෙතගතියෙහිද බ්‍රහ්මාටු දෙවියන් කෙරෙහිද අණ්ඩජ ජලාබුජ සංසෙදජ ඔපපාතික යොනි සංඛ්‍යාත චතුර්විධ ප්‍රතිසන්ධිහු ලැබෙති, කවර හෙයකින් බ්‍රහ්මාටු දෙවියන් කෙරෙහි ඔපපාතික ප්‍රතිසන්ධිය පමණක්ම නොලැබේදයත්? ඔවුන්ද මනුෂ්‍යයන් සමාන බැවින් ඔපපාතික ප්‍රතිසන්ධිය පමණක්ම නොලැබේ. සියළුම යොනි පිළිබඳ ප්‍රතිසන්ධිහු ඔවුන්ට ලැබෙත් යනු භාවයි. කවරහෙයින් නිජ්ඣාමතණ්හික ප්‍රෙතයන් කෙරෙහි අණ්ඩජ ජලාබුජ සංසෙදජ යොනීහු නොලැබෙද්දයත් යම්හෙයකින් නිජ්ඣාමතණ්හික ප්‍රෙතයන්ගේ නිතර දුක් පීඩා ඇතිබැවින් මෙවුන්දම් සෙවීමෙක් නැත්තේද එහෙයින් ඔවිහු අණ්ඩජ ජලාබුජ සංසෙදජ යොනීන්හි නූපදිති. එසේ නොඉපැද්දම්ව අන් කරුණක්ද ඇත. ඔවුන් ගිනිදැල්වලින් වැලඳගත් ශරීර ඇතිව පිළිසිඳගන්නා බැවින් ඔවුන්ගේ ප්‍රතිසන්ධිය මාතෘකුක්ෂියෙක්හි නොපිහිටාමැති. යම් ප්‍රතිසන්ධියක් හටගන්නේ ගිනිමැලයක් වැලඳගනනම් එබඳු ගිනිමැලයෙක්හි තෙත්වූ ප්‍රදෙශයෙක් හෝ අශුචිවලමුත්‍රාදීන්ගේ තෙත්ගුණයක් හෝ නොමැති බැවින් සංසෙදජ යොනියෙහි ප්‍රතිසන්ධියකුදු ඔවුන්ට නැත්තේය. යටකී හෙතුන් නිසා අණ්ඩජ යොනියෙහි පිළිසිඳගැනීමක්ද නැත්තේය. එහෙයින් නිජ්ඣාමතණ්හික ප්‍රෙතයෝ ඔපපාතික යොනියෙහිම පිළිසිඳගනිත්යයි නිශ්චයව යායුතුයි.

**නිංඝනවවෙව රූපීසු සනතති උකකං සනොථ රූපානි**
**සංසෙදුපපාන යොනීසු අථවා අවකංසනොනිංස. සී**

යනු කීහෙයින් ඔපපාතික යොනීන් අතුරෙන් එකදෙශයක්වූ රූපී බ්‍රහ්මයන් කෙරෙහි චක්ඛුර්දශකයට අයත් රූපාවයව දශයද ශ්‍රොත්‍ර දශයකට අයත් රූපාවයව දශයද වත්ථු දශකයට අයත් රූපාවයව දශයද ජීවිතනවකයට අයත් රූපාවයව නවයද එකතුව චතුර්විධ කලාපයන්ගේ වශයෙන් රූප අවයව තිස්නවදෙනෙක් ප්‍රතිසන්ධි විඤ්ඤාණය සමඟ පහළවෙති. රූපී බ්‍රහ්මයන් හැර අනික් ඔපපාතික

යන් කෙරෙහිද සංසෙදජයන් කෙරෙහිද උඩත්පිරිසයින් චක්ඛුර් දශක ශ්‍රොත්‍රදශක ඝ්‍රාණදශක ජිහවාදශක කායදශක වත්‍රුදශක භාවදශකයන්ගේ වශයෙන් රූපාවයව සැත්තෑදෙනෙක් පහළ වෙති. යථොක්ත රූපකලාප සියල්ලම සදිව්‍යලොක වාසීවූ ඔප පාතිකයන්ගේ ප්‍රතිසන්ධි ප්‍රවෘත්තිකාලයන්හි නියතවශයෙන්ම ලැබෙති. කවරහෙතිනයත්? සදිව්‍යලොකවාසීවූ ඔපපාතිකයෝ වනාහි ප්‍රතිසන්ධිනන්නා කෙණෙහිවත් ප්‍රවෘත්තිකාලයෙහිවත් ඉන්ද්‍රිය විකලබවකට හෝ සන්ධිපුම්භාවයෙන් වෙනසකට කිසිකලක නොපැමිණෙද්ද එහෙයිනි. අණ්ඩජ ජලාබුජ සංසෙදජ යොනීන් අතුරෙන් කිසියම් යොනියෙක්හි ජාත්‍යන්ධව ජාතිබධිරව ඝ්‍රාණෙන්ද්‍රිය යෙන් තොරව ජාතිනපුංසකව උපදනා කිසිවක්හට ජිහවාදශක කායදශක වත්‍රුදශක වශයෙන් රූපාවයව නිසක් පහළවෙති. ඔවුන්ට චක්ඛුදසක සොතදසක ඝානදසක භාවදසකයෝ පහළ නොවෙති. මේ වනාහි අණ්ඩජ ජලාබුජ සංසෙදජ යොනීන්හි හෙයිම පරිච්ඡදයෙන් රූපයන්ගේ පහළවන ආකාරයයි. කියන ලද අණ්ඩජ ජලාබුජ සංසෙදජ යොනීන්හි ඇතැම්කෙණෙක් ජාත්‍යන්ධවද ඇතැම්කෙණෙක් ජාතිබධිරවද ඇතැම්කෙණෙක් අඝාණකවද ඇතැම්කෙණෙක් නපුංසකවද ඇතැම්කෙණෙක් චක්ඛු සොත ඝාණ භාවසංඛ්‍යාත ඉන්ද්‍රියයන් අතුරෙන් යම්කිසි ඉන්ද්‍රිය දෙකකින් විකලවද ඇතැම්කෙණෙක් ඉන්ද්‍රිය තුණකින් විකලවද උපදිති. එබැවින් ඔවුන්ගේ වශයෙන් රූප කලාප පිරිහෙළා අභි ප්‍රාය ගතයුතුයි.

**ඔඛ්කාරම්මණ ගතිහෙතු වෙදනාපීති විතක්ක විචාරෙහි හෙදුහෙද විසෙසො චුතිසඤ්ඤිනං පරිසෙසඤ්ඤෙය්‍යා. හි**

කීඉහයින් රූපයෙන් මිශ්‍රාමිශ්‍රවූ යම් යම් ප්‍රතිසන්ධිනු ඇද්ද ඒ ඒ ප්‍රති සන්ධීන්ට අතීතානන්තරවූ යම් යම් චුතියක්හි ඇද්ද යථෝක්ත චුති ප්‍රතිසන්ධීන්ගේ සකඛණ්ඩවශයෙන් සමාන අසමාන බවද ආලම්බන වශයෙන් සමාන අසමාන බවද ගතිවශයෙන් සමාන අසමාන බවද හෙතුවශයෙන් සමාන අසමාන බවද වෙදනාවශයෙන් සමාන අස මාන බවද ප්‍රීතිවශයෙන් සමාන අසමාන බවද විතර්කවශයෙන් සමාන අසමාන බවද විචාරවශයෙන් සමාන අසමාන බවද යන හෙදුහෙද විශෙෂය දතයුතුයි. කෙසේදයත්? කිසිකලෙක්හි වෙදනා සංඥා සංඛාර විඥාන සංඛ්‍යාත සතරක් ඇත්තාවූ අරූපාවචර චුතියෙන් අනතුරුවැ අරමුණු වශයෙන් වෙනසක් නැති වේදනා සංඥා සංඛාර විඥාන සංඛ්‍යාත සතරක් ඇත්තාවූ අරූපාවචර ප්‍රතිසන්ධියවේ. මේ වනාහි සතර අරූපල

යන්නේ ඒ ඒ තලයෙන් චුතවැ ඒ ඒ තලයන්හිම පිළිසිඳගන්නවුන් බව මෙහෙයින් කියනලදී. උඩ උඩ අරූතලවලින් චුතවැ යට යට අරූතලයන්හි පිළිසිඳගැණීමක්වත් අරූතලවලින් චුතවැ රූතල යන්හි පිළිසිඳගැණීමක්වත් නැද්ද එහෙයින් ආරම්මණ භෙදයක් නැතිවැ කියනලදී. අරූතලයෙන් අරූතලයට හුවමාරුවීම් වශ යෙන් ව්‍යුත්‍රිප්‍රතිසන්ධිය කෙරේනම් අරමුණු භෙදය වියහැකිමැ. එසේ නොවේ කියසේත් උඩ උඩ අරූතලයෙන් යට යට අරූතලයට සඞ්ක්‍රමණයක් නැති.

එසේම සතර අරූතලයෙන් සැව කිසිසේත් රූතලයන්හි පිළිසිඳගැණීමක්ද නැත. සතර අරූතලයන් ව්‍යුත්වැ නීතභවයක පිළිසිඳගැණීම කෙරේනම් ත්‍රිහෙතුක පුද්ගලයෙක්ව සපත කාම සුගතියෙහි අනතුරු අත්බැවිහි පිළිසිඳගැණීමැයි රූපභවයෙන් ව්‍යුත්වත තැනැත්තේ වනාහි සපතකාම සුගතියෙහි පිළිසිඳගන්නා ලද ත්‍රිහෙතුක පුහුදුක්වැ හෝ දුහෙතුක පුහුලක්ව පිළිසිඳගණී.

කිසිකලක අමහද්ගත බහිඩ්ඩාරම්මණයන් අරූප ව්‍යුතියව අනතුරුවැ මහද්ගත අජ්ඣත්තාරම්මණයන් දෙවන සතරවන අරූපාව ර ප්‍රතිසන්ධිය නොගණේ මේ වනාහි අරූප භූමීන්හි ව්‍යුතිප්‍රතිසන්ධීන්ගේ පිළිවෙල දක්වන නය මුඛමාත්‍රයෙකි. කිසිකලෙක්හි වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ සංඛ්‍යාත සකඬ සතරක් ඇති අරූපාවචර ව්‍යුතියෙන් අනතුරුව රූප වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ සංඛ්‍යාත සඬ පසක් ඇති කාමාවචර ප්‍රතිසන්ධියද කිසිකලෙක්හි පඤ්චඞ්ගිකයක් ඇති කාමාවචර ව්‍යුතියෙන් අනතුරුවැ හෝ පඤ්චඞ්ගිකයක් ඇති රූපාවචර ව්‍යුතියෙන් අනතුරුව හෝ සඬ සතරක් ඇති අරූපාවචර ප්‍රතිසන්ධියද ගොණේ. මෙසේ අතීතාරම්මණයන් ව්‍යුතියෙන් අනතුරුවැ ප්‍රත්‍යුත්පන්න අරමුණුගන්නා ප්‍රතිසන්ධිය දතයුතුයි.

රූපාවචර අරූපාවචර බ්‍රහ්මකායික සත්වයන්ට වනාහි උපචාර ධ්‍යානලාභීන්ගේ ශක්තිමත්භාවයෙන් එසින් ව්‍යුතවැ සතරඅපා දුගති යෙහි අනතුරු අත්බැවිහි පිළිසිඳ ගැණීමෙක් කිසිසේත් නැත එබැවින් එසින් අන්‍යවූ ඇතැම් සුගතිව්‍යුතියකින් අනතුරුවැ ඇතැම් දුගති ප්‍රතිසන්ධීන් ගනණේ **"එකවවසුගතිවුතියා අනන්තරං එකවම දුගහති පටිසන්ධි"** යනු වදාළ හෙයින් ඇතැම් සුගතිව්‍යුතියන්ත් අනතුරුව ඇතැම් දුගති ප්‍රතිසන්ධියක්ගෙණදේයයි අනිය මත් දැක්වීමේ ප්‍රයොජනය කවරේද? නානත්තකායා නානත්තසඤ්ඤී නම්වූද සත්වයන්ට අන්තර්භූතවූ ඇතැම් විනිපාතික පුද්ගලයෙක් ත්‍රිහෙතුක හෝ ද්විහෙතුක හෝ අහෙතුක හෝ වෙයි

ඔවුන් අතුරෙන් අරූපතල රූපතලයෙන් චුතවැ සපුනකාම සඟ යෙහි පිළිසිඳගන්නාවූ විනිපාතික පුගුලෝම ත්‍රිහෙතුක හෝ විහෙතුකවෙති සුගතිකාම භවයෙන් පමණක් චුතවැ දුගතියෙහි පිළිසිඳගන්නාවූ විනිපාතිකයෝ අහෙතුකවෙති මෙහි වෙනස අනාකුල කොට හඟවනුපිණිස ඇතැම් සුගතිචුතියෙකින් අනතුරුව ඇතැම් දුගති ප්‍රතිසන්ධියක් ගෙණදේයයි අනියමින් දැක්වීමෙහි ප්‍රයොජන යයි දතයුතුයි.

තවද දුගීති ප්‍රතිසන්ධිය වනාහි ඇතැම් සුගති චුතියකින් අනතුරුව හෝ දුගති චුතියකින් අනතුරුවැ හෝ යන දෙපරිද්දෙන් ගෙණදේ ඇතැම් සත්ත්වයන්හට අහෙතුකචුතියෙන් අනතුරුවැ විහෙතුක ප්‍රතිසන්ධියක් හෝ ත්‍රිහෙතුක ප්‍රතිසන්ධියක් හෝ ගෙණදේ. මණ්ඩුක දිව්‍යපුත්‍රයාගේ කථාවස්තුව අහෙතුකචුතියෙන් අනතුරුව ත්‍රිහෙතුක ප්‍රතිසන්ධිය ලත් බවට සාධකයි. මෙසේම විහෙතුක චුතියෙන් අනතුරුවැ විහෙතුක ත්‍රිහෙතුක අහෙතුක ප්‍රතිසන්ධියක් හෝ ත්‍රිහෙතුක චුතියෙන් අනතුරුවැ ත්‍රිහෙතුක විහෙතුක අහෙතුක ප්‍රතිසන්ධියක් හෝ ලැබෙන හැක්කේය. තවද උපෙක්ෂා සහගත චුතියෙන් අනතුරුව සොම්නස් සහගත ප්‍රතිසන්ධියක්ද නිස්ප්‍රීතික චුතියෙන් අනතුරුව සප්‍රීතික ප්‍රතිසන්ධියක්ද අවිතර්ක චුතියෙන් අනතුරුව සවිතර්ක ප්‍රතිසන්ධියක්ද අවිචාර චුතියෙන් අනතුරුවැ සවිචාර ප්‍රතිසන්ධියක්ද අවිතර්ක අවිචාරචුතියෙන් අනතුරුවැ සවිතර්ක සවිචාර ප්‍රතිසන්ධියක්ද ගෙණදේ මෙසේ ඔවුනොවුන්ගේ විපරීතවශයෙන් යෙදෙනපරිදි යොදාගත යුතුයි.

**"ලබ්භපවවසම්භි ධම්මමත්තමෙතං භවන්තරමුපෙති**
**නාසඤ්ඤතනා සඞ්ඛතන්ති න තතා හෙතුං විනාභොති"යි.**

මෙහි කියනලද පරිද්දෙන් අවිද්‍යාදි සහකාරී උපකාරධර්මයන් සහිතවූ සංඝකාරයන්ගේ වශයෙන් ලබනලද ප්‍රත්‍යය ඇතිවැ ප්‍රතිසන්ධි විඤ්ඤාණ සඞ්ඛ්‍යාතවූ නාමධර්ම මාත්‍රය රූපයෙහි මිශ්‍රව හෝ රූපයෙන් අමිශ්‍රව හෝ භවාන්තරයෙහි හටගණියි කියන ඒශ්වර බ්‍රහ්මාදි මවන්නෙකුගේ බලපරාක්‍රමයකින් හටගැන්වීමක් නොවන බවත් ඉවැ හටගැණීමක් නොවන බවත් මෙයින් ප්‍රකාශවෙනවා පමණක් නොවැ සත්ත්ව පුද්ගලයක්හුගේ භවාන්තරයට පැමිණීමක් නැති බවද උගන්වයි. කියනලද ප්‍රතිසන්ධි විඤ්ඤාණ සංඛ්‍යාතවූ රූපාරූප යෙන් මිශ්‍රාමිශ්‍රවූ ධර්මමාත්‍රයාගේ අතීතභවයෙන් මේ භවයට ගමන් කිරීමෙක්ද මේ භවයෙන් අනික්භවයට ගමන්කිරීමෙක්ද නැති නමුත් පූර්වභවයෙහිසකස්කළාවූ අවිද්‍යාසහකාරීවූ කර්මශක්ති සංඛ්‍යාත

හෙතුබලයෙන්ම මේ භවයෙහි සත්ත්වපුද්ගලයොවූ ධම්මාත්‍රයක්හුගේ පහළවීමවේයයි දතයුතුයි.

ඒ මේ ප්‍රතිසන්ධි විඤ්ඤාණයාගේ හෙතුබලයෙන් පහළවීම් මාත්‍රය මනුෂ්‍ය ච්‍යුතියෙන් අනතුරුව ගෙණදෙන ප්‍රකාරවූ කිසියම් ප්‍රතිභාසීයකගේ වශයෙන් පහදාදෙන්නෙමු.

පිරිහුණු ආයුස ඇතිබැවින් සභාවයෙන් හෝ නිසඟසාදෑමීම් ආදිවූ තමා විසින් හෝ මෙරමා විසින් කරතලද උපක්‍රමයකින් හෝ මරණයට ඉතා ලංවසිටියාවූ නොඉවසියහැකි ශරීරාබාධයන්ගේ ලිහිල්වීම හා සන්ධිබන්ධනයන්ගේ ගැලවීම් ආත්තාවූ නොඉවසියහැකි මාරණාන්තික දුඃඛවේදනා සංඛ්‍යාත ආයුධ ප්‍රහාරය ඇත්තාවූ මරණාසන්න පුද්ගලයාගේ වනාහි අච්චේ දමනලද අඹු නල්කොලයක්මෙන් ක්‍රමයෙන් ශරීරය වියලිබවට පැමිණි කල්හි චක්ඛුරාදි පඤ්චේන්ද්‍රියයන්ගේ ඉන්ද්‍රිය ශක්තිය ක්‍රමයෙන් හීරාබව ගියකල්හි හෘදයවස්තුවට අයත් ශරීර ප්‍රදේශයෙහි පවණක් කායින්ද්‍රිය ජීවිතින්ද්‍රිය මනින්ද්‍රිය ශක්තිය ශෙෂව සිටිකල්හි තඞ්ඛණාවේදයවූ හෙවත් එකෙනෙහි ඉනිරිවතුබූ හෘදයවස්තුව ඇසුරුකළාවූ සිත වනාහි මාතෘඝාතාදි ගරු පාපකර්මයක් හෝ මහද්ගතකර්මාදි ගරු පුණ්‍යකර්මයක්හෝ නිතර පුරුදු කළාවූ කුශලාකුශල කර්මයක් හෝ මරණාසන්නකාලයෙහි රැස්කළ අපරාපරිය වේදනීය කුශලාකුශල කර්මයක් හෝ මෙකී කුශලාකුශල කර්මයන් අතුරෙන් අවිද්‍යාදි අභාවශේෂ ප්‍රත්‍යයශක්තීන් සරසනලද යම්කිසි සංඝකාර සංඛ්‍යාත කර්මයක්ද යම් වස්තුවක් අරමුණුකොට කර්මය සකස්කෙරේනම් එබඳුවූ කර්ම නිමිත්තක්ද උපදනා ප්‍රදේශයෙහි යම්කිසි වණ්ණසඤ්ඤා සංඛ්‍යාත ගතිනිමිත්තක්ද අරමුණුකොටගෙණ පවත්නේහි. මරණාසන්න චිත්තසන්තානය මෙසේ පවත්නේම තෘෂ්ණා අවිද්‍යාවන් ප්‍රහීණ නොකළ බැවින් අවිද්‍යාවෙන් මුවාකළ ආදීනවඇති කර්ම කර්මනිමිත්ත ගතිනිමිත්ත සංඛ්‍යාත අරමුණු අතුරෙන් එක්තරා අරමුණක්හි තෘෂ්ණාතොමෝ මුහුකුරායෑමෙන් ප්‍රතිසන්ධි සථානාභිමුඛවූ විඤ්ඤාණය නැම්බරවපවති ච්‍යුතිසිතය ආසන්න (මරණාසන්න) ජවන්සිත් සමග උපන් වේදනාදෝද ඵස්සවේදනාදි ධම්මෝද යන සහජාත සංඝකාරයෝ ප්‍රතිසන්ධි විඤ්ඤාණය හෙවත් පිළිසිඳගන්නා සිත කර්ම කර්ම නිමිත්ත ගති නිමිත්ත සංඛ්‍යාත අරමුණෙක්හි ප්‍රත්‍යය සාමග්‍රී බලයෙන් බහාලන්නාක්මෙන් කෙරෙත් හෙවත් ප්‍රතිසන්ධි චිත්තය ප්‍රත්‍යයධම්මෘකතීන්ගේ ආනුභාවයෙන් පිහිටාය යනු හාවයි.

මරණාසන්න චිත්තයන්ගේ සන්තතිවශයෙන් හෙවත් අතර නොසිඳ පැවැත්ම වශයෙන් තෘෂ්ණාවෙන් නමනුලැබ ක්ෂිපනක

සංඝකාරයන් විසින් බහාලනුලැබ මෙතර ඉවුරෙහි රුකක බඳින ලද රැහැනක් එල්බගෙණ ඇලදෙලකින් එතරවන මිනිසකු මෙතර ඉවිර හැරපියා එතර ඉවිරට පැමිණෙන්නාක්මෙන් පූර්‍ව භවයාගේ නිශ්‍රය සථානය හැරපියා (හෙවත් හෘදයවසතු රූපය හැර පියා) අනතුරු භවයාගේ නිශ්‍රය සහජාත අනෙය්‍යානය ප්‍රත්‍යයාදී ප්‍රත්‍යයශක්තීන් ඇතිවන නිශ්‍රයසථාන සංඛ්‍යාත හෘදයවසතුව ආස්වාදනය කෙරෙමින් හෝ හෘදයවසතුව වැළඳ නොගණිමින් හෝ ප්‍රතිසන්ධිසිත ආලම්බනාදි ප්‍රත්‍යය ශක්තීන් පිහිටයි.

මරණාසන්න චිත්ත පරම්පරාවගේ නොසිඳ පැවැත්ම කරණ කොටගෙණ හෙවත් සිතකට අනතුරුව සිතක් ඉපිද නිරුඩ්වීමෙන් පැවැත්ම නිසා චුතචිත්තය ඉපිද නිරුඩවගිය ඉක්බිති ප්‍රතිසන්ධි චිත්තයාගේ පහළවීම වේය යන මේ කීමෙන් මේ ආත්මභාවයෙහි පැවැති සිතම අනික් ආත්මභාවයට ගමන්කෙරේය යන මිථ්‍යා ග්‍රාහය ප්‍රතිෂේපකෙරේ. ඉහතකී උපමාවෙහි උපමෙය මෙසේයි. මෙතරසිටි ගසකබැඳි රැහැණමෙන් පූර්‍වභවය පිළිබඳ ආත්මභාවය වැලඳගත් කර්මාදි අරමුණු දනයුතුයි. එතරවනු කැමැති පුරුෂයා මෙන් විඤ්ඤාණය දතයුතු එතරවනු කැමැති පුරුෂයාගේ ඇලෙන් ඉක්මයනු කැමැත්තමෙන් තෘෂ්ණාව දතයුතුයි. ඇලෙන් ඉක්මයැමට හත් ප්‍රයත්නයමෙන් ක්ෂිපනක සංඝකාරයෝ දතයුතුයි. අන්‍යත් ඉවිරෙහි පිහිටන්නාවූ ඒ පුරුෂතෙම ඉවිරෙහි ගසකබැඳි කිසියම් රැහැණක් අල්පාගණිමින් හෝ නොඅල්වාගණිමින් සව ශක්තියෙන් යම්සේ පොළවෙහි පිහිටාද එපරිද්දෙන්ම අනතුරු අත්බැවිහි හෘදයවසතු සංඛ්‍යාත ආධාරයක් වැළඳගෙණ හෝ අරූප භවයෙක්හි නම් හෘදයවසතුවක් නොවැළඳගෙණ හෝ ආලම්බන ශක්ති සම්ප්‍රයුක්ත ශක්ති කර්මශක්තී සංඛ්‍යාත ප්‍රත්‍යය ශක්තීන් පිහිටීම කෙරෙන්. මෙහි පූර්‍වවූ විඤ්ඤාණය පූර්‍වභවයාගේ අවසානය කොට චුතිනාමැයිද චුතිසිතට අනතුරුව උපදනා විඤ්ඤාණය වනාහි ආසන්නවූ අන්‍යභවයක්හුගේ මූලසමන්වා ගළපන හෙයින් හෝ අනතුරු භවයොනිගති විඤ්ඤානසම්ප්‍රයුක්ත සත්ත්වව්‍යවහාරයන් හා ගළපන හෙයින් ප්‍රතිසන්ධි නමැයිද කියනුලැබේ. ඒ මෙම ප්‍රතිසන්ධි විඤ්ඤාණය වනාහි පූර්‍වභවයෙන් නික්මැ මේ භවයට පැමිණියේ නොවේ කවර හෙයිනයත් මේ භවයෙහිම ඇතිවූහෙයිනි එසේනමුදු පූර්‍වභවයෙහිදී ප්‍රතිසන්ධිය ගෙණදීමට ශක්තිමත්වූ ජනකකර්මයැ, චුතිසිතව ආසන්නාවූ ජවයන් සමග උපන් ක්ෂිපනක සංඝකාරයැ අනතුරු භවයෙහි බහාලන්නාක් වශයෙන් පැවති තෘෂ්ණායැ කර්ම නිමිත්ත ගතිනිමිත්ත සංඛ්‍යාත අරමුණුයැ යනාදි හෙතූන්නෙන්

වෙන්ව පහළ නොවේමැයි. එහෙයින් සත්ත්වතෙමේ තමනුත් නොවේ අනිකෙකුත් නොවෙයි කියයුතු බවට පැමිණේයැයි දතයුතුයි.

**"සියුංනිදස්සනාතෙපි පටිසෝසාදිකා අථ**
**සන්තානබන්ධතෝ නත්ථි එකතානාපිනානතා"**

යන වදුළු වචන හෙයින් මේ ප්‍රතිසන්ධි විඤ්ඤනයාගේ පූර්භවයෙන් මෙහි නොපැමිණියේද පූර්භවයට ඇතුළත් හෙතු කරණකොට ගෙණ මෙහි පහළ වීමෙහිද ප්‍රතිරූව ප්‍රදීප මුද්‍රාප්‍රතිබිම්බ යනාදීහු නිදර්ශනවෙති. ශබ්දප්‍රතිරූවාදීන්ගේ ප්‍රත්‍යය ප්‍රත්‍යුත්පන්න බවක් ඇතිකල්හිදු හෙවත් ශබ්දසංඛ්‍යාත හෙතුවත් ඉන් උපන් ප්‍රතිරූව සංඛ්‍යාත ඵලයත් යනාදිය ඇතිකල්හිදු සන්තතිවශයෙන් බැඳී පැවැත්මෙක් එහි ප්‍රකට නොවේනුයි. එහෙයින් ඔවුන්ගේ එකත්ව නානත්වය නොසලකා ශබ්ද ප්‍රතිරූවාදි නිදර්ශනයෝ දක්වනුලැබෙත් ඒ මෙසේයි:-ප්‍රතිරූවය වනාහි (හෙවත් ඕංකාරය) ශබ්දය හෙතු කොට පවත්නේයි. ප්‍රදීපයතෙම අන් පහන්සිළු ආදියක් හෙතු කොට පවත්නේහි. මුද්‍රාතොමෝ ලාඤ්ඡනාදි වසතුන් හෙතුකොට පවත්නේයි. ප්‍රතිබිම්බය හෝ ඡායාරූපය කැඩපත් ආදිය හා අභිමුඛ වීම් ආදිය හෙතුකොට පවත්නේයි මෙසේ ප්‍රතිරූව ප්‍රදීපාදීහු ඊට හෙතුවූ ශබ්දාදීන්කරා නොගොස් ශබ්දාදි හෙතූන් නිසාම පවත් නාහු වෙති ඊට මත්තෙන් නොවූවාහු වෙති එපරිද්දෙන් මේ ප්‍රතිසන්ධි විඤ්ඤනය ඊට හෙතුවූ කර්මාදි ප්‍රත්‍යයධර්මයන්කරා නොගොස් කර්මාදි හෙතූන් නිසාම පවත්නේ වෙයි. ඊට මත්තෙන් නොපවතී එහෙයින් පූර්ව භවයෙහි කියනලද හෙතුදිසාභාගයෙන් ප්‍රතිසන්ධි චිත්තය මේ භවයට නොපැමිණෙහි. ප්‍රතිරූවාදිය ශබ්දාදිය පවත්නා දිසාදියෙන් නොපැමිණෙන්නාක්මෙනැයි දතයුතුයි. එතකුදුවුවත් පූර්භවයෙහි හෙතූන් විනා ප්‍රතිසන්ධි චිත්තය නූපදනේයි කෙසේද යත් ශබ්දාදිහෙතූන් විනා ප්‍රතිරූවාදීහු නූපදින්නාක්මෙනි නොගොස් පූර්භව සංඛ්‍යාත හෙතුදිශාභාගයෙහි පිහිටා නිබී එයින් අන් භවය කටනොස් තමඩතුකවූවාහුද නොවෙත් කරුණු කවරේදයත් ප්‍රකාශිද ගැණීමට මත්තෙන් ප්‍රතිසන්ධි විඤ්ඤාණයක් නැතිබැවිනි. එසේනමුදු පූර්භවයෙහි කර්මාදිය හෙතුකොට ප්‍රතිසන්ධිනුතොවන්නාහුනොවෙත් දෙත්මය යනු භාවයි, ඒ එසේමැයි. ප්‍රතිරූවාදිය පූර්භයෙහි ශබ්දාදි හෙතුපක්ෂයෙහි රැස්වසිට එයින් අන්ත නකට ගොස් තමඩතුක වූවාහුනොවෙත් ඇතිවීමට මත්තෙන් නැතිහෙයිනි. එසේනමුදු පූර්භයෙහිඇතිවූ ශබ්දාදිය හෙතුකොටගෙණ ප්‍රතිරූවාදීහු නොවෙද්ද වෙන්මය යනු මෙහි උපමා උපමේය සංසන්දනයයි.

මෙහි මරණාසන්න ජවන්වූනි ප්‍රතිසන්ධි චිත්තයන්ගේ පෙළ නොකැඩී පැවැත්මයහි කියනලදු සන්තතිය ඇතිබැවින් එක සන්තති වශයෙන් හෙවත් එක්පෙළක් වශයෙන් එකක් බවට ගිණියහැකි නමුදු ක්ෂණ ක්ෂණයෙහි එකිනෙක විඤ්ඤාණයාගේ වෙන් වෙන්ව පහළවීමවන හෙයින් ඒකමයහි කියයුතු බවෙක්ද නැත චිත්තයන්ගේ පෙළනොසිඳී පැවැත්මවන හෙයින් ඇවිලෙන පහන් සිළුවක්මෙන් අනිකෙකැයි කියයුතුබවකුදු නැත යම්සේ විටින්විට හෝ ක්ෂණ ක්ෂණයෙහි ඇවිලීයන පහන් සිළුවක්හුගේ පෙළවශ යෙන් සැදීපවත්නා එකාකාර මාත්‍රය නිසා ඒ පහන් සිළුවමයයි ලොකයා විසින් කියනු ලැබේද අනික් පහන් සිළුවෙකැයි නොකියනු ලැබේද එමෙන් පෙළ නොකැඩී පවත්නා විඤ්ඤාණසන්තතිය සලකා ඒකමයයි කියනුලැබේ. අනිකෙකැයි නොකියනුලැබේ. ඉදින් වනාහි චිත්තයන්ගේ පෙළනොකැඩී පැවැත්ම එකාන්තයෙන් එකක් බවම වේනම් කිරෙන් දී හට ගැණීමෙක්ද නොවන්නේමය එසේම චිත්තයන්ගේ පෙළනොකැඩී පැවැත්ම එකාන්තයෙන් අනි කක්වේනම් කිරි අයත්වූ දීහට ගැණීමෙක්ද නොවන්නේමය මෙහිදු කම්මාදිහෙතු හා ප්‍රතිසන්ධි විඤ්ඤාණ සංඛ්‍යාත හෙතුසමුත්පන්නයා ධම් යන්ගේ එකාන්තයෙන් එකත්වයෙක් ඇත්නේවීනම් මනුෂ්‍යගතියෙන් පෙරලී දිව්‍යගතියක පහළවීමෙක්ද නැත එකාන්තයෙන් ඔවුන්ගේ නානත්වයක් ඇත්නේවීනම් කම්මාදි හෙතූන් ඇත්තාහට ඵලයක්ද නැත්නේය පූර්වයෙහි මම අසවල් නම් ඇත්තෙක්වීම් අනාගතයෙහි අසවල්නම් ඇත්තෙක් වන්නෙම් යනාදීන්ගේ ව්‍යවහාරය ලොප් වන්නේය. එහෙයින් මේ අනුප්‍රබන්ධවශයෙන් පෙළසැදී පැවත්ම ඇති හෙතු ධම් හෙතු සමුත්පන්න ධම්යන්හි එකාන්තයෙන් ඒකම යයි කියයුතු බවක්වත් එකාන්තයෙන් අනිකෙක කියයුතු බවක්වත් නැත්නේයයි නිසැකව දතයුත්නේය මෙහි වනාහි එකාන්තයෙන් ඒකමයයි කියයුතුබව පහකිරීමෙන් සත්පුද්ගලාදීන් පිළිබඳවූ සදා කාලික ආත්ම සවරූපයක් විසින් සැපදුක් විඳිනුලබයි යනමේ දෘෂ්ටිය වළක්වයි. එකාන්තයෙන් අනිකෙක්මැයි කියයුතුබව පහ කිරීමෙන් සැපදුක්දෙක අනිකෙක් විසින් විඳිනුලබයි යන මේ දෘෂ්ටිය වළක්වයි. හෙතුඵලවන් ඵලය පවතී යන ඉනැනවීමෙන් ඉබේ සැදේය යන දෘෂ්ටිය හා දිව්‍යබ්‍රහ්මාදීන් විසින් මවනුලබයි යන දෘෂ්ටියද වළක්වයි.

ඉදින් වනාහි භවයෙන් භවයට යමන් කිරීමෙක් නැතිව පහළ වේනම් මේ මිනිස් අත්බැවිනි යම් සකාඛකෙනෙක් ඇද්ද ඒ සකාඛ නිරුඩවගිය බැවින් විපාකයට කරුණුවූ කම්යාගේ අනික් අත් බැවකට යාමෙක් නැති හෙයින් කම්ය සකස්කළ ඇත්තාහටනොව

ඉත් අන්‍යයෙකුට නොහොත් යම් කර්මයක් රැස්කරනලද නම් ඒ කර්මයට විපාකදායී කර්මයෙන් අනිකකට විපාක දෙන්නේ නොවේද කර්මවිපාකය අනුභවකරන්නෙක් නැතිකල්හි කවරක්හට විපාකය දෙන්නේදයත් ? එහෙයින් මේ තර්කය හරිනැතැයි යමෙක් ප්‍රශ්නකෙරේනම් ඒ ගැණ කරුණු දක්වනුලැබේ.

**"සන්තානෙසං ඵලං එතං නාඤ්ඤස්සානව අඤ්ඤතෝ**
**බීජානං අභිසංඛාරෙ එතස්සත්ථස්ස සාධකෝ"**

යම්හෙයකින් එක් සන්තතියෙක්හිම ඵලය උපදනේද හෙවත් එනට බැඳි යන පරම්පරායෙක්හිම ඵලය උපදනේද ඒ එකටබැඳී පවත්නා පරම්පරායෙහි එකාන්තයෙන් ඒකමය කියයුතු බවක් හෝ එකාන්තයෙන් අනිකෙක කියයුතු බවක් හෝ නැතිබව කරුණු දක්වා නිස්ප්‍රභාකළ බැවින් අනිකෙකුට විපාක දෙන්නේය අනිකකට විපාකදෙන්නේයයි නොකිය යුත්තමවේ. හෙතු ඵලයන්ගේ අර්ථයෙන් අන් අර්ථයෙක්හිද එම හෙතුඵල භාවයෙන් සම්බන්ධය ඇතිබැවින් ඒ ඵලය අනිකෙක්හට හෝ අනිකකට හෝ වේයයි නොකියයුතු බවට අඹ දෙසි දෙඩම් ආදි බීජයන්ගේ සකස් කිරීම් සංඛ්‍යාත උපමාදිය සාධකවේ. යම්හෙයකින් අම්බබීජාදියක් රෝපන යකළ කල්හි ඒ බීජයාගේ සන්තානයෙහි ලබනලද ප්‍රත්‍යය ශක්තියෙන් කාලාන්තරයකින් ඵල විශෙෂයෙක් උපදනේවීනම් අන්‍ය බීජයන් පිළිබඳ ඵල විශෙෂයෙක් නූපදනේයි අන්‍ය බීජයක් සකස්කිරීම් හෙතුවෙන්ද අඹඵල විශෙෂයෙක් නූපදනේවි ඒ අම්බබීජාදීහු රෝපනයකිරීම් මාත්‍රයෙකින්ම ඵලහෙණදීමට නොපැමිණෙති. මේ කාරණයද එමෙනැයි දතයුතුයි.

සකස්කළාවූ කර්මඇති පුද්ගලතෙම රෝපනයකළාවූ අම්බබීජාදිය මෙනි. සකස් කළාවූ කර්මය අම්බබීජාදිය රෝපණයකිරීමවැනි අම්බබීජාදිය පිළිබඳවූ අඹකුරු, කඳ, අතු, කොළ, මල්, හෙඬ ආදි පරම්පරාවමෙන් සත්වයාගේ ප්‍රතිසන්ධි භවාඞ්ග චුතිසිත් ආදින්ගේ පෙළනොසිඳී පැවැත්ම දතයුතුවේ. බීජයාගේසකස්කිරීම හෙතුවෙන්ම මිහිරිවූ රස රොන් මල් ඵලයන්ගේ හටනැණීමමෙන් කර්මය සකස් කරන්නාහට එම කර්මහෙතුවෙන්ම විපාකහෙණදෙනබව දතයුතුයි. ප්‍රාණශිලප ඖෂධාදි නිදසුන්වලින්ද මේ අදහස් අවබොධ කටයුතු වේ. ළදරුවයසෙහි සිටියකුගේ බාලශරීරයෙහිශිල්පශාස්ත්‍ර පුරුදු පුහුණු කිරීම හෝ ගිලන් ශරීරයෙක්හි බෙහෙත් යෙදීම හෝ වැනි විට පැමිණියහුගේ ශරීරයටවත් නොගිලන් ශරීරයටවත් නොපැමිණෙති එසේ නමුදු බාල අවස්ථාවෙහි පුරුදු පුහුණු ශිල්පශාස්ත්‍ර නිමිත්තකොටගෙණ ගිලන් අවස්ථාවෙහි පාවිච්චිකළ ඖෂධ නිමිත්ත

කොටහෙන වැඩිවිය පැමිණි ශරීරයෙහි ශිල්පශාස්ත්‍ර පටුවිය‍ද නොගිලන් ශරීරයෙහි නිරොගි බවද පිනිටයි. එකට සන්තානිවශයෙන් බාල්‍යයෙහි පවත් බැඳීපවත්නාවූ වෘඩශරීරයෙහි හා ගිලන් අවස්ථාවෙහි පවත් එකටසන්තති වශයෙන් බැඳී පවත්නාවූ නොගිලන් ශරීරයෙහිත් ශිල්පශාස්ත්‍ර පටුවිය හා ඖෂධ ප්‍රයොග ශක්තිය පසු පසු ඇතිව ඇතිව යන බැවින් ඒ සියල්ල අන්කෙනෙකුගේ නොවෙති පළමු පළමු බාලශරීරයෙහි ශිල්පශාස්ත්‍ර පුරුදු පුහුණු කිරීමෙක් නැතිනම් පසුව පසුව වෘඩශරීරයන්හි තදුබ්‍යාසයක් නොවනහෙයින් ඒ ශිල්ප ශාස්ත්‍රාබ්‍යාසයෝ අනිකකවද නොවෙති. මෙසෙයින් සන්තතිවශයෙන් පවත්නා මේ ධර්ම සමූහයෙහි යම් ඵලයෙක් ඇද්ද ඒ ඵලය අනිසෙකුවත් අනිකකවත් නොලැබේයයි දතයුතු. මේ නිදර්ශනයෙන්ද සංඝකාරයන්ගේ අභාවයෙහි ඵලයන්ගේ අභාවයම දක්වයි. විඳින්නෙකු නැත්නම් කවරෙකුහට එහි විපාකයවේදුසි යම් ප්‍රශ්නයෙක් ඇද්ද ඒ ගැණ කරුණු කියනු ලැබේ.

**"ඵලසසුප්පත්තියා එව සිධාහුඤ්ඤක සම්මුති,**
**ඵලුප්පාදෙනරුක්ඛස්ස යථාඵලති සම්මුති"** යි.

වදුල බැවින් යම් හෙයකින් බීජ අඞ්කුර කදකොල මල් අතු පතර ආදි පරම්පරා වශයෙන් බැඳී පවත්නාවූ අවයව ධර්ම සමූහයක් ඇති වෘක්ෂ සංඛ්‍යාත භූතොපාදාය රූපධර්මයන්ගේ එකදෙශයක්වූ ඵලාඵලයන්ගේ හටගැණීමෙත්ම වෘක්ෂයතෙම ඵලදරයි වෘක්ෂයතෙම පලහන්නේයයි කියනුලැබේද එසේම දිව්‍යමනුෂ්‍යාදි ආකාර විශෙෂයෙන් දෘශ්‍යමානවූ සකඤ්ඤයන්ගේ එකදෙශයක්වූ අනුභවකිරීම් මාත්‍ර සංඛ්‍යාත සැප දුක් ඵලයන්ගේ හටගැණීමෙන්ම දෙවියෙක් විපාක විඳී මිනිසෙක් විපාක විඳියයි කියනුලැබේ. යම් හෙයකින් යම්සේ සකඤ්ඤ සන්තානයෙහි කුශලාකුශල චෙතනාවන්ගේ ඉපදීමක් ඇතිකළ පුද්ගලයෙක් පින්කෙරේ පුද්ගලයෙක් පව් කෙරේ යන කතීෘ ව්‍යවහාරයවේද එමෙන් සංඝකාරයන්ගේ විපාකදීම ඇතිකල්හි පුද්ගලයෙක් සැපවිඳී පුද්ගලයෙක් දුක්විඳී යන කතීෘ ව්‍යවහාරයවේ එහෙයින් මෙනි සකඤ්ඤයන්ගෙන් විනිර්මුක්තවූ කිසියම් විඳින්නෙකුඇතැයි යන ලබ්ධිගැණීමෙන් අපේයෙක් නැති.

මෙසේ ඇතිකල්හි හෙවත් ඒ භවයෙන් මේ භවයට සංක්‍රමණය වශයෙන් පහළවීමක් නැතිවිට කියනලද සංඝකාරයෝ විද්‍යමානවූවාහුම ඵලයට ප්‍රත්‍යයෝවේද්ද නොහොත් අවිද්‍යමානවූවාහුම ඵලයට ප්‍රත්‍යයෝවේද්ද ඉදින් විද්‍යමානවූවාහුම ඵලයට

ප්‍රත්‍යයෝ වෙත්නම් සංඛාරයන් පවත්නා කෙණෙහිම විපාක ඇතිවිය යුතුය ඉදින් අවිද්‍යමානවූවාහුව ඵලයට ප්‍රත්‍යයෝ වෙත් නම් සංඛාරයන් හෙවත් කර්මයන් සකස්කිරීමට මත්තෙහි හෝ විපාක දීමට පසුව හෝ පලදීම වියයුතුයයි යමෙක් තර්කයක් ගෙණඒනම් ඔහුට මෙසේ කියයුතුවේ.

**කතහනාපවවයා එතෙනව නිවවං ඵලාවහා,**
**පාවිභොගාදිකං තස්ස වෙදිතබ්බං නිදස්සනං . සි.**

කී හෙයින් කළබැවින් කළමාත්‍රයකින්ම සංඛාරයෝ (කර්මයෝ) තමන්ගේ ඵලයට ප්‍රත්‍යයවූවාහුවෙති සංඛාරයන්ගේ ඇති බැවින්වත් නැති බැවින්වත් තමන්ගේ ඵලයට ප්‍රත්‍යයවූවාහු නොවෙති එහෙයින් වදාළසේක **''කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකා චක්ඛුවිඤ්ඤාණං උප්පජ්ජනතංහොති''** යි. තවද නුදුන්නාවූ විපාකඇති සංඛාරයෝ කළබැවින් යම්සේ ප්‍රත්‍යයෝ වෙද්ද එමෙන් දුන්නාවූ විපාක ඇති සංඛාරයන්ගේද කළබවත් ඒ සමාන බැවින් හෙවත් නුදුන් විපාකඇති කර්මයන්ගේ සකස්කළබව හා දුන් විපාකඇති කර්මයන්ගේ සකස්කළබවත් යන සකස්කිරීම් දෙකම එකසමාන බැවින් දුන් විපාකඇති සංඛාරයන්ගේද ඵලවිපාක දියයුතු බැවින් සංඛාරයෝ නිත්‍ය විපාකය ගෙණ දෙන්නෝය යන ආශඞ්කාව දුරුකරණු පිණිස **''නවනිවඩංඵලාවහා''** සංඛාරයෝ ප්‍රත්‍යය වූවාහු නමුදු කළ පමණකින් පලදේයයි කිව්කල කළපමණකින් සැමදාම පලදෙන්නාහුයයි නොසැලකියයුතු මේ අර්ථය හැඟවීම වෙහිලා නිදර්ශන මෙසේයි.

ලොකයෙහි යමෙක් කිසිවෙකුට යමක් දීමට පොරොන්දුවිද ඇපවිද එසේම යමෙක් බඩු නයටගණිද එසේම යමෙක් නයමුදල් ගැන්නේද ඔවුන්ගේ ඒ පොරොන්දුවීම් ඇපවීම් ක්‍රියාමාත්‍රය බඩුනයට ගැණීම් ක්‍රියාමාත්‍රය නයමිලහැණීම් ක්‍රියාමාත්‍රය වනාහි පොරොන්දුව ඇපය ඉටුකිරීමවත් බඩුදීමවත් නයගෙවීමටත් ප්‍රත්‍යයවූවාහු වෙති ක්‍රියාවගේ ඇති නැති බව ඊට ප්‍රමාණ නොවේ. ක්‍රියාවගේ ඇතීම මාත්‍රයම ඊට ප්‍රමාණවේවැයි. පොරොන්දුව හෝ ඇපය ඉටු නොකොට්ටපසු බඩුදුන්නාවිත්පසු නය ගෙවිවාසිත්පසු පොරොන්දු වීම් ඇපවීම් බඩුගැණීම් නයගැණීම් සංඛ්‍යාත පූර්වයෙහි කළක්‍රියාවෝ අවසන්වූවාහුවෙති මත්තෙහි ඒ සඳහා කළයුතුදේ නැත්තාහුවෙති සෙසර හෙයින්ද පොරොන්දුව ඇපය ඉටුකළ බැවිනි බඩුදී නිදහස්වූ බැවිනි නයගෙවා නිදහස්වූ බැවිනි එපරිද්දෙන් කළබැවින්ම සකස්කළ නිසාම සංඛාරයෝද තම තමන්ට අනුරූපවූ ඵලයන්ට

ප්‍රත්‍යයෝවෙන් තම තමන්ට සුදුසු ඵලවිපාක දුන්නාමපසු සංඝකාරයෝ ඵලවිපාක දරන්නාහු නොවෙනිසි දතයුතු මෙතෙකින් රූප ම්ශ්‍රාම්ශ්‍රයන දෙයාකාරයෙන් පවත්නාවූ ප්‍රතිසන්ධි විඤ්ඤාණයාගේ සංඝකාර ප්‍රත්‍යයෙන් පැවැත්ම දක්වා නිමවනලදී.

තවද කියනලද දෙනිස් විපාක විඤ්ඤාණයන්හිලා ප්‍රවෘත්ති කාලයෙහි හා ප්‍රතිසන්ධි කාලයෙහි වියතරනොකරණලද සංඝකාරයන්ගේ ප්‍රත්‍යයත්වමෙනි පවත්නා මුළාව දුරලනු පිණිස-

**පවිසන්ති පවත්තිනා වසෙනෙතෙ භවාදිසු ,**
**විඤ්ඤාණඤ්ච සඞ්ඛාර සථාසෙසඤ්ච පච්චයා .**

යන්නෙන් කරුණු දක්වයි. එහි භව තුණෙක්ද යොනි සත රෙක්ද ගති පසෙක්ද විඤ්ඤාණ සථිතීහු සතක්ද සත්ත්වාවාස නවයෙක්ද යනමොවිහු භවාදීහුතම්වෙති මෙකී භවයොනි ගති සථිති සත්තාවාස යන්හි ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති කාලයන්හි කියනලද සංඝකාරයෝ යම් බඳුවූ විපාක විඤ්ඤාණ කෙනෙකුන්ට උපකාරවූවාහු යම් පරිද්දෙකින් ප්‍රත්‍යයෝ වෙද්ද එපරිද්දෙන් දතයුතුවෙයි. එහි පුණ්‍යාභි සංඝකාර යන් අතුරෙන් කාමාවචර කුශල චේතනා භෙදයෙන් අටවැදෑරුම්වූ පුණ්‍යාභි සංඝකාරයතෙම ත්‍රිහෙතුකාදිවශයෙන් භෙදයක් නොස ලකා සාමාන්‍යයෙන් එක්කොසුකොටැ කාමභවයට අතුළත් සපත කාම සවගීයෙහි ප්‍රතිසන්ධි ක්ෂණයෙහිම මහාවිපාක සිත් අටදෙන කුශල විපාක උපෙක්ෂා සහගත සන්තීරණ චිත්තය යන නවවිධ විපාක විඤ්ඤාණයන්ව නානා ක්ෂණික කම් ප්‍රත්‍යයවශයෙන්ද බලවත් කම් ප්‍රත්‍යය සංඛ්‍යාත උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන්ද යන දෙයා කාරයෙන් ප්‍රත්‍යයවේ රූපාවචර කුශලචෙතනා භෙදයෙන් පස් වැදෑරුම්වූ පුණ්‍යාභිසංඝකාරයතෙම රූපභවයෙහි ප්‍රතිසන්ධිය ගන්නාකෙණෙහිම පස්වැදෑරුම් රූපාවචර විපාක විඤ්ඤාණයන්ට යටකී නයින් ප්‍රත්‍යයවේ. ඉහතකී අටවැදෑරුම් කුශල චෙතනා සංඛ්‍යාත පුණ්‍යාභි සංඝකාරයතෙම සුගතිකාම භවයෙහි ප්‍රවෘත්ති ක්ෂණයෙහිලා උපෙක්ෂා සහගත අහෙතුක සන්තීරණ විපාක චිත්තය හැර කුශලවිපාක චක්ඛුවිඤ්ඤාණ සොත විඤ්ඤාණ ඝාණවිඤ්ඤාණ ජිවහාවිඤ්ඤාණ කායවිඤ්ඤාණ සම්ප ටිච්ඡන සොම්නස් සහගිත සන්තීරණ විපාකය යන සපතවිධ විපාක විඤ්ඤාණයන්ව යටකී දෙපරිද්දෙන් ප්‍රත්‍යයවේ. රූපාවචර පඤ්චවිධ චෙතනා සංඛ්‍යාත පුණ්‍යාභි සංඝකාරයතෙම ප්‍රවෘත්ති ක්ෂණයෙහි රූපභවයෙහි චක්ඛුවිඤ්ඤාණ ශ්‍රොත්‍රවිඤ්ඤාණ සම්ප්‍රත්‍යෙෂණ උපෙක්ෂාසන්තීරණ සෞමනස්ස සන්තීරණ යන පස් විඤ්ඤාණයන්ට යටකී දෙපරිද්දෙන්ම ප්‍රත්‍යයවේ. අෂ්ටවිධ කාමාවචර පුණ්‍යාභි

සංඝකාරයතෙම කාමභවයට ඇතුළත්වූ සතර අපා දුගතියෙහි ප්‍රථමත්තීක්ෂණයෙහිලා අහෙතුක කුශල විපාක අටදෙනහට යමකී තයින් දෙපරිද්දෙකින් ප්‍රත්‍යයවේ. නිරයෙහිද තිරිසන්ලෙක මහමුගලන් තෙරුන්ගේ රූපදර්ශන ශබ්ද ශ්‍රවණ දිය ලත් නිරිසත් තව ත්‍රිහේතුකයවූයේවේ. තිරිසනුන් කෙරෙහිද මහානුභාව සම්පන්න ප්‍රේතයන් කෙරෙහිද එසේම ඉෂ්ටාලම්බන ප්‍රතිලාභය ලබ්මැයි. එහෙයින් මහාකුසල් සින් අට පිළිබඳවූ පුණ්‍යාභි සංඝකාරයතෙම සප්තකාම සුගතියෙහි ප්‍රථමත්තියෙහිද ප්‍රතිසන්ධියෙහිද කුශල විපාක විඥානයන් අටදෙනාට හා අහෙතුක කුශල විපාකයන් අටදෙනාට ප්‍රත්‍යයවේ. තොමෝ නස්වශයෙන් එනානී කාමාවචර රූපාවචර පුණ්‍යාභි සංඝකාරයතෙම රූපභවයෙහි ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති ක්ෂණයන්හි දශවිධ විපාක විඥානයන්ට යමකී තයින් දෙපරිද්දෙන් ප්‍රත්‍යයවේ. ව දශ අකුශල චෙතනාසංඛ්‍යාතවූ අපුණ්‍යාභි සංඝකාරයතෙම සතරඅපා දුගතියෙහි ප්‍රතිසන්ධි ක්ෂණයෙහිලා අකුශල විපාක සන්තීරණ චිත්තයට යටකී ලෙස දෙපරිද්දෙකින් ප්‍රත්‍යයවේ. අකුශල විපාක චක්ඛුවිඤ්ඤාණ සොතවිඤ්ඤාණ ඝාණවිඤ්ඤාණ ජිව්හාවිඤ්ඤාණ කායවිඤ්ඤාණ සම්පටිච්ඡන යන ෂට්විධ විපාක විඥානයන්ට පවත්නා කාලයෙහි එසේම ප්‍රත්‍යයවේ. අකුශල විපාක සිත් සත්දෙනාට ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි ක්ෂණයන්හි එසේම ප්‍රත්‍යයවේ. ඉහතකී අපුණ්‍යාභි සංඝකාරයතෙම කාම සුගතීන්හි ප්‍රවෘත්ති කාලයෙහි සත්වැදෑරුම් අකුශල විපාක විඥානයන්ට රූපභවයෙහි ප්‍රවෘත්ති කාලයෙහිදී අකුශල විපාක විඥාන සතරකටද එසේම ප්‍රත්‍යයවේ. බ්‍රහ්මලෝකයෙහිවත් සදිව්‍යලෝකයෙහිවත් අනිෂ්ටරූප දර්ශනාදි අරමුණු හමුනොවන හෙයින් මිනිස් ලොව පවත්නා අරිටු අරමුණු නම්වීම සලකා එහි අකුශල විපාක යන්ගේ ලැබීම කියනලදි. ආනඤ්ජාභිසංඝකාරයතෙම අරූපභවයෙහි චතුර්විධ විපාක විඥානයන්ට ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති ක්ෂණයන්හි ඉහතකී ලෙස කර්මප්‍රත්‍යය උපනිශ්‍රය ප්‍රත්‍යය යන දෙපරිද්දෙන් ප්‍රත්‍යයෝ වෙති මේපරිදෙන් ඒ ඒ භවයන්හි ප්‍රතිසන්ධි විපාක ප්‍රවෘත්ති විපාක වශයෙන් පුණ්‍ය අපුණ්‍ය ආනඤ්ජාභි සංඝකාරයෝ යම් යම් විපාක විඥාන කෙතෙකුන්ට යම් යම් පරිදිදෙන් ප්‍රත්‍යයෝ වෙද්ද එපරිද්දෙන් අණ්ඩජාදි චතුර්විධ යොනීන්හිද ගති පඤ්චක සත්ත්වාවාසයන්හිද ප්‍රත්‍යයවන පරිදි දැනගත යුතුයි. එහි පිළිවෙළ දැක්වීම පිණිස මූඛ මාත්‍රයක් මෙහි දක්වමි. යටසී ත්‍රිවිධ සංඝකාරයන් අතුරෙන් පුණ්‍යාභිසංඝකාරයතෙම කාමභව රූපභව දෙක්හි ප්‍රතිසන්ධිගෙණදී තමා සතු ප්‍රවෘත්තී විපාක සියල්ලම ගෙණෙද්.

එසේම අණ්ඩජාදි චතුර්ධ යොනීන්හිද දෙවිමිනිස් දෙගතියෙහිද නානත්තකායා නානත්තසඤ්ඤී නානත්තකායා එකත්තසඤ්ඤී එකත්තකායා නානත්තසඤ්ඤී එකත්තකායා එකත්තසඤ්ඤීයයි කියනලදු චතුර්ධ විඤ්ඤණස්ථිතීන්හිද ප්‍රතිසන්ධි විපාකය ගෙණදී තම තමන් පිළිබඳවූ සියළු ප්‍රවෘත්ති විපාක ලබා දෙයි. යම්කිසි පුණ්‍යාභිසංඛාරයකින් අසංඥසත්ත්ව තලයෙහි රූපමාත්‍රයක්ම ප්‍රතිසන්ධි වශයෙන් පිහිටීමක්කේරේ. එහෙයින් කාමාවචර රූපාවචර පුණ්‍යාභි සංඛාරයන්ගෙන් කියනලද භවයොනි ගති ස්ථිති සත්ත්වාවාසයන්හි එක්විසි විපාක විඤ්ඤණ කොපමණකුත් කම් ප්‍රත්‍යය උපනිශ්‍රය ප්‍රත්‍යය යන දෙපරිද්දෙන් ප්‍රතිඃණි ප්‍රවෘත්ති කාල යන්හි සුදුසු පරිද්දෙන් ප්‍රත්‍යයවේ. අපුණ්‍යාභිසංඛාරයන්ගෙන්ම වනාහී යම් හෙයකින් එකම කාමභවයෙක්හිද සතර යොනියෙහිද ප්‍රේතනිරශ්චීන නිරය යන ත්‍රිවිධ ගතියෙක්හිද නානත්තකායා එකත්තසඤ්ඤී සංඛ්‍යාත එකම විඤ්ඤණස්ථියෙක්හිද තදනුරූපවූ සත්ත්වාවාසයෙහිද ප්‍රතිසන්ධිවශයෙන් විපාකදේද එහෙයින් මේ අපුණ්‍යාභි සංඛාරයන්ගෙන්ම එක් භවයෙකැ සතර යොනියෙකැ ගතිත්‍රයෙකැ එක් විඤ්ඤණස්ථියෙකැ එක් සත්ත්වාවාසයෙකැ යන මේ තන්හි සත්වැදෑරුම් විපාක විඤ්ඤණයන්ට ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති කාල යන්හි සුදුසු පරිද්දෙන් කම්ප්‍රත්‍යය උපනිශ්‍රය ප්‍රත්‍යයවශයෙන් ප්‍රත්‍යයවේ. ආනඤ්ජාභිසංඛාරයන්ගෙන්ම යම්හෙයකින් එකම අරූපභවයෙකැ එකම ඔපපාතික යොනියෙකැ එකම දෙවගතියෙකැ ත්‍රිවිධ විඤ්ඤණස්ථියෙකැ සත්ත්වාවාස සතරෙකැ යන මේතන්හි ප්‍රතිසන්ධි විපාකය ගෙණදේද එහෙයින් මේ ආනඤ්ජාභි සංඛාරයන්ගෙන්ම එක් භවයෙක්හි එක් යොනියෙක්හි එක් ගතියෙක්හි ත්‍රිවිධ විඤ්ඤණස්ථිතීන්හි චතුර්ධ සත්ත්වාවාසයන්හි චතුර්ධ ආරූපප විපාක විඤ්ඤණයන්ට ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති කාලයන්හි කම්ප්‍රත්‍යය උපනිශ්‍රය ප්‍රත්‍යය යන දෙපරිද්දෙන් ප්‍රත්‍යයවේ. මෙතෙකින් සංඛාර ප්‍රත්‍යයෙන් ඇතිවන විඤ්ඤණය පිළිබඳ විස්තරය සම්පූර්ණයි.

විඤ්ඤණ ප්‍රත්‍යයෙන් **නාමරූපය** වන්නේ කෙසේදයත් ?

**විභාගානාම රූපානං භවාදිසු පවත්තියා,**
**සඞ්ගහා පවත්තයන්තා විඤ්ඤාණබෙඛා විනිච්ඡයෝ.**

යනුකී හෙයින් රූපාදි අරමුණුවෙතනැමි පවත්නාවූ වේදනා සංඥා සංඛාර සකඞ්ගයන්ට ඇතුළත්නාම ධර්මයන්ගේ (හෙවත්) අද්‍රව්‍ය ධර්මයන්ගේ විභාග කිරීම් වශයෙන්ද කැඩීම් බිඳීම් ආදි රූපපණ ලක්ෂණකොට ඇති මහාභූත රූප උපාදාය රූපයන්ගේ විභාග වශයෙන්ද මෙහි විස්තරය දැනගතයුතුවේ. මෙතැන්හි

නාමරූපයන්ගේ ඇතිවීමට හෙතුවූ විඤ්ඤාණයද නාමධර්ම සංඛ්‍යාවට ඇතුළත්වන නමුත් හෙතුධර්මයකි කියනලද උපකාර ධර්මයන්ගේද හෙතු සමුත්පන්න ධර්මයකි කියනලද ඵලධර්මයන්ගේද අවුල්නොකොට පිළිවෙළ දක්වනු පිණිස වෙදනාසංඥා සංස්කාර සකාබිතුණට පමණක් මෙහිදී නාමයයි කියනුලැබේ. යම්කිසි ප්‍රත්‍යය ශක්තියකින් උපකාර ශක්තියකින් හටගැණීමක්නැති නිර්ණය වනාහි අරමුණුකරා නොනැමී පවත්නා බැවින් නාම ව්‍යවහාරය නොලබයි. චිත්තසෛතසික ධර්මයන් තමා කෙරෙහි නැවත අවනත කරවන අර්ථයෙන් පමණක් නිර්ණයද නාම ව්‍යවහාරය ලබයි. නාම ධර්මයන්ගේ සැපදුක් උපෙක්ෂාදි වශයෙන් විභාගයද රූපධර්මයන්ගේ පඨවි ධාත්වාදි වශයෙන් විභාගයද යට කියනලදී. මෙතැන්සිට නාමරූප ධර්මයන්ගේ ඒ ඒ භවයෙහි පවත්නා අයුරු වශයෙන්ද සංග්‍රහ වශයෙන්ද ප්‍රත්‍යයනය වශයෙන්ද විනිශ්චය දක්වනුලැබේ.

මෙහි නාමය එකම අසඤ්ඤසත්ත බඹතලය පමණක් හැර සියලුභව සියලුයෝනි සියලුගති සියලු විඤ්ඤාණස්ථිති අෂ්ටවිධ සත්ත්වාවාසයන්හි පවත්නේයි. රූපය භවදෙකෙක්හිද චතුර්විධ යෝනීන්හිද පඤ්චවිධ ගතීන්හිද මුලකී විඤ්ඤාණස්ථිති සතර හා අසංඥතලය එකතුව විඤ්ඤාණස්ථිති පසෙක්හිද සත්තාවාස පසෙක්හිද පවත්නේයි. මෙසේ නාමරූප ධර්මයන් ඒ ඒ භවාදියට අනුරූපවූ පවත්නා කල්හි භාවරූපයක් නැතිව උපදනා ඇඹ හෝනා ජලාබුජ සත්ත්වයන්ට හා භාවරූපයක් නැතිව උපදන, අණ්ඩජ සත්ත්වයන්ටත් පිළිසිඳ ගන්නා කාලයෙහි වස්තුදශක කලාප කායදශක කලාප වශයෙන් සන්තතිශීර්ෂ හෙවත් රූප පරම්පරාව ලියලීමට තුඩුදීමෙන් පවත්නා මූලස්ථාන දෙදෙනෙක් හා වෙදනා සංඥා සංස්කාරයයි කියනලද නාමස්කන්ධයෝ තුන් දෙනෙක් පහළවෙති. මෙසේ කලාපවයට අන්තර්ගත රූපාවයව ඕස්ස හා නාමධර්ම තුන්දෙන එකතුව නාමරූපධර්ම තෙවිසි දෙනෙක් විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් වෙත්යයිදතයුතුයි. තවද යම් යම් රූපකලාපවල සමාන කොටස් ඇද්ද ඒ ඒ සමාන කොටස් හැර අසමාන කොටස් පමණක් එකතුකොට ගත්කල්හි හෙවත් වස්තුදසක කලාපයෙන් පඨවි ආපස් තෙජස් වායු වණ් ගන්ධ රස ඔජා ජීවිතින්ද්‍රිය යන රූපාවයව නවය හැර හෘදයවස්තු රූපය පමණක්ගෙණ කායදශක කලාපාවයව දසය හා එකතුකොට ඊට වෙදනා සංඥා සංස්කාර නාමධර්මත්‍රය එකතු කොට ගත්කල්හි නාමරූපධර්ම තුදුස්දෙනෙක් විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් වෙත්යයි දතයුතු. මෙසේ අභාවක සත්වයන්ට හටගන්නා

නාමරූප ධම්මයන්ගේ ප්‍රමාණාදිය දක්වා දැන් භාවරූප සහිතවූ පුද්ගලයන්ට ලැබෙන අන්දම ප්‍රකාශකරණුලැබේ. භාව රූප සහිත පුද්ගලයන්ට එනාහි වත්ථුදසක කායදසක භාවදසක වශයෙන් රූපාවයව තිසෙකද ඊට නාම ධම්ම තුන්දෙන එකතු කොට තෙතිස්නාමරූපධම්ම කෙනෙක් පහළවෙති. එහිද සමාන රූප කොටස් හැර අසමාන රූපකොටස් එක්කාසුකොට ගත් කල්හි නාමරූපධම්ම පසළොස් දෙනෙක් විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් වෙත්යයි දතයුතු. යම් හෙයකින් ඔපපාතික සත්ත්වයන් අතුරෙන් බ්‍රහ්මකායිකාදි ඔපපාතිකයන්ගේ පිළිසිඳනත්නා කෙණෙහි චක්ඛුසොතවත්ථු දසක කලාපයන්ගේද ජීවිතේන්ද්‍රිය නවක කලාපයාගේද වශයෙන් රූපඝනනති ශීඝ්‍ර හෙවත් රූප පරම්පරා හටගැණීමට මූලසථානයෝ සතරදෙනෙක් හා වේදනා සඤ්ඤා සංඛාර යන අරූපීසකඛන්ධයෝ තුන්දෙනෙක් පහළවෙද්ද එහෙයින් ඔවුන්ගේ වශයෙන් රූපධම්ම එකුන්සාළිසෙක් හා නාමධම්ම තුන්දෙනකු එකතුව නාමරූපධම්ම දෙසාළිස් දෙනෙක් විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් වෙත්යි දතයුතුවී. ඔවුන්ගේද සමාන කොටස් හැර අසමාන කොටස් පමණක් එක්කාසුකොට ගත්කල්හි පසළොස් නාම රූපධම්ම කෙනෙක් වෙත්.

කාමභවයෙහි වනාහි සෙසු ඔපපාතික සත්ත්වයන්ටත් භාව රූප සහිතව සංපුණී ආයතන ඇතිව පිළිසිඳගැණීමක් ඇති කල්හි රූපවශයෙන් ඝනනති ශීඝ්‍ර හෙවත් රූප පරම්පරාවගේ හටගැණීමට තුඩුදීම්වශයෙන් පවත්නා රූපකලාප මුල් සත් දෙනෙක්ද වෙදනා සංඤ්ඤා සංඛාර සකඛ තුන්දෙනද එකතුව නාම රූපධම් සැත්තැතුන්දෙනෙක් විඤ්ඤාණ ප්‍රත්‍යයෙන්වෙති. ඔවුන්ගේද සමාන කොටස් හැර අසමාන කොටස් පමණක් පිඬු කළ කල්හි එකුන්විසි නාමරූප ධම් කෙනෙක් විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් වෙත්යි දතයුතුවී. මෙසෙයින් කාමභවයෙහි උඩත් පිරිසෙයින් නාමරූපයන්ගේ පහළවීමවේ. යටත් පිරිසෙයින් එනාහි චක්ඛුදශක ශ්‍රොත්‍රදශකාදි වශයෙන් රූපඝනනති ශීඝ්‍රයන්ගේ විකල බවට පැමිණියාවූ ඒ ඒ පුද්ගලයන්ගේ වශයෙන් කලාප කොටස් පිරිහීමකොට සංක්ෂේපවශයෙන් හෝ විසතරවශයෙන් හෝ විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් ඇතිවන නාමරූපයන්ගේ ගණන පඨය දතයුතුවී

අරූපාවචර බ්‍රහ්මකායිකයන්ට වනාහි ප්‍රතිසන්ධි ක්ෂණයෙහි විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් වෙදනා සංඤ්ඤා සංඛාර සකඛන්ධයයි කියන ලද ත්‍රිවිධ නාමඛන්ධයෝම පහළවෙති ඔවුන්ට අනුමාත්‍රගකුදු

රූපධර්මයන්ගේ ලැබිමෙක්නම් නැත්තේමය. අසංඥසත්ත්ව බ්‍රහ්ම කායිකයන්ට වනාහි නාම ධර්මයෙන් කිසිවක් පහළනොවේ. රූපධර්මයෙන් පෘථිවී ආපස් තෙජස් වායු වර්ණ ගන්ධ රස ඔජා ජීවිතෙන්ද්‍රිය යන ජීවිත නවක රූපකලාපයෙක් ලැබේ මේ ප්‍රතිසන්ධි ගන්නා කාලයෙහි නාම රූප ධර්මයන් විඥාන ප්‍රත්‍යයෙන් ලැබෙන්නාවූ ක්‍රමයයි.

ප්‍රතිසන්ධියෙන් මත්තෙහි පවත්නා කාලයෙහි රූපධර්මයන් පවත්නා සියළු භවයන්හි ප්‍රතිසන්ධි චිත්තයාගේ සජීවිතක්ෂණයෙහි ප්‍රතිසන්ධි චිත්තය සමග පැවැති තෙජෝධාතු සංඛ්‍යාත සෘතු බලයෙන් පස වතුර ගින්න සුලඟ පැය ගඳ රස ආහාර ශක්තිය යන ශුද්ධාෂ්ටක රූපකලාපයෙක් පහළවේ. මේ ක්‍රමයෙන් ප්‍රතිසන්ධි චිත්තයාගේ සජීවි ක්ෂණයෙහි පවත් චිත්තක්ෂණයක් පාසා සෘතු සමුට්ඨාන රූපධර්මයන් අතරක් නැතිවැ පහළවනබැව් දත යුතුයි. මේ වනාහි සෘතුජ රූපයන් පහළවන ක්‍රමයයි. මේලඟට චිත්තජ රූපයන්ගේ පහළවන අනුරූ දක්වනුලැබේ. ප්‍රතිසන්ධි ගිය වනාහි රූප නූපදවයි. යම්තෙයකින් ප්‍රපාතයෙහි වැටුනාවූ පුරුෂයෙක් තවත් අයෙකුගම පිණ්ඩාරවීමට පොහොසත් නොවේද එපරිද්දෙන්ම ප්‍රතිසන්ධි චිත්තය හෘදයවස්තුවගේ දුර්වල භාවය නිසා තමනුත් දුබලව සිටින අවස්ථාව බැවින් රූපධර්ම උපදවාලීමට සමර්ථනොවේ. ප්‍රතිසන්ධි චිත්තයට අනතුරුව උපදනා ප්‍රථම භවාඞ්ගචිත්තයෙහි පවත් චිත්තක්ෂණය අතරක් නැතිව පස වතුර ගින්න සුලඟ පැය ගඳ රස ආහාර ශක්තිය යන ප්‍රතිසන්ධි චිත්තයාගේ සජීවි ක්ෂණයෙහි පවත් ඇතිවන සෘතුජ රූපයන්ගේ ධාතු අවයව ගැටීම් ආදියෙන් ශබ්දයක් නැතිනම් එසේම ප්‍රථම භවාඞ්ග චිත්තයේපවත් ඇතිවන චිත්තජ රූපයන්ගේද ධාතු අවයව ගැටීම් ආදියකින් ශබ්දයක් නැතිනම් පස වතුර ගින්න සුලඟ පැය ගඳ රස ආහාර ශක්තිය ශබ්දය යන ශබ්ද නවක කලාපයක් පහළවේ. මේ වනාහි චිත්තජ රූපයන්ගේ පහළවන ආකාරයයි.

කබලිඞ්කාරාහාරයෙන් ජීවත්වන්නාවූ යම්කිසි (අඛහසෙය්‍යක) කෙනෙක් පිළිගිඳුන්නා සත්ත්වයෙනෙක් ඇද්ද ඒ සත්ත්වයන්ට වනාහි.

**යඤ්ච්‍යස්ස භුඤ්ජනීමානා අන්නපානඤ්ච භොජනං,**
**තෙන සොත්තඤ්ඤාපෙති මාතුකුච්ඡි ගතොනරෝ. ඊ.**

යම්කිසිය මාතෘකුක්ෂියෙහි යම් ආහාරපාන භොජනයක් කෙරේ නම් එතුන්හු උපන් සත්ත්වයාගේ ඒ හේතුකොටගෙණ යැපේයයි

කී හෙයින් මව විසින් අනුභවකළ ආහාරයෙන් අනුගතවූ ශරීර යෙහි ආහාර සමුට්ඨාන පස වතුර ගින්න සුලඟ පෑය ගඳ රස ආහාර ශක්තියයි කියනලද ඉඩාෂ්ටකරූප කලාපයෙක්ද ඔපපාතික සත්ත්වයන්ට වනාහි සියළු ආහාරයන්ට පළමුව තමාගේ මුඛ යෙහි වැකුනාවූ කෙළ ගිලින කාලයෙහි ආහාර ශක්තියෙන් ඝටගන්නාවූ පස වතුර ගින්න හුලඟ පෑය ගඳ රස ඔජායයි කියනලද ඉඩාෂ්ටක රූපයෙක්ද පහළවේ. මෙනයින් ආහාර හෙතුවෙන් රූපයන්ගේ පහළවන අයුරු දතයුතුයි.

මෙසේ ඍතුවෙන් සැදෙන්නාවූ රූපාවයව නවයකුදු ආහාර බලයෙන් සැදෙන්නාවූ රූපාවයව අටකුදු කම්බලයෙන් සැදෙන්නාවූ කායදසක භාවදසක වත්ථුදසක චක්ඛුදසක සොතදසක ඝාණදසක ජිව්හාදසක කලාපයන්ට ඇතුළත් රූපකැබලි සැත්තැවකුදු එකතුව ඝනානුවක් පමණ රූප ධර්ම හා වේදනා සංඥා සංඝකාරසකන්ධ සංඛ්‍යාත අරූපී ධර්ම තුන්දෙනද එකතුව සංක්ෂේප වශයෙන් නාමරූපධර්ම 99 දෙනෙකුත් විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් ඇතිවනබැව් දතයුතුයි. යම් හෙයකින් ශබ්දයතෙම කිසියම් කලෙක්හි පහළවන හෙයින් අනියතවේද එහෙයින් චිත්තජ ශබ්දයත් ඍතුජ ශබ්දයත් හැර පියා අනුභත්දෙනෙක් පමණ නාමරූප ධර්මයෝ සියළු සත්ත්වයන්හට විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් ලැබෙත් ඔවුන් නිදාසිටියදීත් ප්‍රමාදව සිටියදීත් නොනිදා සිටියදීත් නොපමාවසිටියදීත් කම්කිටියදීත් බොහෝ සිටියදීත් ගමන්බිමන් ආදියෙහි යෙදීසිටියදීත් රැදහවල්හි කඩනැතිව තොරතැතිව කියනලද නාමරූප ධර්මයෝ විඤ්ඤාණ බලයෙන්ම පවතින්යයි දතයුතුයි.

නාමරූපධර්මයන්ට විඤ්ඤාණයෙන් ඇති ප්‍රත්‍යාන ප්‍රකරණාගත උපකාරක්‍රම මතු ප්‍රකාශකරන්නෙමු. ප්‍රතිසන්ධි විඤ්ඤාණය සමග ඉදිරි පසුනොව යම් ඒකජීව රූපයක් හටනගීද ඒ කම්ජ රූපය පනාහි භවයොනිගති ඨිති සත්තාවාසයන්හි සියල්ලට පළමුව පහළවන්නේවී නමුත් ඍතුචිත්තාහාරජ රූපයන් විසින් අනුබල නුදුන්නොත් පිහිටන්ට නොහැකිවේ. එසේම ඍතුචිත්තාහාරජ රූප කොටස්ද කම්ජරූපයන් විසින් දෙනලද අනුබල නැත්තාහුනම් පිහිටන්ට නොහැකිවෙති එතකුදුවුවත් සුලඟින් වැටෙන්ටනොදී නවත්වන ලද්දාවූ සතරදික්භාගයෙහි මුලෙන් මුල වැලඳගෙණසිටි හුණ පදුරක්මෙන්ද රැළවේගයෙන් පහරණ ලද්දී නමුත් මහාසමුද්‍ර යෙහි කිසියම් පෙදෙසෙක ලබනලද පිහිට ඇති බුන් නැවක් මෙන්ද කම්ජ ඍතුජ චිත්තජ ආහාරජ රූපකලාප ඔවුනොවුන් විසින් අනුබලදෙනලදුවැ රැකුල්දෙනලදුවැ පිළිවෙල නොසිඳ

පැවත එක්භව්‍රැද්දක් හෝ දුවුරැද්දක් හෝ භව්‍රැදු සියයක් හෝ පවතින් යම්තාක් කලකින් ආයුඃක්ෂය මරණයට හෝ පුණ්‍යක්ෂය මරණයට හෝ පැමිණේද ඒතාක්කල් චතුර්විධ රූප සන්තති යීඹී පරම්පරාවෝ අන්‍යෝන්‍ය ආධාර ශක්තීන් පවත්නාහු වෙත් මෙපරිද්දෙන් කාමභවාදීන්හි පවත්නා වශයෙන් විනිශ්චය දතයුතුයි. සංග්‍රහ වශයෙන් කිසේයයන් ?

අරූපභවයෙහි පිළිසිඳහන්නා කෙණෙහිද පිළිසිඳගැණීමෙන් මත්තෙහි පවත්නා කාලයෙහිද විඤ්ඤාන ප්‍රත්‍යයෙන් නාමය පමණක්මවේ. සකඹ පසක්ඇති පඤ්චවොකාර භවයෙහි ද්‍රව්‍ය කොටස් ඉපදවීමට බලයක්නැති චක්ඛුර්විඤ්ඤාදි දුර්‍මිල චිත්ත යන්ගේ පහළවීමක් ඇතිකල්හි සහජාතප්‍රත්‍යය ශක්තිවශයෙන් හෙවත් සමඟ උපදනා උපකාර ශක්තිවශයෙන් පවත්නා කාල යෙහි විඤ්ඤාණය වෙදනාසඤ්ඤා සඞ්ඛාර නාමධර්මයන්ට පමණක් ප්‍රත්‍යයවේ. තවද අභිසංඛාර විඤ්ඤානයයි කියන්නේද පූර්‍වභව යන්හි කර්‍මය සකස්කළාවූ චිත්තබලයෙන් කර්‍මජ රූපත් චක්ඛුර් විඤ්ඤාදි සිතුත් පහළවන බැවින් අභිසංඛාර විඤ්ඤාන ශක්තියෙන් පවත්නා කාලයෙහිද පඤ්චවොකාර භවයෙහි නාම රූපවය පහළවේ. මුලින් මුලින් සැදීයන්නාවූ දීඝායුෂ්කාවූ කර්‍මජ චිත්තජ ඍතුජ ආහාරජ රූපයන්ට පසු පසු ඇතිව ඇතිව යන්නාවූ මධ්‍යායුෂ්කාවූ චිත්තයන් උපකාරවන බැවින්ද රැකුල් දෙනබැවින්ද පසුව උපදනා විඤ්ඤානය මුලින් උපන් රූපයන්ට ප්‍රත්‍යය වේ අසංඥසත්ත්ව තලයෙහි වනාහි පූර්‍වභවයෙහි සකස්කළ අභිසංඛාර විඤ්ඤානය ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති කාලයන්හි රූපයට ප්‍රත්‍යයවේ. පඤ්චවොකාරනම්වූ සකඹ පසකින් යුක්තවූ භවයෙහි පවත්නා කාලයෙහි හෙවත් භවාඞ්ගාදිය උපදවන කර්‍මයෙන් අන්‍යවූ යම්කිසි කර්‍මයකින් රූපයන් උපදවන කාලයෙහිද නිරෝධ සමාපත්තියට සමවන්නහුගේ රූප උපදවන කාලයෙහිද භවාඞ්ගයින් ආදිය නූපදනා අනික් කාලයෙහිද අභිසංඛාර විඤ්ඤානය රූපයට ප්‍රත්‍යයවේ සකඹ්පසක් ඇති පඤ්චවොකාර භවයෙහි ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති කාලයන්හි විඤ්ඤාන ප්‍රත්‍යයෙන් යම් නාමරූපයක්වේද සහජාත ප්‍රත්‍යය ශක්ති අභිසංඛාරාදී විඤ්ඤාන ශක්ති වශයෙන්ද පවත්නාවූ ඒ නාමරූපය ඒ ඒ භවානුරූපව යොදුගැණීම පිණිස (නාමංච, නාමඤ්ච; රූපංච, රූපඤ්ච; නාමරූපංච, නාමරූපඤ්ච; නාමරූපං, නාමරූපඤ්චාමැති නිරුක්තීන්ගෙන් පදඝනුලා නිබෙන්බව දතයුතුයි.) නාමං, රූපං, නාමරූපං, යන පදතුන නාමරූපං කියා එක්පදයක්කොට

ඝකුළුවා නිබෙනබැවින් සතර අරූප භවයෙහි විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමයද අසංඥ සත්ත්වතලයෙහි අභිසංඛාර විඤ්ඤාණයයි කියනලදු පූර්වභවික විඤ්ඤාණ ශක්තියෙන් රූපයද පංචවොකාර භවයෙහි හෙවත් සකල පසක්ඇති භවයෙහි විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූපවයද පහළවේයයි දතයුතුයි.

**නාමරූපස්ස සංහෙතු විඤ්ඤාණං තං ද්විධාමතං,**
**විපාක මවිපාකඤ්ච යුත්තමෙව යතෝ ඉදං.**

යම් හෙයකින් යම් මේ විඤ්ඤාණයක් නාමරූපයන්ට හෙතු වේද ඒ විඤ්ඤාණය වනාහි විපාක විඤ්ඤාණය අවිපාක විඤ්ඤාණය (හෙවත් අභිසංඛාර විඤ්ඤාණයයි) දෙවැදෑරුම්වන හෙයින් ඒ කීම යුතුවැයි. විපාක විඤ්ඤාණයම නාමධර්මයට හෝ රූප ධර්මයට හෝ නාමරූප ධර්මයට හෝ ප්‍රත්‍යවේමයයි කිවහොත් අසංඥසත්ත්ව භව්‍යාගේ පැවැත්ම හා පංචවොකාර භව්‍යාගේ පැවැත්ම කෙසේද යන මේ ආදි සැලකියයුතු ධර්ම්ම විරොධ රාශියක් ප්‍රසඞ්ගවන බැවින් විපාක විඤ්ඤාණ (අභිසංඛාර විඤ්ඤාණ සංඛ්‍යාත) අවිපාක විඤ්ඤාණ යන දෙයාකාර විඤ්ඤාණය නාම රූප ධර්ම්මයන්ට ප්‍රත්‍යයවේයයි ගත්කල්හි කිසි අවුලක් නැතිව භවත්‍රයෙහි පවත්නා පිළිවෙළ තෙරුම්ගතහැකිවේ.

අසංඥසත්ත්ව භවයෙහි විඤ්ඤාණයක් නැතිව එහි පැවැති රූපයට විඤ්ඤාණය ප්‍රත්‍යයවනු නිසේයත් අසංඥ සත්ත්ව බ්‍රහ්මාත්ම භාවය ලබාගන්ට අනතුරු පූර්වභවයෙහි කර්ම්මය සකස්කළ චිත්තය හෙවත් අභිසඞ්ඛාර විඤ්ඤාණය අසංඥසත්ත්ව භවයෙහි ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති කාලයෙහි කර්ම්මජරූපයේ උපදවාලීමට ප්‍රත්‍යය වනබැවින් එහි දෙම ප්‍රසඞ්ගයෙක්නම් නැත. දැනුදු පංච වොකාර භවයෙහි ඉපිද සිටින්නා සත්ත්වයන්ගේ සන්තානයෙහිද අභිසංඛාර විඤ්ඤාණ බලයෙන් හෙවත් (පූර්වකර්ම්මබලයෙන්) ද්‍රව්‍ය කොටස්වූ රූපධර්ම් පහළවන නියාමයෙන් අසංඥසත්ත්ව තලයෙහිද පූර්වකර්ම් බලයෙන් හෙවත් අභිසඞ්ඛාර විඤ්ඤාණබලයෙන් ද්‍රව්‍ය කොටස්වූ රූපධර්ම් සැදෙනබව නිසැකව දතයුතුයි. සංග්‍රහවශ යෙන් විනිශ්චය මෙසේයි. ප්‍රත්‍යයතය වශයෙන් කියේයත් ?

**නාමස්ස පාකවිඤ්ඤාණං නවධාහොති පච්චයෝ,**
**චක්ඛුරූපස්ස නවධා සෙසරූපස්ස අට්ඨධා.**
**අභිසඞ්ඛාර විඤ්ඤාණං හොතිරූපස්ස එකධා,**
**නදඤ්ඤං පන විඤ්ඤාණං තස්ස තස්ස යථාරහං.**

යනු කීහෙයින් ප්‍රතිසන්ධික්ෂණයෙහි හෝ ප්‍රවෘත්තික්ෂණයෙහි හෝ යම් ඒ විපාක සංඛ්‍යාත නාමධර්මයක්වේද රූපයෙන් මිශ්‍රවූද

රූපයෙන් අමිශ්‍රවූද ඒ නාම ධර්මයට ප්‍රතිසන්ධි විපාක විඤ්ඤාණය හෝ ප්‍රවෘත්ති විපාක විඤ්ඤාණය හෝ සහජාත ප්‍රත්‍යය අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය නිශ්‍රය ප්‍රත්‍යය සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය විපාක ප්‍රත්‍යය ආහාර ප්‍රත්‍යය ඉන්ද්‍රිය ප්‍රත්‍යය අස්ති ප්‍රත්‍යය අවිගත ප්‍රත්‍යය යන නවපරිද්දෙකින් ප්‍රත්‍යයවේ. පිළිසිඳගන්නා කෙණෙහි හෘදය වස්තුරූපයට විපාක විඤ්ඤාණය සහජාත ප්‍රත්‍යය අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය නිශ්‍රය ප්‍රත්‍යය විපාක ප්‍රත්‍යය ආහාර ප්‍රත්‍යය ඉන්ද්‍රිය ප්‍රත්‍යය විප්‍රයුක්ත ප්‍රත්‍යය අස්ති ප්‍රත්‍යය අවිගත ප්‍රත්‍යය යන නවපරිද්දෙකින් ප්‍රත්‍යයවේ. වස්තුරූපයහැර සෙසුරූපයන්ට සහජාතනිශ්‍රය විපාක ආහාර ඉන්ද්‍රිය විප්‍රයුක්ත අස්ති අවිගත යන ප්‍රත්‍යය අටකින් විපාක විඤ්ඤාණය උපකාරවේ. අභිසඞ්ඛාර විඤ්ඤාණය වනාහි අසංඥසත්ව භවයෙහි ප්‍රතිසන්ධි ප්‍රවෘත්තික්ෂණයෙහි පවත්නා රූපධර්මයන්ටද පඤ්චවොකාර භවයෙහි ඇතිවන කර්මජ රූපයන්ටද උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන් එක් ආකාරයකින්ම ප්‍රත්‍යයවේ හේවනාහි දෙශනානුසාරයෙන් දතයුතුවේ. ප්‍රථම භවාඞ්ගයෙහි පටන් අවශිෂ්ටවූ සියළු විඤ්ඤාණය පවත්නාකාලයෙහි ඒ ඒ නාමරූපයන්ට සහජාත ප්‍රත්‍යයාදි ඒ ඒ ප්‍රත්‍යයන්ට සුදුසු පරිද්දෙන් ප්‍රත්‍යය වේයයි දතයුතු විස්තරවශයෙන් ඒ පිළිබඳවූ ප්‍රත්‍යයනය දක්වනු ලැබීමක් ඇතිකල්හි සියළු ප්‍රසථාන ප්‍රකරණ දෙශනාව විස්තර කටයුතු බැවින් එහි විස්තරය මෙහි ආරම්භනොකොට මෙතෙකින් අවසන්කරමු.

තවද-ප්‍රතිසන්ධි කාලයෙහි නාමරූපය විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් වේය යන්න කෙසේ දැනගත හැක්කේද පෙළෙහි වදාල හෙයිනුත් යුක්තිහෙයිනුත් දැනගත හැක්කේය දෙශනා පාලියෙහි නොයෙක් තැන්වලදී "චිත්තානුපරිවත්තිනෝ ධම්මා" "මනෝ පුබ්බඞ්ගමා ධම්මා" යනාදි නයින් නොයෙක් පරිදි වෙදනා සඤ්ඤා සංඛාර යන්ත්‍රි සංඛ්‍යාත අදව්‍යවූ අරූපීවූ නාමධර්මයන්ට විඤ්ඤාණයාගේ උපකාරබව වදාරණ ලදමැයි.

චිත්තසමුට්ඨානේහි රූපේහි ඉධදිස්සති
අදිස්සමානම්පි රූපස්ස විඤ්ඤාණං පච්චයෝ ඉති'පි.

වදාළ හෙයින් යුක්තිවශයෙන්ද දක්නාලැබේ. කියේයත් චිත්තය පහන්වූ කල්හි හෝ අප්‍රසන්නවූ කල්හි ශරීරයෙහි උපදනා රූපධර්මයෝද ප්‍රසන්න හෝ අප්‍රසන්න හෝ වෙති ප්‍රසන්නාකාරයෙන් හෝ අප්‍රසන්නාකාරයෙන් දකිනු ලබන රූපකය බලා නොපෙණෙන්නාවූ විඤ්ඤාණය පිළිබඳව දැන් මොහුගේ සිත ප්‍රසන්නය දැන් මොහුගේ සිත අප්‍රසන්නයයි කියා තේරුම්නැණිමට

හැක්කේද එමෙන්ම ප්‍රතිසන්ධි විපාක විඤ්ඤාණය වෙදනා සංඥා සංඝකාර නාමධර්මයන්ට හා රූපධර්මයන්ට ප්‍රත්‍යයවේයයි යුක්තිවශයෙන්ද සලකාගැණීමට හැකිවේ. චිත්තයෙන් හටගන්නාවූ රූපයන්ට චිත්තය උපකාරවන්නාක්මෙන් කර්මයෙන් හටගන්නාවූ රූපයන්ට කර්මය උපකාරවනබව ප්‍රසථාන පාළියෙහි වදාළ බැවින් විපාක විඤ්ඤාණයත් අභිසඛ්ඛාර විඤ්ඤාණයත් රූපඋපදවනබැව් දතයුතුයි. තවද විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූපය වේයයි යන ඉගැන්වීමෙන් පරීක්ෂාකර බලන්නාවූ ඤාණවතයන්ට පරමාර්ථ වශයෙන් නාමරූප ධර්ම මාත්‍රයක් පවත්නා බවත් සත්ත්ව පුද්ගලාදි කිසිවක්හු නැතිබවත් තේරුම්ගතහැකිවෙයි. එපමණක්නොවැ නාමරූප මාත්‍රයක්හුගේ පැවැත්ම දුඃඛසත්‍ය මාත්‍රයක් බවත් ඒ වනාහි කිසියම් ඊශ්වර බ්‍රහමාදිබලයකින්වත් ඉඛ්වත් පහළ නොවන බවත් හෙතුබලයෙන් පහළවනබව හා හෙතුනිරොධයෙන් ඔවුන්ගේ නිරොධය කළහැකි බවත් යම්තාක්කල් හෙතුධර්ම පවතිද්ද ඒතාක්කල් නාමරූප සංඛ්‍යාත ඵලධර්ම පරම්පරාව පවත්නා බවත් හඟවයි මේ වනාහි විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප ධර්මයන්ගේ පහළවීමේ විසතර කථාමාර්ගයවේ.

නාමරූප ප්‍රත්‍යයෙන් සළායතනය වන්නේ කෙසේදයත්?

**නාමං චතුන්නනයං රූපං භූතවත්ථාදිකං මතං,**
**කතනෙකසෙසං නනතසස. නාදිසසෙසව පවවයෝ.**

නාමං, නාමයනම්; චතුන්නනයං, වෙදනා සංඥා සංඝකාර යන සතරනිත්‍රයයි; රූපං, රූපයනම්; භූතවත්ථාදිකං, භූතරූපවසතුරූපාදියයි; මතං, දන්නාලදී; කතනෙකසෙසං, කරණලද එක ශෙෂඇති හෙවත් පදත්‍රයක් එකට හකුළුවාගන්නාලද; තං, ඒ නාමරූපය; නාදිසසෙසව, එසේම එකශෙෂකරණලද හෙවත් එකට හකුළුවා ගන්නාලද සළායතනයට; පවවයෝ, ප්‍රත්‍යයවේ යනු පදගතාර්ථයි.

මෙහි පළමුකොට ආයතනයන්හි විසතරාර්ථ දක්වා ඒ ආයතන යන්ට නාමරූපයෙන් ඇති උපකාරශකතිය විසතරකරණුලැබේ. යම් ඇස් කන් නාස් ආදි සථානයෙක්හි පිහිටා ඒ ඒ දෙරටුවලට හමුවූ අරමුණු රසවිඳින්නාවූ චක්ඛුර්විඤ්ඤාණාදි එසසාදි චිත්තචෛතසික ධර්මකෙනෙක් තමතමන් අයත්වූ දැනීම් හැපීම් විඳීම් හැඳිනීම් ආදි කෘත්‍ය විශෙෂයන්හි වැයම්කෙරෙද්ද චිත්ත චෛතසිකයන්ගේ ඒ ඒ දැනීම් හැපීම් විඳීම් හැඳිනීම් ආදි ක්‍රියාසිද්ධියට ආධාරසථානවූ ඇස් කන් නාස් ආදිය ආයතන නම්වේ. තවද අනවරාග්‍ර සංසාරයෙහි පැවැති ඉතා දික්වූ සසර දුකට ඇතුළත්වූ චිත්තචෛතසික ධර්මයන් යම් යම් චකඛු සොත ඝාන ජිවහා කාය මනො සංඛ්‍යාත

ධම්කොෆ්නාක් විසතරකෙරෙද්ද හෙවත් නොනවත්නාසේ හවයෙන් හවය දිනිත්දිනට ගෙණයද්ද ඒ චක්ෂුරාදි ධම්යෝ සඵරදුක දිගින් දිගට ගෙණියන අර්ථයෙන්ද ආයතන නම්වෙත්-තවද මේ ආයතන ශබ්දය තෙම වාසස්ථානයෙකිද ආකරයෙකිද රැස්වතතන්නිද හෙවත් ලගින්නාවූ ඉඩමෙකිද යම්යම්දේ උපදනා දෙශයෙහිද කාරණයෙහිද වැටෙන හෙයින් ඒ ඒ අර්ථයෙන්ද ආයතනයයි කියනුලැබ්. නෙසේද ලොකයෙහි ඊශ්වරයාගේ වාසස්ථානයවූ කෝවිල ඊශ්වරායතනයයිද විෂණුහුගේ වාසස්ථානයවූ කෝවිල වාසුදෙවායතනයයිද කියනුලබන්නාක්මෙන් චිත්ත චෛතසික යන්ගේ වාසස්ථානවූ ඇස් කන් නාස් ආදි ආධ්‍යාත්මික අවයව සඳහනකු ආයතනයයි බුඩ ධම්යෙහි ව්‍යවහාරකෙරෙති ලොකයෙහි රන් රිදී රටඅහුරු මිනිරන් සැදෙන්නාවූ ආකරයන්ට සවණ්ණ යතනය යනාදිවශයෙන් ව්‍යවහාරකරන්නාක්මෙත් චිත්තචෛතසිකයන් ගැවසීගත් බැවින්ද චිත්ත චෛතසිකයන්ට නිශ්‍රය සථානබැවින්ද චක්ෂුරාදි ආධ්‍යාත්මික අවයව සඳහනා ආකරාදී යෙන් ආයතනයයි ව්‍යවහාරකෙරෙති ලොකයෙහි පක්ෂි සිවුපාවුන් ගොදුරුගෙණ ලගින්නාවූ ඉඩමට ආයතනයයි ව්‍යවහාරකරන්නාක් මෙන් රූපාදි අරමුණු ගසාකා චිත්තචෛතසිකයන් ලගින්නාවූ චක්ෂුරාදි ආධ්‍යාත්මික අවයව සඳහනාට ලගින තැන නිප්පලයන අර්ථයෙන් ආයතනයයි ව්‍යවහාරකෙරෙත්. ලොකයෙහි ගොඇතුන්ගේ ආයතනය හෙවත් උත්පත්ති භූමිය දඤ්ඤාපථනම් ජනපදයයිද අශ්වයන්ගේ ආයතනය හෙවත් උත්පත්තිදෙශය කාම්බොජ රට යයිද ව්‍යවහාරකරන්නාක්මෙන් චිත්තචෛතසිකයන්ගේ උත්පත්ති යට ප්‍රදෙශවූ චක්ෂුරාදි ආධ්‍යාත්මික අවයව සඳහනා උත්පත්ති ප්‍රදෙශාර්ථයෙන් ආයතනයයි ව්‍යවහාරකෙරෙත් "තත්‍රතත්‍රෙව සකඛි හබ්බතං පාපුණාති සඞ්ඝති ආයතනෙ" යනාදි පාඨයන්හි පේන ආයතන ශබ්දය කාරණයෙහි වැටෙන්නාක්මෙන් ඇස් කන් නාස් ආදිය නැත්නම් චිත්තචෛතසිකයන්ගේ පැවැත්මද නොවියහැකි හෙයින් චිත්තචෛතසිකයන්ගේ පැවැත්මට හෙතුවූ කාරණවූ ඇස් කන් නාස් ආදිය මෙහි කාරණාර්ථයෙන්හු ආයතනයයි කියනු ලැබේ.

මෙහි අර්ථයෙන් ආයතන නම්ලද චකඛු සොත ඝාණ ජිව්හා කාය මනො යන ආධ්‍යාත්මික අවයව සඳහනාට උපකාරවූ යම් නාමරූපයක් ඇද්ද එහි නාමයනම් වෙදනා සඤ්ඤ සංඛාරයයි කියනලදී සකඛි තුණයි. රූපයනම් නියමවශයෙන් සතර මහා භූතද වසතුරූපද ජීවිතෙන්ද්‍රියද යන මේ රූපධම් සමූහයයි. රූප

යකඬියට ඇතුළත් නොයෙක් රූපධර්ම තිබියදී සතරමහා භූතයන් ගේද සවැදෑරුම් වසතුරූපයන්ගේද ජීවිතෙන්ද්‍රියයාගේද නියමවශයෙන් මෙහි ගෙණහැර දැක්වීමේ ප්‍රයෝජනය කවරේදයත් සහජාත ප්‍රත්‍යය නිශ්‍රය ප්‍රත්‍යය පුරෙජාත ප්‍රත්‍යය ඉන්ද්‍රිය ප්‍රත්‍යය ඝනාදි වශයෙන් සුදුසුපරිදි සළායතනයන්ගේ පැවැත්මට එකාරාතයෙන් උපකාරවනබව දක්වනුසඳහා සතර මහා භූතයන්ද වසතුරූප සයද ජීවිතෙන්ද්‍රියද යන මේ රූප කොටස් නාමරූප පදයෙහි පේන රූපශබ්දයෙහි ඇතුළත්කොට වදුරණ ලදයහි දතයුතු. රූපා රම්මණාදි බාහිරායතනයන්ගේ සහජාත ප්‍රත්‍යය බවකුදු නිශ්‍රය ප්‍රත්‍යය බවකුදු ඉන්ද්‍රිය ප්‍රත්‍යය බවකුදු නොමැතිහෙයින් රූපායතනාදි සෙසු රූපධර්මයන් මේ පදයෙහි නෙවත් මේ "නාම රූප පච්චයා ඝන පදයෙහි සඞ්ග්‍රහ නොකළ බව දතයුතුයි. අනියමවශයෙන් රූපායතනාදී රූපයන්ගේද මේ පදයෙහි සඞ්ග්‍රහවනබව විශුද්ධිමාගී ටීකාවෙහි කියනලදී.

මෙම නාමරූපය ඒ ඒ භවයට සුදුසු පරිද්දෙන් සළායතනයන්ට ප්‍රත්‍යයවන හෙයින් එකශෙෂනයින් "නාමංච, නාමඤ්ච; රූපංච, රූපඤ්ච; නාමරූපංච, නාමරූපඤ්ච, නාමරූපං, නාමරූපඤ නමැයි අදහස් රැසකින් යුත් පදසමූහයක් එකපදයක්කොට ගළපා එසේම එක ශෙෂනයින් පිඩුකොටගත් අවී රාශියක් ඇති පදකීපයක් එක් පදයක්කොට "ඡළායතනංච, සවැනිවූ මනායතනාඤ්ච; සළායතනංච, චක්ඛුරාදි ආයතනසඳෙනඤ්ච; සළායතනං, සළායතන නමැයි ගළපාගෙණ නාමරූපය ෂඩායතනයට ප්‍රත්‍යය වනබැව් කියනලදී. කවර හෙයින් මෙසේ පදහකුළුවා කීහුද යම් හෙයකින් අරූප භව යෙහි නාමයම ප්‍රත්‍යය වනුයේ සවැනිවූ මනායතනයටම ප්‍රත්‍යය වේද චක්ඛුරාදි ආයතනයන්ට එහි ප්‍රත්‍යය වීමෙක් නැද්ද එහෙයින් පටිච්චසමුපපාද විභඞ්ගයෙහි "නාමපච්චයා ඡළායතනං" යි වදාළේත් මේ අර්ථය සලකා බැව් දතයුතුයි.

නාමරූපය සළායතනයට ප්‍රත්‍යයවේයහි කෙසේනම් දැනගත හැක්කේද යම් හෙයකින් ඒ ඒ නාමයාගේද ඒ ඒ රූපයාගේද විද්‍යමානබවක් ඇතිකල්හිම ඒ ඒ ආයතනයවේද ඒ ඒ නාමයාගේ හා රූපයාගේ අභාවයෙහි ඒ ඒ ආයතනය නොපවතීද එහෙයිනි ඒ නාමරූපයන්ගේ ලැබීමෙහි සළායතනයන්ගේ ලැබීම ප්‍රත්‍යය නය විභාගයෙහිම මතු ප්‍රකාශවන්නේය.

තවද මෙහි නාමරූපයට ඇතුළත් නාමසඤ්ඤිතුණ හා මහා භූත රූපත් වසතුරූප සයත් ජීවිතෙන්ද්‍රියත් ආයතනධර්මයන්ට ඇතුළත් නොවන්නාහු නොවෙති. මහාභූත රූපවලින් පඨවී තෙජ

වායු ඝන ධාතු තුණ පොඩාබබායතන සංඛ්‍යාත බාහිරායතනඝටද ආපොධාතුව ධම්මායතනඝටද වසතුරූප සදෙනා අතුරෙන් හෘදය වඝතුව හැර චක්ඛුප්‍රසාදාදී ප්‍රසාදරූප පස්දෙන චක්ඛායතන සොතා යතන ඝාණායතන ජිව්හායතන කායායතන ඝනමේ ආධ්‍යාත්මික ආයතනඝන්ටද හෘදඝවඝතු රූපඝ ධම්මායතනඝටද ජීවිතෙන්ද්‍රිය රූපඝ ධම්මායතනඝටද ඇතුළත්වේමඝ වෙදනා සංඥා සංඝකාර සඛන්ධතුඝද ධම්මායතනඝයෙහි ඇතුළත්වන්නේඝ. මෙසේ නාම රූප පදයෙන් බාහිරායතන කීපඝකුත් චක්ඛුරාදි ආධ්‍යාත්මික ආයතන පඝඝුත් ගැණෙද්දී නාමරූපඝ සළායතනඝට ප්‍රත්‍යවේ ඝයි කීමෙන් චක්ඛායතනඝ චක්ඛායතනඝට ප්‍රත්‍යඝවේඝයිද සොතා යතනඝ සොතායතනඝට ප්‍රත්‍යඝවේඝයිද ඝාණායතනඝ ඝාණායතන ඝට ප්‍රත්‍යඝවේඝයිද ජිව්හායතනඝ ජිව්හායතනඝට ප්‍රත්‍යඝවේඝයිද කායායතනඝ කායායතනඝට ප්‍රත්‍යඝවේඝයිද වදුළාක්මෙන් වැටහී ඝනවාට සැකඝනැත. නමුදු එහි පුනරුත්වඝයෙන් අඥ විපඨීඝස යෙක්වත් පරඝපර විරොධාඝථයෙක්වත් නැත්තේඝ. ප්‍රත්‍යඝන්ගේ ක්‍රම්විභාගඝ මනාසේ සලකාබලනාවිට බුදුන්ගේ අදහස අවුල් නොකොට තේරුම්ගතහැකිබැව් මෙහිදි සැලකියයුතුඝ.

පූඹ කම්මාදිවූ ප්‍රත්‍යඝ බලයෙන් ඒ ඒ රූපකලාප ඇතිවීමට සුදුසු භූමිවල ආරම්භයෙහිදීම හටගත්තාවූ පෘථිවී ආප තෙජ වායු ඝනමේ ධාතු සතරත් කම්මාදිබලයෙන් ආරම්භයෙහි ඇතිවූ චක්ඛු ශ්‍රොත්‍ර ඝ්‍රාණ ජිහවා කායඝ ඝන මේ වඝතුරූප සඝත් ජීවිතෙන්ද්‍රිඝ යත් ඝන මේකී රූපඝෝ නාම රූප පදඝට අන්තඝීත රූප ශබ්ද යෙහි ඇතුළත්වෙත්. ආරම්භකළාඹින්පසු ඔස් දැල් ආදියෙහි පළමුව ඇතිවූ රිකිලිගොබ ආදිඝ නිඝා පසුව ඇතිවන අතුපතර පරම්පරාවමෙන්ද අල බතල ආදියෙහි පළමුව නහින්නාවූ මොරෙහි ඝන් නිඝා පසුව ඇතිවන පඳුරුලැම්මෙන්ද ඒ ඒ රූපකලාප සෑදී මට රිකිලිගොබ මොරෙහියන්මෙන් තුඩුදීනිඝ තැන් පවන් පෙළ නොනැඹී පරම්පරාවශයෙන් පසු පසු ලිඝලනුලබන්නාවූ චක්ඛුරාදි ආයතනඝෝ සළායතන පදයෙහි ඇතුළත්වන්නාහ. මෙපරිද්දෙන් වටහාගෙණ ප්‍රත්‍යඝවන ක්‍රමඝ සලකාබලන්නවුන්ට නාම රූප ප්‍රත්‍යයෙන් සළායතනඝ වනසැටි නිරවුල්ව දැනගතහැක්කේඝ.

**පවිසඤ්ඤා පවත්තවා හොති යං ඝස්ස පච්චයෝ,**
**ඝථාච පච්චයෝ හොති නථා නෙඝ්‍යං විභාවිනා.**

යං, යම් නාමඝෙක් යම් රූපඝෙක් යම් නාමරූපඝෙක්; පටි සන්ධිඝා, ප්‍රතිසන්ධි ක්ෂණඝෙහි හෝ; පවත්තෙතවා, ප්‍රවර්තති ක්ෂණ

යෙහි හෝ; යස්ස, යම් යම් ආයතනයකට; පච්චයොහොති, ප්‍රත්‍යය වේද; යථාව, සහජාතප්‍රත්‍යයාදී යම් යම් ප්‍රකාරයෙකින් හෝ; පච්චයොහොති, ප්‍රත්‍යයවේද; තථා, ඒ ඒ ප්‍රකාරයෙන්; විභාවිනා, ප්‍රඥා ඇත්තහු විසින්; නෙය්‍යං, දතයුත්තේය.

**නාමමෙවහි ආරුප්පෙ පවිසන්ති පවත්තිසු,**
**පච්චයෝ සත්තධාඡඛා හොති නං අවකංසතො.**

සී වදුළහගින් අරූප භූමියෙහිලා ප්‍රතිසන්ධිය ගෙණදෙන අවස්ථා වෙහි ඔමකවශයෙන් සහජාත ප්‍රත්‍යය අන්‍යෝන්‍යප්‍රත්‍යය නිශ්‍රය ප්‍රත්‍යය සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය අත්‍ථි ප්‍රත්‍යය අවිගත ප්‍රත්‍යය යන සත් වැදෑරුම් ප්‍රත්‍යය ශක්තියෙන් නාම ධර්මයන් කියනලද වෙදනා සංඥා සංස්කාර ස්කන්ධත්‍රය වනාහී සවැනි ආයතන නම්ලද මනායතනයට ප්‍රත්‍යය වන්නේයි මනෝසංචෙතනාදි ආහාරප්‍රත්‍යයාගේ ලැබීමද අරූපභවයෙහි සිදුවෙයින් උත්කෘෂ්ටවශයෙන් අරූපභූමියෙහි ලා ප්‍රතිසන්ධිය ගණදෙන අවස්ථාවෙහි නාමස්කන්ධත්‍රය මනායතනයට අට පරිද්දෙකින් ප්‍රත්‍යය වනබව දතයුතුය හෙතුප්‍රත්‍යයෙන් රුකුල් දීමක් ඇතිකල එහිම නවආකාරයෙකින් නාමස්කන්ධත්‍රය මනායතනයට ප්‍රත්‍යය වනබව දතයුතුයි. මෙහි සත්ආකාරයකින් ප්‍රත්‍යයවීම හීන (ඔමක) ක්‍රමයයි අටපරිද්දෙකින් ප්‍රත්‍යයවීම ඊට වඩා උත්කෘෂ්ට ක්‍රමයයි. නවපරිද්දෙකින් ප්‍රත්‍යයවීම ඊටත් වඩා උත්කෘෂ්ට ක්‍රමයයි ටීකාවෙහි දශආකාරයකින්ද ප්‍රත්‍යයවනබැව් කීහෙයින් හේ සර්වෝත්කෘෂ්ට ක්‍රමයයි. දශපරිද්දෙකින් වන ප්‍රත්‍යය ක්‍රමය නිම්කොට නවපරිද්දෙකින් වන ප්‍රත්‍යය ක්‍රමය හීනයි. නවය නිම්කොට අට හීනතරයි අට නිම්කොට සත හීනතමයි. මෙසේ අරූපතලයෙහි නාමස්කන්ධත්‍රය මනායතනයට උපකාරවීමෙහි ලා ප්‍රත්‍යයන්ගේ හීනොත්කෘෂ්ට භාවය සැලකියයුතුයි. අරූප භූමිවල ප්‍රතිසන්ධියෙන් මත්තෙහ පවත්නාකාලයෙහිද විපාක නාමස්කන්ධත්‍රය ඉහතකී ක්‍රමයෙන්ම මනායතනයට සහජාත ප්‍රත්‍යය අන්‍යෝන්‍ය ප්‍රත්‍යය නිශ්‍රය ප්‍රත්‍යය සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය විපාක ප්‍රත්‍යය අත්‍ථි ප්‍රත්‍යය අවිගත ප්‍රත්‍යය යන මේ සත්පරිද්දෙන්ද හෙතුප්‍රත්‍යය හා යෙදීමෙන් අටපරිද්දෙකින්ද ආහාර ප්‍රත්‍යය හා යෙදීමෙන් නවපරිද්දෙකින්ද ටීකාගත ක්‍රමයෙන් දශපරිද්දෙකින්ද ඔමක උත්කෘෂ්ටවශයෙන් ප්‍රත්‍යය වනබව දතයුතුයි.

අරූප තලයන්හි අවිපාක නාමස්කන්ධත්‍රය හෙවත් කුශලා කුශල ක්‍රියාවශයෙන් භෙදවූ වෙදනා සංඥා සංස්කාරස්කන්ධත්‍රයයි නම්ලද නාමය වනාහී ඉහතකී ප්‍රත්‍යයන් අතුරෙන් විපාක ප්‍රත්‍යය හැර සහජාත ප්‍රත්‍යය අන්‍යෝන්‍ය ප්‍රත්‍යය නිශ්‍රය ප්‍රත්‍යය සම්ප්‍රයුක්ත

ප්‍රත්‍යය අසෂ්‍ඨි ප්‍රත්‍යය අවිගත ප්‍රත්‍යය යන සපරිද්දෙන් හීනවශයෙන් මනායතනයට උපකාරවේ. උත්කෘෂ්ටවශයෙන් අවිපාක නාමය හෙවත් කුශලාකුශල ක්‍රියා නාමසංඛ්‍යාත මනායතනයට හෙතු ප්‍රත්‍යය හා එක්වීමෙන් සත්පරිද්දෙකින්ද ආහාරප්‍රත්‍යය හා එක්වීමෙන් අටපරිද්දෙකින්ද ප්‍රත්‍යයවන්නේය. මෙහි සයආකාරයකින් ප්‍රත්‍යයවීම හීනක්‍රමයයි. සත්ආකාරයකින් ප්‍රත්‍යයවීම උත්කෘෂ්ට නාමයයි අටආකාරයකින් ප්‍රත්‍යයවීම උත්කෘෂ්ටතර ක්‍රමයයි. අට ආකාරය උත්කෘෂ්ටස්ථානයෙහි තබා සත්ආකාරය හීනක්‍රමයයිද ඊට ආකාරය හීනතරක්‍රමයයිද මෙසේ හීනොත්කෘෂ්ටභාවය හැඳිකිය යුතුයි.

**අසඤ්ඤම්පිහවෙ නාමං තථෙව පටිසන්ධියං**
**ජඤ්ඤා ඉතරෙසංතං ජ ආකාරෙහි පවව්‍යෙ.**

යනුහෙයින් අරූපභවයෙන් අන්‍යවූ පඤ්චවොකාරභවය යහි නියනලද සකඹිපයක් ඇති රූතලවල හා එකොළොස් කාමභූමි යෙහි ප්‍රතිසන්ධිය ගෙණදෙන අවස්ථාවෙහි වෙදනා සංඥා සංඛාර සඞ්ඛ්‍යාත ඇතුළත් විපාක නාමය හෘදයවස්තු රූපය පිළිට කොටගෙණ සවැනිවූ මනායතනයට ඉහතකීලෙස සහජාත අඤ්ඤමඤ්ඤ නිශ්‍රය සම්ප්‍රයුක්ත විපාක අසෂ්‍ඨි අවිගත යනමේ සපත විධප්‍රත්‍යය ශක්තික්‍රමයෙන් උපකාර වන්නේහි මෙහිදු හීනොත්කෘෂ්ටභාවයෙන් ප්‍රත්‍යයවීම ඉහතකී අනුසාරයෙන් දතයුතු.

යථොක්ත විපාකනාමය වනාහි මනායතනයෙන් අන්‍යවූ චක්ඛායතන සොතායතන ඝානායතන ජිව්හායතන කායායතන පස්දෙනාට පෘථිවී ආප තෙජ වායු නම්ලද සතරමහා භූතයන් පිහිටකොටගෙණ සහජාත ප්‍රත්‍යය නිශ්‍රය ප්‍රත්‍යය විපාකප්‍රත්‍යය විප්‍රයුක්ත ප්‍රත්‍යය අසෂ්‍ඨිප්‍රත්‍යය අවිගතප්‍රත්‍යය වශයෙන් සයපරිද්දෙකින් ප්‍රත්‍යය වන්නේය. උත්කෘෂ්ටවශයෙන් හෙතුප්‍රත්‍යය හා එක්වීමෙන් සත්ප්‍රකාරයෙකින්ද ආහාර ප්‍රත්‍යය හා එක්වීමෙන් අට ප්‍රකාරයෙකින්ද ප්‍රත්‍යය වන්නේය. ඔවුන්ගේද හීනොත්කෘෂ්ට භාවය පූර්වොක්ත නයින් දතයුතුයි.

**පවත්තෙපි තථාහොති පාකං පාකස්ස පවව්‍යෙ,**
**අපාකං අවිපාකස්ස ජඩාජඤ්ඤස්ස පවව්‍යෙ.**

යනු වදාළහෙයින් පඤ්චවොකාර භවයෙහි ප්‍රතිසන්ධිය ගෙණදෙන අවස්ථාවෙහි මෙන් පඤ්චවොකාර භවයයි කියනලද සකඹිපයක් ඇති රූපභව කාමභවයන්හි පවත්නාකාලයෙහිද විපාකනාමයට ඇතුළත් වෙදනා සංඥා සංඛාරස්කන්ධත්‍රය විඤ්ඤාණඤ්චායතනයට හෙතුම පරිවෙජ්දයෙන් සහජාත අඤ්ඤමඤ්ඤ නිශ්‍රය සම්ප්‍රයුක්ත

විපාක අසති අවිගතප්‍රත්‍යය යනාසන්පරිද්දෙන් අනුබලදෙන්නේය. අවිපාක නාමය හෙවත් කුශලාකුශල ක්‍රියා සංඛ්‍යාත වේදනාදි සකණ්ඩත්‍රය පඤ්චවොකාර භවයෙහිවූ කුශලාකුශලක්‍රියා සංඛ්‍යාත මනායතනයවිපාක ප්‍රත්‍යය හැර සහජාත අඤ්ඤමඤ්ඤ නිශ්‍රයසම්ප්‍රයුක්ත අත්‍ථි අවිගත ප්‍රත්‍යය වශයෙන් සපරිද්දෙන්න් අනුබල දෙන්නේය පුබ්බොකතනයින් මොවුන්ගේද නිනොතඤාෂට භාවය දතයුතුයි.

**තණ්ඩේවමෙඝ පඤ්චනනං විපාකං පච්චයොහවේ**
**චතුධා අවිපාකම්පි එව මෙව පකාසිනං**

යනු වදුළුහසින් ඒ පඤ්චවොකාර භවයෙහිම පවත්නා සමයෙහි මනායතනයෙන් අන්‍යවූ චඤ්ඤායතන සොතායතන ඝානායතන ජිව්හායතන කායායතන නම්වූ ආයතන පස්දෙනාට චක්ඛුප්‍රසාදාදී වැනුරූපයන් ඇසුරුකොට උපදනාවූ චක්ඛුවිඤ්ඤන සෝත්‍රවිඤ්ඤන ඝ්‍රාණවිඤ්ඤන ජිහ්වාවිඤ්ඤන කායවිඤ්ඤනාදි සින් සමග එකොතපාදාදි වශයෙන් පවත්නාවූ වේදනා සංඤ්ඤ සංඛාර සකණ්ඩත්‍රය සංඛ්‍යාත විපාකනාමය වනාහි පවත්‍රාජනවිප්පයුත්ත අත්ථි අවිගත යන චතුර්විධ ප්‍රත්‍යයන්ගේ වශයෙන් රැකුල්දෙන්නේය. අවිපාකනාමයයි කියනලද කුශලාකුශල ක්‍රියා වශයෙන් හෙදවූ වේදනා සංඤ්ඤ සංඛාර සකණ්ඩත්‍රයද එසේමැ චක්ඛුරාදි ආයතන පස්දෙනාට පඤ්ච දොකාරභවයෙහි පවත්නාකාලයෙහි ඉඛනකීලෙස පවත්‍රාජන විප්පයුත්ත අත්ථි අවිගත වශයෙන් සිවුපරිද්දෙයින්ම ප්‍රත්‍යය වන්නේයි.

මෙසේ විපාකනාමයත් අවිපාක නාමයත් යම් යම් ආයතනය කට යම් යම් පරිද්දෙකින් ප්‍රත්‍යයවේනම් ඒ ඒ පරිද්දෙන් විසතර කොට රූපය සළායතනයට උපකාරවනුසැටි දක්වනු පිණිස.

**රූපං පනෙත්ථ ආරුප්ප භවෙ නත්ථි පච්චයො**
**න එකායතනඤ්ඤාපි පඤ්චකණ්ඩම්හි භවෙ පන,**
**රූපනොසඤ්ඤිසංවත්තු ජවාජවස්ස පච්චයො**
**භූතානි චතුධාමොහනි පඤ්චනනං අවිසෙසතො. යි**

කිහු. රූපං පන, මහාභූත රූපයහෝ වසතුරූපය හෝ ජීවිතින්ද්‍රිය රූපය හෝ; එසේ ආරුප්පභවෙ, මේ අරූපභූමියෙහි; එකායතනසස අපි, එක් ආයතනයකටද; පච්චයො නහවති, ප්‍රත්‍යය නොවන්නේය; පඤ්චවොකාරභවෙ පන, සකණ්ඩපසක් ඇති භවයෙහි වනාහි හෙවත් කාමභව රූපභව මෙක්හිලා ප්‍රතිසන්ධිය ගෙණදෙන අවසථා වෙති හෘදයවසතුරූපය සවැනිවූමනායතනයට

සහජාත ප්‍රත්‍යය අන්‍යෝන්‍ය ප්‍රත්‍යය නිශ්‍රය ප්‍රත්‍යය විප්‍රයුක්ත ප්‍රත්‍යය ආහාර ප්‍රත්‍යය අවිගත ප්‍රත්‍යය යනමේ සපරිද්දෙන් ප්‍රත්‍යය වේ. සතර මහාභූතයෝ වනාහි ප්‍රතිසන්ධියෙහිත් ප්‍රවෘත්තිකාලයෙහි නිසිවෙනසක් නැතිව යම් යම් ආයතනයක් උපදිනම් ඒ ඒ ආයතනයාගේ වශයෙන් චක්ඛායතන සෝතායතන ඝාණායතන ජිව්හායතන කායායතනයන්ට සහජාත ප්‍රත්‍යය නිශ්‍රය ප්‍රත්‍යය අත්‍ථි ප්‍රත්‍යය අවිගත ප්‍රත්‍යය යන සතරපරිද්දෙකින් ප්‍රත්‍යය ඇත්තාහු වෙත්.

**නිඛාත්‍වින මෙතෙසං ආහාරෙව පවත්තියං,**
**නානෙවජ්ඣාජ්ඣත්තස්ස වත්ථුනෝසෙව පඤ්චධා. සි**

යි‍හෙයින් ප්‍රතිසන්ධි ප්‍රවෘත්තිකාලයන්හි මෙකී චක්ඛායතනාදි ආයතන පස්දෙනාට ජීවිතෙන්ද්‍රිය අත්‍ථි ප්‍රත්‍යය අවිගත ප්‍රත්‍යය ඉන්ද්‍රිය ප්‍රත්‍යය යන තුන්පරිද්දෙකින් ප්‍රත්‍යය වේ. ආහාරය නෙමේද චක්ඛ යතනාදි ආයතන පස්දෙනාට ප්‍රවෘත්තිකාලයෙහි අත්‍ථි අවිගත ආහාරප්‍රත්‍යය යන තුන්පරිද්දෙකින් ප්‍රත්‍යයවේ. ඒ ආහාරය නෙමේ යම් සත්ව කෙනෙක් ආහාරයෙන් ජීවත් වෙන්නම් ඒ සත්ව යන්ට ආහාර ඔජාව පැතිරෙයි සිරුරෙහි ප්‍රවෘත්තිකාලයෙහිම ප්‍රත්‍යයවේ. ප්‍රතිසන්ධිය ගෙණදෙන කාලයෙහි ප්‍රත්‍යය නොවේ. චක්ඛායතනාදිවූ ආයතනයෝ පස්දෙන සවැනි ආයතනයවූ චක්ඛු විඤ්ඤාණ සෝතවිඤ්ඤාණ ඝාණවිඤ්ඤාණ ජිව්හාවිඤ්ඤාණ කාය විඤ්ඤාණයයි කියනලද මනායතනයට නිශ්‍රය ප්‍රත්‍යය පුරෙජාත ප්‍රත්‍යය ඉන්ද්‍රිය ප්‍රත්‍යය විප්‍රයුක්ත ප්‍රත්‍යය අත්‍ථි ප්‍රත්‍යය අවිගත ප්‍රත්‍යය යන සපරිද්දෙකින් පවත්නා කාලයෙහි රැකුල්දෙන්නාහු වෙත්. ප්‍රතිසන්ධියෙහිලා එසේ ප්‍රත්‍යයවන්නාහු නොවෙත් චක්ඛුර්විඤ්ඤාණාදි පඤ්චවිඤ්ඤාණයන් හැර තදවශෙෂවූ සවැනිවූ මනායතනයට හෘදය වස්තුරූපය නිශ්‍රය ප්‍රත්‍යය පුරෙජාතප්‍රත්‍යය විප්‍රයුක්තප්‍රත්‍යය අත්‍ථිප්‍රත්‍යය අවිගතප්‍රත්‍යය වශයෙන් පස්අයුරකින් ප්‍රවෘත්ති කාලයෙහිම ප්‍රත්‍යයවන්නේය. ප්‍රතිසන්ධික්ෂණයෙහි එසේ ප්‍රත්‍යය නොවන්නේය.

මෙසේ රූපයම යම් යම් ආයතනයකට ප්‍රතිසන්ධි කාලයෙහි හෝ ප්‍රවෘත්තිකාලයෙහි යම් පරිද්දෙකින් ප්‍රත්‍යයවේද ඒ ඒ පරිද්දෙන් දතයුතු. පළමුකොට නාමය යම් යම් ආයතනයන්ට ප්‍රත්‍යය වනසැටිද දෙවනුව රූපය යම් යම් ආයතනයන්ට ප්‍රත්‍යයවන සැටිද දක්වා දැන් නාමරූපවල යම් යම් ආයතන කෙනෙකුන්ට **ප්‍රත්‍යයවේ නම් හේ දක්වනු සඳහා**

**නාමරූපං පනුභයං හොතියං යස්ස පච්චයෝ**
**යථාවනම්පි සබ්බත්ථ විඤ්ඤාතබ්බං විභාවනා.** යි කීහු.

හේ කෙසේදයත්. පඤ්චවොකාර භවයහි කියනලද සකඤ්ඵපසක් ඇති කාමරූපභවයන්හි වෙදනා සංඥාසංඛාරසකඤ්ඵත්‍රය හා හෘදයවස්තුරූප සංඛ්‍යාත නාමරූපවය සවැනිවූ මනායතනයට සහජාත ප්‍රත්‍යය අන්‍යෝන්‍ය ප්‍රත්‍යය නිශ්‍රය ප්‍රත්‍යය විපාක ප්‍රත්‍යය සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය විප්‍රයුක්ත ප්‍රත්‍යය අස්ති ප්‍රත්‍යය අවිගත ප්‍රත්‍යය යනමේ ආදීන්ගේ වශයෙන් ප්‍රත්‍යය වේ. මේ මෙහි දක්වනලද නයමුඛ මාත්‍රයෙකි කියනලද අනුසාරයෙන් සියල්ල යොදාගන්ට හැකිබැවින් අතිවිස්තර කථායෙන් ප්‍රයොජන කිම? නාමරූප ප්‍රත්‍යයෙන් සළායතනය වේය යන්නෙහි විස්තරය මෙතෙකින් සම්පත්ති.

---

ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වන්නේ කෙසේදයත්?

**ඡළෙවස්සා සඞ්ඛිපා චක්ඛුසම්ඵස්ස ආදයෝ,**
**විඤ්ඤාණම්ව ඛත්තිංස විත්ථාරෙන භවන්තිතෙ.** යි

කීහෙයින් ෂඩායතන ප්‍රත්‍යයෙන් වන්නාවූ ස්පර්ශයනෙම සඞ්ක්ෂප වශයෙන් චක්ඛුසම්ඵස්සය සොතසම්ඵස්සය ඝාණසම්ඵස්සය ජිව්හා සම්ඵස්සය කායසම්ඵස්සය මනොසම්ඵස්සයයි සපරිද්දෙකින් වන්නේය. විස්තරවශයෙන් වනාහි කුශලවිපාක චක්ඛුසම්ඵස්ස සොතසම්ඵස්ස ඝාණසම්ඵස්ස ජිව්හාසම්ඵස්ස කායසම්ඵස්ස පස්දෙනා හා අකුසලවිපාක චක්ඛුසම්ඵස්ස සොතසම්ඵස්ස ඝාණසම්ඵස්ස ජිව්හාසම්ඵස්ස කායසම්ඵස්ස යන පස්දෙන එකතුව පඤ්චවිඤ්ඤාණයෙහි ස්පර්ශෝ දසදෙනෙක්ද කුසලාකුසල විපාක සම්පටිච්ඡනයෙහි සම්ප උපදනා ස්පර්ශයද කුසලාකුසලවිපාක සන්තීරණ සිත් තුන සම්ප උපදනා ස්පර්ශතුන්ද මහා විපාකයෙහි අට සම්ප උපදනා ස්පර්ශඅටද රූපාවචරවිපාකයෙහි පස්දෙනාසම්ප උපදනා ස්පර්ශ පසද අරූපාවචරවිපාකයෙහි සිවුදෙන සම්ප උපදනා ස්පර්ශ සිවුදෙනද යනමේ මනොද්වාරික ස්පර්ශයෝ දෙවිසිදෙන හා එකතුව සංඛ්‍යාර ප්‍රත්‍යයෙන් ඇතිවන්නාවූ දෙතිස් විපාක විඤ්ඤාණ යන් මෙන් ෂඩායතන ප්‍රත්‍යයෙන් දෙතිසක් විපාක ස්පර්ශයෝ වෙත්හි දතයුතුහි.

මෙහිකී දෙතිස් වැදෑරුම්වූ විපාකස්පර්ශයට ප්‍රත්‍යයවූ යම් සවැදෑරුම්වූ ආයතන කෙනෙක් ඇද්ද ඒ ආයතනයන් විභාග කිරීමෙහිලා,

**ඡළෙනාසඟ අජ්ඣත්තං චක්ඛාදිං බාහිරෙහිපි ,**
**සළායතන මිච්ඡන්ති ඡහිසඩ්ඩං විචක්ඛණා . සී**

වදුළුහෙයින් යම් පූර්වාචාර්‍යයී කෙනෙක් මේ කථා ප්‍රවෘත්තිය වනාහි ආධ්‍යාත්මිකවූ ආයතනයන් පිළිබඳවූ කථාවෙහි සළායතන (ඉන්ද්‍රියබද්ධ) සන්තානයෙහි කර්මයෙන් හටගන්නාවූ ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්නධර්ම නම්වූ හෙතුඵලධර්මයන් භවන් ෂඩායතනය හා චක්ඛුසම්ඵස්සාදි ඵලශීර්ෂයන් ගෙණහැර දක්වද්ද ඒ පූර්වාචාර්‍යයී වරයෝ වනාහි "ඡළායතනපච්චයා ඵස්සෝ" යනාදී දෙශනාපාඨය ඇසූ ඒ දෙශනාපාඨානුසාරයෙන් අරූප භවයෙහි සැදෙනිවූ මනා යතනය එහි ඵලශීර්ෂයට ප්‍රත්‍යයවන බවත් ඉන් පිටත් සකඤ්ඤ ඵලක් ඇති භවයන්හි සියළු ආයතන සඞ්ග්‍රහකිරීම් වශයෙන් ආයතන සදෙන එහි ඵලශීර්ෂයන්ට ප්‍රත්‍යයවන බවත් අදහස්කොට නිරුක්ති ශාස්ත්‍රක්‍රමයෙන් "ඡළායතනඤ්ච සළායතනඤ්ච සළායතනං"යි පදඝටනාවක් කෙවෙත් ඡළායතන සළායතන යන පදදෙකක්හුගේ අර්ථය එක් පදයෙක්හි ඇතුළත්කොට සළායතනය කැමැති වෙත්. ඒ ආචාර්‍යවරයන්ගේ මතයේ හැටියට "ඡළායතනංච, සැදෙනිවූ මනායතනයද; සළායතනඤ්ච, චක්ඛායතන සෝතායතන ඝාණායතන ජිව්හායතන කායායතන මනායතන සදෙනද; සළායතනං, ෂඩායතන නමැයි ව්‍යවහාරයට යේ.

යම් පූර්වාචාර්‍යයී කෙනෙක් වනාහි ප්‍රත්‍යයොත්පන්නවූ ඵලධර්ම පක්ෂයට අන්තර්ගත ඵලශීර්ෂධර්මයන් එකඝන්තති වශයෙන් සළකා ප්‍රත්‍යය ධර්මවූ ෂඩායතනය භින්නසන්තාන වශයෙන් සළකා සළායතනය ගෙණහැර දක්වද්ද ඒ පූර්වාචාර්‍යවරයෝවූකලි යම් යම් ආයතනයෙක් ඵලශීර්ෂයට ප්‍රත්‍යයවේනම් ඒ සියල්ල නිෂ්ඵල ගෙණහැර දක්වන්නාහු බාහිර ආයතනයන්ද මෙතනට ගෙණ හුදුමනායතනයත් චක්ඛායතනාදි ආධ්‍යාත්මික ආයතන සදෙනත් රූපායතන සද්දායතන ගන්ධායතන රසායතන පොට්ඨබ්බායතනයයි කියන ලද බාහිරායතන සදෙනත් නිරුක්තිශාස්ත්‍රක්‍රමයෙන් "ඡළායතනඤ්ච සළායතනඤ්ච සළායතනඤ්ච සළායතනං" යි කිහු මෙසේ පදඝටනාවක් ගත්කලැ "ඡළායතනංච, මනායතනයද; සළායතනඤ්ච, ආධ්‍යාත්මික ආයතන සදෙනද; සළායතනඤ්ච, බාහිරායතනසදෙනද; සළායතනං, ෂඩායතන නමැයි ව්‍යවහාරයට යේ.

මෙහි ප්‍රථම ආචාර්‍යමතයේ හැටියට රූපායතනාදි බාහිරායතන සදෙන සළායතන පදයෙහි ඇතුළත් නොවන බවත්, දෙවැනි ආචාර්‍යමතයේ හැටියට රූපාදි බාහිරායතන සදෙනද සළායතන පදයෙහි ඇතුළත්වන බවත් කියනලදය මනුෂ්‍ය

තිරශ්චීනාදී ඉන්ද්‍රියබද්ධ වසතුන්නිද චක්ඛාදීනාදි අනින්ද්‍රියබද්ධ වසතුන්හිද පවත්නාවූ රූපායතනාදි බාහිරායතනයෝ සප්‍රතීඝයට අරමුණුවෙත් නම්දු යම්හෙයකින් ඒ රූපායතනාදි බාහිරායතනයෝ චක්ඛායතනාදි අධ්‍යාත්මිකායතනයන් මෙන් අධ්‍යාත්මික සන්තානගතවූ කම්මක්ලෙශයන්ට එකාන්ත කරුණුවී පවත්නා සප්‍රතීඝව පත්‍යයවූවාහු නොවෙත්ද එහෙයින් ප්‍රථම ආවාර්‍යී වාදයෙහි බාහිරායතනයෝ සළායතන පදයෙහි නොගන්නාලදහ. දෙවැනි ආවාර්‍යී වාදයෙහි වනාහි කිසියම් ආකාරයකින් සප්‍රතීඝට ප්‍රත්‍යයවීමක් ඇතිකළ එබදු ආයතනයක් පියන්ට නොහැක්කේ යහි සළකා එසසායට උපකාරවූ බාහිරායතනයෝ ගන්නාලදහ.

පුබ්බෝකත්ත යම් ආචාර්‍යී කෙනෙක් ඒකුත්තරයෙහිත් නාමරූප යද සළායතනයද එසසායද වෙදනාවද ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න කොට ආධ්‍යාත්මික සන්තානයෙහි ඇතුළත්කොට දක්වන්නාහු මේ කාරණයෙහිදී විපාකප්‍රතීත්‍යදීන්ම කැමතිවූවෝද ඒ උභයපක්ෂයෙහිවූ පුබ්බෝකත්ත ආචාර්‍යවරයෝ වනාහි මහාවිහාර වාසිහුමයහි දතයුතු.

සළායතන හෙතුවෙන් එකම සප්‍රතීඝයක් ලැබෙයයි වදාළේ කවරහෙයිනයත්? එහි මේ විසඳීමයි ෂඩායතන ප්‍රත්‍යයෙන් එකම සප්‍රතීඝයක් වේයයි වදාළ වචනය සැබව සියළු ආයතන බලයෙන් එක් සප්‍රතීඝයක්වත් එක් ආයතන බලයකින් සියළු සප්‍රතීඝයෝවත් නොලැබෙන්නාහ එසේනමුත් සියළු ආයතන බලයෙනුදු නොවැ එක් ආයතන බලයකිනුදු නොවැ නොයෙක් ආයතනබලයෙන් එක් සප්‍රතීඝයෙක් ලැබේමය ඒ මෙසේයි. චක්ඛුඤ්චපටිච්චසසායතෙම චක්ඛායතන බලයෙන්ද රූපායතන බලයෙන්ද චක්ඛුර්විඤ්ඤාණයයි කියනලද මනායතන බලයෙන්ද ඒ සමග යෙදුන්නාවූ අනේක චෛතසික ධර්මස්කන්ධයන ධර්මායතන බලයෙන්ද යන නොයෙක් ආයතනබලයෙන් ලැබෙන්නේය. මේක්‍රමයෙන් සොතඤ්චපටිච්චසසාදි යෙහිද නොයෙක් ආයතනයන්ගේ ලැබෙන අන්දම සුදුසු පරිදි යෙදුගතයුතු එහෙයින් කීහු.

**එකොපනෙකායතනයුහවෝ ඉති දිට්ඨෙ,**
**එසෙසායං එකවචන නිද්දෙසෙනිධනාදිනා. සී**

ඉධ, මේ පටිච්චසමුප්පාද විභාගයෙහි; එකවචන නිද්දෙසෙන, සළායතන පච්චයාඵස්සායන මේ එකවචනය දැක්වීමෙන්; අයං එකොපිඵස්සො, මේ එක් සප්‍රතීඝයකුදු; අනෙකායතනපහවෝති; නොයෙක් ආයතනශක්තීන් හවඅණ්ඩයහි; තාදිනා, අෂ්ටලෝක ධර්මයෙහි කම්පානොවන්නාවූ තථාගතයන්වහන්සේ විසින්; දීපතෝ, දක්වනලදහ, යනුයි.

**ඡඩායතනතෝ එකං නවධා බාහිරානිජ,**
**සඵාසමහව මෙතස්ස පවිභයෙන්ත විභාවයෙ. සී**

වියූහෙයින් චක්ඛායතන සොතායතන ඝාණායතන ජිව්හායතන කායායතන පස්දෙන චක්ඛුසම්ඵස්ස සොතසම්ඵස්ස ඝානසම්ඵස්ස ජිව්හාසම්ඵස්ස කායසම්ඵස්ස යනමේ සඵාසීයන් පස්දෙනාට නිශ්‍රය ප්‍රත්‍යය පුරෙජාතප්‍රත්‍යය ඉන්ද්‍රියප්‍රත්‍යය විප්‍රයුක්ත ප්‍රත්‍යය අඝනි ප්‍රත්‍යය අවිගතප්‍රත්‍යය යනමොවුන්ගේ වශයෙන්සයපරිද්දෙකින් ප්‍රත්‍යයෝ වෙත්. එකම විපාක මනායතනය වනාහි නොයෙක් ප්‍රභෙදවූ විපාකසිත් සමග උපදනා සඵාසීයන්ට සහජාත ප්‍රත්‍යය අන්‍යොන්‍ය ප්‍රත්‍යය නිශ්‍රයප්‍රත්‍යය විපාකප්‍රත්‍යය ආහාරප්‍රත්‍යය ඉන්ද්‍රියප්‍රත්‍යය සම්ප්‍රයුක්තප්‍රත්‍යය අඝනිප්‍රත්‍යය අවිගතප්‍රත්‍යය යන මොවුන්ගේ වශයෙන් නවආකාරයෙකින් ප්‍රත්‍යය වේ. බාහිරායතන නයන් අතුරෙන් රූපායතනයවනාහි චක්ඛුසම්ඵස්සයට ආලම්බන ප්‍රත්‍යය පුරෙජාතප්‍රත්‍යය අඝනිප්‍රත්‍යය අවිගත ප්‍රත්‍යය යන මොවුන්ගේ වශයෙන් සිවුපරිද්දෙකින් ප්‍රත්‍යයවේ. එසේම ශබ්ද ගන්ධාදීහුද සොතසම්ඵස්සාදීන්ට ආලම්බන පුරෙජාත අඝනි අවිගත ප්‍රත්‍යය වශයෙන් සිවු සිවු පරිද්දෙන් ප්‍රත්‍යයෝවෙත්. මනොසම්ඵස්සයට වනාහි රූපායතනාදි අරමුණු පස්දෙනද ධම්මායතනයද ආලම්බන පුරෙජාත අඝනි අවිගත ප්‍රත්‍යය යන සිවුපරිද්දෙන්ද ආලම්බනප්‍රත්‍යය පමණකින්ද ප්‍රත්‍යය වන්නේයයි දතයුතු මේ වනාහි ෂඩායතන ප්‍රත්‍යයෙන් සඵාසීයවීමෙහි විසතර කථා මාගීයයි.

—o—

සඵාසීප්‍රත්‍යයෙන් වෙදනාව වනුයේ කෙසේදයන්?

**චාරතෝ වෙදනාවුත්තා චක්ඛුසම්ඵස්ස ජාදිකා**
**ඡළේවනාපභෙදෙන එකූන නවුතීමතා.**

යනු හෙයින් මේ පදයාගේ විභාගයෙහි සාමාන්‍ය හටගැණීම් වශයෙන් වෙදනාව එක් ආකාරයකිවූ චක්ඛුසම්ඵස්ස හෙතුවෙන් ඇතිවන වෙදනාය සොතසම්ඵස්ස හෙතුවෙන් ඇතිවන වෙදනාය ඝාණසම්ඵස්ස හෙතුවෙන් ඇතිවන වෙදනාය ජිව්හාසම්ඵස්ස හෙතුවෙන් ඇතිවන වෙදනාය කායසම්ඵස්ස හෙතුවෙන් ඇතිවන වෙදනාය මනොසම්ඵස්ස හෙතුවෙන් ඇතිවන වෙදනාය කියා මෙසේ චාරවශයෙන් වෙදනාවෝ සඳෙහකක් වදුරණලදහ. ඒ වෙදනාවෝ තුමූ ප්‍රභෙද වශයෙන් එකුන් අනූ (89) සිත් සමග යෙදෙන බැවින් එකුන් අනූවක් වන්නාහ.

**වෙදනාසු පනෙතාසු ඉධ ඔතනිංස වෙදනා**
**විපාක සම්පයුත්තනාව අධිප්පෙතාති භාසිතා**

එතාසුවෙදනාසුපන, මේ එකුන් අනූවැදෑරුම්වූ (89) වෙදනා වන් අතුරෙන්; ඉධ, එසසපච්චයා වෙදනා යනමේ පදයෙහි; විපාකසම්පයුත්තනාඒව, ලෞකික විපාකසිත් දෙනිස්දෙන සමග යෙදෙන්නාවූම; ඔතනිංසවෙදනා, දෙනිස්විපාක වෙදනාවෝ; අධිප්පෙතාති අදහස්කරණලදහයි; භාසිතා, වදරණලදහ. යනුයි.

මේ නියමයේ හැටියට චක්ඛුවිඤ්ඤාණවීථියෙහි චක්ඛුර්විඤ්ඤාණ විපාකයින් දෙදෙන සමග උපදනා විපාක සපශීයෙන් විපාක වෙදනා දෙදෙනෙක්ද ශ්‍රොත්‍රවීථියෙහි ශ්‍රොත්‍රවිඤ්ඤාණවිපාකයින් දෙදෙනසමග උපදනා විපාක සපශීයෙන් විපාකවෙදනා දෙදෙනෙක්දඝ්‍රාණවීථියෙහි ඝ්‍රාණවිඤ්ඤාණ විපාකයින් දෙදෙන සමග උපදනා විපාක සපශීයෙන් විපාක වෙදනාදෙදෙනෙක්ද ජිහ්වාවීථියෙහි ජිහ්වාවිඤ්ඤාණ විපාක යින් දෙදෙන සමග උපදනා විපාක සපශීයෙන් විපාක වෙදනා දෙදෙනෙක්ද කායවීථියෙහි කායවිඤ්ඤාණ විපාකයින් දෙදෙන සමග උපදනා විපාක සපශීයෙන් විපාක වෙදනා දෙදෙනෙක්ද පඤ්ච වීථි මනොවීථියෙහි යෙදෙන පරිත්තෙන් සම්ප්‍රතීත්‍යඝණයින් දෙදෙන සන්තීරණ යින් තෙදෙන මහාවිපාක යින් අටදෙන රූපාවචර විපාකයින් පස්දෙන අරූපාවචර විපාකයින් සිවුදෙන යන මෙතෙක් විපාකයින් සමග උපදනා විපාකසපශීයෙන් විපාක වෙදනාවෝ දෙවිසිදෙනෙක්ද උපදනාහයි දතයුතු.

**අඤ්ඤාතඤ්ච පඤ්චන්නං පඤ්චවාරම්හි පච්චයෝ,**
**සෙසානං එකධා එසෝ මනොද්වාරෙපි සොතථා.**

යන්නෙන් එසසය වෙදනාවට ප්‍රත්‍යයවන අයුරු දක්වූහ. කෙසේද පඤ්චවාරයෙහි චක්ඛුඃ ප්‍රසාදාදී වසතුන් ඇසුරුකොට උපදනා පස්වැදෑරුම් වෙදනාවන්ට චක්ඛු. ඵස්සාදිවශයෙන් පඤ්චප්‍රකාරවූ සපශීයතෙම සහජාතප්‍රත්‍යය අන්නමඤ්ඤප්‍රත්‍යය නිශ්‍රයප්‍රත්‍යය විපාකප්‍රත්‍යය ආහාරප්‍රත්‍යය සම්ප්‍රයුක්තප්‍රත්‍යය අඝනි ප්‍රත්‍යය අවිගතප්‍රත්‍යය වශයෙන් අටපරිද්දෙකින් ප්‍රත්‍යයවේ. චක්ඛුඃවාර ශ්‍රොත්‍රවාර ඝ්‍රාණවාර ජිහ්වාවාර කායවාර යනමේ එක එක වාරයෙහි උපදනා චක්ඛුර්විඤ්ඤාණාදි සින් සමග යෙදෙන සපශීයෝ තුමූ තම තමන්ගේ ඒකීවල උපදනා සමනන්තර සන්තීරණ තදාලම්බන වශයෙන් පවත්නාවූ කාමාවචර විපාක සින් සමග යෙදෙන වෙදනාවන්ට උපනිශ්‍රය වශයෙන් එක් අයුරකින් ප්‍රත්‍යඃයි වෙත්. මනොවාරයෙහි තදාලම්බන වශයෙන් පමණක් පැවැති කාමාවචර විපාක වෙදනාවන්ට මනොසම්ඵස්ස

යම් නම්ලදා ඒ ඇපගීයතෙම ඉහතකීලෙස සහජාත අඤ්ඤාඤ්ඤ නිශ්‍රය විපාක ආහාර සම්ප්‍රයුක්ත අස්ති අවිගතප්‍රත්‍යය වශයෙන් අවපරිද්දෙකින් ප්‍රත්‍යයවේ. මනොවාරයෙහිම ප්‍රතිසන්ධි චුතිභවාඞ්ග කෘත්‍ය වශයෙන් පැවැත්තාවූ එකුන්විසි වැදෑරුම්වූ විපාකසිත් සමඟ උපදනා තෙහුම්ක විපාක වෙදනාවන්ටද මනොසම්ඵස්ස යම් කියනලදා සඵගීයතෙම ඉහතකී පරිද්දෙන්ම අෂ්ටප්‍රකාර යෙකින් ප්‍රත්‍යයවේ. තවද යම් කාමාවචර වෙදනා කෙනෙක් මනොවාරයෙහි තදුලම්බන වශයෙන් පැවැත්නාහුද එකී වෙදනා වන්ට මනොවාරාවජ්ජන චිත්තය සමඟ යෙදෙන මනොසම්ඵස්සය තෙම උපනිශ්‍රය වශයෙන් එක් අයුරකින්ම ප්‍රත්‍යය වන්නේය. මෙනයින් අනන්තරුව අනන්තරුව උපදනා චක්ඛුසම්ඵස්සාදි සියළු ඵස්සයන්ගේ ඒ ඒ විපාක වෙදනාවන්ට උපනිශ්‍රය ප්‍රත්‍යය වන බැව් සුදුසු පරිද්දෙන් යොදා දතයුතුයි. මේ වනාහි සඵගී ප්‍රත්‍ය යෙන් වන්නාවූ වෙදනාවසම්බන්ධවූ විසතර කථාමාර්ගය වේ.

———o———

**වෙදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වනු කිසේයත්?**

**රූපතණ්හාදි භෙදෙන ඡතණ්හා ඉධ දීපිතා,**
**එකෙකා තිවිධානන්ති පවත්තාකාරතොමතා.**

ඉධ, මේ වෙදනාපච්චයාතණ්හා යන පදයෙහි (නොහොත්) ඉධ, මේ ලොකයෙහි හෝ මේ ශාසනයෙහි, රූපතණ්හාදිභෙදෙන, රූපතෘෂ්ණාදීන්ගේ ප්‍රභෙදවශයෙන්; ඡතණ්හා, තෘෂ්ණාවෝ සදෙනෙක්; දීපිතා, දක්වනලදහ; තන්ති, ඒ ෂඩ්විධ තෘෂ්ණාවන්හි; එකෙකා, එක එක තෘෂ්ණාව; පවත්තාකාරතො, පවත්නා ආකාර වශයෙන්; තිවිධාමතා, තුන්වැදෑරුම්යයි දන්නාලදී.

සිටු පුත්‍රතෙමේය බ්‍රාහ්මණපුත්‍ර තෙමේයහි පියාගේනාම වශ යෙන් පුත්‍රව්‍යවහාරයමෙන් මෙහි රූපතෘෂ්ණා ශබ්දතෘෂ්ණා ගන්ධ තෘෂ්ණා රසතෘෂ්ණා ඵොට්ඨබ්බතෘෂ්ණා ධම්මතෘෂ්ණායයි ආලම්බන නාම වශයෙන් ව්‍යවහාරවූ තෘෂ්ණා සදෙනෙක් දක්වනලදහ. ඒ තෘෂ්ණාවන්හි එකෙකී තෘෂ්ණාව කාමතෘෂ්ණා භවතෘෂ්ණා විභවතෘෂ්ණා වශයෙන් තෙපරිද්දෙකින් ප්‍රභෙද වන්නීය.

හුදෙක් කම්සැපවිඳීම්වශයෙන් පවත්නා කාමතෘෂ්ණාවගේ සභාවට අතිශයින් වෙනස් බැවින් ශාස්වතදෘෂ්ටිරාග වශයෙන් පැවැති භවතෘෂ්ණාවගේද උච්ඡේදදෘෂ්ටිරාග වශයෙන් පැවැති විභවතෘෂ්ණාවගේද රූපාදී ආලම්බනයන්හි රජ්ජනාකාරය හෙවත්

ඇලී බැඳී පවත්නා ආකාරය දෙණ එතෙකී තෘෂ්ණාව එතෙකී අරමුණෙහිලා තුන් තුන් කොටස් කළහයි දතයුතු.

යම්හෙයකින් යම්කිසිකලෙක්හි ඇසට හමුවූ රූපාලම්බනය රූප තෘෂ්ණාව විසින් කාමාස්වාදවශයෙන් ආස්වාදනයකරණු ලබමින් පවතීද එකල්හි කාමතෘෂ්ණාව උපන්නීනම්වේ. යම්කලෙක්හි ඇසට හමුවූ රූපාලම්බනය නිත්‍යය සදාකාලිකයයි ගන්නාලද මිථ්‍යාලබ්ධිය සමග යම් රූප තෘෂ්ණාවක් පවතීද එකල්හි භව තෘෂ්ණාව උපන්නීනම්වේ. **"සහසඤ්ඤාදිට්ඨිසහගතඤ්ඤාණසම්පයුත්තරූපාරම්මණාදීනි භවතණ්හානි වුච්චන්ති"** යි එහෙයින් වදාළසේක. යම් කලෙක්හි ඇසට හමුවූ රූපාලම්බනය නස්නේය මුල්සුන්වන්නේය නැවත නොවන්නේය නැත්තටම නැතිවන්නේය යනාදි වශයෙන් ගන්නාලද මිථ්‍යාලබ්ධිය සමග යම් රූපතෘෂ්ණාවක් පවතීද එකල්හි විභව තෘෂ්ණාව උපන්නීනම්වේ. **"උච්ඡෙදදිට්ඨිසහගතඤ්ඤාණසම්පයුත්තරූපාරම්මණාදීනි විභවතණ්හානි වුච්චන්ති"** යි එහෙයින් වදාළසේක. ශබ්දතෘෂ්ණා ගන්ධ තෘෂ්ණා රසතෘෂ්ණා ඵොට්ඨබ්බතෘෂ්ණා ධම්මතෘෂ්ණාවන්ද මෙ නයින් විසතරකොට ගත්කලැ අටලොස් තෘෂ්ණාකෙනෙක් වන්නාහ. ඒ අටළොස්දෙන ආධ්‍යාත්මික සන්තානයෙහිවූ රූපාදීන්හි පවත්නා වශයෙන්ද බාහිර සන්තානයෙහිවූ රූපාදීන්හි පවත්නාවශයෙන්ද දිගුණකොට සතිස් (36) දෙනෙක් වන්නාහ. ඒ සතිස්දෙන අතීත භව අනාගතභව වර්තමානභව වශයෙන් තුන්ගුණකොට තෘෂ්ණා වෝ එක්සියඅට (108) දෙනෙක් වන්නාහ. මේ එක්සියඅටක් තෘෂ්ණාව නැවත සංක්ෂේපකොට ගත්කල රූපතෘෂ්ණාදි වශයෙන් සකොටසකටද නොහොත් කාමතෘෂ්ණාදිවශයෙන් තුන්කොටසකවද ඇතුළත්වන්නියයි දතයුතු.

යම්හෙයකින් වනාහි මේ සත්වයෝ පුත්‍රසෙනහය උපදවා පුත්‍රයා කෙරෙහි මමත්වයෙන් කිරි ආදිය පොවන්නාවූ කිරිමවට සඬ්ඝාත කරන්නාක්මෙන් රූප ශබ්ද ගන්ධ රස ඵොට්ඨබ්බාලම්බන මූනගැසීම් වශයෙන් උපදින්නාවූ සුවදුරුම් වේදනාව (අරමුණුරසඳිදීම) කෙරෙහි මමත්වයෙන් කැමැති කැමැති රූපාලම්බන සම්පාදනයකරදෙන්නාවූ සිත්තරුන් ආදී ශිල්පීන්වත් කැමැති කැමැති ශබ්දාලම්බන සපයාදෙන්නාවූ ගීකියන්නාවූ භෙරිවීණාදිය වයන්නාවූ ශිල්පීන්වත් කැමැති කැමැති ගන්ධාලම්බන සපයා දෙන්නාවූ සුවඳතන්නාවූ ශිල්පීන්වත් කැමැති කැමැති රසාලම්බන සපයාදෙන්නාවූ අරක්කැමියන් ආදීන්වත් කැමැති කැමැති ඵොට්ඨබ්බාලම්බන සපයාදෙන්නාවූ ඇඳපුටු කොට්ටමේට්ට යානාවාහණ ඇදුම් පැලදුම් තනන්නාවූ ශිල්පීන්වත් ශරීර ඔජාශක්තිය හා ජීවිතය

පැවැත්මට කරුණුවූ රසායන බෙහෙත් යෙදීම් ආදිවශයෙන් කැමති කැමති ධර්මාලම්බණ සපයාදෙන්නාවූ වෙදවරුන්ටත් මහත්සත්කාර ගරුබුහුමන් කෙරෙද්ද එහෙයින් මෙහිකී සියළු එක්සියඅටක් තෘෂ්ණාවෝ වේදනාප්‍රත්‍යයෙන් වෙත්යයි දතයුත්තාහ. උපමා උපමෙයසාම්‍යය මෙසේයි. එහි පුත්‍රයාමෙන් වේදනාව දතයුත්තීය කිරිපෙවීම් ආදියමෙන් වේදනාවට රුකුල්දෙන්නාවූ රූපාදි අරමුණු දතයුත්තාහ. කිරි ආදිය දෙන්නාවූ කිරිමවුන් මෙන් රූපාදි අරමුණු සපයාදෙන්නාවූ සිත්තරුආදි ශිල්පීන් දත යුත්තාහ

**යඤ්ඤා වෙඤ්ඤ අධිප්පෙතා විපාක සුඛ වේදනා,**
**එකාවඑකධාවෙඤා තඤ්ඤා තණ්හායසම්භවයෝ.**

යඤ්ඤා, යම්හෙයකින්, එකාවවිපාකසුඛවේදනා, එකම විපාක සුඛවේදනාවක්; එඤ්ඤ, මේ වේදනාපච්චයා තණ්හා යන පද යෙහි; අධිප්පෙතා, අභිමතද; තඤ්ඤා, එහෙයින්; එඤා, මේ විපාක සුඛවේදනාතෝවේ; එකධා, උපනිශ්‍රයප්‍රත්‍යය සඞ්ඛ්‍යාත එක් පරිද්දෙකින්; තණ්හායා, තෘෂ්ණාවම; පච්චයෝ, ප්‍රත්‍යයවන්නේය; මෙයින් භගවන්නේ විපාකයින් සමග උපදනාවූ සුඛ වේදනාව තෘෂ්ණාවම ප්‍රත්‍යය වනබවයි. සුඛවේදනාව පමණක්නොව අනික් විපාක වේදනාවන්ද තෘෂ්ණාවට ප්‍රත්‍යය වනබැව් දක්වන්නාවූ අර්ථකථාචාර්‍යයෝ මෙසේකීහු.

**දුක්ඛී සුඛං පත්ථයති සුඛීහියෝපි ඉච්ඡති,**
**උපෙක්ඛා පන සන්තත්තා සුඛමිච්ඡව භාසිතා.**
**තණ්හාය පච්චයා තඤ්ඤා හොන්ති නිස්සෝපිවේදනා,**
**වේදනාපච්චයා තණ්හා ඉති වුත්තං මහෙසිනා.** ති.

දුක්ඛී, දුකට පත් තැනැත්තේ; සුඛං, සැප; පත්ථයති, පතාද; සුඛී, සුවපත්තැනැත්තේ; හියෝපි ඉච්ඡති, වඩවඩාත් සැපකැමති වේද; උපෙක්ඛා පන, උපෙක්ෂාව වනාහී; සන්තත්තා, සාන්ත (සන් හන්) සභාව ඇතිබැවින්; සුඛංඉච්ඡිතබ්බ, සැපයැයිකියාම; භාසිතා, වදාරනලද්දීද; තඤ්ඤා, එහෙයින්; නිස්සෝපිවේදනා, සුඛ දුඃඛ උපෙක්ෂාවේදනාත්‍රයම්; තණ්හාය, තෘෂ්ණාවට; පච්චයා හොන්ති, ප්‍රත්‍යයවූවාහුවෙති; ඒ කාරණයෙන්; මහෙසිනා, සම්‍යක් යන්වහන්සේ විසින්; වේදනාපච්චයාතණ්හාඉති, වේදනාප්‍රත්‍ය යෙන් තෘෂ්ණාවවේයැයි; වුත්තං, අසවල් අසවල් වේදනාප්‍රත්‍ය යෙනැයි විපාකවේදනාවගේ වෙනසක්නොකොට වදාරණලදී. යනුයි.

මෙහි චක්ඛුර්විඤ්ඤාණාදි කුශලවිපාකයින් සමග යෙදෙන උපෙක්ෂා වේදනාව ඉෂ්ට ඉෂ්ටමධ්‍යස්ථාලම්බන අනුභවකිරීමෙහි නියුක්ත බැවින් සුඛවේදනා පක්ෂයෙහි අන්තර්ගීතකළාක්මෙන් චක්ෂුර් විඤ්ඤාණාදි අකුශලවිපාකයින් සමග යෙදෙන උපෙක්ෂාවේදනාව අනිෂ්ට අනිෂ්ටමධ්‍යස්ථාලම්බන අනුභවකිරීමෙහි නියුක්ත බැවින් දුඃඛ වේදනා පක්ෂයෙහි අන්තර්ගීතවනබව දතයුතු කරුණු මෙසේ මහයින් සුඛවේදනාවද දුඃඛවේදනාවද උපෙක්ෂාවේදනාවද උප නිශ්‍රය ප්‍රත්‍යයවශයෙන් තෘෂ්ණාවට උපකාරවේමැයි.

තවද වේදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වන්නීය යන මේ කීමෙන් යහපත් අයහපත් රූපාදි අරමුණු රස අනුභවකරනු ලබන සුඛ දුඃඛ උපෙක්ෂා වේදනාවන්ගේ ලැබීම කෙලෙස් සහිත කෙලෙස් රහිත සිත්ඵස්සාදිනාට සාධාරණ හෙයින් කෙලෙස් රහිත පුගුලන්ට උපදනා විපාකවේදනා තෘෂ්ණාවට ප්‍රත්‍යය නොවන බැව් දක්වනු සඳහා වේදනා පච්චයාවාපි යනාදිය කීහු

**වේදනා පච්චයාමාපි යස්මා නානුසයං විනා,**
**හොති තස්මා නසාහොති බ්‍රාහ්මණස්සවුසීමතෝ.**

යස්මා, යම් හෙයකින්; වේදනාපච්චයාවාපි, වේදනාප්‍රත්‍ය යෙනුදු; අනුසයංවිනා, අනුසයකෙලෙස් සහායකොට ඇති වේදනා වෙන් තොරවැ; නහොති, තෘෂ්ණාව නොවන්නීද; තස්මා, එහෙ හින්; වුසීමතෝ, වැස නිමවූ මාගී බ්‍රහ්මචර්‍යාවඇති රහත් පුගු ලන්ට; සා, ඒ තෘෂ්ණාතොමෝ; නාහොති, අනුසයකෙලෙස් රහිත බැවින් නොවන්නීය. මෙහි ඵලසමාපත්තිවශයෙන් රහතුන්ට උපදනා නිරනුසයවේදනාව කිව්හෙමුදු සොවාන් සෙදගැමි අනගැමි පුගු ලන්ටද ඔවුන් විසින් ප්‍රහීණකාරණලද කෙලෙසුන්ගේවශයෙන් නිරනුසය වේදනාවෝ ඇතියහ. එහෙයින් සොවාන් සෙදගැමි අනගැමි පුගුලන්ට සතක්ඛත්තු පරමතාදිවශයෙන් භවය පිරි හෙන්නේයයි දතයුතුයි. මේ වේදනා පච්චයා තණ්හා පදයෙහි විස්තර කථාමාර්ගයයි.

---

තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදානය වනු කිසේයත්?

**උපාදානානි චත්තාරි තානි අත්ථ විභාගතෝ,**
**ධම්මසඞ්ඛපවිත්ථාරා කම්මතොව විභාවයෙ.**

උපාදානානි, උපාදානයෝ; චත්තාරි, සතරෙකි; තානි, ඒ උපා දානයන්; අත්ථවිභාගතෝ, අර්ථවිභාගවශයෙන්ද; ධම්මසඞ්ඛප විත්ථාරා, ධර්මකාය විස්තරකිරීම්වශයෙන්ද සඞ්ඛෂේපකිරීම්වශ

යෙන්ද; කම්මතොච, ක්‍රමවශයෙන්ද; විභාවයෙ, විභාගයෙකෙරේ; මේ එහි විනිශ්චයයි.

කාමූපාදානය දිට්ඨුපාදානය සීලබ්බතූපාදානය අත්තවාදූපාදාන යයි මෙහි උපාදානයෝ සතරෙක්වෙත ඒ උපාදානයන්ගේ අර්ථ විනිශ්චය මෙසේයි. **"වත්ථුසඞ්ඛාතං කාමං උපාදියතීති කාමූපා දානං කාමෝ ච සෝ උපාදානන්ති කාමූපාදානං"** යනු නිර්වචන මෙයින් "වත්ථුසඞ්ඛාතං කාමං, රූප ශබ්ද ගන්ධ රස ඵොට්ඨබ්බ නම්වූ වස්තුකාමයය; උපාදියතීති, දෘඩිවශයෙන් ගන්නාලැබෙනුයි දෘඩිකොට ආස්වාදනය කරණ්ණුලැබෙනුයි හෝ; උපාදානං, උපාදාන නම්වේ; කාමොච, කෙලෙශකාමයවූයේත් හේමනුයි; උපාදානං ඉතිපි, උපා දානය මෙවත් දෘඩිවශයෙන් ආස්වාදනය කරණ්ණුලබන්නේත් හේම නුයි; කාමූපාදානං, කාමූපාදාන නම්වේ. මෙහි කාමං උපාදියතීති කාමූපාදානං යන්තෙහි කම්කාරකයෙහිවූ කාමශබ්දයෙන් වස්තු කාමයද; කාමොචසොඋපාදානං යන්තෙහි කර්තෘකාරකයෙහිවූ කාම ශබ්දයෙන් කෙලෙශකාමයද ගැණේ. **"භූසෝ අඝාසෝ උපාඝාසෝ භූසං භූසං උපකුඨං"** යනාදි පාඨයන්හි පේන උපසඟ්ගශබ්දයමෙන් උපාදානං යන්තෙහි උපසඟ්ගශබ්දයතෙමේද දෘඪ (දැඩි) අර්ථයෙහි වැටේ. එසේම **"දිඞ්ඨිඤ්ච උපාදානංචෙති දිට්ඨුපාදානං දිට්ඨිං උපාදියතීති වා දිට්ඨුපාදානං"** යන්තෙන් දිට්ඨුපාදානය දක්වයි. දිට්ඨිච, දෘෂ්ටියත්; සා, ඕමය; උපාදානංචඉති, උපාදානයද හේමනුයිකියා‍ෙහෝ; දිට්ඨිං, දෘෂ්ටිය; උපාදියතීතිවා, දැඩිකොටගණ්නුයිහෝ; දිට්ඨුපාදානං, දිට්ඨු පාදාන නමැති කීහෙයින් **"සස්සතෝ අත්තාච ලෝකොචාති"** යනාදීන් දක්වූපරිදි තෙමේද පඤ්චස්කන්ධ ලෝකයද සදාකාලික යයි ගන්නාලද පූර්වාරම්භදෘෂ්ටිය පසුපසුව උපදනා එබදුවූම දෘෂ්ටියක්තොමෝ දැඩිකොට අල්වාගණ්නීද නොහොත් මුලින්ම ආරම්භයෙහි උපදනා දෘෂ්ටිආරයෙන් පසුව උපදනා දෘෂ්ටියද උපදින්නී ඒ පසුව උපදනා දෘෂ්ටියෙන් පූර්වාරම්භදෘෂ්ටිය දැඩි කෙරේද හේ දිට්ඨුපාදානනාම්. විභඞ්ගාර්ථයෙහි **"පුරිමදිට්ඨිං උත්තර දිට්ඨි උපාදියතීති උපාදානං"** පූර්වාරම්භදෘෂ්ටිය මතුමත්තෙහි උප දනාවූ දෘෂ්ටිතොමෝ දැඩිකෙරේනුයි යන අර්ථයෙන් උපාදාන නමැති යම් විනිශ්චයෙක් කරණ්ලදද ඒ මේ විනිශ්චය පාඨයෙහි පේන **"පුරිමදිට්ඨි"** යන්තෙන් භගවත ශාස්වත දෘෂ්ටිය උත්තර දිට්ඨියන්තෙන් භගවත නාස්තික දෘෂ්ටි ආදිය දැඩිකෙරේනුයි දක්වනුසඳහා යොදනලද්දේය. එහෙයින් මේ දිට්ඨුපාදානයෙහි **"සස්සතෝ අත්තාච ලෝකොචාති"** යනාදීන් දක්වූ ශාස්වත දෘෂ්ටියද **"නත්ථිදිනනං නත්ථිසිඨං නත්ථිහුතං සුකට දුක්කටාන**

**කම්මානං ඵලං විපාකෝ''** යනාදීන් දැක්වූ නාස්තිකදෘෂ්ටි ආදියද අන්තගීතවනබැව් දතයුතුයි.

**''සීලබ්බතං උපාදියතීති සීලබ්බතුපාදානං සීලබ්බතං වතං උපාදානං මෙති සීලබ්බතුපාදානං''** යන්නෙන් දැක්වූ සීලබ්බතුපාදානයෙහි ශීලයනම් කවරේද? ව්‍රතය නම්කවරේද? සංසාර විශුද්ධිය හෙතුනුවූ මිථ්‍යාමාර්ගීයටවැද ගොසීල ශුනකසීලාදිය සමාදම්වීම්දැසයෙන් පැවැත්ම ශීලයයි සමාදන්වූ ගොසීල ශුනක ශීලාදිය නොඉක්මවීම්දැසයෙන් පැවැත්ම ව්‍රතයයි නොහොත් ගොසීල ශුනක ශීලාදිය සමාදන්ව හෝ නොඉක්මවා හෝ දෙවිඩි යෙන් පැවැත්ම ශීලයයි ගොසීල ශුනක ශීලාදිය කෙලෙස් තවන ප්‍රතිපත්තියක්කොටගෙණ ගොශුනකාදීන්ගේ ප්‍රකෘතිස්වභාව එඩා ගැණීම ව්‍රතයයි නොහොත් තමතමන්ව ගොශුනකාදි සත්ත්ව ලීලායෙන් ඉවාගැණීම ශීලයයි යෙමින් සිටිමින් අහරගැණුම් මලමුත්‍රකිරීම් ආදිවශයෙන් ගොශුනකාදීන්ගේ ක්‍රියා පැවැත්ම ව්‍රතයයි නොහොත් ඒ ඒ නොකටයුතුයයි සම්මතදෙයින් නොමගට වැද වැළැක්ම ශීලයයි ගොසීල ශුනක ශීලසමාදන්වූවහුගේ (නෛපථ්‍යය ආකල්පය) හෙවත් වේසයද නොණුත් ශුණකයන්ව බදු පාන හොජන කෘත්‍යකිරීම් ආදිවශයෙන් විශෙෂ ප්‍රත්පත්ති පිරීමද ව්‍රතයයි යම් යම් ගොසී ගොව්‍රත ශුනක ශීල ශුනක ව්‍රතාදි යක් සංසාර ශුද්ධිය මාර්ගයෙකැයි දෘෂ්ටිවශයෙන් පරාමර්ශනය කෙරෙමින් දෘෂ්ටිවශයෙන් බැසගණිමින් දැඩිකොට අල්වාගණිද ඒ ඒ ගෙසීල ගොව්‍රත ශුනකසීල ශුනකව්‍රතාදිය වනාහි ශීලබ්බතු පාදාන නම්වේ නවද ගොසීල ගොව්‍රත ශුනක ශීල ශුනක ව්‍රතාදිය මිථ්‍යාදෘෂ්ටිවැඩිනුදු තුම්ම උපාදාන වනබැවිනුද ගොසීල ගොව්‍රතාදීන් සමග එක්ව පැවති පරාමාස නම්ලද දෘෂ්ටිතොමෝ සීලබ්බතු පාදාන නම්වේ.

**''වදන්ති එතෙනාතිවාදෙ උපාදියන්ති එතෙනාති උපාදානං, අත්තනොවාදස්ස උපාදානං අත්තවාදූපාදානං''** එතෙන, මේ කරණකොටගෙණ; වදන්තීති, (ආත්මය) ප්‍රකාශකෙරෙත් නුයි; වාදෙ, වාදනම්වේ. එතෙන, මේ කරණකොටගෙණ; උපාදියන්ති ඉති, (ආත්මය) දැඩිකොට ගණිත්නුයි; උපාදානං, උපාදාන නම්වේ; අත්තනොවාදස්ස, ආත්මවාදයාගේ; උපාදානං, දැඩිකොට ගැණීම් සඞ්ඛ්‍යාත දෘෂ්ටිය; අත්තවාදූපාදානං, ආත්මවාදූපාදාන නම්වේ; මේ නිර්ව්චනයන් විසින් දක්වනලද්දේ ආත්මය යන ලබ්ධිය පැණවීමවද ආත්මය යන ලබ්ධිය ගැණීමවද කාරණවූ දෘෂ්ටියයි **''අත්තවාදමත්තමෙව වා අත්තානි උපාදියන්ති එතෙනාති**

**අත්තවාදූපාදානං**" මා, නොහොත්; අත්තවාදමත්තකංඑව, ආත්ම යක් කියිසේත් නොලැබියහැකිබැවින් ආත්මය යන මේ වචන මාත්‍රයම; අත්තානි, ආධාරයයි; එතෙන, මේ අභිනිවෙසය කරණ කොටගෙණ; උපාදියන්තිඉති, දැඩිකොට ගණිත්නුයි හෝ; අත්ත වාදූපාදානං, අත්තවාදූපාදාන නම්වේ. මේ නිර්වචනයෙන් වසතු වශයෙන් ආත්මයකියා කිසියම් ද්‍රව්‍ය ධාතුවක් හෝ අද්‍රව්‍ය ධාතුවක් හෝ තෙත්‍රිභූමික සකල සංඝකාරධර්මයන්හි නොලැබියහැකි බැවින් ආත්මය යන වචන මාත්‍රයම දැඩිකොට ගැණීම යම් දෘෂ්ටිග්‍රාහයකින් කෙරේනම් එය අත්තවාදූපාදානයයි කියනලදී මේකෙනින් කාමූපා දානාදි පදයන්ගේ වචනාර්ථ කියා නිමවේ.

ධර්ම සංඛ්‍යාපනිරීම්වශයෙන් කාමූපාදානාදිය කෙසේ දත යුතුද "**යෝ කාමෙසු කාමච්ඡන්දෝ කාමරාගෝ කාමනන්දී කාම තණ්හා කාමසිනෙහෝ කාමපරිළාහෝ කාමමුච්ඡා කාමජ්ඣෝ සානං ඉදං වුච්චති කාමූපාදානං**" යි පෙළෙහි ආබැවින් කාමූපා දානය තම් ධර්මකායවශයෙන් තෘෂ්ණාවගේ ඝනබහල භාවයයි හෙවත් දැඩිබැයි තෘෂ්ණාවගේ ඝනබහලභාවය හෙවත් දැඩිවන්ම පළමු පළමු පැවති තෘෂ්ණාවගේ උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තීන් දැඩිවූ ගතඉබාල්වූ උත්තරාවස්ථාවට පැමිණි හෙමත් මතු පහළවන තෘෂ්ණාවයි ඇතැම්කෙනෙක් වනාහි අධිකාරවයෙහි සොරාගේ අතපය ගැමමෙන් හම්මනාවූ අරමුණු පැනීම තෘෂ්ණාවයයිද සොරාගේ විඳු පැහැරගැණීමෙන් හම්මවූ අරමුණු ගැණීම උප්පාදන යයිද තෘෂ්ණාව අසතුප් බවටත් උපාදානය අමිස්සවටත් ප්‍රතිපක්ෂ යයිද තෘෂ්ණාව පරෙස්ත්‍රීෂණදුකවත් උපාදානය ආරක්ෂාදුකටත් නිදානයහයිද කීහු. දිට්ඨුපාදාන සීලබ්බතුපාදාන අත්තවාදූපාදානත්‍රය ධර්මකායවශයෙන් දෘෂ්ටිමෛථුනසිකමාත්‍රයයි.

සවිඤාණකධර්මකායවශයෙන්වනාහි පූර්වෝක්ත ක්‍රමයෙන් රූපාදි ආලම්බනවිෂයයෙහි පැත්තාවූ එක්සිය අටවැදෑරුම්වූ තෘෂ්ණාවගේ ගතඉබාල්බව කාමූපාදාන නම්වේ "**තණ්හෙදිනතං**" යනාදීන් දක්වා වදාළ මිත්‍යාදෘෂ්ටිය හෙවත් රූපයෙහි දැනයද ඵලවිපාක යක් නුපදනා බැවින් දැනැත්තම් නැතැනි කියා හෝ (1) මහා විජිත රාජ්‍යරුවන්ගේ පරිත්‍යාගය වැනිවූ ඵලවිපාක හෙණදෙන මහා යාගයක් හෙවත් මහා තෑගැක් නැතැයි කියා හෝ (2) ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් කැඳවා පිරිනමන දන් අනුත්තරාදි දෙන දන් මඩනල්‍ය ත්‍රියාවශයෙන් දෙන දන්වලට කුනාඹයි කියකුලබන හෙයින් ඵලවිපාක දෙන එබඳු දනක් නැතැයිකියා හෝ (3) කුශලා කුශල කර්මයන්ගේ ඵලවිපාකයෙක් නැතැයි කියාහෝ (4) පර

ලෙව්හි සිටිනැනැත්තහුගේ වැටහීම්වශයෙන් මෙලොවක් නැතැයි කියාහෝ (5) මෙලොව සිටි නැනැත්තහුගේ වැටහීම්වශයෙන් පරලොවෙක් නැතැයි කියාහෝ (මෙලොවක් නැත පරලොවක් නැත යන්නොහි තවත් අදහසෙක් ඇත මෙලොව පරලොව නම්වූ යම්කිසි සැරිසරණ පියසෙක් නම් නැත සැරිසරණ තෙනක් නැති බැවින්ද මෙලොව උපන් නැනැත්තේ මෙලොවදීම නැත්තටම නැතිවන හෙයිනුත් පරලොව උපන් නැනැත්තේ පරලොවදීම නැත්තවම නැතිවන හෙයිනුත් මෙලොවක් පරලොවක් නැතැයි කියාහෝ) (6) මවකෙරෙහි මනාකොට පිළිපැදීමෙන්ද කුශල ඵල යක්ද වරදවා පිළිපැදීමෙන් අකුශල ඵලයක්ද නැතැයි කියාහෝ (7) එසේම පියාකෙරෙහි මනාව පිළිපැදීමෙන් කුශල විපාකයක්ද වරදවා පිළිපැදීමෙන් අකුශල විපාකයක්ද නැතැයි කියාහෝ (8) ඔපපාතික සත්වයෙනෙක් කෙවත් චුතවැ උපදනා සත්ව කෙනෙක් නැතැයි කියාහෝ

(මෙහි ඔපපාතිකයන්ගේ දිව්‍ය බ්‍රහ්මාදිවූ ඔපපාතික යෝනි යෙහිවූ සත්වයන් පමණක් නොගැණේ පූර්වභවයෙන් චුතවැ පශ්චිම භවයෙහි උපදනාසුළු අණ්ඩජ ජලාබුජ සංසෙදජ ඔපපාතික යෝනි පරිහාපන්නවූ සියළු සත්වයෝ ගැණෙති. එහෙයින් දික්සඟි අටුවා විශුද්ධිමාගී ටීකාවන්හි කිහු "නත්ථි සත්තා ඔපපාතිකාති ච විත්ථා උපපජ්ජනකා සත්තා නාම නත්ථීති...පුරිමභවතෝ පච්ඡිම භවේ උපපත්තිං උපපාතෝ සොයෙසං සීලං තේ ඔපපාතිකා තේ පන චවනඤ්ච උපපජ්ජනකසත්තා නත්ථීති දස්සනත්ථා ආහනාපීසත්තා ඔපපාතිකාති" යී]

ඔම්හුබමී ප්‍රතිපත්තියට පිළිපන්නාවූ ධාර්මික ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙකුදු මෙලොව පරලොව තුමුම සම්‍යක්ඥානයෙන් දැන ප්‍රකාශකිරීමට සමර්ථවූ කොලසුන්කෙරෙත් සන්හුන්ඳැන බැවින් ශ්‍රමණ නම්ලද බැහැරකළපව් ඇතිබැවින් බ්‍රාහ්මණනම්ලද සම්‍යක් බුද්ධවූ කෙනෙකුදු මේ ලෝකයෙහි නැතැයි කියා හෝ (10) ගන්නා ලද දෘෂ්ටිසන්තක මිත්‍යාදෘෂ්ටිතොම දුෂ්ටුපාදනයහි. එහෙයින් පෙළෙහි "නත්ථි කතමං දිට්ඨුපාදානං නත්ථි දින්නං නත්ථියිට්ඨං නත්ථිහුතං නත්ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකෝ නත්ථි අයං ලෝකෝ නත්ථි පරලෝකෝ නත්ථි මාතා නත්ථි පිතා නත්ථි ඔපපාතිකා සත්තා නත්ථි ලෝකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නාසෙ ඉමඤ්චලෝකං පරඤ්චලෝකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීනිසා එවරූපා දිට්ඨි විපත්තිසෙසභාගෙ ඉදං වුච්චති දිට්ඨුපාදානං" යී වදාළසේක.

මෙබඳු ශීලයක් ඉවාහැණීමෙන් හෝ මෙබඳු ව්‍රතයක් පිරීමෙන් හෝ මෙබඳු ශීල ව්‍රත වයක් සම්පූර්ණකොට කිරීමෙන් හෝ කෙලෙස සංසාරයෙන් ශුද්ධිතොමෝ වන්නීයයි මිථ්‍යාශීල ව්‍රත පරිහරණය කිරීම්වශයෙන් වරදවාගන්නාලද දෘෂ්ටිතොම සීලබ්බතුපාදානනාම්. එහෙයින් පෙළෙහි "තත්ථ කතමං සීලබ්බතුපාදානං සීලෙන සුද්ධි වතෙනසුද්ධි සීලබ්බතෙනසුද්ධිති යා එවරූපා දිට්ඨි...පෙ... විසූකායිකං දිට්ඨිගතං දිට්ඨිසල්ලං දිට්ඨිකන්තාරෝ දිට්ඨිවිසූකං දිට්ඨිවිපරියෙසගාහෝ ඉදං වුච්චති සීලබ්බතුපාදානන්ති" යී වදළ සේක.

විසිවැදෑරුම්වූ සක්කායදෘෂ්ටිතොම අත්තවාදූපාදාන නම්වේ එහෙයින් පෙළෙහි "තත්ථකතමං අත්තවාදූපාදානං ඉධ අස්සුත වා පුථුජ්ජනෝ...පෙ...රූපං අත්තතෝ සමනුපස්සති...පෙ... විසූකායිකං දිට්ඨිගතං දිට්ඨිසල්ලං දිට්ඨිකන්තාරෝ දිට්ඨිවිසූකං දිට්ඨිවිපරියෙසගාහෝ ඉදං වුච්චති අත්තවාදූපාදානන්ති" යී වදළ සේක. මේ සක්කායදෘෂ්ටියෙහි විභාගය මේ ග්‍රන්ථයේ අන්තැනක ඇතිබැවින් එතනින් දැනගතයුතු.

ක්‍රමවශයෙන් උපාදානයන්ගේ පිළිවෙල කිම්යත් උත්පත්ති ක්‍රමය ප්‍රහාණක්‍රමය දෙශනාක්‍රමයයි ඔවුන්ගේ පිළිවෙල තුන් ආකාරවන්නේය ඒ ත්‍රිවිධ ක්‍රමයන් අතුරෙන් අනවරාග්‍ර සංසාර යෙහි අසවල් උපාදානයාගේ පළමුව හටගැණීමවේයයි නියමයෙක් නැතිබැවින් කෙලෙසයන්ගේ එකාකාරවශයෙන් උත්පත්ති ක්‍රමයෙක් මෙහි නොකියනුලැබේ පර්‍යායවශයෙන් වනාහි බෙහෙවින් එක් තැනෙක්හි ආත්මලබ්ධිය පෙරදැරිකොට ආත්මය අනුක දෙනක් සම්මුණ ඇතැයි සදාකාලිකවශයෙන් ගන්නා ලබ්ධියටද මරණින් මත්තෙහි ආත්මයතෙම මුල්සුන්වන්නේයයි ගන්නා ලබ්ධියටද අයත්වූ ශාශ්වත උච්ඡේදවූ කිසියම් ආත්මයෙක් ඇතැයි බොහෝ සෙයින් ආත්මලබ්ධි නැණීම වන්නේය. ඒ ගැණීමද සක්කායයන් අරමුණුකොටනෙණ පවත්නේයි. ඉක්බිති මෙ ආත්මයතෙම සදාකාලිකයයි ගන්නාහට ආත්මවිශුද්ධිය පිණිස ශීලව්‍රත පරිහරණය කිරීම වනහෙයින් සීලබ්බතුපාදානයද ඉක්බිති ආත්මයතෙම සම්මතෙම මුල්සුන්වන්නේයයි ලබ්ධිගන්නාවූ එහෙයින්ම පරලොවක් බලාපොරොත්තු නොවන්නාවූ පුද්ගලයාහට කාමුපාදානයද වන්නේය. මෙපරිද්දෙන් බෙහෙවින් එක්භවයෙක්හි පළමුකොට අත්තවාදූපාදානයද දෙවනුව තදනුගතිකවූ දිට්ඨුපාදානයද තුන්වනුව සීලබ්බතුපාදානයද සිව්වනුව කාමුපාදානයද යථාක්‍රමයෙන් ඵලබව දතයුතුයි. මේ වනාහි කාමුපාදානාදීන්ගේ බෙහෙවින් වන උත්පත්තික්‍රමයයි.

භවයෙහි ගන්නාලද ප්‍රතිසන්ධි ඇත්තහුට පළමුව භව නිකාන්තික ජවන්සිත් පහළවීම්වශයෙන් භවරාගය්‍යම වියයුතු බැවින් කාමූපාදානයම පළමුව පහළවියයුතු නොවේදයන්? ඒ භවරාගය්‍යතෙමේ වනාහි ප්‍රතිසන්ධි කාලයෙහි භවනිකාන්තික ජවන් සිත් සමඟ පවත්නේවීන්මුත් සියුම් බැවින් හා ගන බොල් නොවන බැවින්ද තෘෂ්ණාවගේ දැඩිබවයයි කියනලද උපාදානාවස්ථාවට නොගිණිය හැකියුයි පළමුකොට කාමූපාදානය උත්පත්තික්‍රම වශයෙන් නොදක්වනලදී.

ප්‍රහාණක්‍රමවශයෙන් කෙසේද? දිට්ඨුපාදාන සීලබ්බතුපාදාන අත්ත වාදූපාදානයෝ ශ්‍රොතාපත්ති මාර්ගඥානයෙන් ප්‍රහීණකටයුතු බැවින් පළමුකොට ප්‍රහීණවෙති සාමාන්‍යයෙන් විභාගනොකිරීමෙනිදී සිය ළු තෘෂ්ණාව කාමූපාදානයයි කාමරාග රූපරාග අරූපරාගවශයෙන් තෘෂ්ණාවගේ විභාගකිරීමෙහිදී කාමරාගයෙන් අන්‍යවූ දැඩිබවට ගියාවූ රූපරාග අරූපරාගය කාමූපාදානයයි ඒ මේ රූපරාග අරූප රාග සංඛ්‍යාත කාමූපාදානය අනාගාමීමාර්ගඥානයෙන්ම ප්‍රහීණ කටයුතු බැවින් පසුව ප්‍රහීණවේ මේ සතර උපාදානයන් ප්‍රහීණවන ක්‍රමයයි.

දෙශනා ක්‍රමවශයෙන් කෙසේද? මෙකී සතර උපාදානයන් අතුරෙන් අටවැදෑරුම් ලොබ සහගිය සිත් සමග පවත්නා කාරණ යෙන් මහා විෂය බැවින්ද බොහෝසෙයින් සත්ත්වතෙමේ පැහැදූ පාදානසන්තියෙහි ඇලී බැඳී පවත්නා බැවින්ද කාමූපාදානය පළමු කොට දෙසුළසේක. දිට්ඨුපාදාන සීලබ්බතුපාදාන අත්තවාදූපාදානත්‍රය ලොබසහගිය සිත් සතරක් සමග උපදනා කාරණයෙන් අල්පවිෂය බැවින් පසුව දෙශනාකළසේක තවද සුව දුක් දෙක කම්මයන් වේයයි පිළිනොගෙණ පස්කම් සැප අයත්කිරීම පිණිස යමෙක් යම් යම් මිස්කරුණු දෘෂ්ටිවශයෙන් පිළිගෙණ දිගිමඩගලික සුත මඩගලිකාදිවශයෙන් කොතුහල මඩගලිකයෙක්මේද කාමූපාදාන යෙන් යුක්තවූ නෙවත් කම්සැපත්හි දැඩිවශයෙන් බැඳුනාවූ ඒ පුද්ගලයාහටම ඒ වරදවා ලබ්ධිවශයෙන් ගන්නාවූ කොතුහල මඩගල්‍ය බහුලබව වනබැවින් තදනන්තරවැ දිට්ඨුපාදානයද වන්නේය. ඒ දිට්ඨුපාදානය වෙනස්වනුලබන්නේ සීලබ්බතුපාදාන අත්ත වාදූපාදානයයි දෙපරිද්දෙකින් පෙනස්බවටයේ එහිදු ගවයන්ගේ ක්‍රියාව ශුනකයන්ගේ ක්‍රියාව ඇසින් බලාද දැනගතහැකිබැවින් තදනන්තරවැ ඔහුදුරිකවූ සීලබ්බතුපාදානයද අනාත්මවූ ධර්ම මාත්‍ර යෙක්හි ආත්මයකියා ලබ්ධිගැණීම ඉතා සියුම් කරුණක් බැවින් තදනන්තරවැ අත්තවාදූපාදානයද දෙශනාකළසේක, මේ වනාහි උපාදානයන්ගේ දෙශනා පරිපාටියවේ.

**තණ්හා ච සුදිමසෙසඤ්ච එකධා හොති පච්චයෝ,**
**සහජාතා අඤ්ඤමඤ්ඤා හොති සෙසනතයස්සපි.**

එන්ව, මෙසේ වදාළ උපාදාන චතුෂ්කයෙහි; පුරිමස්ස, පළමු වනුව කී කාමුපාදානයට; තණ්හා, කාමතෘෂ්ණාතොමෝ; එකධා පච්චයොහොති, උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන් එක්පරිද්දෙකින් ප්‍රත්‍යයවේ; සෙසතතයස්ස, තදිතරවූ දිට්ඨුපාදාන සීලබ්බතුපාදාන අත්තවාදූපාදානත්‍රයට; සා. ඒ තෘෂ්ණාතොමෝ; සතතධා, සහජාත අන්‍යෝන්‍ය නිශ්‍රය සම්ප්‍රයුක්ත අසති අවිගත හෙතුප්‍රත්‍යයවශයෙන් සත්පරිද්දෙකින්ද; වා, නොහොත්; අඤ්ඤා, උපනිශ්‍රයප්‍රත්‍යයද එක තුව අටපරිද්දෙකින්; පච්චයොහොති, ප්‍රත්‍යයවේ. (යම් කලෙක ඒ තෘෂ්ණාතොම උපනිශ්‍රයවශයෙන් උපාදානයට ප්‍රත්‍යයවේද එකල්හි සහජාත ප්‍රත්‍යයවීමෙක් නැත්තේය) උපනිශ්‍රය වචනයෙන් ආලම්බනොපනිශ්‍රය අනන්තරොපනිශ්‍රය ප්‍රකෘත්‍යුපනිශ්‍රයයෝද කියතලදහ එහෙයින් අනන්තරප්‍රත්‍යයාදීන්ගේද මෙහි සංග්‍රහයවේ. මේ වනාහි තණ්හා පච්චයා උපාදානං යන පදයෙහි විසතර කථාමාර්ගයවේ.

උපාදාන ප්‍රත්‍යයෙන් භවයවනුයේ කෙසේදයන්

**අත්ථතෝ ධම්මතෝ චෙව සාත්ථතෝ භෙදසඞ්ගහා**
**යං යස්සුපච්චයෝ චෙව විඤ්ඤාතබ්බා විනිච්ඡයෝ**

අත්ථතෝ, නොවෙනස්වනසුළු පරමාර්ථවශයෙන්ද; ධම්මතෝ, සභාවධර්මවශයෙන්ද; සාත්ථතෝ, සාර්ථකවශයෙන්ද; නොහොත් ප්‍රාර්ථනයෙහි කියතලද්ද නැවත කියාපෑමෙන්ද; භෙදසඞ්ගහා, විභාග කිරීම් වශයෙන්ද විභාගකළදු සඞ්ක්ෂෙප කිරීම්වශයෙන්ද; යං, යම් යම් උපාදානයක්; යස්ස, යම් යම් භවයකට; පච්චයොචෙව, ප්‍රත්‍යයවන්නේද එපරිද්දෙන්; විනිච්ඡයෝ, විනිශ්චයතෙම; විඤ්ඤාතබ්බා, දතයුතුයි.

එහි "භවතීති භවෝ" යනු නිර්වචනයි. ඒ නිර්වචනයෙන් උපපත්තිභවය කෙළින්ම දක්වයි. එලයෙහි නාම ව්‍යවහාරය හෙතුවෙහිද දවත්නා බැවින් කර්මභවයත් එයින්ම ගෙණහැර දක්වයි. එහෙයින් 'භවතීතිභවෝ" යන මේ නිර්වචනය කර්මභව උපපත්තිභව දෙකම දක්වීමෙහි සාධාරණවශයෙන් පවතී "භවොදුවිධෙන අත්ථි කම්මභවෝ උපපත්තිභවෝ" යි වදාළ බැවින් කර්මභව උපපත්තිභව දෙක අතුරෙන් කර්මය කර්මභව නම් කර්මයෙන් භවගත් සකඞ්ඛයෝ උපපත්තිභවනම්. මෙයින් චිත්ත ඍතු ආහාරාදි හෙතුවින් භවගත් සකඞ්ඛයන්ටද පැමිණෙන භව ව්‍යවහාරය මෙහිදී වැළකී කර්මයෙන්ම උපන් සකඞ්ඛයන්ව උපපත්ති

භව ව්‍යවහාරය ලැබෙනබවත් එසේම සකඞ්ඛයන් පහළකිරීමට පොහොසත්වූ චිතක සෘතු ආහාරප්‍රත්‍යයාදිය ඇතැත් ඒ හෙතුන් වලක්වා කම්යටම කම්නව යන ව්‍යවහාරය ලැබෙන බවත් කියේ මැයි. මෙසේ පරමාර්ථවශයෙන් විනිශ්චය දතයුතු. සභාවධර්ම වශයෙන් වනාහි කම්භවය නම් කුශලාකුශල චෙතනා හා ඒ චෙතනාවන් සමග යෙදෙන්නාවූ චෛතසික ධර්මයෝයි. එහෙයින් **"තත්‍ථ කතමෝ කම්මභවෝ පුඤ්ඤාභිසඞ්ඛාරෝ අපුඤ්ඤාභිසඞ්ඛාරෝ ආනඤ්ජාභිසඞ්ඛාරෝ පරිත්තභූමකෝවා මහාභූමකෝවා අයං වුච්චති කම්මභවෝ සඞ්ඛම්පි භවගාමිකම්මං කම්මභවෝ"** යි වදළසේක. මේ පාඨයෙන් දක්වන පුණ්‍යාභිසංඛාරය නම් පරිත්තභූමියහි නම්ලද එකොළොස් කාමභවයෙහි හෝ මහාභූමියහි නම්ලද රූපභවයෙහි හෝ ඇතුළත්වන්නාවූ මහා කුසල්සිත් අටදෙන රූපාවචර කුසල්සිත් පස්දෙන සමග උපදනාවූ තෙළෙස් (13) චෙතනාවෝයි. අපුණ්‍යාභිසංඛාරයනම් පරිත්තභූමියහි නම්ලද කාමභවයෙහි ඇතුළත්වූ දෙළොස් අකුසල් සිත් සමග උපදනාවූ දෙළොස් චෙතනාවෝයි. ආනඤ්ජාභි සංඛාරය නම් මහා භූමියහි නම්ලද අරූතලයෙහි ඇතුළත්වූ සතර චෙතනාවෝයි කාම රූපාරූප භවත්‍රයෙන් කොයි භවයක නමුත් කාමාවචරසිතක් පහළවේනම් එය කාමභූම්‍යටම ඇතුළත්වේ එසේම කොයිභවයකනමුත් රූපාවචරසිතක් පහළවේනම් එය රූපභූමියටද අරූපාවචර සිතක් පහළවේනම් අරූපභූම්‍යටද ඇතුළත්වේ. **"පරිත්තභූමක මහාභූමක"** යන්නෙන් එකී චෙතනාවන්ගේ විපාක මදබව හා විපාක මහත් බව ප්‍රකාශ කෙරෙයි. **"සඞ්ඛම්පි භවගාමිකම්මං"** යන පාඨාංශයෙන් කුශලා කුශල චෙතනාවන් සමග උපදනාවූ අලොභ අදෙෂ අමොහාදීවූද ලොභ දෙෂ මොහාදීවූද චෛතසික ධර්මයෝ සකස්කිරීම් සභාව ඇතිබැවින් ඔවුන්ගේද පර්‍යායය වශයෙන් කම්භවය සලකා කම් භවයෙහි ඇතුළත්කොට දක්වනලදහ.

උපපත්තිභවයනම් සඞ්ඛේපවශයෙන් කම් ශක්තියෙන් උපද වනලද රූපාදි සකඞ්ඛෝයි. ප්‍රභෙදවශයෙන් කාමභව රූපභව අරූපභව සඤ්ඤීභව අසඤ්ඤීභව නෙවසඤ්ඤී නාසඤ්ඤීභව එක වොකාරභව චතුවොකාරභව පඤ්චවොකාරභවයයි උපපත්තිභවය නවවිධවේ. එහි කාමභවය නම් කවරේද කාම තෘෂ්ණාවෙන් කැමැති වියයුතුබැවිනුදු භොගසම්පත්තිමෙන් කාමතෘෂ්ණාවට ආධාර බැවිනුදු **"කුන්නාපවරන්ති"** යි කියන්හි කුන්නායුධ දරන්නවුන් හෙවත් කුන්නායුධ නාමයෙන් ඒ ආයුධ සමග හැසි

රෙන්නවුන් ගැණෙන්නාක්මෙන් කාමතෘෂ්ණාව සමග බැසිරෙන බැවිනුදු රූපාදිය ශුභය සුඛයයි ගන්නාක්මෙන් කාමතෘෂ්ණාවට අරමුණුවන බැවිනුදු දෙව්ලොව මිනිස් ලොව සැප ඇත්තේයයි ගන්නාක්මෙන් කාමතෘෂ්ණාවට ප්‍රත්‍යයවූ සථාන බැවිනුදු යට අවීචියෙන් හා උඩ පරනිම්මිත වශවත්තී දිව්‍යලොකයෙන් මාසිම්වූ උපාදිනනාමසකඛියෝ හෙවත් කම්යෙන් පහළවන සකඛියෝ කාමභව නාමයෙන් කියනුලැබෙන්. රූප තෘෂ්ණා ඇතිබැවිනුදු රූපතෘෂ්ණාවට ආධාරසථාන බැවිනුදු **"මඤ්ඣාසක්‍රොසනති"** යන්නෙහි මඤ්ඣශබ්දයෙන් මඤ්ඣවසථාන් ගැණෙන්නාක්මෙන්ද **"ඉඤ්ඣඵන්ධනානං"** යන්නෙහි ඵන්ධනශබ්දයෙන් කොලොම්රුක් දෙවියා ගැනෙන්නාක්මෙන්ද **"රූපභව"** යන්නෙහි රූපශබ්ද යෙන් රූපතෘෂ්ණාව සථානූපචාරනයින් භගවන බැවිනුදු ඒ රූප තෘෂ්ණාව සමග පවත්නාවූ අකනිට්ඨ බඹලොව අවසන්කොට ඇති උපාදිනනාසකඛියෝ රූපභවනාමයෙන් කියනු ලැබෙත්. එසේම සතර අරූපතලයෙහි අරූප තෘෂ්ණාව සමග පවත්නා උපාදිනන සකඛියෝ අරූපභව නාමයෙන් කියනුලැබෙත් ධම්කාය වශයෙන් කාමාවචර විපාකසිත් තෙවිසි (23) දෙන චෙතසික තෙතිස් (33) දෙන කම්ජරූප විසි(20)දෙන කාමභව නම්වේ. රූපාවචරවිපාකසිත් පස් (5) දෙන චක්ඛූර්විඤ්ඤන දෙදෙන (2) ශොත්‍රවිඤ්ඤන (2) දෙදෙන සම්ප්‍රත්‍යෙෂණ සිත් තෙදෙන (3) චෙතසික නිස්පස් (35) දෙන කම්ජරූප පසළොස් (15) දෙන රූපභව නම්වේ. අරූප විපාකසිත් සතරදෙන චෙතසික නිස්දෙන (30) අරූපභව නම්වේ.

චතුර්ථාරූප්‍ය විපාකසිත හැර ලෞකික විපාකසිත් එක්තිස් (31) දෙන චෙතසික පන්තිස් (35) දෙන කම්ජරූප විසි (20) දෙනා සංඥිභව නම්වේ. මහාභූතරූප සිවුදෙන වණ්ණ ගන්ධ රස ඔජා ජීවිතෙන්ද්‍රිය යනමේ ජීවිත නවක කම්ජරූපකලාපය අසංඥිභව නම්වේ. නෙවසංඥා නාසංඥායතන විපාකසිත හා චෙතසික නිස්දෙන (30) නෙවසංඥි නාසංඥි භවනම්වේ. රූපසකඛියට ඇතුළත් ජීවිතනවක රූපකලාපය එකවොකාර භවනම්වේ. අරූපවිපාකසිත් සිවුදෙන හා චෙතසික නිස්දෙන (30) යයි නම්ලද නාමසකඛි සතරදෙන චතුවොකාර භවනම්වේ. කාමාවචරවිපාක සිත් තෙවිසි (23) දෙන රූපාවචර විපාකසිත් පස් (5) දෙන චෙතසික පන්තිස් (35) දෙන කම්ජරූප විසි (20) දෙන පඤ්චවොකාරභවනම්වේ. උපාදින සතරදෙන චෙතනාවෙනම ප්‍රත්‍යයවීමෙන් ලැබෙන කම්භවය හා නවවිධ උපපත්ති භවය භවයයි කියනුලැබේ.

සාමීකවශයෙන් විනිශ්චයකෙසේද? **"උපාදානපච්චයාභවෝ"** යන්නෙහි භවය විභාගකිරීමේදී පුණ්‍යාභිසංඝකාරාදීහු යම්සේ දක්වනලද්දාහුද එමෙන්ම **"සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං"** යන්නෙහි සංඝකාර විභාගයෙහිද පුණ්‍යාභිසංඝකාරාදීහු කියනලද්දාහුමය. එහෙයින් පටිච්චසමුප්පාදයහි පේන **"භවසඞ්ඛාර"** දෙපදයෙහි කිසිවෙනසෙක් නැත්තේ නොවේදයත්? **"සඞ්ඛමසිනව භාමීකම්මංකම්මභවෝ"** භවයෙහි ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාකගෙණදෙන්නාවූ සියළුම කර්ම්ය කර්මභවයහි **කී** වචනයෙන් කුශලාකුශල චෙතනාවන් පමණක් නොවැ චෙතනාසම්ප්‍රයුක්තවූ අවශෙෂ කුශලාකුශල චෛතසිකයෝද කියනලදහ. එබැවින් භවසඞ්ඛාර දෙපදයෙහි එකදෙශයකින් නොවෙනස් බවක් ඇතිනමුදු විශෙෂ අදහස් රැසක් ප්‍රකාශකරනු ලබන හෙයින් වෙනස් බවෙක් ඇත්තේමය. හේ මෙසේයි. **"සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං"** යන්නෙහි පේන සඞ්ඛාර පදයෙන් වර්තමාන භවයෙහි පිළිසිඳගැණීමට උපකාරවූ පූර්ව භවයෙහි සකස්කළ පුණ්‍යාභිසංඝකාරාදීන්ද **"උපාදාන පච්චයාභවෝ"** යනාදෙහි පේන භවපදයෙන් අනාගත භවයෙහි පිළිසිඳගැණීමට උපකාරවූ මේ භවයෙහි සකස්කළ පුණ්‍යාභිසංඝකාරාදීන්ද ගැණෙන බැවින් විශෙෂාර්ථ ඇත්තුයි උපාදාන ප්‍රත්‍යයෙන් වන භවයාගේ දුක්ඛම සාමීකම වන්නේය.

සඞ්ඛාරභව යන දෙපදයෙන් වෙනස් අදහස් ප්‍රකාශවේනම් භවයාගේ දුක්ඛම සාමීකයහි කීබස අයුතු නොවේද? භවයාගේ එක දෙශයක් වශයෙන් සංඝකාරයන් භවයහි ව්‍යවහාරවන බැවින් භවයාගේ පුනරුක්තිය සාමීකවම්මය. අභිඤ්ඤාදු ඇත. **"සඞ්ඛාරපච්චයා"** යන්නෙන් කුශලාකුශල චෙතනාපමණක් කියනලදහ. භවයන්නෙන් කුශලාකුශල චෙතනාපමණක් නොවැ ඒ සමග යෙදෙන චෛතසිකද දක්වනලදහ. තවද සඞ්ඛාරපච්චයා යන්නෙන් විඤ්ඤාණයට ප්‍රත්‍යයවූ කර්මයද "භවෝ" යන්නෙන් අසංඥසත්ව තලයෙහි උපදවන්නාවූ කර්මවිශෙෂයද දක්වූහ. වැනි දුරකීමෙන් ප්‍රයෝජනකිම "සඞ්ඛාර" යන්නෙන් කුශලාකුශලධර්ම පමණක්ද භවෝ යන්නෙන් උපපත්තිභවයද සඞ්ග්‍රහවන බැවින් කුශලාකුශලාව්‍යාකෘත ධර්මයෝද කියනලදතුයි සර්ප්‍රකාරයෙන්ම පුනරුක්තිය නැවත "භව" යන්නෙන් දුක්ඛම සාමීකවේමැයි.

උපාදාන ප්‍රත්‍යයෙන්වන භවයාගේ භෙදවශයෙන් හා සඞ්ග්‍රහ වශයෙන් විනිශ්චය කෙසේද? කාමූපාදාන ප්‍රත්‍යයෙන් කාමභව යෙහි උපදවන්නාවූ යම් කර්මයක් කරණ්ඩුලැබිද එය කර්මභව නම්වේ. (කාමභවාදීන්හි උපදවන්නාවූ කර්මයාගේ කාමභවාදි

භාවයතෙම ඵලව්‍යවහාරයෙන් අට්ඨවාවේ කියනලදී. සඞ්ඛාරග්‍රහණයෙන් සහජාත විඤ්ඤාණයටද ප්‍රත්‍යයවූ අවිද්‍යාව නිදානකොට ඇත්තාවූ කිසිකර්මයක් පෙරකියනලදය. මෙතැන්හි සියළු භාවගාමී කර්මය කීමෙහිත් භවය උපදවන්නාවූ උපාදාන ප්‍රත්‍යයාගේ විපාක වාරයට කරණලද අවකාශ ඇත්තාවූම කර්මය කර්මභවයයි අභිමත වේ. කාමූපාදාන ප්‍රත්‍යයෙන් කාම භවයෙහි නිපදවූ සඤ්ඤාදෝ උපපත්තිභවනාම්.

කාමූපාදාන ප්‍රත්‍යයෙන් රූපභවයෙහි උපදවන්නාවූ අරූප භවයෙහි උපදවන්නාවූ යම් කර්මයක් සකස්කරණු ලැබිද ඒ කර්මය කර්මභවනාම්. ඒ කර්මයෙන් නිපදවූ සඤ්ඤාදෝ උපපත්ති භවනාම්. මෙසේ කාමූපාදානප්‍රත්‍යයෙන් කාමකර්මභවය කාමඋපපත්ති භවය කියා කාමභව දෙකකැ. රූපකර්ම භවය රූපඋපපත්තිභවය කියා රූපභව දෙකකැ අරූපකර්මභවය අරූප උපපත්තිභවයයිකියා අරූපභව දෙකකැයි සකොටසක්කොට ඊමම ඇතුළත්වූ සඤ්ඤීභව නොවසඤ්ඤී නාසඤ්ඤීභව චතුවොකාර පඤ්චාවොකාර භවයන්ද එසේම මිගුණකොටගෙණ භවසදෙනෙක් වන්නාහ. යම්සේ කාමූපාදාන ප්‍රත්‍යයෙන් භවසදෙනෙක් වන්නාසුද එසේම සෙසු උපාදාන ප්‍රත්‍යයෙන්ද සකොටස බැගින් වෙන්නුයි උපාදාන හෙතුවෙන් ප්‍රභෙදවශයෙන් ගණනූපගනොවැ ඇතුළත්වූවන් සමග සූවිසි භවකෙනෙක් වන්නාහ.

සඞ්ග්‍රහවශයෙන් වනාහි කර්මභවයත් උපපත්ති භවයත් එකක් වශයෙන්ගෙණ කාමූපාදාන ප්‍රත්‍යයෙන් අභ්‍යන්තර ඝතවූවද ගණනට නොයන්නාවූ එකක් වශයෙන්ගත් භවයත් සමග එක්කාම භවයෙක්ද එසේම රූපභවයෙක්ද අරූපභවයෙක්දැයි භව තිදෙනෙක් වෙති. මෙපරිද්දෙන් සෙසු උපාදාන ප්‍රත්‍යයෙන්ද භව තුණ බැගින් ගණනූපගනූවුවන් සමග සඞ්ග්‍රහවිමෙන් භව දෙළොසෙකි. තවත් සංග්‍රහභවකුදු ඇත. එනම් කාමූපාදානාදී උපාදාන වශයෙන් භෙදයක් නොවකාව කාමභවයට පමුණුවන කර්මය කර්මභවයයිද එම කර්මයෙන් ඇතිවන සඤ්ඤීදෝ උපපත්ති භවයයිද මෙනයින් රූපභව අරූපභව දෙක්කිද ගද්‍රපා උපාදාන ප්‍රත්‍යයෙන් ගණනට නොගොස් ඇතුළත්වූවන් සමග කාමභව දෙකකැ රූපභව දෙකකැ අරූපභව දෙකකැයි අනික් අයුරකින් භව සදෙනෙක් සඞ්ග්‍රහබවට යෙති.

තවද කර්මභව උපපත්තිභව වශයෙන් භෙදයට නොගොස් ගණනූපගතුවූ ඔවුන්සමග කාමභව රූපභව අරූපභව වශයෙන් භවතුණෙකි. කාමභවාදි වශයෙන් තුන්ආකාරයකවද භාවූ

මිණ කම්භව උපපත්තිභව වශෙයන් භවදෙකෙකි. කම්භව උපපත්තිභව වශයෙනුදු භෙදයට නොපැමිණ "උපාදානප්පච්චයා භවෝ" යි වදාළහෙයින් එකම භවයෙක්වේ. මෙසෙයින් උපාදානය ප්‍රත්‍යයකොට ඇතිභවයාගේ භෙදවශයෙනුදු සඞ්ග්‍රහවශයෙනුදු විනිශ්චය දතයුතුයි.

ඒ ඒ උපාදානය ඒ ඒ භවයට ප්‍රත්‍යයවීම් වශයෙන් විනිශ්චය කෙසේ දතයුත්තේද. "උම්මත්තකොවියකි පුථුජ්ජනෝ" යි වදාළ හෙයින් උමතුවෙකු බඳුවූ පෘථග්ජනතෙම මෙය කටයුතුය මෙය නොකටයුතුය මෙය යුතුය මෙය අයුතුයයි පරීක්ෂානොකොට යම්කිසි උපාදානයක්හුගේ වශයෙන් යම්කිසි භවයක් පතා යම් කිසි කුශලාකුශල කම්යක් සකස්කෙරේමය. එහෙයින් මේකාරණයෙහි කෙව්වාදී කෙනෙක් ශෝසීල කුක්කුරසීල සමාදානයෙන් නොන් බවට සුනඛබවට පැමිණෙත්යයි මැදුම්සඟි පෙළේ වදාළ වචනය වරදවා සිතවගෙණ සීලබ්බතූපාදානයෙන් ධ්‍යානභාවනා අසිඳ හෙයින් රූපා රූපභව නොලැබත්යයි කියද්ද ඔවුන්ගේ ඒ අවිනිශ්චිතකම් නොපිළිගෙණ සියළුම උපාදානයෙන් සියළුම භවය වේයයි පිළිගතයුතු. හේ කෙසේද:—

මේ ලොකයෙහි උමතුවෙකුට බඳුවූ කිසිවෙක් යම් යම් කරුණු අසා දැනීමෙන් හෝ ප්‍රත්‍යක්ෂ වශයෙන් ඇසුදුටුවිරූ කාරණයෙන් හෝ මිනිස්ලොව දෙව්ලොව කම්සැප සම්බන්ධයයි සිතවගෙණ ඒ කම්සැප අයත් කරණ්හු පිණිස පුරාණ භාරත රාමායණ පසුබඹවිධි ආදි මිථ්‍යාධර්මකථා ඇසීමෙන්ද අසත්පුරුෂ සංසර්ගයෙන්ද පෙර වාසනා ගුණ නැතිබැවින්ද වරදවා ලබ්ධිගැණීමෙන්ද යනමේ ඇ කරුණුවලින් රැවටීමට පැමිණියේ මේ ක්‍රියාවෙන් කම්සැප සම්බන්ධ වෙතියි හඟිමින් කාමූපාදාන වශයෙන් ප්‍රාණඝාතාදි කායදුශ්චරිතාදිය කෙරේද ඒ පුද්ගලතෙම සවර්ගයෙහි කම්සැප අයත්කරනු සඳහා වෙදයෙහි කී පරිදි සත්ත්වඝාතනාදිකොට යාගකිරීම් යුද්ධකිරීම් ආදි දුශ්චරිත සම්පූර්ණවීමෙන් අපායෙහි උපදනේය. යමෙක් මේලොව කම්සැප අයත් කරණ්හු පිණිස රජ යුවරජ සෙනෙවි සිටුතනතුරු ආ ලැබ ලත්කම්සැප බුදිමින් ආරක්ෂා කෙරෙමින් කාමූපාදාන වශයෙන් කායදුශ්චරිතාදිය කෙරේද හෙතෙම දුශ්චරිත සම්පූර්ණවීමෙන් අපායෙහි උපදනේයි එහි ඔහුගේ උත්පත්තියට හෙතුවූ කම්ය කම්භව නම්වේ. කම්යෙන් හටගත් සකඬියෝ උපපත්තිභව නම්වේ. දුශ්චරිතබලයෙන් ලැබියහැකිවූ කාමභවයෙහි සඤ්ඤාභව පඤ්චවෝකාර භවයෝද එකදෙශයකින් ඇතුළත්බවට යෙත්මය.

තවත් අයෙක් වනාහි බුඩාදි සත්පුරුෂයන්ගේ යහපත් ධම් කථාවන් ඇසීම් කල්‍යාණමිත්‍ර සෙවනයකිරීම් ආදියෙන් දියුණුකර ගත් නුවණැත්තේ මේ මේ ක්‍රියාකිරීමෙන් කම්‍යැප සම්‍ඩවෙත්යි හඟිමින් කාමූපාදාන වශයෙන් කායසුචරිතාදිය කෙරේද හෙතෙම සුචරිතධම්ම්‍යාදාන යෙන් දෙව්ලොව්මිනිස්ලොව උපදනේය. එතන්හි ඔහුගේ උතපත්තියට හෙතුවූ කම්ය කම්භවයයි. එම කම්යෙන් හටගත් සඤ්ඤියෝ උපපත්තිභවයයි. සංඥිභව පඤ්චවොකාර භවයෝද එහි ඇතුළත් වෙත්මය මෙසේ කාමූපාදානය සුගති දුගති දිව්‍ය මනුෂ්‍යාදි වශයෙන් ප්‍රභෙදවත්වූ කම්භව උපපත්ති භවාදි වශයෙන් අනාගත භවවිශෙෂ ඇති කාම්භවයට ප්‍රත්‍යය වන්නේය.

තවත් අයෙක් රූපාරූප භවයන්හි කාමසම්පත්තීහු මිනිස්ලෝ දෙව්ලෝ කාම්සම්පත්තියට වඩා සම්‍ඩහයි අසාහෝ කල්පනා කොට හෝ කාමූපාදානවශයෙන්ම රූපාරූප සම්‍යාපත්තීන් උපදවා සමාපත්ති බලයෙන් රූපලොක අරූපලොකයන්හි උපදනේහි. ඒ භවයන්හි ඔහුගේ උතපත්තියට හෙතුවූ කම්ය කම්භවයවේ. ඒ කම්යෙන් උපදවාගත් ඤාණසම්පයුත්ත ඤඤියෝ උපපත්තිභවයවේ. සඤ්ඤි අසඤ්ඤි නෙවසඤ්ඤි නාසඤ්ඤි එස චතුපඤ්චවොකර භවයෝද එහිම අනාගතයෙහි. මෙසේ කාමූපාදානය සටකීන්සින් ප්‍රභෙද වත්වූ කම්භව උපපත්තිභවාදි වශයෙන් අනාගත භවවිශෙෂ ඇති රූපාරූප භවයන්ටද ප්‍රත්‍යය වන්නේය.

තවත් අයෙක් මේ ආත්මයතෙම වනාහි කාමාවචර සම්පත්ති භවය හෝ රූපාරූප භවයන් අතුරෙන් එක්තරා භවයක් හෝ මුල්සුන්වනියකල්හි හෙවත් ඒ ඒ තන්හි සඤ්ඤියන් බිඳිනියකල්හි නැවත නුපදනේයයි උවෙජ්දදෘෂ්ටිගෙණ හෙවත් කාමාවචර සම්පත්තිභවයෙහි ප්‍රථම ච්තීය උවෙජ්දවාදද රූපභවයෙහි තුන්වන උවෙජ්ද වාදයද අරූපභවයෙහි ඉතිරි උවෙජ්දවාදසතරද උපදවා කම්ඵල විශ්වාස නොකිරීමෙන් යම් යම් කම් සකස්කෙරේද ඔහුගේ කම්ය කම්භව නම්වේ. කම්යෙන් අටගත් සඤ්ඤියෝ උපපත්තිභව නම්වේ. සඤ්ඤිභවාදීහුද එහිම ඇතුළත් වෙත්මය. මෙසේ දිට්ඨු පාදානය නොයෙක් ප්‍රභෙද ඇති අනාගත භවවිශෙෂ ඇති කාම රූපාරූප ත්‍රිවිධ භවයන්ට ප්‍රත්‍යයවේ.

තවත් අයෙක් වනාහි මේ ආත්මභාවය තෙමේ කාමාවචර සම්පත්තිභවයෙහි හෝ රූපාරූප භවයන් අතුරෙන් එක්තරා භවයෙක හෝ සුවපත්වන්නේය. පහවූ දුක්ඛ තන්හාප ඇතිබැවින් ප්‍රත්‍යක්ෂවූ භවයෙහිම නිවණවැ පැමිණෙන්නේයයි දිට්ඨධම්මනිබ්බාන

වාද වශයෙන් ආත්මවාද උපදවා එසේ ගත්තාලද ආත්මවාදය පාදනයෙන් සුවපත්වූ නිරොගිවූ අජරාමරවූ ආත්මභාවයක් ලබා ගැණීම පිණිස යම් යම් කර්ම සකස්කෙරේද ඔහුගේ ඒ කර්මය කර්ම භවනම්වේ. එසින් අවශත් සත්ත්වයෝ උපපත්තිභව නම්වේ. සඤ්ඤීභවාදීහුද එසි ඇතුළත් වෙත්මය. මෙසේ අත්තවාදූපාදානය නොයෙක් ප්‍රභෙද අත්තාවූ ඇතුළත් භවවිශෙෂ ඇත්තාවූ කාමරූපාරූප භවයන්ට ප්‍රත්‍යයවේ.

තවත් අයෙක් මේ ශීලය මේ ව්‍රතය මේ ශීලව්‍රතය නම් කාමාවචර සම්පත්ති භවයෙහි හෝ රූපාරූප භවයන් අතුරෙන් එක්තරා භවයකැ හෝ සම්පූර්ණ කරන්නහුගේ සැපත සම්පූර්ණ වන්නේයසි සලකා සීලබ්බතොපාදාන වශයෙන් යම්යම් කර්ම සකස්කෙරේද ඔහුගේ ඒකර්මය කර්මභවනාම්වේ. එසින් හවගත් සත්ත්වයෝ උපපත්ති භව නම්වේ. සඤ්ඤීභවාදීහුද එසි ඇතුළත්ම වෙති. (මේ සීලබ්බතුපාදානයෙහි ගොශීල කුක්කුරශීල ගොව්‍රත කුක්කුරව්‍රතාදි අපාය ගාමී ශීලව්‍රත පමණක්නොවැ ලොලශසංසාරශුද්ධියට මාර්ගයසි ගත්තාලද සියළුම ලෞකිකශීලද ලෞකිකධ්‍යානසමාපත්තිද ශීලව්‍රත යසි දතයුතුයි.) මෙසේ සීලබ්බතුපාදානය නොයෙක් ප්‍රභෙද වත්වූ ඇතුළත්වූ භවවිශෙෂ ඇති කාමරූපාරූප භවයන්ට ප්‍රත්‍යයවේ, යම් යම් උපාදානයක් යම් යම් භවයකට ප්‍රත්‍යයවේනම් මෙහි කී නසින් එසි විනිශ්චය දතයුතු.

**රූපාරූපභවානං උපනිස්සයපච්චයෝ උපාදානං,**
**සහජාතාදිහිපිතං කාමභවස්සාති විත්ථාරෙතබ්බං.**

කීහෙයින් චතුර්විධ උපාදානය තමන්හා සම්ප්‍රයුක්තකුවූ හෙවත් සතර උපාදානයන් සමග එකවට උපන්නාවූ අකුසලකර්ම ලෞකික කුශලකර්ම සඞ්ඛ්‍යාත කර්මභවයටද නානාවිධ උපපත්තිභවයටද උපනිශ්‍රය ශක්තීන් ප්‍රත්‍යයවේ. තමන් හා සම්ප්‍රයුක්තවූ අකුශලකර්ම සංඛ්‍යාත කර්මභවයට කාම්පාදානය හෙතු සහජාත අන්‍යොන්‍යනිශ්‍රය සම්ප්‍රයුක්ත අත්ථි අවිගත වශයෙන් සත් ආකාරයෙකින්ද දිට්ඨුපාදාන සීලබ්බතුපාදාන අත්තවාදූපාදානත්‍රය හෙතුප්‍රත්‍යයහැර සහජාත අන්‍යොන්‍ය නිශ්‍රය සම්ප්‍රයුක්ත අත්ථි අවිගත වශයෙන් සයාකාරයෙකින්ද ප්‍රත්‍යයවේ. මේ වනාහි **"උපාදානපච්චයාභවෝ"** යන්නෙහි විස්තර කථාමාර්ගයයි.

---

භවප්‍රත්‍යයෙන් ජාතිය වන්නේ කෙසේදයත් ?

මේ ජාතිශබ්දයතෙම නොයෙක් තේරුම්හි බැසගණ ඇත්තේය. **"එකම්පිජාතිං මෙපිජාතිංයෝ"** යනාදි තන්හි භවයෙහිද **"අත්ථිවිසාඛේ නිගණ්ඨානාම සමණජාති"** යනාදි තන්හි නිකා

යෙහිද "ජාතිමිහි භගවති සඞ්ඝගිහිනා" යනාදි තන්හි සංස්කාර ධර්මලක්ෂණයෙහිද "සංඛතුකුච්ඡිම්හි සති වත්තනං උපපත්තනං ...පෙ... භවසඞ්ඛාවසඞ්ඛතී" යනාදි තන්හි ප්‍රතිසන්ධියෙහිද "සමපති ජාතෝ ආනන්ද බොධිසත්තෝ" යනාදි තන්හි ප්‍රසූතියෙහිද "අඤ්ඤතරා අනුපඛකුලිකා ජාතිවාදෙන" යනාදි තන්හි කුල යෙහිද "යතොහං භගිනි අරියාය ජාතියා ජාතෝ" යනාදි තන්හි ආර්‍ය්‍ය ශීලයෙහිද ජාතිශබ්දය වැටේ "භවපටවසඞ්ඛාජාති" යන්නෙහි පේන ජාති ශබ්දයතෙම අණ්ඩජ ජලාබුජ සංසෙදජ ඔපපාතික යොනීන්හි උපදින්නාවූ සත්ත්වයන්ට යම් යම් සකඹ කෙනෙක් පහළ වෙද්ද ඒ ඒ සකඹයන්ගේ පළමුව හටගැන්ම ජාතිනම්වේ.

ඒ ඒ භවයෙහි සකඹයන්ගේ පළමුහවගැණීමයහි කියනලද ජාතියට කර්මභවය පමණක් ප්‍රත්‍යයවන්නේය උපපත්තිභවය ඊට ප්‍රත්‍යය නොවේ කර්මභවය විස්තරකිරීමෙහිදී "තත්ථ කතමෝ කම්මභවෝ පුඤ්ඤාභිසඞ්ඛාරෝ" යනාදිය වදාළබැවින් මෙහි භවයන්නෙහිද "සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං" යන තැන සඞ්ඛාර පදයෙහිද චෙතනසක් නැත්තේ නොවේද? එහෙයින් සමානාර්ථවත් "සංඛාර භව" යන දෙපදයෙහි පුනරුක්තදෝෂයක්මෙන් හැඟෙන බැවින් දෙපදයෙන් එකක් ව්‍යර්ථනොවේදයත්? මේ ප්‍රශ්නය ගැණ දියයුතු පිළිතුරු මුලදී පහදාදුන් ක්‍රමයෙන් දතයුතු. ඒ ඒ සකඹ යන්ගේ පළමුව හටගැණීමනාම ක්ෂණත්‍රයට පැමිණිම්වැනි ප්‍රතිසන්ධි විපාක චිත්තයන්ගේද ඒ සමග උපදනා නාමසකඹ හා කර්මජරූප යන්ගේද ලක්ෂණයම පහළවීමයි "විඤ්ඤාණාදීනි පඤ්චකානි ජාතිගහණෙන වුත්තානි" යනාදි පට්ඨානමූලපාද විභඞ්ග අට්ඨකථා පාඨයෙන්ද "ජාතීති පනෙත්ථ සවිකාරා පඤ්චක්ඛන්ධා දට්ඨබ්බා" යන බ්‍රහ්මජාල සූත්‍ර අට්ඨකථා පාඨයෙන්ද "ඉධ පනාසං ජාතිසඳ්දෙ සහවිකාරෙසු පඨමාභිනිබ්බත්තනඛන්ධෙසු පවත්තති" යන සත්‍ය විභඞ්ග අට්ඨකථා පාඨයෙන්ද ක්ෂණත්‍රයෙන් යුත් බව දක්වනලදය. "ජාති මීහි භගවති එකෙනාසත්තෙන එකාසධාතුයා සඞ්ඛ ගිහා" යන ධාතුකථාප්‍රකරණපාඨයෙන් හා "භඞ්ගානං නිබ්බත්තී ජාති පරිපාකෝ ජරා භෙදෝ මරණං" යන විනයඅට්ඨකථා පාඨ යෙන්ද ප්‍රතිසන්ධි විපාක නාමසකඹ කර්මජරූපයන්ගේ උත්පාද ක්ෂණයම දක්වනලදය.

මෙහි කර්මභවයතෙම ජාතියට ප්‍රත්‍යයවන කාලයෙහි නානා ක්ෂණික කර්ම ප්‍රත්‍යය උපනිශ්‍රය ප්‍රත්‍යය යන දෙපරිද්දෙන් ප්‍රත්‍යය වේමය. එහිදු අකුශලකර්මභවය මහතුකොටගෙණ සතර අපායෙහි

පිළිසිඳගන්වන අකුශල විපාක සන්තීරණසිත ඒ සිත සමඟ යෙදෙන චෛතසික දසදෙන (10) කම්ජරූප විසිදෙන (20) යන මෙතෙක් නාමසකඬ කෘතවාද්‍රූප නම්ලද ජාතිතොම වන්නීය. කාමාවචර කුශලකර්‍ම භවය හෙතුෂකොටගෙණ සප්‍රත්‍යකාමසුගතියෙහි පිළිසිඳගන්වන කුශල විපාක උපෙක්ෂා සන්තීරණසිත මහා විපාක සිත් අටදෙන ඒ සිත් සමඟ උපදනා චෛතසික තිස්තුන්දෙන (33) කම්ජරූප විසිදෙන (20) යන මෙතෙක් නාමසකඬ කෘතවාද්‍රූප නම්ලද ජාතිතොම වන්නීය. රූපාවචර කුශලකර්‍මභවය හෙතු කොටගෙණ රූපලොකයෙහි පිළිසිඳගන්වන රූපාවචර විපාකසිත් පස්දෙන ඒසිත්සමඟ යෙදෙන චෛතසික පන්තිස්දෙන (35) කම්ජ රූප පහළොස්දෙන (15) යන මෙතෙක් නාමසකඬ කෘතවාද්‍රූප නම්ලද ජාතිතොම වන්නීය අරූපාවචර කුශලකර්‍මභවය හෙතු කොටගෙණ අරූපාවචර බඹලොව පිළිසිඳගන්වන අරූපාවචර විපාකසිත් සිවුදෙන ඒ සිත් සමඟ යෙදෙන චෛතසික තිස්දෙන (30) යන මෙතෙක් නාමයකඬ නම්ලද ජාතිතොම වන්නීය. භවය තෙම ජාතියට ප්‍රත්‍යයවේයයන මේ කාරණය කෙසේනම් දැනගත හැක්කේදයත්? මවුපියන්ගේ ශුක්‍රශ්‍රොණිත හා ආහාරපානාදි බාහිරප්‍රත්‍යයන්ගේ සම්බැව් ඇතිකල්හිදු චෙනස්බැව් දක්නා හෙයිනි ඒ එසේමැයි. මවුපිය දෙදෙනාගේ ශුක්‍රශ්‍රොණිතයයි කියන ලද බාහිර හෙතූන්ගේද ආහාරපාන හා ශීතොෂ්ණ සාතුයයි කියන ලද බාහිරහෙතූන්ගේද සම්බවක් ඇතිව හවතන්නාවූ නිඹුල් දරු වන්ගේද හීනප්‍රණීතබැව් දකිඵුලබන හෙයින් ඒ චෙනස්කම්ද හෙතුවක් නැතිව නොවියහැක්කේය. අවාසනාවතානයෙක්වැ උපන් නැනැත්තේ හැමකල්හිම හැමභවයෙහිම අවාසනාවතානයෙක්වැ උපදනේයයිද වාසනාවතාවැ උපන් නැනැත්තේ හැමකල්හිම හැමභවයෙහිම වාසනාවතාවැ උපදනේයයිද මෙසේ එකාකාර හීනොතනාෂට භාවාදියක් සියළුකල්හි සියළු භවයෙහි සියළු සත්ව යන්ට නොලැබෙන බැවින් චෙනස්වම ලැබෙන බැවින් හෙතුවක් නැතිව නොවන්නේමය හෙතුවක් ඇතිවම වියයුත්තේය. එසේ සත්ත්වයන්ගේ හීනප්‍රණීතබව මතා පැහැ හැඩහුරුකම් නොමතා පැහැ හැඩහුරුකම් ඇතිබව යනාදිය වීමට ඇති හෙතුව කුමක්දැයි සොයන විට කර්‍මභවයෙන් මුත් අන් හෙතුවක් නොපෙණෙන්නේ මය. සැම අතින්ම එකිනෙකාට චෙනස්ව හීනප්‍රණීතබැව් ආදිය ඇතිව උපන් සියළු සත්ත්වයන්ගේ අබභ්‍යන්තරඝනතානයෙහි ඇති හෙතූන් පරීක්ෂාකර බලනවිට තමන්ගේ ආත්මභාවයෙහි මිට වඩා විශෙෂ කාරණයක් හෙවත් හීනප්‍රණීත භාවාදිය ඇතිවීමට කර්‍ම භවයට වඩා විශෙෂ හෙතුවක් නොපෙණෙන බැවින්ද විශිෂ්ට

කාරණයක් නැතිව ඵල විශෙෂයක් නොලැබියහැකිබැවින්ද කම් හවයම ඊට හෙතුවන්නේය. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ විසින් **"යම්මං සත්තෙ විභජති සදිදං හීනපණීතතාය"** යී වදාළ හෙයිනුදු කම්භවයතෙම ජාතියට ප්‍රත්‍යයවනබව දතයුත්තේය. මේ වනාහි භවප්‍රත්‍යයෙන් වන්නාවූ ජාතිය පිළිබඳවූ විසතර කථා මාර්ගයවේ.

ජාතිය ප්‍රත්‍යය වීමෙන් ජරාමරණාදියවනු කිසේයත්? යම් හෙයකින් ජාතියයි කියනලද ප්‍රතිසන්ධි නාමසන්ධියන්ගේ හා කම්ජරූපයන්ගේ පහළවීමෙක් නැත්නම් ජරා මරණය හෝ සෝක පරිදෙවාදි ධර්මයෝ පහළ නොවෙද්ද එහෙයින් ජාතිය හෙවත් නාම සන්ධි කටත්තාරූපයන්ගේ පහළවීම ඇතිනල්හි ජරා මරණාදියද ජරා මරණයයි කියනලද දුඃඛයෙන් පොපියන්නාවූ අඥබාල ජනයා හට ජරාමරණයෙන් සම්බන්ධවූ ශොකාදී ධර්මයෝද ඤාතිව්‍යසන රොග ව්‍යසන භොගව්‍යසනාදිවූ ඒ ඒ දුඃඛධර්මයෙන් පොපියන්නාවූ අඥ බාල ජනයාහට ජරාමරණයෙන් සම්බන්ධනොවූ ශොකාදී ධර්මයෝද පහළවෙත්මය. එහෙයින් මේ ජාතිනොමෝ ජරා මරණයට ද සොකාදීන්වද උපනිශ්‍රය කොටිවශයෙන් එක් අයුරකින් ප්‍රත්‍යයවේයයි දතයුතුයි. (මෙහි උපනිශ්‍රය කොටියනම් ප්‍රසථානපාලියේ නොආයේ නමුදු සුත්‍රදෙශනානයින් යම් ධර්මයක්හුගේ වීමෙහි යම් ධර්මයෙක් වේද නොවීමෙහි නොවේද එබදුවූ ප්‍රත්‍යයශකති විශෙෂයෙකැයි කියනුලැබේ).

යම්හෙයකින් පටිච්චසමුප්පාදදෙසනාවෙහි සොකපරිදෙව දුක්ඛ දොමනස්සුපායාසයෝ අවසානයෙහි වදාරණලද්දාහුද එහෙයින් **"අවිජ්ජාපච්චයා සඞ්ඛාරා"** යී මේ භවචක්‍රයාගේ ආරම්භ යෙහිම යම් අවිද්‍යාවක් වදාරණ ලදද ඒ අවිද්‍යානොමෝ සොකකිරීමෙන් විලාපකීමෙන් දුක් දොම්නස් උපායාසාදියෙන්ම සිදුවන්නියැ. එහෙයින් ජාතියයි කියනලද ප්‍රතිසන්ධි නාමසන්ධි කම්ජරූපයන්ගේ පහළවීම හුදු ජරාමරණයට හා සොක පරිදෙවාදි ධර්මයන්ට පමණක්නොවැ අවිද්‍යාවටද ප්‍රත්‍යයවේමය. කවරහෙයින්ගතත්? අවිද්‍යාවෙන් නොරවැ ශොක පරිදෙවාදි ධර්මයන්ගේ වීමක් නැති හෙයිනි.

මෙසේ මේ සංසාරචක්‍රය අප්‍රකාශවූ නොදන්නාලද්දාවූ පූර්වකෝටියක්හුව හෙවත් මුලක් නැත්තේ කාරක වෙදක රහිතවූයේ වාදශූන්‍ය බවිත් ශූන්‍යවූයේ සියළු කාලයෙහි නොනැවතී අඛණ්ඩ ප්‍රවාහක්‍රමය දක්වා මුල්සුන්නොවැ හෙතුඵල පරම්පරාවශයෙන් වැල නොකැඩී පෙළඟැදී පවත්නේයි.

මේ භවචක්‍රයෙහි සොකාදීන් කරණකොටගෙණ අවිද්‍යාව සිඳ වතුයේ කෙසේද? මේ භවචක්‍රය නොදන්නාලද පුළු සිංහාව ඇත්තේ හෙවත් මුලක් නැත්තේ කෙසේද? කාරක වේදක රහිතවූයේ කෙසේද? වාදශබ්ධ ශූන්‍යතායෙන් ශූන්‍යවූයේ කෙසේද?

යම්සේහයකින් මේ පටිච්චසමුප්පාදයෙහි දුක්වූ සොක දෙම්නස් දැඩි ආයාසයෝ අවිද්‍යාවෙන් වෙන්ව නුපදිද්ද විලාපකිම මෝඩයාට මුත් අනිකෙකුට නොවේද එහෙයින් සොකකිරීම වැලපීම දෙම් නසට පැමිණීම දැඩි ආයාසය යන මේ පාපධර්මයන් ලැබෙනකල්හි අවිද්‍යාව නම්ලද මොහයද ලැබිමය. තවද "**ආසවසමුදයා අවිජ්ජාසමුදයෝ**"යි වදාළ කාරණයෙන් ආශ්‍රවධර්මයන්ගේ හට ගැණීමෙන් සොකපරිදෙවදුක්ඛදෙම්නස්සුපායාස ධර්මයෝද තදනුගතිකවූ අවිද්‍යාවද හවගණිනි. ඒ කෙසේද රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශඛ්‍යාත වස්තුකාමයන් කෙරෙන් වන්විමෙදී ඇතිවන්නාවූ සොකයතෙම කාමාශ්‍රවයෙන් හවගන්නේය. එහෙයින් වදාළසේක.

**නස්සමේකාමයානස්ස ජන්තුජාතස්සජන්තුනෝ**
**තේකාමාපරිහායන්ති සල්ලවිද්ධොවරූපති.**

කාමයානස්ස, වස්තුකාමය පතන්නාවූ; ජන්තුජාතස්ස,, හවගත් තෘෂ්ණාඡන්දය ඇත්තාවූ; තස්ස ජන්තුනෝ, ඒ සත්ත්වයාගේ; තේ කාමා, ඒ වස්තුකාම ක්ලේශකාමයෝ; වෙපරිහායන්ති, ඉදින් පිරිහෙත්නාම්; (ඒ පුද්ගලයාම) සල්ලවිද්ධොව, හුලින් විදිනලද්දෙකු මෙන්; රූපපති, ශොකකිරීම් වැලපීම් ආදිවශයෙන් විකෘතියට පැමිණේ.

තවද මේකී ශොකාදීවූ ධර්මයෝ දෘෂ්ට්‍යාශ්‍රවයන් හටගැණීමෙන්ද උපදනාහු වෙති එහෙයින් වදාළසේක. ("**තස්ස අහං රූපං මම රූපන්ති පරියුට්ඨානිනෝ රූපවිපරිණාමඤඤථාභාවා උප්පජ්ජන්ති සොක පරිදෙවදුක්ඛදෙම්නස්සුපායාසා**" කියාගි. රූපං, රූපය; අහං, මමවෙමි; රූපං, රූපය; මම්ඉති, මාගේයැයි; පරියුට්ඨානිනෝ, දෘෂ්ටිවශයෙන් භාරගෙණසිටින්නාවූ; තස්ස, ඒ පුග්ගලයාට රූපවිපරිණාමඤඤථාභාවා, රූපයාගේ ප්‍රකෘතිය වෙනස්ව විකෘති යට පැමිණීම් හෙතුවෙන්; සොකපරිදෙවදුක්ඛදෙම්නස්සුපායාසා, සොකකිරීම් වැලපීම දුක් දෙම්නස් දැඩි ආයාසයෝ; උප්පජ්ජන්ති, උපදිති.

දෘෂ්ට්‍යාශ්‍රවයෙන් යම්සේ සොකාදීහු වෙද්ද භවාශ්‍රවයෙහුදු එසේම වෙත්මය. එහෙයින් වදාළසේක "**යෙපිතෙදේවාදීඝායුකා වණ්ණවන්තෝ සුඛබහුලා උච්චෙසුවිමානෙසු චිරං දීඝමඛානං තිට්ඨන්ති තෙපි තථාගතස්ස ධම්මදෙසනං සුත්වා භයං සන්තාසං**

සංවෙගමාපජ්ජනතීති... පඤ්චපුබ්බනිමිත්තානි දිස්වා මරණ භයෙන සන්තාසජ්ජිතානං දෙවානං විය" කියාසි. මෙහි අදහස්තම් දීඝායුෂකවූ වණ්ණවත්වූ හෙවත් මනා රූඇත්තාවූ වැඩිතරම් සැප ඇත්තාවූ යම් දෙවිකෙනෙක් උස්වූ දිව්‍ය විමානයක්හි බොහෝ දීඝ කාලයක් මුළුල්ලෙහි සිටිද්ද ඒ දෙවතාවෝ පවා බුදුන්ගේ බණ අසා මහත් බයට තැතිගැණීමට කළකිරීමට පැමිණෙත්යයි කීබැවින්ද මරණ බියෙන් බියපත්වූ දෙවතාවුන්ට පලන්මල්දම් මලානිකවීම් හැඳපැළඳගත් දිවසළු කිළුටිවීම් කිසිල්ලෙන් බාබිදු සෙලවීම් සිරුරු පැහැ වෙනස්වීම් දිව්‍යාසනයෙහි නොකැමැතිවීම් යන මේ පුබ්බනිමිති පස දැක කම්මයෙන් උපන් සකක්‍රයයි කියනලද උපපත්තිභවයෙහි භවතෘෂ්ණා බලයෙන් බලවත් සෝකය හටගන්නේයයි කී බැවින්ද ඔවුන්ටද භවාශ්‍රව සමුදයෙන් ශොකාදිය හටගණිත්මය. භවාශ්‍රව යෙන් යම්සේද එසේම අවිද්‍යාශ්‍රවයෙහුදු ශොකාදීහු හටගණිත්මය. එහෙයින් වදාළසේක "සබ්බා හිකඛවෙ බාලෙ දිසෙවධම්මෙ තිවිධං දුකඛං දොමනස්සං පටිසංවෙදෙති" කියාසි. (හිකඛවෙ මහණෙනි; සොළඛාබාලෝ, අවිද්‍යාවෙන් අන්ධවූ ඒ අඥානතෙම; දිසෙවධමෙම, මේ ආත්මභාවයෙහිම; තිවිධං දුකඛං, මරණ සනන අවසථාවෙහි කම් කම්නිමිති ගතිනිමිති වශයෙන් නිදහසකොට ඇති සෝක වැලපීම් දුක; පටිසංවෙදෙති, විඳී.)

මෙහි කී පරිද්දෙන් සම්භවයකින් කාමාශ්‍රව භවාශ්‍රව දෘෂ්ටාශ්‍රව අවිද්‍යාශ්‍රවයන්ගේ හටගැන්මෙන් මේ ශොකපරිදෙවදුකඛදොමනසසු පායාසයෝවේද එහෙයින් මෙසේ සිඳවන්නාවූ සොකාදීවූ ධර්මයෝ අවිද්‍යාවමහෙතුවූ කාමාදි ආශ්‍රවයන්සිඳීමකෙරෙත්ය. කාමාදි ආශ්‍රවයන් සිඳවූකල්හි ප්‍රත්‍යයක් හෙතුවක් විද්‍යමානවූවහොත් ඵලයකුදු විද්‍ය මානවියයුතුබැවින් අවිද්‍යාවද සිඳවන්නීය. මෙසේ හත්කල සොකා දීන් විසින් අවිද්‍යාව නිපදවනලද්දීමයයි දතයුත්තීය. තවද යම්හෙයකින් ප්‍රත්‍යයන්ගේවීමෙහි ඵලයන්ගේවීම වත්‍රුයෙන් ආශ්‍රව හෙතුවින් අවිද්‍යාවනම්ලද ඵලය සිඳවූකල්හි නැවත අවිද්‍යාහෙතුයෙන් සඞඛාර නම්වූ ඵලයද සංසකාර හෙතුවින් විඤඤාණනම්වූ ඵලයදැයි මෙසේ හෙතුඵල පරම්පරාවගේ අවසානයෙක්නම්නැද්ද එහෙයින් හෙතුඵල බැඳගැළපීම්වශයෙන් පවත්නාවූ දෙලොව් අඛණ්ඩක් ඇත්තාවූ ඒ භවචක්‍රය නොදන්නාලද පුළු කෙළවර හෙවත් පටන්ගැම්මක් නැත්තේයයි කියයුතු බවට පැමිණේ.

මෙපරිද්දෙන් භවචක්‍රයාගේ නොදන්නාලද පුළුකෙළවරඇති බැවින් හෙවත් පටන්ගැම්මක් නැති බැවින් මූලක් නැති බව හැඟෙනකල්හිදු 'අවිජ්ජාපච්චයාසඞඛාරා'යි අවිද්‍යාවගේ වශයෙන්

සංසාරචක්‍රයාගේ පූර්වකෝටිය හෝ මුල හොයාගැනීමක් වරද නොවේදැ? මේවනාහි මූලක් පවත්නැම්මක් දක්වනු පිණිස භව චක්‍රයාගේ සවභාව හොයාගැනීමක් නොවේ. යම් හෙයකින් අවිද්‍යාතොමෝ කර්මඋත්පත්ති විපාකඋත්පත්ති හේතුඋත්පත්තියන්ට ප්‍රධාන වන්නීද ඒ එසේමැයි අවිද්‍යාව උපදවාගැනීමෙන් හෝ අවිද්‍යාව දුරුකොකිරීමෙන් හෝ අවිද්‍යාව තමාසතන්නි පිනිටුවාගත් අඛණ්ඩාල ජනයාට හේතුඋත්පත්තියද කර්මවිපාක උත්පත්තියෝද නොයෙක් දුකින් වැලඳසිටි සංසාරයෙහිලා වෙලාගණිති. සජීවිත අල්වාගත්කල සෙසු සජීවශරීරය අත වෙලාහන්න ක්මෙන්ද සජීවිතය සිඳදැමූකල්හි ශෙෂ සජීවශරීරයෙන් වෙලාඉවිම් අත නිදහස්වන්නාක්මෙන්ද අවිද්‍යාව හැණීමෙන් ත්‍රිවිධ උත්පත්තිදුඃඛයන්ගේ හැණීමද අවිද්‍යාවත් නිදහස් වීමෙන් ත්‍රිවිධ උත්පත්තිදුඃඛයෙන් නිදහස්වීමද දක්වනු සඳහා අවිද්‍යාව ප්‍රධාන අවයවයක්කොට **"අවිජ්ජායත්වේව අසේසවිරාග නිරෝධා සඛ්ඛාරනිරෝධෝ"** යනාදිය දේශිතසේක. මෙසේ භවචක්‍රය මූල පවත්නැම්මක් නැතිව පවත්නාක්මෙන්ම 'අවිද්‍යාදි හේතූන් කරණ කොටගණ සංඛ්‍යාරාදී ඵලයන්ගේ පැවැත්ම වන හෙයින් බ්‍රහ්ම විෂ්ණු මහෙශ්වරාදිවූ නිර්‍යම මැවුම්කරුවෙකු විසින් නොකරණලද බැවින්ද **"සොඛෝ පනමේ අයං අත්තා වදෙ වෙදෙය්‍යෝ"** මාගේ ඒ ඉම්අත්තභයතෙම වනාහි වැඩ අවැඩ දෙක දක්වන්නේය. සුවදුක් විඳින්නේය. අරමුණු දැනගැදිනීම කරන්නේය. සැපතට පැමිණියෙක දුකට පැමිණියෙකැයි යනාදි වශයෙන් ආත්මයතෙම මෙරමා විසිනුදු හඳුනාගැනුලබන්නේයයි මේසේ කල්පනාමකොට ගන්නාලද විඳින්නෙකු නැති බැවින්ද දිව්‍යමනුෂ්‍ය නිරශ්චීනාදි සත්වාකාරයෙන් ව්‍යවහාරයට පැමිණි හෙතුඵලධර්මමාත්‍රයක්වූ මේ සංසාර ස්වභාව කාරක වේදක රහිතව හෙවත් කරන්නෙක් විඳින්නෙක් නැතිව පවත්නේයැයි දතයුතුයි.

යම් හෙයකින් මේ සංසාර චක්‍රයෙහි කිසි අවිද්‍යාතොමෝ උදය වයයයි කියතැලද ඇති නැතිවීම සවභාවකොට ඇති බැවින් (නිත්‍ය භාවයෙන්) සදාකාලිකභාවයෙන් පවතාවත්නීද එසේම ප්‍රකෘතියෙන් කිළිටි කෙලෙස් ධර්මයක් නිසාත සංකෙලෙශපක්ෂණයකිවූ හෙවත් ලෞකිකවූ ධර්මයන්ට පක්ෂපාත ධර්මයක්නිසාත් ශුභලක්ෂණයෙන් පවතාරවන්නීද එසේම ඇතිනැතිවීමෙන් පෙළෙනුලබන බැවින් සැපයෙන් පවතාරවන්නීද ප්‍රත්‍යයන්ට සවත්ව පවත්නාබැවින් තමා වසඟවූ ආත්මභාවයෙන් පවතාරවන්නීද සංස්කාරාදිවූ එකොළොස් අඟහත් මෙකී සතර පරිද්දෙන් එකක්පාසා ශූන්‍යවන්නීද එහෙයින් මේ භවචක්‍රය මාදශවිධ ශූන්‍යත්වයෙන් ශූන්‍යයයි දතයුතුය. එහෙ

සින් කිහු "අවිජ්ජා න අතිකා න අතිතතෝ න අතිතති න අතිතවති" යි.

**නස්සා විජ්ජා නණහා මූල මතීතාදයෝ තයොකාලා**
**මෙ අඤ්ඤෙ එවව සරූපතෝ තෙසු අඩගානි.**

යි කීහෙයින් අවිද්‍යාව හා තෘෂ්ණාව භවචක්‍රයාගේ මූලයයි දතයුතු. පූර්වාන්තයයි කියනලද අතීත කොඨාසය තෙරෙන් වර්තමාන විපාක වාරය ගෙණහැරදක්වන හෙයින් වේදනාව අවසන්කොටඇතී ඒ මේඅවිද්‍යාවපරිවෘත්තියමුපපාදයාගේ එක්මුලකි. ඒ එසේමැයි. වේදනා තොමෝ තෘෂ්ණාව සහායකොටඇති අවිද්‍යාවපරිත්‍යායවේ. එහෙයින් වේදනාව ඇත්තාහට අවිද්‍යාවත් අවිද්‍යාව ඇත්තාහට සංස්කාරයෝත් ලැබෙත්හුයි. වේදනාව අවසන්කොට ඇති අවිද්‍යාවමුල්කොට ඇති භවචක්‍රය සම්පූර්ණ බවට පැමිණෙන්නේය. අතීතකුදුඇත අවිද්‍යාවගේ ගැණීමෙන් තෘෂ්ණා උපාදානයන්ද සංස්කාරයාගේ ගැණීමෙන් භවයද විඤ්ඤාණාදීන්ගේ ගැණීමෙන්ජාතිජරා මරණශොක පරිදෙවාදීන්ද අතීතගීත වන බැවින් වේදනාව අවසන් කොට ඇති අවිද්‍යාව මුල්කොට ඇති භවචක්‍රය ගැළපී ගන්නේය. මෙහයින් තෘෂ්ණාව මුල්කොට ඇති ජරා මරණාදිය අවසන්කොට ඇති අපරාන්තයයි කියනලද පශ්චිමඨකකි කොඨාසය ගෙණ හැරදක්වීම්වශයෙන් කී භවචක්‍රයෙහිද යොදා ගතයුතුයි.

මේ උභය පරිවෘත්තපාදධර්මයන් අතුරෙන් පළමුව දැක්වූ අවිජ්ජාමූලික පරිවෘත්තපාදදෘෂ්ටිචරිත පුද්ගලයන්ගේ වශයෙන්ද පසුවකී තෘෂ්ණාමූලික පරිවෘත්තපාදය තෘෂ්ණාචරිත පුද්ගලයන් ගේ වශයෙන්ද වදාළසේක. ඒ එසේමය. අවිද්‍යාතොමෝ හෙතුඵල ධර්මයන්ගේ ඇති සභාව තේරුම්නැණීමට ඉඩතනාදී මුවාකරදම් වරදවා ලබ්ධි නැණීම කරවන්නී දෘෂ්ටිචරිත පුද්ගලයන් සසර බම වන්නීය. තෘෂ්ණාතොමෝ රාගචරිත පුද්ගලයන් සසරබම වන්නීය.

තවද මේ වර්තමාන ආත්මභාවයෙහි විඤ්ඤාණ නාමරූපාදි ඵල ධර්මයන්ගේ උත්පත්තිතොම දක්නාලැබෙයි. ඒ ඵලයන් ඉපිදවීමට අතීතභවයෙහි මුල්හෙතුධර්මයන්ව සිටියාවූ අවිද්‍යාසංස්කාරයන් තමතමන් පිළිබඳවූ ඵලවිපාක නූපදවා මුල්සුන්නොවනහෙයින් පළමුකී භවචක්‍රය නෙවත් අවිජ්ජාමූලික පරිවෘත්තපාදය උවෙදැ දෘෂ්ටිවිනාශය පිණිසද උපන්නාවූ සත්ත්වයන්ගේ ජරාමරණය ප්‍රකාශවන හෙයින් පසුවකී භවචක්‍රය නෙවත් තෘෂ්ණා මූලික පරිවෘත්ත සම්පූර්ණය ශාශ්වතදෘෂ්ටි විනාශය පිණිසද වදාළසේක. නොහොත් පළමුවකී අවිජ්ජාමූලිකභවචක්‍රය පසුවකී තෘෂ්ණාමූලිකභවචක්‍රය හා සම්බන්ධවන හෙයින් යම්තාක්කල් ඵලධර්ම පරම්පරාව පවත්නීද

ඒතාක්ම හෙතුඵලී පරම්පරාව නොසිඳ පවත්නා බවත් යම්තාක් කල් හෙතුඵලී පරම්පරාව පවත්නීද ඒතාක්ම ඵලඵලී පරම්පරාව නොසිඳ පවත්නාබවත් දක්වනු සඳහා උභය භවචක්‍රය වදාරණ ලදය. තවද අපරිපූර්ණී ආයතනඇති ගැබහෝනාසතුන්ගේ වශයෙන් **'සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං විඤ්ඤාණපච්චයා නාමරූපං'** යනාදිනයින් ධර්මයන්ගේ පිළිවෙල පවත්නා පරිදි දක්වනු පිණිස පළමු භවචක්‍රයද පරිපූර්ණී ආයතන ඇති ඔපපාතික සත්වයන්ගේ වශයෙන් ධර්මයන්ගේ එ සැටිට පහළවන පිළිවෙළ දක්වනුවස් පසුව කී භවචක්‍රයද වදාළසේක. (ඒ එසේමැති. ගැබහෝනා සතුන්ගේ **කලලරූපය** සම්පූර්ණී ආයතන ඇතිව පහළ නොවේ. ඔපපාතික යන්ට වනාහි පිළිසිඳගන්නාකෙනෙහිම සියළු ආයතනයෝ එකවිට පහළවෙත්.)

මේ භවචක්‍රයාගේ අතීත අනාගත වර්තමානයයි තුන්කලෙකි. පෙළෙහි වදාළ ක්‍රමයෙන් **අවිද්‍යාසංඛාර** යන අඞ්ග දෙක අතීත කාලයෙහිය. **විඤ්ඤාණ නාමරූප සළායතන ඵස්ස වේදනා තණ්හා උපාදාන භව** යන මේ අඞ්ග අටදෙන වර්තමානකාලයෙහිය **ජාතිය** හා **ජරාමරණ** වය අනාගතකාලයෙහියයි දතයුතුයි.

**හෙතුඵල හෙතුපුබ්බක තීසන්ධිචතුහෙදසඞ්ගහං,**
**වීසති ආකාරාරං තිවට්ටමනවඨිතං භමති.**

හෙතුඵල හෙතුපුබ්බක තීසන්ධි චතුහෙදසඞ්ගහං, හෙතුඵලසන්ධි ඵලහෙතුසන්ධි හෙතුඵලසන්ධි ත්‍රයක් හා චතුර්විධ සඞ්ඛේපයක් ඇති; වීසතිආකාරාරං, විසිආකාර අරඇති; තිවට්ටං, වෘත්තත්‍රයක් ඇති; එතං, මේ භවචක්‍රය; අනවඨිතං භමති, නැවතනැඟිත පෙරළෙමින් පවත්නේය.

මේ භවචක්‍රයෙහි **සංඛාරයයි** කියනලද අතීත හෙතුවටත් **විඤ්ඤාණයයි** කියනලද වර්තමාන ඵලයටත් අතර එක් හෙතුඵල සන්ධිසථානයෙකි, **වේදනායයි** කියනලද වර්තමාන ඵලයටත් **තණ්හායයි** කියනලද වර්තමාන හෙතුවටත් අතර එක් ඵලහෙතු සන්ධිසථානයෙකි **භවයයි** කියනලද වර්තමාන හෙතුවටත් **ජාතියයි** කියනලද අනාගතඵලයටත් අතර එක් හෙතුඵල සන්ධිසථානයෙකි. තවද මේ භවචක්‍රයෙහි සඞ්ග්‍රහයෝ සතරෙකි. එනම් **අවිද්‍යා සංඛාර** දෙදෙන එක් සඞ්ග්‍රහයෙකි. **විඤ්ඤාණ නාමරූප සළායතන ඵස්ස වේදනා** තුන්ය එක් සඞ්ග්‍රහයෙකි. **තණ්හා උපාදාන භව** එක් සඞ්ග්‍රහයෙකි. **ජාතිජරාමරණ** එක් සඞ්ග්‍රහයෙකි.

**අතීතෙහෙතවොපඤ්ච ඉදානි ඵලපඤ්චකං,**
**ඉදානි හෙතවොපඤ්ච ආයතිං ඵලපඤ්චකං**

යන්නෙන් දැක්වූ විසිආකාර අර නම් කිමයත් අතීත හෙතු පස් දෙනා අතුරෙන් අවිද්‍යාසංඛාර දෙදෙන පමණක් කියනලදහ. යම් හෙයකින් මොහයෙන් මුළාවූ තැනැත්තේ ඒ ඒ වස්තූන් තමා අයත් කරණු පිණිස තෘෂ්ණාව උපදවාද තෘෂ්ණාවෙන් යුත් පුද්ගලතෙම දැඩිකොට අරමුණු අල්වාගණීද දැඩිකොට ගත්තාවූ පුද්ගලයාහට කර්මභවාදිය වේද එහෙයින් අවිජ්ජාසංඛාර යන අතීත හෙතුවයෙන් **අවිජ්ජා සංඛාර නාමා උපාදාන භව** යන අතීත හෙතු පස් දෙනකු දක්වූහ. එහෙයින් වදාළසේක **"පුරිම කම්මභවස්මිං මොහෝ අවිජ්ජා ආයූහනා සංඛාරා නිකන්තී නාමා උපගමනං උපාදානං චෙතනා භවෝ"** කියායි. පූර්ව කර්මභවයෙහි කියන ලද අතීත ජාතියේහි කර්මභවය සකස්කරණුලබන කල්හි දුක දුක් හටගැණීමට ඇති හෙතුව දුක් නිරුඩවූ නිර්වාණය දුක්නැතිකර දමන උපායමාර්ගය යනාදී අටතැනෙක්හි මූලාකරදැමූ යම් මොහයෙක් වේද ඒ මොහය අවිද්‍යා නම්. ඒ කර්මය සකස්කරණ කාලයෙහි හෙවත් දනක් දෙන්නෙමියි සිල්රකින්නෙමියි භාවනා කරන්නෙමියි සිත් උපදවා මසකුදු හවුරුද්දකුදු දානොපකරණාදිය සූදානම් කරන්නාහට සීලභාවනාදිය කිරීමට පූර්ව කෘත්‍ය ආරම්භකරන්නාහට උපන්නාවූ යම් පමණ පූර්ව චෙතනාවෝ ඇද්ද ඒ සියල්ල ආයූහන සංඛාර නම්. ප්‍රතිග්‍රාහකයන්ගේ අත්හි දානය පිරිනමන්නහුට සීලභාවනාදිය සම්පූර්ණකරන්නහුට උපදනා චෙතනාතුමූ කර්මභව නම් නොහොත් එක් වීටි සිත්පනහිනෙක්හි මුලින් පැවැති ජවන් සියක උපන් චෙතනාතුමූ ආයූහන සංඛාර නම්. සත්වන ජවන්සිත සමග උපන් චෙතනාව භාවය නම් නොහොත් ඒ ඒ කුශලාකුශල ජවන්සින් සමග උපදනා ධර්මකිසි චෙතනාකෙනෙක් ඇත්නම් හේ භව නම්. ඒ සමග උපදනා චෛතසික ධර්මයෝ ආයූහන සංඛාර නමැයි කියාත් දතයුතුයි. යම් කර්මභවයක් සකස්කරන්නහුට විපාකයෙහි හෙවත් උපපත්ති භවයෙහි යම් බලාපොරොත්තුවක් ඇත්නම් හේ තෘෂ්ණා නම්. කර්මභවය සකස්කරගැණීමට උපකාරවූ හෙවත් මෙනම්දෙයක් කොට අසවල් භවයෙහි කර්මඵල විඳින්නෙමියි මෙනම් දෙයක්කොට සසරින් මුල්සුන් පාන්නෙමියි යනාදිනයින් පැවැත්මක් ලබ්ධි හැණීමක් ඇද්ද හේ උපාදාන නම් ආයූහනාවසානයෙහි කී යම් චෙතනා විශෙෂයක් ඇද්ද හේ භව නම්. මෙසේ අතීත හෙතුපඤ්චකය දතයුතුයි.

ප්‍රතිසන්ධි භවයෙහි ඵලපංචකය කවරේද, විඤ්ඤාණ නාමරූප සළායතන ඵස්ස වෙදනා නාමා යන මේ පස්දෙන වෙති.

එහෙයින් වදාළසේක "ඉධ පටිසන්ධිවිඤ්ඤාණං ඔක්කන්තිනාමරූපං පසාදෙආයතනං ඵුට්ඨො එසෙසා වෙදයිතං වෙදනාඉති ඉමෙ පඤ්චධම්මා ඉධූපපත්තිභවස්මිං පුරෙකතස්ස කම්මස්ස පච්චයා"යි. මෙහි ප්‍රතිසන්ධි විඤ්ඤාණය නම් යම් සිතක් අනාදිකාලීන භවය ගැළපිම්වශයෙන් උපදනේද ඒ සිතයි. යම් රූපාරූප ධර්ම කෙරෙහි ගැබ්ගෙන්නා සත්ත්වයන්ට මාතෘගර්භයෙහි අත්තැනකින් අවුත් ප්‍රවිෂ්ටවූවාක්මෙන් එතැන්හිම හටගණිද්ද ඒ රූපාරූප ධර්මයෝ නාමරූප නම්. චක්ඛාදි ප්‍රසාදරූප ආයතනයන්ගේ නම්. යම් ධර්ම සවභාවයෙක් අරමුණුපහස්නාකාරයෙන් උපන්නේවේද ඒ සඵස්සය නම්. ප්‍රතිසන්ධි චිත්තය සමග හෝ සළායතනය නිසා උපන් සඵස්සය සමග හෝ යම් විපාක වෙදනාවක් හටගණිද්ද ඒ වෙදනා නම්. මෙසේ වර්තමාන ඵල පඤ්චකය දතයුතු.

වර්තමාන භවයෙහි හෙතුපංචකය කවරේද? පෙළෙහිආ තෘෂ්ණා උපාදාන භවයෝයි. භව යන්නෙන් සංස්කාරය ගැණෙන හෙයින්ද තෘෂ්ණා උපාදාන යන්නෙන් ඒ සමග යෙදෙන අවිද්‍යාව ගැණෙන හෙයින්ද තෘෂ්ණා උපාදාන භව අවිද්‍යා සංස්කාර ධර්ම පස්දෙන වර්තමාන භවයෙහි හෙතු පස්දෙන වෙති. එහෙයින් වදාළසේක. ඉධ පරිපක්කකත්තා ආයතනානං මොහො අවිජ්ජා ආයූහනා සඞ්ඛාර නිකන්ති තණ්හා උපගමනං උපදානං චෙතනාභවෝ ඉති ඉමෙ පඤ්චධම්මා ඉධ කම්මභවස්මිං ආයතිං පටිසන්ධියා පච්චයා,,යි. යම්හෙයකින් ගැබ්ගෙන්නාවූද ඉතා ළදරුවියෙහි සිටියාවූද බාල දරුවන්හට භවාඞ්ගභවශයෙන් බෙහෙවින් ඇතිවන්නාවූ සිත්හු බොහෝසේ භවාන්තරයෙහි ප්‍රතිසන්ධිය ලබාදීමට ශක්තිමත් කම් සක්‍රිය්‍රීමෙහි අසමර්ථවේද්ද එහෙයින් ඉම් භවයෙහි මුහුකුරා ගිය ආයතන ඇත්තහුට කර්මය සක්‍රිය්‍රීකරණ කාලයෙහි ඇතිවන්නාවූ කර්මයට රුකුල්දෙන්නාවූ යම් මොහයක් ඇත්නම් ඒ මෙහි අවිද්‍යාවයයි දක්වනු සඳහා "ඉධ පරිපක්කත්තා ආයතනානං මොහො අවිජ්ජායි වදාළහ. ආයූහන සංස්කාරාදිය යථාර්තයින් දතයුතු.

අනාගත ඵලපංචකය කවරේද? විඤ්ඤාණ නාමරූප සළායතන එස්ස වෙදනා යන ඵල පංචකයයි. ඒ ඵල පංචකය "ජාති පච්චයා" යන්නෙන් දක්වනලදය. ජරාමරණය නම් ඒ හෙතුඵල ධර්මයන්ගේ දිරායෑම හා බිඳීයෑමයි. එහෙයින් වදාළසේක. "ආයතිං පටිසන්ධිවිඤ්ඤාණං ඔක්කන්තිනාමරූපං පසාදෙ, ආයතනං ඵුට්ඨො එසෙසා වෙදයිතං වෙදනා"යි. මෙපරිද්දෙන් මෙ භවචක්‍රය අතීත හෙතු පස්දෙනෙක වර්තමානඵල පස්දෙනෙක වර්තමාන හෙතු පස්දෙනෙක අනාගතඵල පස්දෙනෙකැයි විසිආකාර අරඇත්තේවෙයි.

මෙකී විංශදුකාරයන් අතුරෙන් පුම්භවයෙහි කර්මසම්භාර පස්දෙනද වර්තමාන භවයෙහි කර්මසම්භාර පස්දෙනද එකතුව දශදෙනකු කර්ම නම්. වර්තමාන භවයෙහි විපාකධර්ම පස හා අනාගත භවයෙහි විපාකධර්ම පස්දෙන එකතුව විපාක දසදෙනෙක් විපාකනම්. මෙසේ දෙනැනෙක්හිවූ කර්ම කර්මවෘත්තයයිද දෙනැනෙක්හිවූ විපාකය විපාකවෘත්තයයිද මෙනයින් දෙනැනෙක්හි කර්මසඞ්ක්ෂේපයද විපාක සංක්ෂේපයද දෙනැනෙක්හි කර්මභවයද විපාකභවයද දෙනැනෙක්හි කර්මප්‍රවෘත්තියද විපාකප්‍රවෘත්තියද දෙනැනෙක්හි කර්මසන්තතියද විපාකසන්තතියද දෙනැනෙක්හි ක්‍රියාවද ක්‍රියාඵලයද දතයුතුයි.

තවද සංඛාරය හා භවය කර්මවෘත්ත නම්. අවිද්‍යා තෘෂ්ණා උපාදානයෝ ක්ලේශවෘත්ත නම්. විඤ්ඤාණ නාමරූප සළායතන ඵස්ස වේදනාතුමූ විපාකවෘත්ත නම්. මෙකී වට තුණකින් ශුන්‍යතාවූ සංසාරචක්‍රයතෙම යම්තාක්කලකින් එකලෙස්වට මුල්සුන්නොවේද ඒතාක්කල් මුල්සුන්නොවූ හෙතු ඇතිබැවින් නැවත නැවත පෙර ළඟින් පවත්නේමවේ.

**එවං සමුප්පන්නන මිදං සහෙතුකං**
**දුක්ඛං අනිච්චං චලිතඤ්ඤරඛ්ඛුවං**
**ධම්මෙහිධම්මා පභවන්තිහෙතුසෝ**
**නහෙත්ථ අත්තාව පරොව විජ්ජති.**

**ධම්මාධම්මෙම සඤ්ඤනොනත්ති හෙතුඤ්ඤභාරපච්චයා,**
**හෙතූනඤ්ච නිරොධාය ධම්මොබුද්ධන දෙසිතො.**

**හෙතුසුඋපඤ්ඣසු ඤ්ඤනං වට්ටං නවට්ටති,**
**එවං දුක්ඛන්තක්‍රියාය බ්‍රහ්මචරියධවිජ්ඣති,**
**සහෙතව නුපලබ්භනෙනනෙවුච්ඡෙදෙ, නාසඤ්ඤතං.**

එවං සමුප්පන්නං, කර්මයෙන් විපාකඤතෙමේද අවිද්‍යාවෙන් සංඛාරයෝදැයි මේ ආදිවශයෙන් භවගත්තාවූ මේ භවචක්‍රය; සහෙතුකං, දිව්‍යබ්‍රහ්මාදීන්ගේ කෘතියක් මැවීමක් නොවන නිසත් ඉබේ නොසැදෙන නිසත් හෙතු ඇතිව කරුණු ඇතිව හටනැගීම පැවැත්ම වන්නේය; අනිච්චං, නිත්‍යනොවන්නේය; දුක්ඛං, නිත්‍ය ශාශ්වතභෙයින්ම පැවැත්වීමෙහි දුක් හිරිහැර කරදරවත්නේය; චලං, චපලබැව් විකාරබැව් ඇත්තේය; ඉත්තරං, විර දීර්ඝකාලානන්ත රයක් නොපැවත නස්කාසුළුය; අධ්‍රුවං, ස්ථිරබැව් නැතිභෙයින් නිසරුවන්නේය. මහතු සෝ ධම්මෙහි, හෙතුධර්මයන් කාරණකොට ඉගණ; ධම්මා, ඵලධර්මයෝ; පභවන්ති, හටගණිති; එත්ථ, මේ හෙතු ඵල පරම්පරාවෙහි; අත්තාව, තෙමේය කියාත්; පරොව, අනිකෙක කියාත්; නහිවිජ්ජති, කිසිවෙක් නැත්තේමය.

හෙතුසමඞ්ගාරපච්චයා, අසාධාරණහෙතු සාධාරණහෙතු ප්‍රධාන හෙතු අප්‍රධානභාවවූ; ධම්මා, සත්ව පුද්ගලනොවූ ධර්මයෝ; ධම්මෙ, සත්වපුද්ගලනොවූ ධර්මයන්; සඤ්ඤාහෙතු, උපදවති, බුදුවන, සම්බුදු යන්වහන්සේ විසින්; හෙතුනංචනිරොධාය, හෙතුනිරුධයෙන් නොරවැ ඵලනිරොධයක් නොවන බැවින් හෙතුනිරොධය පිණිස; ධම්මෙ දෙසිතො, ධර්මයවදාරණලද්දේය.

හෙතුසු, හෙතුධර්මයන්; උපරුද්ධෙසු, නිරුද්ධව හෝ මුල්සුන්ව නියකල්හි; ජීවිතංවට්ටං, සුත්වනිය වෘත්තදුඃඛය; න වට්ටති, නොපවත්නේය; එවං දුක්ඛවත්තාක්‍රියාය, මෙසේ හෙතුනිරාධයෙන් සහර දුක් නැතිකිරීම පිණිස; ඉධ, මේ ශාසනයෙහි; බ්‍රහ්මචරියං, ත්‍රිවිධ ශික්ෂා සම්පූර්ණකිරීමෙන් සිදකටයුතුවූ මාර්ග බ්‍රහ්මචර්‍යාව; චිජ්ජති, විද්‍යමානවෙයි; සහෙතුවත්‍රුපලබ්භනෙන, හෙතූන් පිළිබඳව පවත්නා සත්ව පුද්ගලනොවූ ධර්මමාත්‍රයෙහි ව්‍යවහාරවශයෙන් මුත් පරමාර්ථ වශයෙන් සත්වයෙකු නොලබනකල්හි; නෙවුච්ඡෙදෙ, හෙතු නිරොධ යක් නැතිව මොවුන්ගේ මුල්සුන්වීමකුදු නැත; නසස්සතං, හෙතු ඇතිතාක් සදාකාලිකබවකුදු නැත. යනුයි.

**සච්චපච්චයතො කිච්චා වාරණා උපමාහිව,**
**ගම්භීරතාඝනෙදව විඤ්ඤාතබ්බං යථාරහං**

සච්චපච්චයතෝ, සත්‍යවශයෙන්ද හෙවත් සත්‍යයන්ගේ හව හැණීම් වශයෙන්ද; කිච්චා, කෘත්‍යවශයෙන්ද; වාරණා, කාරකාදීන් වැළැක්වීම්වශයෙන්ද; උපමාහිව, උපමාවශයෙන්ද; ගම්භීරතාඝ නෙදව, ගැඹුරුනය නෙදවශයෙන්ද; යථාරහං, සුදුසු පරිදි; විඤ්ඤා තබ්බං, භවචක්‍රය දැනගතයුතුයි.

යම් නයකින් ඒ භවචක්‍රයෙහි දුක්වූ කාමාදි ආශ්‍රවයන් සමග පැවැති කුශලාකුශල කර්මය චෙතනාවශයෙන්. හා චෙතනා සම්ප්‍ර යුක්ත චිත්තචෙතසික ධර්මවශයෙන් වෙනස්නොකොට සමුදය සත්‍යය කියා සත්‍ය විභාගයෙහි ආදළුසේක්ද එහෙයින් තෘෂ්ණාවද චෙතනාද සෙසු සම්ප්‍රයුක්ත ධර්මද යන සියළු ආශ්‍රව කුශලාකුශල ධර්මයෝ හෙවත් අවිද්‍යාවෙන් වන්නාවූ සංස්කාරයෝ තුමූ සමුදය සත්‍යය උත්පත්තිස්ථානකොට්ඨාසයි සමුදය සත්‍යය නම්. සංස්කාර යෙන් වන්නාවූ විඤ්ඤාණය සමුදය සත්‍යය උත්පත්ති ස්ථානකොට ඇති දුඃඛ සත්‍යයහි විඤ්ඤාණයෙන් වන්නාවූ නාමරූපයද නාමරූප යෙන් වන්නාවූ ෂඩායතනයද සළායතනයෙන් වන්නාවූ ඵස්සයද ඵස්සයෙන් වන්නාවූ වෙදනාවද යනමොහු දුඃඛ සත්‍යය උත්පත්ති ස්ථානයකොට ඇති දුඃඛ සත්‍යයෙහි ඇතුළත්වෙති. වෙදනාවෙන් ඇතිවන්නාවූ තෘෂ්ණාව දුක්ඛසත්‍යය උත්පත්ති ස්ථානකොට ඇති

සමුදයසත්‍යයයි තෘෂ්ණාවෙන් ඇතිවන්නාවූ උපාදානය සමුදය සත්‍යය උත්පත්ති ස්ථානකොටඇති සමුදය සත්‍යයයි උපාදානයෙන් ඇතිවන්නාවූ භවය සමුදයසත්‍යය උත්පත්තිස්ථානකොටඇති දුක්ඛ සමුදයසත්‍ය ශුද්ධියයි භවයෙන් ඇතිවන්නාවූ ජාතිය සමුදයසත්‍යය උත්පත්තිස්ථානකොටඇති දුඃඛසත්‍යයයි ජාතියෙන් වන්නාවූ ජරා මරණය දුඃඛසත්‍යය උත්පත්ති ස්ථානකොටඇති දුඃඛසත්‍යයයි. මෙසේ සත්‍යවශයෙන්ද යොජනාකොට දතයුතුයි.

පටිච්ච සමුප්පාදඞ්ගයන්ගේ කෘත්‍යයෝ කවරහුද? අවිද්‍යා නොමේ ආලම්බනයන්හි හෝ තමා විසින් වසාදමාසිටී දුඃඛාදී වස්තූන්හි විද්‍යමාන සභාව තේරුම්ගන්ට ඉඩනොදී මුළාකරවන්නීය. සංඛාරයන් පහළකිරීමටද හෙතුවන්නීය. සංඛාරයෝතුමූ චෙතනාදිය සකස්කිරීමද විඤ්ඤාණයට රුකුල්දීමද කෙරෙත්. විඤ්ඤාණයතෙම අරමුණු දැනගැණීමද නාමරූපයට රුකුල්දීමද කෙරේ. නාමරූපයතෙම එකිනෙක ගළපා පිහිට වියහැකි උතුම් ඉදකක්මෙන් ඔවුනොවුන් උපස්ථම්භකව සිටීමද සළායතනයට රුකුල්දීමද කෙරේ. සළායතනයතෙම රූපාදි ආයතනයන් විෂයෙහි පැවැත්මද ස්පර්ශයට රුකුල්දීමද කෙරේ. ස්පර්ශයතෙම අරමුණුවල හැපීමද වේදනාවට රුකුල්දීමද කෙරේ. වේදනාතොම අරමුණු රස බුක්තිවිඳීමද තෘෂ්ණාවට රුකුල්දීමද කෙරේ. තෘෂ්ණා තොම ආලයකටයුතු ධර්මයෙහි ආලයකිරීමද උපාදානයට රුකුල් දීමද කෙරේ. උපාදානය තෘෂ්ණා දෘෂ්ටින්ට ඒජාවවූ වස්තු දැඩිකොට ගැණීමද භවයට රුකුල්දීමද කෙරේ. භවයතෙම තොමෙයක් ගතියෙහි බහාලීමටද ජාතියට රුකුල්දීමදකෙරේ. ජාතිතොම හට ගන්නාවූ සතුඹුයන්ගේ විකාර භාවයක් බැවින් ස්කන්ධයන් පහළකිරීමද ජරාමරණයට රුකුල්දීමද කෙරේ. ජරාමරණයතෙම සතුඹුයන් පැවැත්ම මිනිකිරීම් බිඳීම් වශයෙන් පැවැත්මද සොක පරිදෙවාදියට කරුණු බැවින් ශෝකපරිදෙවාදිය සමග සිඳුවූ අවිද්‍යාවෙන් යුත් සංඛාරයන් සමග යෙදුනේ භවාන්තර යෙහි පහළවීමට රුකුල්දීමදකෙරේ. "වුත්තිවිඤ්ඤාණං පටිසන්ධි විඤ්ඤාණස්ස අනන්තරපච්චයෝ" යනු ඒට සාධකයි. මෙසේ අවිද්‍යාදි අඞ්ගයෝ එකිනෙක තමා අයත් නෛසර්ගික කෘත්‍යය ආසන්න ධර්මයකට රුකුල්දීම් කෘත්‍යය යන මේ දෙපරිද්දෙන් කටයුතු කෙරෙත්.

ත්‍රිඵ්‍යාදර්ශන වැලැක්වීම්වශයෙන් කෙසේ දතයුතුද? "අවිජ්ජා පච්චයා සඞ්ඛාරා" යී පටිච්ච සමුප්පාදයෙහි වදාළ භගවතින් සංඛා රයන් ඉඛ්බිත්ත බ්‍රහ්ම විෂ්ණු මහෙශ්වරාදීන්ගේ මැවීමෙක්වත්

නොවැ හෙතුබලයෙන් උපන්බව දැක්වීමෙන් කවරෙක් සකස් කෙරේද දෙවියෙක් බඹෙක් වෙනයම් පුහුලෙක් සකස් කෙරේද යන ප්‍රශ්නයට අනවකාශ කෙරේද එහෙයින් මේ "අවිජ්ජා පච්චයා සඞ්ඛාරා" යන්නෙන් දිව්‍ය බ්‍රහ්මාදි මැවුන්කාරයන් නැතිබව දක්වයි. "සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං" යන්නෙන් ආත්මයතෙම ප්‍රාණය තෙම හවයෙන් හවය ගමන්කෙරේ යන මිථ්‍යාදර්ශනය වළක්වයි. "විඤ්ඤාණපච්චයා නාමරූපං" යන්නෙන් පඤ්චස්කන්ධය විනාශ නොවෙකොට කැලෑකොටසලකන්නාහට ආත්මලබ්ධිවශයෙන් උපදනා යම් ඝණ සංඥාවක්වේද ඉරට්ටා නල්කඳක් දෙකටපලන්නාක්මෙන් පරීක්ෂාකිරීමෙහිදී මේ නාම ධර්මය මේ රූපධර්මයයි වැටහියන බැවින් ඒ ඝණ සංඥාව නිවාරණය කෙරෙයි. "නාමරූප පච්චයා සළායතනං ... පේ ... ජාතිමරණං" යන්නෙන් සත්වතෙම ආත්මය තෙම රූප දක්නේය ශබ්දය අසන්නේය ගන්ධාඝ්‍රාණය කරන්නේය රසය ආස්වාදනය කරන්නේය ස්පර්ශකරන්නේය දැනගන්නේය පහස්නේය විඳින්නේය ආලයකරන්නේය දැඩිකොට ගන්නේය උපදින්නේය දිරන්නේය මියයන්නේය යන මේ ආදි වශයෙන් ගන්නාවූ මිථ්‍යාලබ්ධි නිවාරණය කෙරේ. මෙසේ මිථ්‍යා දර්ශන නිවාරණකිරීම්වශයෙන්ද භවචක්‍රය දතයුත්තේය.

යම් හෙයකින් මේ පවිඩඝමුප්පාදයෙහි දැක්වූ සත්වපුද්ගල නොවූ සඤ්ඤායතන ධාතු ධර්මයන් සවභාවලක්ෂණ සාමාන්‍ය ලක්ෂණවශයෙන් නොදක්නේද එසේ පරමාර්ථවශයෙන් ඇතිසැටි ධර්මයන් දැක්කනොහියදත්තාවූ මෝහය තෙම ජාත්‍යන්ධයෙකු වැනිය. අන්ධයාගේ පය පැකිළීමෙන් අවිද්‍යාවෙන් වන්නාවූ දුකට හෙතුවූ සංඝකාරයෝ දතයුත්තාය. පය පැකිළි අයගේ බිම වැටීම මෙන් සඞ්ඛාරබලයෙන් භවාන්තරයෙහි ඇතිවන විඤ්ඤාණය දතයුත්තාය. වැටුනාහුට හටගන්නා තැල්ම හෝ ගණ්ඩියමෙන් විඤ්ඤාණබල යෙන් වන්නාවූ දුක්බැව් නැමැති රුජා ඇති කෙලෙස් පුයාව වැනිමිඇති නාමරූපය දතයුත්තේ. ගඩොලක්ගේ පිපිරීම්ව පැහෙන කල්හි ඒ මතු සැදෙන කුඩා බිබිලිමෙන් හෝ ගණ්ඩියමෙන් ගඩොලක් පරිද්දෙන් බුන්කල්හි නැති බිබිලිමෙන් නාමරූප හෙතු වෙන් ඇතිවන සළායතනය දතයුත්තේ. ගඩොලක්ගේ යමක හැපීම මෙන් සළායතන බලයෙන් වන්නාවූ පහස්නා කෘත්‍යඇති සපර්ශය දතයුත්තේය. ගඩොලක්ගේ හැපීමෙන් ඇතිවන දුක් පීඩාවමෙන් ප්‍රත්‍යයෙන් වන්නාවූ සුඛ දුඃඛ උපෙක්ෂාවශයෙන් පැවැති වේදනාව දතයුත්තේය. දුකට පිළියම් කරණුකැමැත්තමෙන් වේදනා හෙතුවෙන් වන්නාවූ තෘෂ්ණාව දතයුත්තේය. පිළියම්කරණු කැමැත්තෙන් අපථ්‍ය ඖෂධ ගැණීමෙන් තෘෂ්ණා හෙතුවෙන් වන්නාවූ බොගෝ අනර්ථ

සන්ත කාරණවූ උපාදානය දතයුතුයි. ඇරගත් අපථ්‍ය ඖෂධ ආලෙපකිරීමක්මෙන් උපාදාන ප්‍රත්‍යයෙන් වන්නාවූ දුකටම හෙතුන් සඩසනනානයෙනි ඇතිකරන්නාවූ භවය දතයුතුය. අපථ්‍ය ඖෂධ ආලෙපකිරීමෙන් ඉදිමීම් ලේ සැරව හටගැණීම් ආදිවූ ගඩගෙඩියේ විකාර පහළවීමමෙන් භව හෙතුවෙන්වන්නාවූ ආධාමභාවයාගේ පහළවීම් ලක්ෂණඇති ජාතිය දතයුතුයි. ගඩගෙඩිය පැසවා බිදීයාමමෙන් ජාතිය ප්‍රත්‍යයවීමෙන් වන්නාවූ ජරාමරණාදිය දතයුතුයි. මේසේ භවචක්‍රය එක් වසතුවක් කරුණුකොටඇති උපමාවලින් හඟවා මෙතැන්සිට නානා වසතුක උපමාවලින් ගෙණ හැරදක්වනුලැබේ.

යම්සේ තිමිර පටලයකින් වැසීගිය ඇස්ඇති පුහුල්තෙම රූපයන් නොදක්නේවේද මැදක් දක්නේවීනමුත් වෙනස් අන්දමට දක්නේවේද එමෙන් අවිද්‍යාවෙන් පිඩිතවූ පුරුෂ පුද්ගල තෙමේද පඤ්චසඛන්ධ දුඃඛය නොදක්නේය දක්නේවී නමුත් සුභ සුඛ ආතමාදිවශයෙන් වරදවා දක්නේය එබැවින් දුඃඛාදි අවතැන මුවාකොට සිටි අවිද්‍යාව ඇසවසාසිටි නිමිර පටලයක් වැන්න. අවිද්‍යාවෙන් මුළාවට පැමිණි අඥතතෙම කොෂකාරක කෘමියකු තනාගත් කොෂප්‍රදෙශයෙකින් තමාම දූවටෙන්නාක්මෙන් නොහොත් රැසියෙකු තමන් තනාගත් රැසිපයියෙන් දූවටී සිටින්නාක්මෙන් දෙවන භවයට හෙතුවූ සංසකාරයන් කරණකොටගෙණ තුමූම තනාගත් වටට දුකඛයෙහි දූවටීම කෙරේනුයි. සංසකාරයෝ කෘමි කොෂප්‍රදෙශයක් නොහොත් රැසිපයියක් වැන්නාහ. යම් හෙයකින් පරිණායකයකු (අනුශාසක ප්‍රධාන ඇමතියකු) විසින් අනුග්‍රහකරණලද රාජකුමාරයෙක් තෙම රාජ්‍ය පරිපාලනයෙහි මහත් පිණිව ලබන්නාක්මෙන් සංසකාරයන් විසින් අනුබල දෙන ලද විඥානය භවයෙහි පිහිටීම කරන්නේද ඒ කාරණයෙන් සංසකාර ප්‍රත්‍යයෙන්වන විඥානය අනුශාසක ප්‍රධාන අමාත්‍යානුග්‍රාහක රාජකුමාරයෙකු වැන්න. යම්හෙයකින් මායාකාරයෙක් මායාවක්ගෙණහැර පාන්නාක්මෙන් කම් කම්නිමිති ගතිනිමිති අතුරෙන් කිසිනිමිත්තක්අරමුණුකිරීම් වශයෙන් පවත්නා විඥානය ප්‍රතිසන්ධික්ෂණයෙහිම දිව්‍ය බ්‍රහම මනුෂ්‍ය ආදි ආකාරවත්වූ නාම රූපධර්මයන් පහළකරන්නේද එහෙයින් විඤ්ඤාණයෙන් ඇතිවන නාමරූපය මායාකාරයෙකුගේ ඉඳුජාලයක් වැන්න. යම්හෙයකින් මනාභූමියෙක්නි වැඩෙන්නාවූ වනලැහැබක් හෝ පඳුරක්මෙන් නාමරූපයෙහි පිහිටි සළායතනය වැඩීමට මහත්බවට පැමිණේද එහෙයින් නාමරූපය ඇසුරුකොට ඇති ෂඩායතනය වනලැහැබක් මහත්

පදුරක් වැන්න. යම් හෙයකින් ගිනිගාන දන්ඩ හා ගැටීමෙන් උපදනා ගින්නමේන් ආයතනගන්හා ගැටීමෙන් සපශීය උපදනේද එහෙයින් සපශීය බෝකර ගන් ගින්නක් වැන්න. ගින්නෙන් පහළ නැනැත්තාව ඇති දැවිල්ලමෙන් සපශීයෙන් පහස්නාලද නැනැත්තාව වෙදනාව වන්නීද එහෙයින් වෙදනාව වහනිසන්තාපයක් වැන්න. ලුණුවතුර බොන්නාහට මතුමත්තෙහි පිපාසය ඇති වන්නාක්මෙන් අරමුණු රස විඳින්නාහට මතුමත්තෙහි තෘෂ්ණාව වන්නීද එහෙයින් තෘෂ්ණාව එණුදිය බිමක් වැන්න. පිපාසයට පැමිණි නැනැත්තේ පැන්පානයෙහි දැඩිලොල්වන්නාක් මෙන් තෘෂ්ණාවෙන් පීඩිතවූ පුද්ගලතෙම භවයෙහි ආසාවකරන්නේද එහෙයින් තෘෂ්ණා දෘෂ්ටිවශයෙන් කරණ අභිලාසය හා අභිනිවෙසය තෘෂ්ණා දෘෂ්ටින් යුකත පුද්ගලයාගේ උපාදානයවන්නේය. තමහට වන විපතනොදැන ආමිස ලොභයෙන් මසෙකු ගිලින්නාවු බිලිය මෙන් මතුපැමිණෙන විපත්නොදැන උපාදානයෙන් භවය දැඩිකොට ගණිද එහෙයින් භවය ගිලගත් බිලිය වැන්න. බීජය ඇතිකල්හි අඬකුරය නගින්නාක්මෙන් භවය ඇතිකල ජාතිතොම වන්නීද එහෙයින් ජාතිය පැලැටිවක් වැන්න. භවගත් වෘක්ෂයන්ගේ එකානත යෙන් දිරාගොස් ගිලිහීම මෙන් උපන්නාවූ සත්ත්වයන්ගේ අවස්ථයෙන් දිරීමබිඳීම වේද එහෙයින් ජරාමරණය රුක්කඳක් දිරා ගිලිහීම වැන්න. මෙසේ උපමාවලින්ද භවචක්‍රය සවිසතරවැ දත යුතුය.

තවද භාග්‍යවතුන් වහන්සේ මිසින් පටිච්චසමුප්පාදය අතීත වශයෙන්ද ධර්මවශයෙන්ද දෙශනාකිරීම් වශයෙන්ද ප්‍රතිවෙධය කිරීම්වශයෙන්ද ගැඹුරුබැව් දක්වනු සඳහා "ගම්භීරොවායං ආනන්ද පටිච්චසමුප්පාදෝ, ගම්භීරාවභාසෝ" යන්නෙන් ආනන්දය, මේ පටිච්චසමුප්පාදයතෙම පථවීතලයක් අද්දර පිහිටි තෘණ පණ්ඩාදියෙන් වැසී නොගැඹුරුවුවද ගැඹුරුබව දක්වන්නාවූ දියකනින් තක්මෙන් නොවැ මහමෙර පත්ල පිහිටි මහාසමුද්‍රයමෙන් ඉතා ගැඹුරුවන්නේ මතුනොවෙහි ගැඹුරුවම ප්‍රකාශවන්නේය.

එසි අතීගම්භීර භාවය කෙසේද ? ජාතිය ප්‍රත්‍යයවීමෙන් ජරා මරණය නොවන්නේ නොවේදැයි සැකයක් ඇතිකල ජාතිය ප්‍රත්‍යය වීමෙන් ජරාමරණය වන්නේමය යන අර්ථයද ජාතියෙන් වෙන්වැ අන්හෙතුවකින් ජරාමරණය නොවන්නේදැයි සැකයක් ඇතිකළ ජාතියෙන් වෙන්ව අන්හෙතුවකින් ජරා මරණය නොවන්නේය යන අර්ථයද පහළවන්නේය. මෙයාකාරයෙන් මතු මත්තෙහි වෙළි

වෙළීඝන්නාවූ අඥාරාශියකින් අවබොධයට පහසුනොවන කාරණයෙන් සියළු භවචක්‍රයෙහි දුක්වූපදයක් පාසා (විද්‍යමානවූ ප්‍රත්‍යය සම්භූතාථී සමුදාගතාථී තථාථී අවිතථාථී අනන්‍යථාථී වශයෙන්) ඉතා ගැඹුරුමය.

"හෙතුඵලලක්ඛණං අට්ඨපටිසම්භිදා" යි වදාළ වචනයෙන් හෙතුඵලයෙහි පැවැති ලක්ෂණය අථී ප්‍රතිසම්භිදානම්වේ. "අට්ඨ පටිසම්භිදා" යන මේ වචනයෙන් අථීයාගේ හෙතුඵලභාවය කෙසේ දතයුතුද "අට්ඨපටිසම්භිදා" යනාමේ සමාස පදයාගේ අවයව පදථී දක්වන්නහු විසින් "හෙතුඵලලක්ඛණං" යන් නෙන් හෙතුඵලයෙහි පැවැති ත්‍රුවණයයි වදාලබැවින් දතයුතුය. තවද "අට්ඨපටිසම්භිදා අට්ඨපටිසම්භිදා" යනමේ සමාස පදයෙහි අථීදක්වන්නහු විසින් "අට්ඨහිහෙතුඵලේ" යි අථීයෙහි නම් හෙතුඵලයෙහිනි කියාද "පටිසම්භිදානිලක්ඛණං" යි ප්‍රතිසම්භිදාව නම් ලක්ෂණයයි කියාද අථීදක්වනලදී. එහෙයින් හෙතුඵලය කීවන් අථීයකීවත් සමානාථීයි. ලක්ෂණය කීවන් ප්‍රතිසම්භිදාවය කීවත් සමානාථීයි. මේ කාරණය හෙණහැර දක්වන්නහු විසින් අථී යාගේ හෙතුඵලභාවය සිඛකරණලදය.

"හෙතුඛන්ධිලක්ඛණං ධම්මපටිසම්භිදා" යි වදාළ වචනයෙන් සවභාව ධර්මයෝ වනාහී ප්‍රත්‍යයන්ගේ හෙතූන්ගේ හෙතස් ආකාරවලින් සිදුව පවත්නා නොයෙක් හෙතස්ගති ඇත්තාහුමය. (ඒ හෙතස්බැව් සියළු ආකාරයෙන් වැටහීම සම්ඵලයන්වහන්සේගේ ලක්ෂණයටම සාධාරණවේ. එහෙයින් වදාළසේක. "සබ්බධම්මා සබ්බාකාරෙන බුඛලක්ඛණාහිඥාය ලක්ඛණමුඛේ ආපාථමනවස්සන්ති" යි. එබඳුවූ යම් ප්‍රවෘත්තිආකාරයකින් අවස්ථා විශෙෂයකට හෙවත් හෙතස් ආකාරයකට පැමිණි අවිද්‍යාව වනාහී නොමෝ අවස්ථා විශෙෂයකට හෙවත් ආකාරවිශෙෂයකට පැමිණි කාරණයෙන් ඒ ඒ කෘත්‍යයකරන්ට සමර්ථවූවා එසේම අවිස්ථාවිශෙෂයකට පැමිණි හෙවත් හෙතස් හෙතස් ආකාරවලට පැමිණි ඒ ඒ සංස්කාරයන්ට උපකාරවන්නීද එ ස් අවිද්‍යාහෙතුවෙන් සංස්කාරයන්ගේද සංස්කාර හෙතුවෙන් විඤ්ඤාණයාගේද - පෙ—ජාතිහෙතුවෙන් ජරාමරණයා ගේද පැවැත්මට කාරණවූ ප්‍රස්ථානප්‍රකරණාගත ප්‍රත්‍යයන් පිළිබඳවූ ආකාර විශෙෂයන් කියනලදී ප්‍රත්‍යයාථීය පෙරපුණ්‍යවාසනාගුණ නැත්තවුන් විසින් අවබොධකරගත නොහෙන හෙයින් නොලැබිය හැකි පිණිට ආත්තේයි. සවභාව ධර්මයන්ගේ ප්‍රත්‍යයාථීය තෙරුම් ගන්නාවූ ලක්ෂණය ධර්මප්‍රති සම්භිදානම්වේ. "හෙතුඛන්ධිලක්ඛණං ධම්ම පටිසම්භිදා" යන්නෙහි අථී දක්වන්නාවූ තැන හෙතුවත් ධර්මයන්

සම්‍යාංශී බවත් යුගුණයක් ප්‍රතිසමහිදුවත් සම්‍යාංශී බවත් දක්වනලදි මෙසි විසතාරකළ අත්දම්න් අර්ථප්‍රතිසමහිදු ධම්ප්‍රතිසමහිදු වශයෙන්ද ගැඹුරුවන හෙයින් පටිච්චසමුප්පාදයෙහි අර්ථගම්භීරත්ව යද ධම්මගම්භීරත්වයද ඇත්තේය.

තවද මේ පටිච්චසමුප්පාදය ඒ ඒ පුද්ගලයන්ට වැටහෙන අකාරයෙන් හෙතුඵලධම්මයන් ගැළපෙනසේ ධම්මසභාවරීතිය නොවෙනස්කොට ඇතිසැටි පැවැත්වියයුතු බැවින් දෙශනා කිරීමද පහසු නොවන හෙයින් ඉතා ගැඹුරු වන්නේය. **"නහි සබ්බඤ්ඤුතඤ්ඤාණඤ්ඤා අඤ්ඤං ඤාණං පතිඛංලභති"** යි කී හෙයින් සර්ව්ඥතාඥානය හැර අන්‍යඥාණක් ඒ පටිච්චසමුප්පාදය විස්තර කිරීමෙහි පිහිටක් නොලබාගසි දතයුතු. ඒ එසේමැසි. මේ පටිච්චසමුප්පාදය කිසිතැනෙක්හි අනුලෝම වශයෙන්ද කිසිතැනෙක්හි ප්‍රතිලෝම වශයෙන්ද කිසිතැනෙක්හි අනුලෝම ප්‍රතිලෝම වශයෙන්ද කිසිතැනෙක්හි මැදපවත් අනුලෝම වශයෙන් හෝ ප්‍රතිලෝම වශයෙන්ද කිසිතැනෙක්හි ත්‍රිසන්ධි චතුඃසඞ්ඛ්‍යප යුක්තකොටද කිසිතැනෙක්හි විසන්ධිත්‍රිසඞ්ඛ්‍යප යුක්තකොටද කිසිතැනෙක්හි එකසන්ධිවිසඞ්ඛ්‍යපයුක්තකොටද දෙශනා කරණලදය. එහෙයින් මේ භවචක්‍රය දෙශනාගම්භීරත්වයෙන් යුක්තමැසි.

මෙසි ප්‍රතිවෙධගම්භීරත්වය කෙසේද? යම් හෙයකින් අවිද්‍යාවගේ නුවණට විපක්ෂවූ අඥාන (අනුවණ) අර්ථයද අරමුණ ප්‍රත්‍යක්ෂ වශයෙන් දැකීමට ප්‍රතිපක්ෂවූ අදර්ශනාර්ථයද දුඃඛසත්‍යාදීන් ඇතිසැටි ප්‍රතිවෙධයකරන්ට නොදී වසාදමා මුවාකොට සිටිනා අඥාප්‍රතිවෙධාර්ථයද ගැඹුරුය. එසේම සංඛාරයන්ගේ අභිසංඛාරාර්ථී ආයූහනාර්ථී සාරාර්ථී විරාගාර්ථියෝද විඤ්ඤාණයාගේ ගුන්‍යතාර්ථී අව්‍යාපාරාර්ථී අසංක්‍රමණාර්ථී ප්‍රතිසන්ධිප්‍රාදුර්භාවාර්ථියෝද නාමරූපයාගේ එකොතපාදාර්ථී විනිර්භොගාර්ථී අවිනිර්භොගාර්ථී නමනාර්ථී රූපපණාර්ථියෝද සළායතනයාගේ අධිපත්‍යාර්ථී ලොකාර්ථී වාරාර්ථී ඛෙත්‍රාර්ථී විඤ්ඤාණභාවාර්ථියෝද ඵස්සයාගේ ඵුසනාර්ථී සඞ්ඝර්ෂණාර්ථී සඞ්ගතාර්ථී සන්නිපාතාර්ථියෝද වෙදනාවගේ ආලම්බනරසානුභවනාර්ථී සුඛාර්ථී දුඃඛාර්ථී මධ්‍යස්ථභාවාර්ථී නිර්ජීවාර්ථී වෙදනාර්ථියෝද තෘෂ්ණාවගේ අනිත්තඥනාර්ථී අපෙක්ඛාසනාර්ථී සරිතාර්ථී ලතාර්ථී නද්‍යාර්ථී තෘෂ්ණාර්ථී සමුද්‍රාර්ථී දුෂ්පූරාර්ථියෝද උපාදානයාගේ ආදානාර්ථී ගහණාර්ථී ඛණ්ඩනාර්ථී පරාමාසාර්ථී දුරතික්‍රමාර්ථියෝද භවයාගේ ආයූහනාර්ථී අභිසංඛාරාර්ථී යොනිගතිසත්ත්වාවාසයන්හි ප්‍රක්ෂේපනාර්ථියෝද ජාතියගේ ජනනාර්ථී සංජාත්‍යර්ථී අවක්‍රාන්තාර්ථී ව්‍යක්තාර්ථී ඛෙදාර්ථී විපරිණාමාර්ථියෝද ගැඹුරුවෙන්නුසි. පටිච්චසමුප්පාදය ප්‍රතිවෙධගම්භීරභාවයෙන් යුක්ත වේ.

නය හෙදවශයෙන් කෙසේද?

මෙහි එකත්තනය නානත්තනය අබ්‍යපාරනය ධම්මතානය වශයෙන් අටිනය සතරෙකි. එහි අවිද්‍යාවෙන් සංසකාරයෝද සංසකාරයෙන් විඤ්ඤාණයදැයි මෙපරිද්දෙන් පිළිවෙල නොසිද බීජයාගේ අඹයුර පත්‍රනාලසකඛ සාඛාපල්ලව පරිණත පත්‍රාදි භාවයෙන් වෘක්ෂභාවයට පැමිණීම මෙන් පෙළසැදී පැවැත්ම එකත්තනය නම්වේ. මේ එකත්තනය මනාකොට දක්නා තැනැත්තේ හෙතුඵලසම්බන්ධ වශයෙන් සියළු සකඛාරගතන ධාතු ධම්මයන්ගේ පිළිවෙල නොවෙනස්ව පවත්නා බැව් අවබොධ කිරීමෙන් උච්ඡේද දෘෂ්ටිය පියන්නේය. මේ එකත්තනය වරදවා දක්නා තැනැත්තේ හෙතුඵලසම්බන්ධ වශයෙන් පවත්නාවූ සකඛාරගතන ධාතුධම් පරම්පරාවගේ වෙනස් බැව් නොවිමසා හෙවත් හෙතුව එකෙක ඵලය අනිකෙකැයි කල්පනා නොකොට දෙකම එකක්මෙන් භාරගැණීමෙන් ශාස්වත දෘෂ්ටිය උපදවා ගන්නේයයි දතයුතු. අවිද්‍යාදීවූ හෙතුඵලධම්මයන්ගේ වෙනස්බව හෙවත් හෙතුහුගේ ලක්ෂණාදිය හා ඵලයාගේ ලක්ෂණාදිය සෑම අතින්ම වෙනස්බව අවබොධකර ගැණීම නානත්තනයනම්. මේ නානත්තනය මනාකොට දත් තැනැත්තේ අභිනව අභිනවවූ හෙතුඵලධම්මයන්ගේ හටගැණීම දක්නා හෙයින් ශාශ්වත දෘෂ්ටිය පියන්නේය. මේ නානත්තනය වරදවා දක්නා තැනැත්තේ එක් පරම්පරාවක්ව පැවති හෙතුඵලධම්ී සමූහය හෙතුව අනිකෙක ඵලය අනිකෙක එහෙයින් හෙතුව ඵලය හා සම්බන්ධයෙක් නැත. ඵලය හෙතුව හා සම්බන්ධයෙක් නැතැයි හිඳනාවූවන් වෙන් වෙන්වූවන් කොට සැලකීමෙන් හෙවත් අනිකෙක් මළේය අනිකෙක් උපන්නේය. මළාවූ සත්වතෙම එසින්ම සුන්ව ගියේය. උපන් සත්වතෙම අනිකෙක්මයයි සැලකීමෙන් උච්ඡේදදෘෂ්ටිය ගන්නේයයි දතයුතු.

අවිද්‍යාගේ වනාහි මා විසින් සංසකාරයෝ ඉපිදවිය යුත්තාහ කියාද සංසකාරයන්ගේ අප විසින් විඤ්ඤාණය ඉපිදවිය යුතුයයි කියාද කිසි ඕනෑකමක්වත් උත්සාහයක්වත් නැත. මෙසේ හෙතු ඵලධම්මයන්ගේ ඔවුනොවුන් නිරුත්සාහීව පැවැත්ම අබ්‍යාපාරනය නම්වේ. මේ අව්‍යාපාරනය මනාකොට දත් තැනැත්තේ කරන්නෙකු මවන්නෙකු නැතැයි වටහාගැණීමෙන් ආත්මදෘෂ්ටිය පියන්නේය. මේ අබ්‍යාපාරනය වරදවා දක්නා තැනැත්තේ හෙතුඵලධම්මයන්ගේ උනන්දුවක් උත්සාහබවක් අවිද්‍යමාන කල්හිදු සසම්භාරවූ නින්න බෝවනකල්හි උඩුඅතට හැසිරන්නාක් මෙන්ද සසම්භාර දාතය හරහට හමන්නාක්මෙන්ද සභාව ධම්

ශක්තිවශයෙන්ම හෙතුවනබව සිඹ තමුදු ඒ නොසලකා කර්‍ම භූතවූ කිසියම් හෙතුඑක් නැතැයි සැලකීමෙන් අක්‍රියා දෘෂ්ටි ගන්නේය.

කිරෙන්මුත් වතුරෙන් දී නොලැබෙන්නාක්මෙන්ද තලවලින් මුත් වැල්ලෙන් තලතෙල් නොලැබෙන්නාක්මෙන්ද අවිද්‍යාදි හෙතූන්ගෙන් මුත් ඉන්පිටින් අන්කිසිවකින් සංඝකාරාදීන්ගේ ලැබීම නොවන්නේයයි යනමේ නීතිය ධම්මතානය නම්. මේ ධම්මතානය මනාකොට දත් තැනැත්තේ ඒ ඒ ප්‍රත්‍යයන්ට සුදුසු පරිද්දෙන් උපදනා ඵලය අවබොධකරගැණීමෙන් අහෙතුක දෘෂ්ටියද අක්‍රියා දෘෂ්ටියද දුරුකරන්නේය. මේ ධම්මතානය වරදවා දත් තැනැත්තත් ප්‍රත්‍යයන්ට අනුරූපාකාරයෙන් ඵලයන්ගේ පැවැත්ම නොදුන ඉදින් අනිකක්හු කෙරෙන් අනිකකුගේ උත්පත්තිය වේනම් හෙවත් හෙතුවෙන් උපදනා ඵලය හෙතුවට වඩා වෙනස් වේනම් කවරහෙයින් වැල්ලෙන් තෙල්නුපදනේද උක්‍රස යයන් කිරිහට නොගනීදැයි සලකා කිසිවක් කිසිවකට හේතු නොවේයයි වටහාගණ අහෙතුක දෘෂ්ටියද නියතවාද දෘෂ්ටියද ගන්නේයයි දතයුතුය.

මේ සංසාරචක්‍රයයි කියනලද පටිච්චසමුප්පාදය වනාහී ඉතා ගැඹුරු හෙයින් පන්ලනොදුක්ක හැක්කේය. නොයෙක් නයක්‍රම යෙන් ගැවසීගත් හෙයින් ප්‍රවෙශවීමට නොහැක්කේය. සමාධි නමැති උතුම් සණගලෙහි ගා මුවහත් තබනලද ප්‍රඥානමැති ආයුධ යෙන් අසනිවක්‍රාඝක්මෙන් උරවක්‍රමාලයක්මෙන් නිත්‍යයෙන් දුක් දීමෙන් මඩින්නාවූ මේ භවචක්‍රය පලාතොපියා සංසාර නීතිය ඉක්මවූ කිසිවකුගේ නීනෙන්වත් පැවැත්මෙක් නැත්තේමය. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ විසින් වදාරණලදී.

**"ගම්භීරෝවායං ආනන්ද පටිච්චසමුප්පාදෝ, ගම්භීරාවභාසෝ ච එතස්සධම්මස්ස අඤ්ඤාණා අනනුබෝධා එවමයං පජා තන්තාකුලකජාතා කුලාගුණ්ඨිකජාතා මුඤ්ජබබ්බජභූතා අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතිවත්තති".**

ආනන්ද, ආනන්දයෙනි; අයංපටිච්චසමුප්පාදෝ, මේ පටිච්ච සමුප්පාදයතෙම; ගම්භීරෝ, ගැඹුරුය; ගම්භීරාවභාසෝ, ගැඹුරු කාරණයෙන්ම පතුරුදුක්ඵට දුෂ්කරය; ආනන්ද, ආනන්දයෙනි; එතස්සධම්මස්ස, මේ පටිච්චසමුප්පාද ධර්‍මය; අඤ්ඤාණා, නොදැනීම් හෙතුවෙන්ද; අනනුබෝධා, අවබොධනොකළ කාරණයෙන්ද;

එවං, මේ දෙයාකාරයෙන්; අයංපජා, මේ සත්ත්වප්‍රජාතොමෝ; තන්තා කුලකජාතා, ගුවැටියක්සේ අවුල්වූවා; කුලාගුණ්ඩිකජාතා, පක්ෂී කැදැල්ලක්මෙන් ආකුලව්‍යාකුලවූවා; මුඤ්ජබබ්බජභූතා මුදුතණ, බබුස්තණමෙන් ආකුලව්‍යාකුලවූවා; දුග්ගතිං, දුකවපිළිසරණවූ; විනිපාතං, විශෙෂයෙන්දුක්හිමිඇති; අපායං, සතරඅපායද; සංසාරං, සංසාරයද; නාතිවත්තති, නොඉක්ම වන්නේය.

ගම්භීරප්පවිසාකාරප්පභෙදෙ ඉධපණ්ඩිතෝ
යථාගාධං ලභෙථෙව මනුඤ්ඤෙඳ්‍ය සදාසතෝ.

—o—

## ප්‍රතීත්‍යසමුත්පාද ධර්මවිභාගය නිමි.

---

ඉතිප්‍රබන්ධ ශිරොමණී නාම ජිනවංශදීප මාගධී මහාකාව්‍ය කර්‍ත්‍රා
සද්ධර්ම මෙධානන්දාභිධාන යතීන්ද්‍රෙන නිර්මිතෙ
පරමාර්ථ ධර්මකරණ්ඩෙ
ප්‍රණීතාභිමුක්තිකානාමතෘතීයකරණ්ඩකරඃ
ප්‍රථමොභාගඃ.

# පරමාර්ථ ධර්ම මකරන්දය

## ගැටපද විවරණය

# පරමාභිධම්මකරණ්ඩයේ

# ගැටපදවිවරණය.

---

ආභිධම්මික

මොරවුවේ

මෙධානන්ද සවාමිපාදයන්වහන්සේගෙන්

ලබනලද ගුරුපදෙශ ඇතිව

රුවතාවත්තේ පරමාභිධර්ප්‍රකාශිනී සමිතියේ ලේකම්තැන්පත්

බී. දෙන් තෝමස්

විසින්

සංශොධිත සමිතියේ නියමයපිට සම්පාදනයකරණලදි.

# පරමාර්ථධම්මකරණ්ඩයෙහි
# ගැටපදවිවරණය.

## 1. ගාථාව.

නිස්සෙසස සත්ත විසයෙ, අතන්තා පරිමාණ හාජන ලොකධාතු වෙහි පරිභ්‍රමණය වන්නාවූ අනාභන්තාපර්‍යන්න සත්වලොකයා විෂයෙහි; යස්ස, යම් බුදුවරයෙකුගේ; කරුණාඉව, පර දුඃඛයෙහි හෘදය කම්පිතවන ආකාරයෙන් හෝ මහා කරුණා සමාපත්තිවශයෙන් හෝ පැවැති කරුණාචමෙන්; සබ්බධමෙම, සංඝාර විකාර ලක්ෂණ නිර්‍වාණ ප්‍රඥප්ති සංඛ්‍යාත පඤ්ච ඥෙයමණ්ඩලයෙහි; යස්ස, යම් බුදුවරයෙකුගේ; නිස්සඞ්ඝක්ෂුණඟති, ජීර්ණපත්‍රපුටයෙහි තප්ත නාරාචයමෙන් නොපැකිළ පවත්නා ප්‍රඥාගතිතොමෝ; වත්තති, ආවර්ජනා ප්‍රතිබඳව පවතීද; අරහාදි ගුණාකරස්ස, ඉතිපිසො භගවා යන්නාදීන් දක්වනලද අරහාදි නවවිධවූ බුඩ ගුණයන්ට උත්පත්තිස්ථානවූ; තස්සබුඩස්ස, පරොපදෙශ විරහිතව චතුස්සත්‍ය ධර්මයන් දැන වදාළාවූ ඒ බුදුරජාණන්වහන්සේගේ වාසයට; මයහං, පරමාර්ථ ධම්මකරණ්ඩ ග්‍රන්ථ කර්‍තෘවූ මාගේ; මනං, භක්ති ශ්‍රඛාදීන් යුත් චිත්තඝන්‍යතායෙ; සුරභිගන්ධකුටිඃව, සුවඳ ගඳකිළි යක්මෙන්; හොතං, වේවා.

## 2. ගාථාව.

පරමත්ථපකාසිනීති විඛ්‍යාත සොභනසභාය, මොරවුවේ රාවතා වත්තේ පිහිටුවනලද "පරමාර්ථප්‍රකාශිනී" යන නාමයෙන් ප්‍රසිඛවූ බෞඛ සමිතිය විසින්; අපේක්ඛසිතෙන, ලාංකික මහජනයා කෙරෙහි පැවති මෛත්‍රීකරුණා පූර්‍වික නිර්ලාඛ්‍යාශයෙන් අරාධනා කරනලද්දාවූ; ධම්මගරුනා, ධර්මයට ගරුකිරීම්ඇති; ජිනවංසදීප කාරෙන, ප්‍රබන්ධශිරොමණි නම්ලද ජිනවංශදීප මහාකාව්‍යයෙහි කර්‍තෘවූ; මම, (පාණ්ඩුරේ වැලිපිටියේ අභයකරුණරතනාරාමාධිපතීවූ මොරවුවේ මෙධානන්ද සථවිරවන) මාවිසින්; රව්වාසරෙසු, රවි දිනයන්හි; සුනිපුණා, අති සුක්ෂ්මවූ; යාදෙසනා, සර්‍වඥයන්වහන්සේගේ පරමාර්ථධර්මය පිළිබඳ යම් ධර්මදෙශනාවක්; පරමත්ථපකා සිනීති විඛ්‍යාත සොභනසභාය, "පරමාර්ථප්‍රකාශිනී" නම්ලද බෞඛ සමිතියෙහි; විභාවිතා, ප්‍රකාශකරනලද්දීද

## 3. ගාථාව.

සරසඞ්ගුර මධු මධුරං, නිසගී සිඔරසයෙන් මිකිරි මධු පවල යක් මෙන් ධම්මාමිරසයෙන් මිකිරිවූ; පරමං, විශිෂ්ටවූ; තංපරමත්ථ ධම්ම මකරන්දං, ප්‍රකෘෂ්ට ශූනයට විෂයවූ ධර්මයයි කියනලද නොහොත් අවිපරිතාර්ථ ධම්මයක් කියනලද ඒ පරමාර්ථ ධම් නැමති මධුරසය; හොත්තෝ, පින්වත් සත්පුරුෂයෝ; සුණඤ්ජලිනා, නුවණ නැමති දෙහොතින් ගෙණ; නිපීය, පානයෙහොට; අජරාමර සුඛභාගී, ජරා මරණ රහිතවූ නිර්වාණ සෞඛ්‍යයට කොටස්කාරයෝ; භවන්තු, වෙත්වා.

## 1 වෙනි පිට.

ඉන්ද්‍රියබඞ්ධ-ඇස් කන් නාස් ආදී ඉඳුරන් පිළිබඳවූ (ප්‍රාණවත් දේ පිළිබඳවූ) (වූ

අනින්ද්‍රියබඞ්ධ-අප්‍රාණික දේ පිළිබඳ

ධාතුකාය-ධාතු ශරීරය, ධාතු සමූහය

ව්‍ප්‍රකාරවේ-දෙයාකාරවේ.

වෘක්ෂලතා-ගස්වැල්

වහති-ගිනි

නිත්‍ය-නිතර පැවැත්ම

ධ්‍රුව-ඒකාන්තයෙන් පැවැත්ම

ශාශ්වත-සදාකාලිකව පැවැත්ම

ආත්ම-තෙමේය

ආත්මීය-තමාසන්තක

වේදක-විඳින තැනැත්තා

කාරක-කරන්නා, මවන්නා

විරහිත භාවයෙන්ද-නැති බැවින්ද

## 2 වෙනි පිට.

සංඛ්‍යාතවූ-කියනලද්දාවූ

නිරශ්චින-නිරිසන් (යක්

අසුර-එනම් දුගතියෙකි සත්වයෝ

නෙරයික-නිරිසතුන්

ප්‍රභෙද-වෙනස්බැව් (ණීම

අවබෝධකරගැණීම-තේරුම් නැ

අත්‍යන්තෝපකාරිවන-බොහෝ සෙයින් උපකාරවන

ශරීර ශෛලාවයව-ශරීර යෙහි තදගතිය ඇති ද්‍රව්‍ය

ශරීරාග්නීහු-ශරීරගත ගිනි

සිවුරැස්-හතරැස්

මුහුකුරුවන-මෝරුන

අතුනු-බඩවැල් [ඇවිය

අතුනුබඳන්-බඩවැල වෙලාසිවි

නිසඇති-ක්‍රියාකිරීම්ඇති

ද්‍රව-දියාරු

සඳම්දුළු-අත් පා ආදින් පිළිබඳ සන්ධි සථානයන්ගේ ක්‍රියා කිරීමට ආධාරවූ තෙල්වැනි කුණප කොටසක්

අග්නි අවයවවූ-ගිනි කොටස්වූ

ශීතජ්වර-ගැහෙනඋණ (රොග

උෂ්ණජ්වර-සන්නිපාතාදීවූ උණ

සන්තාපන-බොහොසෙයින් තව

මිහිකිරීමෙන්-මේරීමෙන් [න

විකලබව-විකාරබව

ජීරණ-දිරවන සුළු

පුටපාකයක්සේ-කඩවැස්ම බැඳ තම්බන්නාක් මෙන් නොහොත් රසගාසනු ක්‍රමයෙන් බෙහෙත් පිලිස්සීමක්සේ

දහන-දවන්නාවූ

## 3 වෙනි පිට.

පාවක-පැසවන, පුළුස්සවන
උඩංගම-උඩුකුරුවූ, උඩට ගමන් කරන
අධොගම-යටිකුරුවූ. පහතට ගමන්කරන
කුවජ්ජිසය-කුසතුල පිහිටි
කොෂ්ඨාශය-බඩවැලතුළ පිහිටි, ආමාශයෙහි පිහිටි
අඞ්ගමඞ්ගානුසාරී-අත් පා ආදි අවයව අනුව ගමන්කරණ
පරමාණුමාත්‍රවූ-අතිශයින් සියුම් වූ, ඇසට නොපෙණෙනතරම් සියුම්වූ
රජස්-දූලි රෙන්
නාසිකාඡ්ඩ්‍රයෙන්-නාශාපෙකිසිදු
ධාත්වාවයව-ධාතු කොටස්
චෛතසික-හිත සමග පවත්නා සුළු, වෙදනා සංඥාදීවූ අදව්‍ය ධර්ම පණස්දෙදෙනා
එක්අයුරක්-එක් ආකාරයක්
වාතුර්භූමිකා-කාම, රූප, අරූප ලෝකොත්තර යන භූමි සතර ට ඇතුළත්
කාමාවචරසිත්-කාම තෘෂ්ණාව සමග එකට ඉපදීම්වශයෙන් හෝ කාමතෘෂ්ණාව රැකුල් දීම්වශයෙන් හෝ පවත්නා සිත්
සුපණසෙක්-පණස් සතරක්
රූපාවචරසිත්-රූප තෘෂ්ණාව අනුබල දීමෙන් (රැකුල් දීමෙන්) පවත්නා සිත්
ලොකොත්තර සිත්-පඤ්චස්කන්ධයයි කියනලද ලෝකයෙන් එතරවූ සිත්
යථාක්‍රමයෙන්-පිළිවෙලින්
ලෝභ සහගත-ලෝභය සමග පවත්නා
දෙෂසහගත-වෛෂය (ක්‍රෝධය) සමග පවත්නා
මෝහ සහගත-මුලාබව (මෝඩකම්) සමග පවත්නා

## 4 වෙනි පිට.

ඉෂ්ටානිෂ්ට-යහපත් අයහපත්
දර්ශනය-දැකීම
ශ්‍රවණය-ඇසීම
ආඝ්‍රාණය-ගඳ සුවඳ සිඹ බැලීම
රසාස්වාදය-රසබැලීම
පහස-ස්පර්ශය
රූපාදි අරමුණුපස-රූපය, ශබ්දය, ගන්ධය,රසය, ස්පර්ශයන පස
නීරණකරන්නාවූ-විභාග කරන්නාවූ
පඤ්චද්වාරයෙහි-ඇස, කන, නාසය, දිව, ශරීරය, යන දොරවල් පසෙහි
ගැටුණුකළ-වැදුනුකළ
ආවර්ජනාකරන්නාවූ-මෙනෙහි කරන්නාවූ
අට්ඨවිධඅරමුණු-රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම යන අරමුණු අටදෙන
සෘජුමගට-ඇද නැති මාර්ගයට (ශීල, සමාධි, භාවනා ක්‍රම යෙන් නුවණ දියුණුකර ගැනීම)
ජනිත-උපන්
ප්‍රතිසන්ධි-පිළිසිඳගැනීම්, සම්භවය ක මුලින් හටගැනීම

භවාඞ්ග-ඒ ඒ භවයෙහි පිළිසිඳ ගත්තැන් පටන් මරණය දක්වා විපාකචිත්තවශයෙන් නොකඩව පැවැත්ම

චුති-මරණය, හෙවත් ඒඒ භවයෙහි අවසාන සිත

ප්‍රතිසන්ධිභවාංගචුති-ඉපදීම, පැවැත්ම, මරණය

රූපසමාපත්තීන් සමවදනා කාලයෙහි-ප්‍රථම, ද්විතීය, තෘතීය, චතුර්ථ පඤ්ච ක්‍රියාධ්‍යාන යන්ට සමවදනා(පැමිණෙන සනා) කාලයෙහි (න්ති

අරූසමවත්-අරූපාවචර සමාප

## 5 වෙනි පිට.

සඤ්ඤා-සඤඤන්, හැඳිනුරුකම්

අදස්සනමාන-දක්කනොහැකි

අද්‍රව්‍යයභ-ද්‍රව්‍යනොවන්නාහ

චෙතස්සවරූපහයි-චෙතස්සවභාව ඇත්තාහයි.

ආසන්නන සමීප

ලාමකධම්මාවරණය-නීච ධර්මයෙහි හැසිරීම (ණිම

ලබ්ධිගැණීම-වරදවා තේරුම්ගැනෙඅඟින්-අංග තුණකින්

දෞම්නස්වීම-අසතුටුවීම

උදාසීනවීම-මධ්‍යස්ථවීම

## 6 වෙනි පිට.

ච්‍ාදස-දෙළෙස්

ඉමකීනයින්-මෙකී ක්‍රමයෙන්

බිඳුමාත්‍රයකින් ඉතා සුළුප්‍රවශයෙන්

චක්ඛුරාදි වසතුරූප-ඇස කණ නාසය දිව ශරීරය හෘදය වස්තු යන සදෙනා

ඉදිරිපසුනොවී-එහාමෙහානොදී, එකවර

භින්නව-චෙනස්ව

## 7 වෙනි පිට.

විෂයවු-අරමුණුවු

සොම්නස් ආකාරයෙන්-සතුටු ආකාරයෙන් [න්

සුඛාකාරයෙන්-සැප ආකාරයෙ

එක දෙශයකින්-එක් කොටසකින්

සාතිශයෙන්-සියළු ආකාරයෙන් අධිකවශයෙන්

## 8 වෙනි පිට.

වඩසකී-ඉඩුවෝ

භවාන්තරයට-ආසන්න ආත්ම භාවයට

කුම්භකළ-නොමේරූ, ලපවී

අඟපසඟ නිමිතිවශයෙන්-ශරීරාවයව සවහන් වශයෙන්

ඉනඤ්ඤිමකිසඳ-ඉගණිම්කෘත්‍යයද

පැමිණිභාරය-පැමිණි කටයුත්ත

ව්‍යාවෘතචන්නාසේ-යෙදෙන්නාසේ

## 9 වෙනි පිට.

චිත්තානුවත්තීනකවැ-සිතට අනුව

පහස්නා-හැපෙන (පැවත

නිදර්ශනයක්-උදාහරණයක්

රශ්කලඹ-රශ්මි සමූහය

චිත්තායතන ප්‍රවෘත්ති-සිත පිළිබඳව පැවති

පුදීපාලොකයද--පහන් එලියද
භාධෙත්ති--උදහරණ්නි
ආරම්මණසම්පාදක-අරමුණුඉෂ්ට කරදෙන්නාවූ
චිත්තසම්පාදක-චිත්තවීථි සපයා දෙන්නාවූ
ජවන සම්පාදක-ජවන්සින් සපයාදෙන්නාවූ
තදුභයමනසිකාරයෝ-ඒ දෙයාකාර මනසිකාර චෛතසිකයෝ

## 10 වෙනි පිට.

අයොනිසොමනසිකාරය-නුවණින් මෙනෙහිකිරීම
අයොනිසො මනසිකාරය--අනුවණින් මෙනෙහිකිරීම
රිත්තදුරා-රථය පදින්නා
ථාමජව සම්පන්නා--ශක්තියෙන් වෙගයෙන් යුත්
අතිමහන්ත-ඇස්, කන් නාස් ආදී දෙරටුපසට හමුවන බලවත් අරමුණු, දැඩිවශයෙ ඕනෑකම්ඇති අරමුණු
මහන්ත-එම දෙරටු පසට හමුවන සාමාන්‍ය අරමුණු
පරිත්ත-බලාපොරොත්තුවක්නැති අරමුණු.
විභූත-සිතට පමණක් (මනොවාරයට) වැටහෙන ප්‍රකට අරමුණු
අවිභූත-සිතට පමණක් වැටහෙහෙන අප්‍රකට අරමුණු
උල්ලුඛ්සනය නොකොට--නොඉක්මවා
එරුසාකාරයෙන්-රළු අන්දමින්
මෙහෙයන්නාසේ--යොදවන්නාසේ
කුහරගත-සිදුරුතුළ පිහිටි
තහවුරුව-සථිරව
සඛන්ධපරිනිම්මාණය-රහතුන් පිළිබඳ රූපාදි සඛන්ධයන්ගේ පිරිනිවීම
හුණුවාවු-වැටුනාවූ
ඔදාරික සණ්ඨාරුවය-මහත්වූ සිනුහඩ
සුඛුම අනුරුවය-සියුම් හඩ
භාඛාගයාගේ-මිනිස්සුගේ
පරිභ්‍රමණය-කරකැවීම
සඛබමචා-ඉරාදයකරකවා
කුඹලාගේ-මැටි භාජන සාදන්නාගේ (චෙන
අවට සිසාරාගන-වටේට කරකැ
සනිට්ඨහන්-නිශ්චයකිරීම
ගල්ටැඹක්සේ-ගල්කනුවක්සේ
ජඹහමසථාවරවසතුහු-චංචල නිශ්චල දේ

## 12 වෙනි පිට.

ගිලිහියනොදී-වැටියනොදී
ආරම්මණ භාරොවහනයෙහි--අරමුණු බර ඉසිලීමෙහි
ධාතුසෙෂාහයෙක්වේද-ධාතු කැලැඹීමෙක් වේද
වාජීකරණ-අෂ්ටාංග වෛද්‍යයෙහි සඳහන් ක්‍රමයක්
භසත්‍රාවක්--මසිනහමක්
ඡන්ද-කැමැත්ත

## 13 වෙනි පිට.

බහලාඛකාරයෙන්--ඝනාකාරයෙන්
යුඛතභොයාත්‍රා-යුඩ පිණිස නැනු ආකාශයාත්‍රා

පටුතර-ඉතා මහත්වූ
භයතාසාරයක්මෙන්-අතට ගත් සාර වස්තුවක්මෙන්
නොබා වදින-භයනැතුව පැමිණෙන
අනවස්සිත-සථිරව නොපිහිටි, චපල
පුවරුකඩ-ලැලි කැබල්ල
උපමාසාම්‍යය-උපමාව හා ගැලපීම

## 15 වෙනි පිට.

මේරමෑ-අනුන්ගේ

## 16 වෙනි පිට.

පාප ජුගුපසාකාරයෙන්-පාපයට පිළිකුල් ආකාරයෙන්
පරාධීනවූ-අනුන් අයත්වූ
පිළිගම් කටැටිනොවන්න-බෙහෙත් නොකළහැකි
දුඃසාධ්‍යවූ-සුවකළනොහැකි.

## 17 වෙනි පිට.

සමපකඛින්න-පමුණුවන
පිළිබිඹුන්-සෙවනැල්ලන්
නිඃසත්ව-සත්වනොවූ
නිර්ජීව-ආත්මනොවූ

## 18 වෙනි පිට.

සමෘතිප්‍රතිරූපකවූ-සමානයවැනිවූ
ප්‍රත්‍යුපසථාන-වැටහීම් ලක්ෂණ
පාපොත්‍රාස-පාපයටතැතිගැණීම
පාපභීරුතාව-පාපයට භයවීම

## 19 වෙනි පිට.

දූෂණයකිරීම-කිළිටිකිරීම

## 20 වෙනි පිට.

කායදරථය-මොහාදී සකඛයන්ගේ විඩාව

## 21 වෙනි පිට.

විවෘතනොකෙරෙයි-දිගනැරෙයි | ප්‍රතිපක්ෂයෑ-විරුඬයෑ
කර්මාර්හී-ක්‍රියාවට සුදුසු

## 22 වෙනි පිට.

කුටිලත්වය-ඇදගනිය
මායාසාඛෙය්‍ය-වංචා සඨප්‍රයෝග
ලඝුභාවය-සැහැල්ලුබව
ප්‍රශ්‍රබ්ධිභාවය-විඩා සංසිදුනුබව
සෘඩිවිකුර්ණයන්හි-සෘඩි විශෙෂ දක්වීමෙහි

## 23 වෙනි පිට.

අර්‍ථධර්‍ම ප්‍රතිසංයුක්ත-අර්‍ථයෙන් ධර්‍මයෙන් යුක්ත
විරමණාකාරයෙන්-වෙන්වීම් ආකාරයෙන්
විරති--වෙන්වීම
නිරවද්‍යවූ-වැරදි නැතිවූ
කෘෂිවණික්කර්‍මාදිය-ගොවිතැන් කිරීම් වෙළඳම්කිරීම් ආදිය

ගීයඤ්ඤාදිය-පිණ්ඩපාත කිරීම් ආදිය
උපාදානීයෂු-ඛෙදයුක්කිරීම

ආජීවසුඛිය-පිරිසිදු ජීවිකාව
අඤ්ඤතරකොට-සලකා (දේ
සම්ප්‍රාප්තවසනුව-ඉදිරියටපැමිණි

**24 වෙනි පිට.**

නිස්සීමණාලම්බනිකවෙයි-නිස්සීමණය අරමුණුකරන්නීවෙයි
ව්‍යතික්‍රම්තව්‍ය-ඉක්මවියයුතුවූ
විරමණබබ-වැළකියයුතුවූ
ව්‍යසනප්‍රාපති-විපතට පැමිණීම
අප්‍රමාණසත්වාලම්බනික-අනන්ත සත්වයන් අරමුණුකොට පැවැති (ඥාන්
ප්‍රතිපක්ෂකාරයෙන්-විරුද්ධකාර

විහත විධවංසනයකොට-දුරුහුත කොට; නසාදමා
මහාප්‍රාප්තික-මහත් තෙජසක් ඇති
මහාවිස්තාරවු-මහත් පැනිරීමක් ඇති
කෙලෙශප්‍රහාන කෘත්‍යයෙහි-කෙලෙස් නැසීමෙහි
අග්‍රෙසරව-මුලිකව

**25 වෙනි පිට.**

සවෙතනික-සිතිවිලි සහිත
වර්ණසංස්ථානාදියෙන්-වර්ණ සව

හත් ආදියෙන්
පරිහරණීය-පාවිච්චිකළයුතු

**26 වෙනි පිට.**

ඛෙරි-බෙර
ඝෝෂ ශබ්ද-හෙරවීම්
මූල ප්‍රකෘතිවූ-මුලින් ඇතිවන

සභාවධර්මිවූ
ජීර්ණවිවරකාරයෙන්-සිදුරු, කුහරාකාරයෙන්

**28 වෙනි පිට.**

ආකුලනොවීම-අවුල්නොවීම

**29 වෙනි පිට.**

අස්මුල් විරහිතවැ-අහ මුල නැතිව
ඝනබහළ-ගනබොල්
අදශීනා ඥුනය-අනිත්‍යාදිවශයෙන් දක්නා ඥුවණ

පෘථග්ජන-තෙලෙස් සහිත ජනයන්
කෙලිශවාසනා ශකතිය-කෙලිශයන්ගේ පුරුදුවීමෙන්ඇතිවූ ශකතිය

**30 වෙනි පිට.**

අභ්‍යන්තාරගත-ශරීරය ඇතුළත පිහිටි

**31 වෙනි පිට.**

යථාසවභාව-ඇතිසැටි

**32 වෙනි පිට.**

නිර්මිතවී-මැවී

ධර්මපුඤ්ජයෙහි-ධර්ම සමූහයෙහි

**33 වෙනි පිටු.**

කුසුම් ජාතීන්ගේ-මල්වගීවල | මාංසලොහිතාදී-මස් ලේ ආදි

**35 වෙනි පිටු.**

ශාසෙතලබ්ධි-සදකල් පවත්නේ ය යන ලබ්ධි | නිජකාරණොතපත්ති-ඉබේ ඉපදීම

**36 වෙනි පිට.**

විඤ්ඤාණවිෂයතොවේ-සිතට නොවැටහේ

**37 වෙනි පිටු.**

සාඛාරණ-පොදු | අසාඛාරණ-පොදුනොවූ,
ආසවාදනයකොට-රසවිඳ

**38 වෙනි පිට.**

ගොවාවූ-හමුවූ | ප්‍රතිරූපදෙශ-සුදුසුදෙශ

**39 වෙනි පිට.**

උතපාදක්ෂණය-උපදිනඅවස්ථාව
ස්ථිතික්ෂණය-ඉපිද පවත්නා අවස්ථාව
භංගක්ෂණය-පැවත නිරුඬවන අවස්ථාව

අනන්තරප්‍රත්‍යය-55 වෙනි පිට බලනු.
සමනන්තරප්‍රත්‍යය-55 වෙනි පිට බලනු.
ප්‍රරෙජාතප්‍රත්‍යය-60 වෙනි පිට (බලනු.

**40 වෙනි පිට.**

අනුසාරයෙන්-අනුවහැසිරීමෙන්
හස්තාමලකය-අතට ගත්නෙල්ලි

ගෙඩිය
නිශ්‍රිත-ඇසුරුකළ

**41 වෙනි පිට.**

පටිච්චසමුප්පන්න-නිසාඋපන්නේ | පටිච්චසමුප්පාද-නිසාඋපදවන්නා

**42 වෙනි පිට.**

අඛණ්ඩව්‍යවස්ථාන-අඛණ්ඩ විනිශ්චය කිරීම
න්‍යායානුවෙධාර්ථ-යුක්තිය රැම්මගැණීම

සමන්තභද්‍රනිසාත්-සියළු ආකාරයෙන් යහපත් නිසාත්
නානානයින්-නොයෙක් ආකාරයෙන්

**43 වෙනි පිට.**

සංසාර ප්‍රවෘත්තියට-සංසාරයා ගේ පැවැත්මට
මෙතෙක ජනයන්-නිකම්මිය හැකි ජනයන්
ප්‍රතිලාභයට-ලැබීමට
ප්‍රත්‍යක්ෂ-ඇසට හසුවූ,අත්දුටු

**44 වෙනි පිටි.**

ආශ්‍රමධර්ම-කාමාශ්‍රම, භවාශ්‍රම, දීක්ෂාශ්‍රම, අභිෂේකාශ්‍රම යන ආශ්‍රමධර්ම, ධර්ම මාර්ගයන් ගොතුනුනම් සිතපහළවීම දක්වා භවමාර්ගයෙන් යෙදෙව

සතුසිදු නාසකුසදුගතත නැ ලැබෙන්නාක්මා අතිශයින්වැහෙන් කුසී ආශ්‍රම නම්වේ.

සත්‍යනාථය-විඩාව

**45 වෙනි පිටි.**

ආමරාශු-කෙළුම්රනැති

අණ්ඩජ-බිත්තරය ආධාරකොටම හටගන්නා සත්ත්ව

ජලාබුජ-ගර්භාශය ආධාරකොට හටගන්නා සත්ත්ව

සංසේදජ-දිහසීරුදි ප්‍රදේශ ආශ්‍රය කොට හටගන්නා සත්ත්ව

ඔපපාතික-එකපිම්ම ගියේ ඇතත නැගත්තේ ලැබීමෙන් පහල වන සත්ත්ව

**46 වෙනි පිටි.**

පඤ්චස්කන්ධය-ඇතුළත්වූ

**47 වෙනි පිටි.**

පරිඤ්ඤාධර්ම-කාමාවචරධර්ම

මහග්ගතධර්ම-රූපාවචරධර්ම

**48 වෙනි පිටි.**

ආදිඅන්තමජ්ඣ-ඒදෙයාකාර අර මුණු

ප්‍රගුණකතවශ්‍රුතු බැවින්-දුණුකම ශ්‍රුතු බැවින්

**49 වෙනි පිටි.**

අග්‍රඥවන්-බුදුරජාණන්ගේ ධර්ම අසාබලා දැනගැනීමෙන්

**51 වෙනි පිටි.**

කායවිඤ්ඤත්ති-කයින් ක්‍රියා හටගන්නා කල්හි ඇතිවන්නාවූ ශරීරගත ධාතු කැලඹීම

වාග්විඤ්ඤත්ති-වචනයෙන් ක්‍රියා

කිරීමක් ඇතිකළ පවත්නා ශරීරගතධාතුකැලඹීම

ඉච්චමේවත්‍ථාම=එතනම් සිත ස්ථිර උපදනා වචනයාම

**52 වෙනි පිටි.**

ඉඤ්ජනා නැවතුන-මැරෙදි සිතින් විතින් මිදීම

විපරිණාම-පෙරළෙන

**55 වෙනි පිටි.**

ධම්මනියාමතාවේ-ධර්මයන්ගේ යථාතත්ත්වයේ.

**56 වෙනි පිටි.**

මහාභූතානි

විකතාත්‍යතානිය-විකතත්‍යතරූපයන්

**57 වෙනි පිට.**

ප්‍රදීපසිඛාව-පහත් දැල්ල

**58 වෙනි පිට.**

බාහ්‍යසඤ්ඤානමයෙනි-ශරීරයෙන් පිටත් වූ සකු සමූහයෙනි

අධ්‍යාත්මික සඤ්ඤානමයෙනි-සැම ශරීරයෙනි

උපසම්පදාවිමෙනි-උදව් වීමෙන්, ඉවහල්වීමෙනි

භූතභූත-භූතරූප හුන්දෙන

නිශ්‍රයසම්පන්න-ආධාරවූසම්පන්න

**59 වෙනි පිට.**

විඤ්ඤාසම්පයුත්ත-විඤ්ඤා බලයෙන් හමගහන්නා

වත්තූපනිස්සිත්තබන්ධ-පැනිවැනිබඳින

ප්‍රත්‍යවෙක්ෂා කෙරේද-නුවණින් සලකාද

සප්තාධිශේෂපුද්ගලයෝ-සොතාපන්න වූත් මාංගීය, සෝවාන් ඵල ය, සකෘදාගාම්මාංගීය, සකෘදාගාම් ඵලය, අනාගාම්මාංගීය, අනාගාම් ඵලය, රහත් මාංගීය, උබැනත් ආර්‍ය්‍ය පුද්ගලයෝ සත්දෙන

**60 වෙනි පිට.**

පුග්ගලප්‍රසාදපාය-ගුණ තුවණින් පැහැම්ම හෙතුවූ පුද්ගලයන් ආශ්‍රයම ලැබීම

හොජ්ඣාසපපාය-සැපයහසු ලැබීම මම මනහුදු හොජ්ඣා ලැබීම

ආශ්‍රයාදුනිත්‍යාදි දශයෙන්-දෙස විදිම හන්නොසෙම් වශයෙන්

අවිඤ්ඤාකාය කුසල් අකුසල් වශයෙන් ප්‍රඥාශරීරාකාරනැලද නොවෙනත් විපාක ක්‍රියා වශයෙන් දක්වනලද ධර්ම

**61 වෙනි පිට.**

බලවපරිච්ඡය-බලවත් පුරුද්ද

තාතාඅඤ්ඤිය-තෘෂ්ණාවෙක් දාර

යෙහි පවත්නා

නිද්ධාරණ-එයින් අන්‍යවූ

**62 වෙනි පිට.**

ප්‍රවර්තනවූ-පැවැත්තාවූ

**63 වෙනි පිට.**

සම්ප්‍රයෝගනාවසෙන්-සමඟ පවත්නා බැවින් හෙමත් එක්ව

යෙදෙන බැවින්

විප්‍රයුක්ත-වෙන්ව යෙදීම

**64 වෙනි පිට.**

සාවද්‍ය-වරද සහිත

නිරවද්‍ය-නිර්දූෂණ වරදනැති

කදාචිත්තෙකමවූ-එකින් එකි වූ, ඉන්

පවත්

ආදිනව-දූෂණ

ත්‍රිවිධ

හඳෙහිඋපනිස්සයෙනි-සහජ ඉපදී

**66 වෙනි පිට.**

සප්තම-සත්වෙනි

**67 වෙනි පිට.**

| | |
|---|---|
| ක්‍රියාවධාරණ වශයෙන්-ක්‍රියාව | හුදකලාවූ-තනිවූ |
| නියම්කොට නිම්වශයෙන් | වෙදනතෙමේ-දෙස් නගන තැ |
| ඵලාවධාරණ-ඵලය නියම්කොට | නැත්තේ |
| දැක්වීම (කොට දැක්වීම | දෙශනාරොපණය කරණ්නම්-දෙස් |
| හෙතුවධාරණ-හෙතුව නියම | නා නම් |
| කරවධාරණවශයෙන්-නියම්කොට | වක්‍ෂ්‍යමානපරිද්දෙන්-කියනු ලබ |
| කිම්වශයෙන් | න පරිද්දෙන් |

**68 වෙනි පිට.**

| | |
|---|---|
| සවෙතනය ජනයන්ගේ බුදුන් | යන්ගේ (වක් |
| මිසින්දමනයකළහැකි ජන | දෙශනාවිලාසයක්-දෙශනාලීලා |

**69 වෙනි පිට.**

| | |
|---|---|
| සදෘශසම-සෙම | එකධම්මූලික-එක්ධර්මයක් මූල් |
| වර්‍ත්තමානවතුදු-ඇත්තේවීනමුදු | කොටඇති |

**72 වෙනි පිට.**

තඹවූරුකිමක්සේ-සුවිර කිමක්සේ

**73 වෙනි පිට.**

| | |
|---|---|
| ප්‍රසන-පහස්නා, හැපෙන | යට |
| කාලබ්‍රයාගේ-ශරීරයාගේ | සංක්‍රමණය-ගමන්කිරීම |
| අනිරිකතාවූයේ-ඉතිරිවූයේ | හුඟකින්-හුලකින් |
| භවාන්තරයට-ඊළඟ ආත්මභාව | සම්බන්ධීකවූහෝ-සම්‍යොගවූහෝ |

**74 වෙනි පිට.**

| | |
|---|---|
| සෙල්ලශදරථ ව්‍යුපසමයෙන්-කෙ | ළු ඇත්තාවූ |
| ලෙස්වඩාව සංසිදීමත් | සොපාදිශෙෂ-පසුවසකකිය සම |
| ශාන්තාකාරරූපවූ-සැනසීම් සහිතා | න පවත්නා |

**76 වෙනි පිට.**

වාදස-දෙළඟාත්

**77 වෙනි පිට.**

කතිපයඅත්‍යයක්-කවයුතු කීපයක්

## 78 වෙනි පිටට.

ජාතිබධිර-උත්පත්තියෙන්ම බි ජානිඑළුමුන-කෙළංතාලු (නිරි නවකතව්‍ය-අතීතාදි විශයයන්

නොනියුතුවූ නිර්‍වාණ ප්‍රඥ පති අරමණු. ගුහණයකිරීමක්-ගැණීමක්

## 79 වෙනි පිට.

සිසුනුඉගුලුඅහස-කසිනනිමිතත ලා හැරිය තැන අවකාශය මෙනෙහි නොකොට උගුල් අවතතකිරීම්-හැමීම

## 80 වෙනි පිටට.

භවාඞගවිඝයවු-භවාඞග සිතට බාදුවු

## 83 වෙනි පිට.

අනුශය කෙලෙශයන්-සියුම්වූ ඇතැන් විත්ත සන්තානයෙහි හෙවිපැවතිකෙලෙස්

භූමිපත්‍යාපන්නවූ-භූමියට ඇතුළත්වූ ගුඩ-හකුරු ශර්කරා-සීනි

## 85 වෙනි පිටට.

චතුර්ථාරූප්‍ය ත්‍රිතියයෙන්-සතරවන අරූපාවචර වූනිදිනි

## 86 වෙනි පිට.

පුර්‍වභාවරූප-පුරුෂභාවරූප

## 87 වෙනි පිටට.

බුවාවුදෙවියන්-බුව ඇසුරුකොට සිටින දෙවියන්

## 88 වෙනි පිට.

හෙට්ඨිමපරිවේදයයන්-යටත්පිරි සෙසින්

අඤානතව්-නාසය(ඤාණප්‍රසාදය) නැතිව

## 89 වෙනි පිට.

සැව-ද්‍රුතව

අමඤද්ඝත බඩිඩාරම්මණ-කසී නය ඉගුළු ආකාශ නිමිත්ත

හා, නාසතිභාවඅරමුණ

විනිපාතික-එනම් ප්‍රේත ලොව සක්

## 90 වෙනි පිටට.

නිරාප්‍රීතික-ප්‍රීති රහිත

සප්‍රීතික-ප්‍රීති සහිත

## 91 වෙනි පිට.

මාරණන්තික-මරණය ලංවෙතාම ඇති

සම්පූණක-දමාගසන්නාක් වැ නිවූ

**92 වෙනි පිටම.**

[illegible]ග්‍රාහය-වරදවාගැනීම | ප්‍රතිඛේපකෙරේ-ඉවත් කෙරේ
මූලසමන්වා-මූලසම්බන්ධකොට

**93 වෙනි පිට.**

[illegible]ගල-දෙංකාරය | ප්‍රතිබිම්බ-ඡායාරූපය
[illegible]-අවවිව; සිල්එක | තෘෂ්ණාතුක-ඊට හෙතුවූ

**95 වෙනි පිට.**

අඞ්කුර-මෝරරැස්සා; පැලයක මුල් අවස්ථාව

**96 වෙනි පිට.**

[illegible]ණතාපාදායරූප-පෘථිවී ධාතු | හා වණ් ගන්ධාදී සුවිසි (24)
ආදි සතරුකාරවූභූතරූප | උපාදායරූප
විනිර්මුක්තවූ-මිදුණුවූ

**97 වෙනි පිට.**

ආඝඞ්කාව-සැකය

**98 වෙනි පිට.**

ප්‍රවර්තති-පවත්නා
ක්ෂණයෙහි-ඇසිල්ලෙහි, මොහොතෙහි,

**99 වෙනි පිට.**

ඉඟොලම්බන-ගුහ අරමුණු

**101 වෙනි පිට.**

තදනුරූපවූ-ඒ ඒ සුදුසුවූ

**101 වෙනි පිට.**

අභාවක-භාවරූපයක් නැති

**103 වෙනි පිට.**

අනුමාත්‍රායකුදු-සැලලුමාත්‍රයකුදු | දීඝායුෂකවූ-දිගු ආයුෂඇති
මධ්‍යායුෂකවූ-සැලලුප ආයුෂඇති

**104 වෙනි පිට.**

[illegible]ඛාෂටකරූප කලාපය-ගින්දර. පස, එතුර, හුළඟ, පැය, ගඳ රස, ආහාර ශක්තියයි කියන ලද රූප කැබලි අට | බුත්නාවක්-කැඩුනු නැවක්
දෙඅප්‍රඥහයක්-දෙස් පැමිණීමක්

**105 වෙනි පිට.**

අවශිෂ්ටවූ-ඉතිරිවූ

**107 වෙනි පිටට.**

ගසංකා-උදුරාකා

**109 වෙනි පිටට.**

ඛානිරායතනායෙ-ශරීරයෙන් පිටත්තන්නිවූ ආයතනයෙ

**110 වෙනි පිටට.**

ඕමකදිශායෙන්-යටින්පිරිසෙසින්

ඔමක-ලාමක; පහත්

සළෝතකාඡ්ඩ-සියල්ලම උසස්

**113 වෙනි පිටට.**

ඉඤ්ජිමපරිවෙඡ්දායෙන්-යටත්පිරිසෙසින්

**114 වෙනි පිටට.**

එකොතත්‍යාදුදිවශායෙන්-එකව ඉපදීම් ආදිවශයෙන්

**115 වෙනි පිටට.**

සිරාරෙහි-ශරීරයෙනි

**116 වෙනි පිටට.**

නයමුඛමාත්‍රයකි-නේරුම් ගැණීමට පහසුවෙන පිණිස ලුහුඬුරීතියකි

**117 වෙනි පිටට.**

ප්‍රත්‍යයොතපන්න-හෙතුවෙන් උ
පන්නවූ; උළුධම්

නිරාකතිඤාඤත්‍රක්‍රමයෙන්-වාක
රණ ශාසත්‍රක්‍රමයන්

පදඝකුළුවා-පද කිපයක් ලුහුඬු

කොටි

එකසතතති-එක් පරමපරාවක්

වශයෙන්

නිබතතසභාතතිය-වෙනස් පරම්
පරාව

**118 වෙනි පිටට.**

පියත්ම-අහකදමින්ට, ඉවත්කර
න්ට

මහාවිහාර වාසීහු-අනුරාධපුර

මහා මේඝවතයෙහි නරවත
ලද මහා විහාරවාසි මිහිඳු
මහතතර පරපුරෙන් පැවති
භික්ෂූහු

**122 වෙනි පිටට.**

කාමාසඤ්ඤාදවශායෙන්-කාම රසඥදිම් වශයෙන්

ආසඤ්ඤාදනය-රසඥදීම

**123 වෙනි පිටට.**

සාමුය-සමකොට දුක්වීම

අනුසයකිලෙස්-කරුණක් ඇතිවිටක මතුවන මිදිශමෙන්

කරුණක් ඇතිවිට මතුවන
සියුම් ආකාරයෙන් සිත්හි
පවත්නා කෙලස්

නිරනුසයවෙදනාව-සඵලප වෂ යෙන්වත් කෙලෙස් නැති සිත්හි හටගන්නා වෙදනාව

සඵානකම්තනුපරමතාදිවශයෙන්-සත්වරක් භවයෙහි ඉපදීම් ආදිවශයෙන්

**126 වෙනි පිට.**

ගොශීල-හරකෙකුගේ ඉරියව් ලෙස පැවැත්ම ගොශීලයයි

ශුනකශීල-බල්ලෙකුගේ ඉරියව් ලෙසපැවැත්ම ශුනකශීලයයි

පරාමශීනය කෙරෙමින්-හාර ගණිමින්

**127 වෙනි පිට.**

අභිනිවෙශය-හාරගැණීම

සතුස්ඛව-ලදදෙසින් සතුටුවන බව

අපිස්බව-මද දෙයකින් කැමති වනබව

පයේෂණ-එසතු සැපසීමේ

ආරක්ෂාදුකටත්-වසතු ආරක්ෂා කිරීමේ දුකටත්

**130 වෙනි පිට.**

අල්පව්මයබැවින්-සඵලප ධම්මෙ නෙකුත් අරමුනුකොට පව ත්නා බැවින්

දිඨමංගලික-දුටුදේ ශුභාශුභ ල

කුණුවශයෙන් පිළිගත්තෝ

සුතමංගලික-ඇසුදේ ශුභාශුභ ලකුණුවශයෙන් පිළිගත්තෝ

ඔෘදරිකවූ-ශරීරස්සුවූ

**132 වෙනි පිට.**

පඤ්ඤාය වශයෙන්-සමාන වශයෙන්

**133 වෙනි පිට.**

මඤ්ඤසඤ්ඤන්-ඇදේනිදින්නවුන්

**134 වෙනි පිට.**

පුනරුකනිය-කී දේ නැවත යිම

**135 වෙනි පිට.**

ගණනූපගමනාවැ-ගණන් නොගත්

**137 වෙනි පිට.**

දුකඛසන්නාප-දුකෙන් තැවීම.

ප්‍රත්‍යක්ෂවූ-ඇසට හමුවූ නොහොත් දැනට පෙනෙන්ට තිබෙන්නාවූ

දිඨධම්ම නිබ්බානවාද-පවකාම සමපත් ආදිය නිවීනයයි ගන්නා ලබ්ධිප

**138 වෙනි පිට.**

ආනම්වාදෙපාදනයෙන්-ආ නම ලබ්ධිය දැඩිකොගැණීමෙන්

ශීලබ්බතාපාදන-මිථ්‍යාසීලවාත

යෙන් ශුද්ධියක්ඇතැයි ගන්නා ලබ්ධි (පැවැත්ම

කුක්කුර සීල-ශුනකයන්ට බදු

**139 වෙනි පිට.**

ප්‍රසූතියෙහිද-බිහිවීමෙහිද ක්ෂණත්‍රයන්-උතුපාද,ඨිති,භංග
ව්‍යාප්ති-නිමවුල යන ක්ෂණ තුනෙන්

**140 වෙනි පිට.**

කෘතමාද්‍රූප-කර්මයෙන් සෑදෙනරූප

**141 වෙනි පිට.**

කවඩනාරූප-කර්මයෙන් සෑදෙන රූප

**145 වෙනි පිට.**

ඛම්වත්නීය-කරකවන්නීය

**146 වෙනි පිට.**

අපරිපූණී-අසම්පූණී

**147 වෙනි පිට.**

ප්‍රතිග්‍රාහකයන්ගේ-පිළිගන්නවුන්ගේ

**151 වෙනි පිට.**

ආලම්බනයන්හි-අරමුණුවල | නෛසර්ගික-ස්වභාවයෙන්සිදුවූ

**152 වෙනි පිට.**

කෞශල්‍යසූත්‍රය-කෙළෙස් නැමති සැරව

**154 වෙනි පිට.**

අසිනිවෙණ්‍ය-හාරකැණීම

**157 වෙනි පිට.**

සංස්කාර වාතය-සංස්කාරයෙන් පවත්නා දුඃඛ සුළඟ

**158 වෙනි පිට.**

සංඝගල-මුවහත්කැබිමට ප්‍රාර්ථිත්කරණ ගල්වැගීයක්

**159 වෙනි පිට.**

නුවැටියක්සේ-නූල් ගුටියක්සේ

පරමාර්ථධම්ම මකරන්දයෙහි ප්‍රථමභාගය සම්බන්ධවූ

## ග්‍රන්ථිපද විවරණය

**පරිසමාප්තයි.**

සබ්බ දානං ධම්ම දානං ජිනාති